අපේ ස්වර්ගීය පියවූ උතුම් බල ඇත්තාවූ රජුන්ට රජවූ ස්වාමිවරුන්ට ස්වාමිවූ අධිපත්වරුන්ගේ එකම ආඥාකාරයාවූ ස්වකීය සිංහාසනේ ඉඳ සියලු ලෝවැසියන් බලන්නාවූ ස්වාමිනි, අපේ ඉතා කාරුණාවන්ත උතුම් ස්වාමිදූවූ වික්ටෝරියානාම් මහේසිකාව කාරුණාවෙන් බලමින් ඔබගේ අභිප්‍රාවට නිතර කීකරුව ඔබගේ මාර්ගයේ හැසිරෙණ පිණිස ඔබගේ ශුද්ධාත්මයානන්ගේ පිහිටෙන් උන්වහන්සේ සම්පූර්ණකරණ හැටියටත්, ස්වර්ගීයවූ තෑගි උන්වහන්සේට බොහෝසෙයින් දෙනහැටියටත්, නිරෝගිකමින්ද සැපසන්තෝෂයෙන්ද බොහෝ කාලයක් උන්වහන්සේ ජීවත්කරණ හැටියටත් උන්වහන්සේගේ සියලු සතුරන් පරදවා ජයගන්නා පිණිස බලවීර්‍ය දෙන හැටියටත්, මේ ජීවිතයෙන් පසු සදාකාල ප්‍රීතියට සහ සැපතට පැමිනෙන පිණිස උන්වහන්සේට කාරුණාකරණ හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මුලු හිත්වලින් ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.

රාජ වංශය උදෙසා කරණ යාච්ඤාවය.

සියලු යහපත්කම්වල උල්පතක්වූ සියලු බල ඇති දෙවියන්වහන්ස, ඇල්බර්ට් ඈඩ්වර්ඩ් නාම් වේල්ස්හි කුමාරයානන්ටද වේල්ස්හි කුමාරිකාවන්ටද මුලු රාජ වංශයටද ආශිර්වාදකළ මැනව. ඔවුන්ට ඔබගේ ශුද්ධාත්මය දෙමින් ඔබගේ ස්වර්ගීයවූ පිහිටෙන් ඔවුන් පොහොසත්කොට, සියලු සැපතින් ඔවුන් වර්ධනකොට, ඔබගේ සදාකාලවූ රාජ්‍යයට ඔවුන් පමුනුවාගන්නා පිණිස, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඔබගෙන් යටහත්භාවයෙන් ඉල්ලා සිටිමුව. ආමෙන්.



දේවගැතියන් හා සමූහයා උදෙසා කරණ යාච්ඤාවය.

මහත් ආශ්චර්යයවල් කිරීමට එකම කර්තෘවූ සියලු බල ඇති සදාකාලවූ දෙවියන්වහන්ස, අපේ බිස්කොප්වරුන්ටත් අනිකුත් දේවගැතියන්ටත් ඔවුන්ගේ ප්‍රවේසමට භාරදුන් සියලු සමූහවලටත්, ඔබගේ පිහිටෙන් ලැබෙන සැපදායක ආත්මය එව්ව මැනව. ඔවුන්ට සැබෑලෙස ඔබ ප්‍රශංනාකරන්ට පුළුවන්වෙන පිණිස ඔබගේ ආශිර්වාද නැමති පිනිබින්දු ඔවුන් පිට නිතර වැග්රෙව්ව මැනව. ස්වාමිනි, අපේ ආධාරකාරයත් මැදහත්කාරයත්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෞරවය පිණිස මේ පිහිට ඔවුන්ට දුනමැනව. ආමේන්.

ශුද්ධ ක්‍රිසොස්තොම්ගේ යාච්ඤාවක්ය.

සියලු බල ඇත්තාවූ දෙවියන්වහන්ස, දැන් අපි සියල්ලෝම එක්සිත්ව ඔබට අපේ සාමාන්‍යවූ යාච්ඤාවල් පවත්වන පිණිස ඔබ අපට කාරුණාකළාය. ඔබගේ නාමයෙන් දෙන්නෙක්වත් තුන්දෙනෙක්වත් එක්වූකල ඔවුන්ගේ යාච්ඤාවල් සම්පූර්ණකාරණලෙස ඔබ පොරොන්දුවූනාය. එබැවින් ස්වාමිනි, ඔබගේ දාසයෝ වන අපේ ප්‍රාර්ථනාවලුත් යාච්ඤාවලුත් අපේ ප්‍රයෝජනයට නිසි හැටියට සම්පූර්ණකරමින්, මෙලොවදී ඔබගේ සත්‍යකම දැනගැණීමත් පරලොවදී සදාකාල ජීවනයත් අපට දුනමැනව. ආමෙන්.

2. කොරින්ති 13.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාරුණාවත්, දෙවියන්වහන්සේගේ ආදරයත්, ශුද්ධාත්මයානන්වහන්සේගේ සමගිකමත්, සදාකාලේටම අප සියල්ලන් සමග වේවා. ආමෙන්.

අවුරුද්ද මුලුල්ලේ උදය යාච්ඤාවීමේ ක්‍රමය මෙහි නිමිදුය.

# සවස යාච්ඤාකිරීමේ ක්‍රමය.

---

¶ සවස යාච්ඤාව පටන්ගැම්මේදී දේවගැතියා මේ පහළ ලියවී තිබෙන ශුද්ධලියවිල්ලේ පදවලින් එකක්වත් ඊට වැඩියවත් මහත් ශබ්දයෙන් කියා ඉන්පසු ඒ පදවලට පහළ ලියා තිබෙන ලෙස කියාවා.

දුෂ්ටවූ මනුෂ්‍යයා තමා විසින් කළාවූ දුෂ්ටකමෙන් දුරුව යුතුවූ ධර්මිෂ්ඨවූ දෙය කරතොත් ඔහු තමාගේ ප්‍රාණය ජීවත්කොට ගලවාගණියි. එසෙකියෙල්. 18. 27.

මම මාගේ වරදවල් කියාදෙමි, මාගේ පාපය මා ඉදිරියේ නිතර තිබෙනවාය. ගීතිකා 51. 3.

ඔබගේ මුහුණ මාගේ පාපවලින් හරවාගත මැනව, මාගේ සියලු නපුරුකම්ද මැකුවමැනව. ගීතිකා 51. 9.

දෙවියන්වහන්සේට කරණ යාගනම් බිඳුනාවූ හිතක්ය, දෙවියන්වහන්ස ඔබ බිඳුනාවූ තැළුනාවූ හිත නොසලකන්නේනැත. ගීතිකා 51. 17.

තොපගේ දෙවිවූ යෙහෝවඃවහන්සේ කාරුණාවන්ත නිසත්, දයාබර නිසත්, ඉක්මනට කෝප නොවෙන නිසත්, බොහෝ ගුණවන්තයෙක් නිසත්, නපුරට පසුතැවිලිවෙන නිසත්, තොපේ රෙදි නොව හිත් ඉරාගණිමින් උන්වහන්සේ දෙසට හැරෙව්. යෝවෙල් 2. 13.

අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේට විරුද්ධව අපි කැරලිගසමින්, උන්වහන්සේ අපට දුන් ආඥාවල නොහැසිර, උන්වහන්සේගේ වචනවලට අකීකරුව සිටියෙමුව. නුමුත් අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේ කාරුණාවත් කමාවත් ඇති කෙනෙක. දැනියෙල් 9. 9, 10.



යෙහෝවඃවහන්ස ඔබ මා විනාශ නොකරණ පිණිස කෝපයෙන් නොව සැලකීමෙන් මට අච්චු කළ මැනව. යෙරමියා 10. 24. ගීතිකා 6. 1.

ස්වර්ග රාජ්‍යය කිට්ටු නිසා පශ්චාත්තාප වෙයව්. මතෙව් 3. 2.

මම නැගිට මාගේ පියාණන් ලඟට ගොස් පියාණනි ස්වර්ගයට විරුද්ධව නුඹ ඉදිරියේ පව්කෙළෙමි මෙයින් මතු නුඹගේ පුත්‍රයායයි කියනු ලබන්ට නොවටිමියි කියමි. ලූක් 15. 18, 19.

යෙහෝවඃවහන්ස ජීවත්වෙන්නාවූ කිසිවෙක් ඔබ ඉදිරියේ නිදොස්වෙන්නේනැත, ඒ නිසා ඔබගේ දාසයා සමග නඩුවට නොපැමිනුන මැනව. ගීතිකා 143. 2.

අපට පාපය නැතැයි කියමුනම් අපම මුළාකරගණිමුව, සැබෑකමද අප තුළේ නැත, නමුත් අපේ පව් කියාදෙමුනම් අපේ පව් කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පිරිසිදුකරන්ටත්, දෙවියන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. 1 යොහන් 18. 9.

---

ප්‍රිය සහෝදරයෙනි, අපේ ස්වර්ගීය පියවූ සියලු බල ඇති දෙවියන්වහන්සේගේ අප්‍රමාණ යහපත්කම සහ කාරුණාව නිසා අපේ නොයෙක් ආකාර පාපවල් සහ දුෂ්ටකම්වලට කමාව ලබාගන්නා පිණිස ඒවා වසාවක්වත් සැඟවිල්ලක්වත් නැතුව යටත්පහත්වූ පශ්චාත්තාපවූ කීකරුවූ සිතෙන් උන්වහන්සේ ඉදිරියේ ප්‍රකාශයෙන් කියාදෙන්ට ශුද්ධ ලියවිල්ලේ නොයෙක් තැන්වල අපට දැනුමැතිකම් ලියා තිබෙයි. තවද දෙවියන්වහන්සේ ඉදිරියේ අපේ පව් සෑම කාලයේම යටත්ව කියාදෙන්ට යුතුව තිබෙන නුමුත් ප්‍රධානකොට උන්වහන්සේගෙන් අපට ලැබුනු මහත් උපකාර නිසා උන්වහන්සේට සතුතිකරන්ටත් උන්වහන්සේගේ ඉතා සුදුසුවූ කීර්තිය ප්‍රකාශකරන්ටත් උන්වහන්

සේගේ ඉතා පිරිසිදු වචනය අහන්ටත් ශරීර ප්‍රාණ දෙකට නිසිවූ ප්‍රයෝජනවත් දේ ලබාගන්නා පිණිස උන්වහන්සේට යාච්ඤාවල් පවත්වන්ටත් අපි රැස්වූකල අපේ පාපවල් යටත්ව කියාදෙන්ට අපට බොහොම යුතුව තිබෙනවාය. ඉන්නිසා මෙහි එකතුවී සිටිනා මනුෂ්‍යයෙනි, පිරිසිදු සිතිනුත් බැගෑපත්වූ ශබ්දයෙනුත් ස්වර්ගීය කරුණාසනය ඉදිරියට මා සමග පැමිණෙමින් මේ ආකාර කියනලෙස සියලු දෙනාගෙන් ඉල්ලමි.

¶ දේවගැතියා සහ සියලු සෙනගත් දනගසා මේ සාමාන්‍යවූ පාපුච්චාරණය කියත්වා.

සියලු බල ඇති ඉතා දයාවන්තවූ පියාණනි—අපි මුළාවූ බැටළුවන්සේ මුළාවී ඔබගේ මාවත්වලින් හැරී ගියෙමුව—අපේම හිත්වල කල්පනාවල්ද තෘෂ්ණාවල්ද ලෙස බොහෝකොට හැසුරුණෙමුව. ඔබගේ ශුද්ධවූ ආඥාවල් කඩකොළෙමුව—අප විසින් කටයුතුව තිබුණු දේ අත්හැර නොකටයුතුව තිබුණු දේ කළෙමුව—අපේ හිත්වලට කිසි සැපයක් ඇත්තේ නැත—නුමුත් ස්වාමිනි, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ මනුෂ්‍ය ජාතීන්ට ප්‍රකාශකළ ඔබගේ පොරොන්දුවල හැටියට—කාලකණ්ණි පව්කාරයෝවූ අපට කරුණාකළ මැනව—දෙවියන්වහන්ස තමතමුන්ගේ වැරදි කියාදෙන්නාවූ අපට අච්චුනොකළ මැනව—පසුතැවිලිවෙන්නාවූ අපට සුවකළ මැනව—ඉතා කරුණාවන්තවූ පියාණනි—යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා—මින්මතු දේවභක්තිවූ ධර්මිෂ්ඨවූ යුතුවූ කල්යැවීමකින්—ඔබගේ ශුද්ධවූ නාමයට ගෞරව පැමිණෙන ලෙස—අපට කල්යවන්ට පුළුවන්කළ මැනව. ආමෙන්.

¶ සමුදුව දනගසා සිටිද්දී ප්‍රෙස්බිතර් පමණක් නැගිට මේ නිර්දෝෂකිරීම නොහොත් පව්වලින්මිදීම ප්‍රකාශයෙන්කියාවා.

යම් පව්කාරයෙක් තමාගේ දුෂ්ටකම් අත්හැර ජීවත් වෙනවාට මිස විනාශ වෙනවාට කැමති



නැත්තාවූ, පශ්චාත්තාපවෙන තමන්ගේ සේනාවට ඔවුන්ගේ නිර්දෝෂවීමත් පව් කමාවීමත් ප්‍රකාශකොට දන්වන්ට තමන්ගේ ගැතියන්ට බලයත් ආඥාවත් දුන්නාවූ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ සියලු බල ඇති දෙවියන්වහන්සේ, සැබවින් පශ්චාත්තාපව තමන්වහන්සේගේ ශුද්ධවූ සහපත් ආරංචිය වඤ්චා නැතුව අදහන්නාවූ සැම දෙනාටම කමාවෙමින් ඔවුන් නිර්දෝෂකරණවාය. ඒ නිසා අපි දැන් කාරණ දේ උන්වහන්සේට ප්‍රශනනාව තිබෙන පිණිසත්, අපේ කල් කිරීම මින්මතු පිරිසිදුව ශුද්ධව තිබෙන පිණිසත්, අපි අනාගමේදී උන්වහන්සේගේ සදාකාලවූ ප්‍රීතියට පැමිණෙන පිණිසත්, හරියාකාර පශ්චාත්තාපවීම සහ උන්වහන්සේගේ ශුද්ධාත්මයත් අපට දෙනලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා උන්වහන්සේට යාච්ඤාවෙමු. ආමෙන්.

¶ එවිට දේවගැතියා දනගසා ස්වාමින්ගේ යාච්ඤාව කියාවා. සෙනගත් දනගසා ඒ යාච්ඤාව ඔහු සමග කියත්වා.

ස්වර්ගයේ සිටිනා අපේ පියාණනි—ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා—ඔබගේ රාජ්‍යය ඒවා—ඔබගේ කැමැත්ත ස්වර්ගයේමෙන් පොළවෙත් කරණු ලැබේවා—අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව—අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නාවාගේ—අපේ වැරදිවලටත් කමාවුව මැනව—අප පරීක්ෂාවීමට නොපමුනුවා—නපුරෙන් අප ගලවාගත මැනව—මක්නිසාද රාජ්‍යයත් බලයත් මහිමතාවයත් සදාකල්ම ඔබගේය. ආමෙන්.

¶ ඊලඟට දේවගැතියා මෙසේ කියාවා.

ස්වාමිනි අපේ කටවල් ඇරියමැනව.

උත්තරය. එවිට අපි එයින් ඔබගේ කීර්තිය ප්‍රකාශකරමුව.

දේවගැතියා. දෙවියන්වහන්ස අප ගලවන පිණිස කඩිනම්වූවමැනව.

උ. ස්වාමිනි අපට උපකාර පිණිස ඉක්මන්වූවමැනව.

¶ මෙහිදී සියල්ලෝම නැගිට්ටාම දේවගැතියා මෙසේ කියාවා.

දේ. පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

උ. පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

දේ. ස්වාමින්වහන්සේට ප්‍රශංසා කරව්.

උ. ස්වාමින්වහන්සේගේ නාමයට ප්‍රශංසාවේවා.

¶ නියමකර තිබෙන ලෙස මෙහිදී ගිතිකාවල් කියත්වා නොහොත් ගායනාකරත්වා.

පසුව නියමකර තිබෙනලෙස පරණ ගිව්සිමෙන් පරිච්ඡෙදයක් කියවා ඉන්පසු "මාගේ සිත ස්වාමින්වහන්සේට" යන ගීතිකාව එනම් ආශිර්වාදලත් කන්නිමරියාගේ ගිතිකාව මෙහි පහත පෙණෙන හැටියට කියන්ට නොහොත් ගායනා කරන්ට යෙදේ.

*Magnificat.* ශුද්ධවූ ලූක් 1.

මාගේ සිත ස්වාමින්වහන්සේට ප්‍රශංසාකරණවාය. මාගේ ආත්මය මාගේ ගැලවුම්කාර දෙවියන්වහන්සේ කෙරෙහි සතුටුවෙනවාය.

උන්වහන්සේ තමන්ගේ දාසියගේ හීනකම බැළුවාය.

එබැවින් මෙතැන් පටන් සියලු වර්ගයෝ මට වාසනාවන්තියයි කියනවා ඇත.

බලවත්වූ තැනන්වහන්සේ මහත්වූ කාරණා මට කළාය. උන්වහන්සේගේ නාමය පිරිසිදුය.

උන්වහන්සේගේ කරුණාව උන්වහන්සේට භය වෙන්නන් කෙරෙහි පරම්පරාවෙන් පරම්පරාවට පවතිනවාය.



උන්වහන්සේ තමන්ගේ අතේ බලය දැක්වූවාය. අහංකාරයන්ගේ අභිප්‍රාවල් විසිරෙව්වාය.

උන්වහන්සේ බලවන්තයන් සිංහාසනාවලින් හෙළා යටහත්තුන් උසස්කළාය.

බඩගිනිවූවන් යහපත් දෙයින් පිණවා වස්තුකාරයන් සිස් අතින් ඇරියාය.

උන්වහන්සේ අපගේ පියවරුන්ට කී ලෙස ආබ්‍රහම්ටද හැම කල්හිම ඔහුගේ වංශයටද අනුකම්පා සිත් ඇතුව තමන් දාසවූ ඊශ්‍රායෙල්ට පිහිටවූනාය.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැම්මේදී තිබුනුලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ නොහොත් මේ ගීතිකාව කියත්වා, නමුත් මාසේ දහනවවෙනි දවසේදී මේ ගීතිකාව අනිත් ගීතිකාවල් සමග කියන්ට යෙදෙන නිසා ඒ දවසේ මෙහිදී කියන්ට නොයෙදේ.

*Cantate Domino.* ගීතිකා 98.

යෙහෝවඃවහන්සේ ආශ්චර්යවූ ක්‍රියාවල් කළ නිසත් තමන්ගේ දකුණු අතින්ද පවිත්‍රවූ හස්තයෙන්ද ජයගත් නිසත් උන්වහන්සේට අලුත් ගීතිකාවකින් ගීතිකා කරව්.

යෙහෝවඃවහන්සේ තමන්ගේ ගැලවීම දැක්වූවාය. තමන්ගේ ධර්මිෂ්ඨකමද පරදේශීන් ඉදිරියේ ප්‍රකාශකළාය.

උන්වහන්සේ තමන්ගේ දයාව සහ සත්‍යකම ඊශ්‍රායෙල්ගේ වංශය කෙරෙහි සිහිකළාය. ලෝකේ ඉම දක්වා සියල්ලෝ අපේ දෙවියන්වහන්සේගේ ගැලවීම දුටුවාය.

අහෝ සියලු රාජ්‍යයෙනි යෙහෝවඃවහන්සේට ප්‍රීති ශබ්ද පවත්වව්, මහත් ශබ්ද පවත්වමින් සතුටුව සතුති ගීතිකාකරව්.

වීනා ශබ්දයෙනුත් හේව්සි ශබ්දයෙනුත් සතුති ගීතිකාවක් යෙහෝවඃවහන්සේට ගීතිකාකරව්.

බෙර සහ හොරණෑ ශබ්දයෙන් රජවූ යෙහෝවාවහන්සේ ඉදිරියේ ප්‍රීති ශබ්ද පවත්වව්.

උන්වහන්සේ ඉදිරියේ සමුද්‍රය සහ එහි පූර්ණකමද මුළු ලෝකය සහ එහි වාසයකරන්නෝද ශබ්දකරත්වා.

ජලධාරාවෝ අත්පොළසන් දෙත්වා. කඳු ඒක පැහැර ප්‍රීතියට පැමිණෙත්වා.

මක්නිසාද යෙහෝවාවහන්සේ ලෝකය විනිශ්චයකරණ පිණිස එනාවාය.

උන්වහන්සේ ලෝකයා ධර්මිෂ්ඨකමෙන්ද මනුෂ්‍යයන් යුතුකමෙන්ද විනිශ්චයකරණවා ඇත.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසාවේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ නැවත නියමකර තිබෙන ලෙස අලුත් ගිවිසුමෙන් පරිච්ඡේදයක් කියාවා.

පසුව "ස්වාමිනි මිථ්‍යාදෘෂ්ටීන්ට" යන ගීතිකාව එනම් සිමියොන්ගේ ගීතිකාව මෙහි පහත පෙණෙනලෙස කියත්වා.

*Nunc dimittis.* ශුද්ධවූ ලූක් 2. 29.

ස්වාමිනි මිථ්‍යාදෘෂ්ටීන්ට එළියකිරීමට එළියත්ද ඔබගේ ඊශ්‍රායෙල් සේනාවේ තේජසදවූ.

සියලු මනුෂ්‍යයන් ඉදිරියේ ඔබ විසින් පඩිගාඩම්කළ ගැලවීම මාගේ ඇසින් දුටිමි.

ඒ නිසා ඔබගේ දාසයා වන මා ඔබගේ වචනය ලෙස සමාදානයෙන් යන්ට අරිණවාය.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසාවේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.



¶ නොහොත් මාසේ දොළොස්වෙනි දවසේ ඇර අනිත් දවස්වල මේ ගීතිකාව කියන්ට යෙදේ.

*Deus misereatur.* ගීතිකා 67.

දෙවියන්වහන්ස පොළවේ ඔබගේ මාර්ගයද සියලු ජාතීන් අතරේ ඔබගේ සැපදායක ගැලවීමද ප්‍රකාශවෙන පිණිස අපට කාරුණාකොට ආශීර්වාද කළ මැනව. ඔබගේ මූන අප කෙරෙහි බැබලුව මැනව.

දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා, සියලු ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා.

ඔබ ධර්මිෂ්ඨකමෙන් සේනාව විනිශ්චයකරණ නිසාත් ලෝවැසියන්ට ප්‍රධානකම් කරණ නිසාත් ලෝවැසියෝ සතුටුව ගීතිකා කියත්වා.

දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා සියලු ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා.

එවිට භූමිය ඇගේ සඵලකම උපදවන්නීය, දෙවියන්වහන්සේ එනම් අපේම දෙවියන්වහන්සේ අපට ආශීර්වාදකරණවා ඇත.

දෙවියන්වහන්සේ අපට ආශීර්වාදකරණවා ඇත, පොළවේ ඉම දක්වා සියල්ලෝ උන්වහන්සේට භය වෙනවා ඇත.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ එවිට දේවගැතියා සහ සමූහය හිටගෙණ අපොස්තුළුවරුන්ගේ ඇදහිල්ලේ ක්‍රමය කියත්වා නොහොත් ගායනාකරත්වා.

ස්වර්ගයේ සහ පොළවේ මැවුම්කාර සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේ අදහමි—උන්වහන්සේගේ එකම ජාතක පුත්‍රයත් අපේ ස්වාමියන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද අදහමි—උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ—මරියානම් කන්‍යාවගෙන්

ඉපද—පොන්තිවුස් පිලාත් යටතේ වධ විඳ—කුරුසියේ ඇනගැසුම්කා මැරී වළලනු ලැබ—පරලොවට ගොස්—තුන්වෙනි ද මළවුන්ගෙන් නැවත නැගිට ස්වර්ගයට නැගී—සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳගත් බවද—ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චය කරණ පිණිස එතනින් එනබවද අදහමි—ශුද්ධාත්මයාණන්වහන්සේද අදහමි—ශුද්ධවූ සර්ව සාධාරණ සභාවත්—පවිත්‍රයන්ගේ එකඟකමත්—පාපවල කමාවත්—මළවුන්ගේ නැවත නැගිට්මත්—සදාකාල ජීවනයත් ඇතෙයි කියා අදහමි. ඇමෙන්.

¶ නැවත සියල්ලෝම භක්තියෙන් දනගසා මේ පහළ ලියවී තිබෙන යාච්ඤාවල් කියත්වා, නමුත් ඊට පළමුවෙන් දේවගැතියා මහත් හඬින් මෙසේ කියාවා.

ස්වාමින්වහන්සේ නුඹලා සමග වේවා.

උ. උන්වහන්සේ නුඹ සමගත් වේවා.

දේවගැතියා. අපි යාච්ඤාවෙමු.

දේ. ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

උ. ක්‍රිස්තුස්වහන්ස අපට කරුණාකළ මැනව.

දේ. ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

¶ එවිට දේවගැතියත් උපසභායකයොත් සමූදුවත් ස්වාමින්වහනසේගේ යාච්ඤාව මහත් ශබ්දයෙන් කියත්වා.

ස්වර්ගයේ සිටිනා අපේ පියානනි—ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා—ඔබගේ රාජ්‍යය ඒවා—ඔබගේ කැමැත්තා ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණු ලැබේවා—අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව—අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නාවාගේ—අපේ වැරදිවලටත් කමාවූව මැනව—අප පරීක්ෂාවීමට නොපමුනුවා—නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

¶ එවිට ප්‍රෙස්බිතර් නැගිට සිට මෙසේ කියාවා.

ස්වාමිනි ඔබගේ කරුණාව අපට පෙන්නුව මැනව.



උ. ඔබගේ ගැලවීම අපට දුනමැනව.

ප්‍රෙ. ස්වාමිනි අපේ මහේසිකාව ආරක්ෂාකළ මැනව.

උ. අපි ඔබට යාච්ඤාවෙනකල අපේ වචන කරුණාවෙන් ඇසුව මැනව.

ප්‍රෙ. ඔබගේ ගැතියන් ධර්මිෂ්ඨකමෙන් පැලඳුව මැනව.

උ. ඔබගේ තෝරාගත් සේනාව ප්‍රීතිකළ මැනව.

ප්‍රෙ. ස්වාමිනි ඔබගේ සේනාව ආරක්ෂාකළමැනව.

උ. ඔබගේ උරුමයවූවන්ට ආශිර්වාදකළ මැනව.

ප්‍රෙ. දෙවියන්වහන්ස ඔබ ඇර අප වෙනුවට යුද්ධකරණ කෙනෙක් නැත.

උ. ඒ නිසා ස්වාමිනි අපේ කාලයේදී සමාදානය අපට දුනමැනව.

ප්‍රෙ. දෙවියන්වහන්ස අපේ හිත් පිරිසිදුකළ මැනව.

උ. ඔබගේ ශුද්ධාත්මය අපෙන් අහක නොගත මැනව.

¶ එවිට ලුහුඬු යාච්ඤා තුනක් කියන්ට යෙදේ එනම් පළමුකොට ඒ දවසට නියමකර තිබෙන එකත්, දෙවනුව මෙහි පහත පෙණෙන ලෙස සමාදානය ගැණද, තුන්වෙනුව සියලු උපද්‍රවලින් ආරක්ෂාවීම ගැණද, කරණ යාච්ඤාවලුත්ය. මෙයින් දෙවෙනි තුන්වෙනි යාච්ඤා වෙනස්නොව දවස්පතා සවස යාච්ඤාවේදී කියන්ට යෙදේ.

සවස යාච්ඤාව පැවැත්වීමේදී කියන දෙවෙනි ලුහුඬු යාච්ඤාවය.

සියලු පිරිසිදු කල්පනාත් සියලු යහපත් දැනුමැතිකමුත් සියලු ධර්මිෂ්ඨ ක්‍රියාත් නික්මවන්නාවූ දෙවියන්වහන්ස ඔබගේ ආඥාවලට කීකරුවෙන්ට අපේ හිත් කැමතිවෙන පිණිසත් කැලඹීමක් නැත්තාවූ නිවාඩුවෙන් කල්අරින්ට අපට පුළුවන්වෙන පිණිසත් අපේ සතුරන්ගෙන් පැමිණෙන භයින් අප ආරක්ෂාකොට ලෝකයෙන් ලැබෙන්ට නුපුළුවන්වූ

සමාදානය ඔබගේ දාසයෝ වන අපට අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් නිසා දුනමැනව. ආමෙන්.

සියලු උපද්‍රවලින් ආරක්‍ෂාවීම ගැණ කරණ ලුහුඬු යාච්ඤාවවූ තුන්වෙනි යාච්ඤාවය.

ස්වාමිනි අපේ අන්ධකාරය එළියකොට ඔබගේ මහත්වූ කරුණාවෙන් අද රාත්‍රියේ සියලු අනතුරුවලිනුත් උපද්‍රවලිනුත් අප ආරක්‍ෂාකරණමෙන් ඔබගේ එකම පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තිබෙන ප්‍රේමය නිසා අපි ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ ගීතිකා මණ්ඩප ඇති තැන්වලත්, ගීතිකා කිරීම ව්‍යවහාරවෙන ස්ථානවලත් මෙහිදී ගීතිකාකරන්ට යෙදේ.

උතුම්වූ මහේසිකාව උදෙසා කරණ යාච්ඤාවය.

අපේ ස්වර්ගීය පියවූ උතුම් බල ඇත්තාවූ රජුන්ට රජවූ ස්වාමිවරුන්ට ස්වාමිවූ අධිපතිවරුන්ගේ එකම ආණ්ඩුකාරයාවූ ස්වකීය සිංහාසනේ ඉඳ සියලු ලෝවැසියන් බලන්නාවූ ස්වාමිනි, අපේ ඉතා කරුණාවනත උතුම් ස්වාමිදූවූ වික්ටෝරියානම් මහේසිකාව කරුණාවෙන් බලමින්, ඔබගේ අභිප්‍රාවට නිතර කීකරුව ඔබගේ මාර්ගයේ හැසිරෙණ පිණිස ඔබගේ ශුද්ධාත්මයානන්ගේ පිහිටෙන් උන්වහන්සේ සම්පූර්ණකරණ හැටියටත්, ස්වර්ගීයවූ තෑගි උන්වහන්සේට බොහෝසෙයින් දෙන හැටියටත්, නිරෝගීකමින්ද සැප සන්තොෂයෙන්ද බොහෝ කාලයක් උන්වහන්සේ ජීවත්කරණ හැටියටත්, උන්වහන්සේගේ සියලු සතුරන් පරදවා ජයගන්නා පිණිස බලවීර්‍ය්‍ය දෙන හැටියටත්, මේ ජීවිතයෙන් පසු සදාකාල ප්‍රීතියට සහ සැපතට පැමිනෙන පිණිස උන්වහන්සේට කරුණාකරණ හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මුලු හිත්වලින් ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.



රාජ වංශය උදෙසා කරණ යාච්ඤාවය.

සියලු යහපත්කම්වල උල්පතක්වූ සියලු බල ඇති දෙවියන්වහන්ස, ඇල්බර්ට් ඇඩ්වර්ඩ නම් වේල්ස්හි කුමාරයානන්ටද වේල්ස්හි කුමාරිකාවින්ටද මුලු රාජවංශයටද ආශිර්වාදකළ මැනව. ඔවුන්ට ඔබගේ ශුද්ධාත්මය දෙමින්, ඔබගේ ස්වර්ගීයවූ පිහිටෙන් ඔවුන් පොහොසත්කොට, සියලු සැපතින් ඔවුන් වර්ධනකොට, ඔබගේ සදාකාලවූ රාජ්‍යයට ඔවුන් පමුනුවා ගන්නා පිණිස, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඔබගෙන් යටහත්භාවයෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

දේවගැතියන් හා සමූහයා උදෙසා කරණ යාච්ඤාවය.

මහත් ආශ්චර්‍ය්‍යවල් කිරීමට එකම කර්තෘවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, අපේ බිස්කොප්වරුන්ටත් අන්කුත් දේවගැතියන්ටත් ඔවුන්ගේ ප්‍රවේසමට භාරදුන් සියලු සමූහවලටත් ඔබගේ පිහිටෙන් ලැබෙන සැපදායක ආත්මය එව්ව මැනව. ඔවුන්ට සැබෑ ලෙස ඔබ ප්‍රශංසා කරන්ට පුළුවන්වෙන පිණිස ඔබගේ ආශිර්වාද නැමති පිනි බින්දු ඔවුන් පිට නිතර වැගිරෙව්ව මැනව. ස්වාමිනි, අපේ ආධාරකාරයත් මැදහත්කාරයත්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෞරවය පිණිස මේ පිහිට ඔවුන්ට දුනමැනව. ආමෙන්.

ශුද්ධ ක්‍රිසොස්තොම්ගේ යාච්ඤාවක්ය.

සියලු බලඇත්තාවූ දෙවියන්වහන්ස, දැන් අපි සියල්ලෝම එක්සිත්ව ඔබට අපේ සාමාන්‍යවූ යාච්ඤාවල් පවත්වන පිණිස ඔබ අපට කරුණාකළාය. ඔබගේ නාමයෙන් දෙන්නෙක්වත් තුන්දෙනෙක්වත් එක්වූකල ඔවුන්ගේ යාච්ඤාවල් සම්පූර්ණකරණලෙස ඔබ පොරොන්දුවූනාය. එබැවින් ස්වාමිනි, ඔබගේ දාසයෝ වන අපේ ප්‍රාර්ථනාවලුත්

යාච්ඤාවලුත් අපේ ප්‍රයෝජනයට නිසි හැටියට සම්පූර්ණකරමින්, මෙලොවදී ඔබගේ සත්‍යකම දැනගැණීමත් පරලොවදී සදාකාල ජීවනයත් අපට දුනමැනව. ආමෙන්.

2 කොරින්ති 13. 14.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවත්, දෙවියන්වහන්සේගේ ආදරයත්, ශුද්ධාත්මයානන්වහන්සේගේ සමගිකමත්, සදාකාලේටම අප සියල්ලන් සමග වේවා. ආමෙන්.

අවුරුද්ද මුලුල්ලේ සවස යාච්ඤාවීමේ ක්‍රමය මෙහි නින්දුය.

---

## උදයයාච්ඤාව පැවැත්වීමේදී කියන්ට සුතුවූ ශුද්ධ අතානාසිවුස්ගේ ඇදහිල්ලේ ක්‍රමයයි.

¶ ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්ති දවස, එපිඵානියේ දවස, ශුද්ධවූ මත්තියස්ගේ දවස, පස්ඛාමංගල්‍යයේ දවස, ස්වර්ගයට නැගීමේ දවස, පෙන්තකොස්තේ දවස, ශුද්ධවූ යොහන්බව්තිස්තගේ දවස, ශුද්ධවූ යාකොබ්ගේ දවස, ශුද්ධවූ බර්තලමෙවුගේ දවස, ශුද්ධවූ මතෙවුගේ දවස, ශුද්ධවූ සීමොන් සහ යූද්ගේ දවස, ශුද්ධවූ අන්ද්‍රෑගේ දවස, යන මේ මංගල්‍ය දවස්වලදීද, ත්‍රිත්වයේ ඉරිදා දවසේදීද, උදය යාච්ඤාවීමේදී අපොස්තුළුවරුන්ගේ ඇදහිල්ලේ ක්‍රමය වෙනුවට ශුද්ධවූ අතනාසිවුස්ගේ ඇදහිල්ලේ ක්‍රමයනම්වූ මේ අපේ ක්‍රිස්තියානි ඇදහිල්ල ප්‍රකාශකිරීම දේවගැතියා සහ සමූදුව හිටගෙණ කියත්වා නොහොත් ගායනාකරත්වා.

*Quicunque vult.*

ගැලවෙන්ට කැමත්කෙනෙක් සියල්ලටම ප්‍රධානකොට සර්වසාධාරණවූ ඇදහිල්ල අදහගන්ට සුතුය.

ඒ ඇදහිල්ල කිසි කෙනෙක් සම්පූර්ණව පිරිසිදුව රක්ෂා නොකලොත් ඒකාන්තයෙන්ම ඔහු සදාකාල විනාශයට පැමිණෙයි.



සර්වසාධාරණ ඇදහිල්ලනම්, ත්‍රිත්වයෙහි ඒකත්වයද ඒකත්වයෙහි ත්‍රිත්වයදවූ එකම දෙවියන්වහන්සේට නමස්කාර කිරීමය.

දේවත්වයෙහි තුන්දෙනා මිශ්‍රකරන්ටවත් භාවය භේදකරන්ටවත් සුතු නැත.

ඒමක්නිසාද පියානන්වහන්සේ වෙනය, පුත්‍රයානන්වහන්සේ වෙනය, ශුද්ධාත්මයානන්වහන්සේ වෙනය.

එසේනුමුත් පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් දෙවිකම එකමය තේජසත් එකාකාරය මහිමතාවත් සදාකාලේටම එකලෙසය.

පියානන්වහන්සේ යම්සේද, පුත්‍රයානන්වහන්සේත් එසේමය. ශුද්ධාත්මයානන්වහන්සේත් එලෙසමය.

පියානන්වහන්සේ මවන්ටවත් පුත්‍රයානන්වහන්සේ මවන්ටවත් ශුද්ධාත්මයානන්වහන්සේ මවන්ටවත් යෙදුනේ නැත.

පියානන්වහන්සේ අචින්ත්‍යය, පුත්‍රයානන්වහන්සේත් අචින්ත්‍යය, ශුද්ධාත්මයානන්වහන්සේත් අචින්ත්‍යය.

පියානන්වහන්සේ සදාකාලිකය, පුත්‍රයානන්වහන්සෙත් සදාකාලිකය, ශුද්ධාත්මයානන්වහන්සෙත් සදාකාලිකය.

එසේනුමුත් සදාකාලිකවූ එක්කෙනෙක්ම මිස සදාකාලිකවූ තුන්දෙනෙක් නැත.

තවද අචින්ත්‍යවූ මවන්ට නොයෙදුනාවූ එක්කෙනෙක්ම මිස, අචින්ත්‍යවූ මවන්ට නොයෙදුනාවූ තුන්දෙනෙක් නැත.

එසේම පියානන්වහන්සේ සියලු බල ඇත්තාය, පුත්‍රයානන්වහන්සේත් සියලු බල ඇත්තාය, ශුද්ධාත්මයානන්වහන්සේත් සියලු බල ඇත්තාය.

නුමුත් සියලු බලඇති තුන්දෙනෙක් නොව සියලු බලඇති එක්කෙනෙක්මය.

එසේම පියානෝ දෙවියන්වහන්සේය, පුත්‍රයානොත් දෙවියන්වහන්සේය, ශුද්ධාත්මයානොත් දෙවියන්වහන්සේය.

නුමුත් දෙවිවරු තුන්දෙනෙක් නොව එකම දෙවියන්වහන්සේය.

එසේම පියානන්වහන්සේ ස්වාමීය, පුත්‍රයානන්වහන්සේත් ස්වාමීය, ශුද්ධාත්මයානන්වහන්සේත් ස්වාමීය.

නුමුත් ස්වාමිවරු තුන්දෙනෙක් නොව එකම ස්වාමියාය.

මක්නිසාද, සත්‍යවූ ක්‍රිස්තියානි ධර්මය හැටියට දේවත්වයෙහි එක එක කෙනෙක් වෙනවෙනම දෙවියන්කොටත් ස්වාමිකොටත් පිළිගැණීම අපට අණකර තිබෙන්නාක්මෙන්ම

සර්වසාධාරණ ආගම හැටියට දෙවිවරු තුන්දෙනෙක්වත් ස්වාමිවරු තුන්දෙනෙක්වත් ඇතැයි කීම අපට එපාකර තිබෙනවාය.

පියානන්වහන්සේ කිසි කෙනෙක් විසින් සෑදුවේවත් මැව්වේවත් ජනක කළේවත් නැත.

පුත්‍රයානන්වහන්සේ පියානන්වහන්සේගෙන්ම පමණක් වූනාය. උන්වහන්සේ පියානන්වහන්සේට ජනකවූනා මිස සාදන්ටවත් මවන්ටවත් යෙදුනේනැත.

ශුද්ධාත්මයානන්වහන්සේ පියානන්ගෙනුත් පුත්‍රයානන්ගෙනුත් වූනාය. උන්වහන්සේ නික්මෙනවා මිස සාදන්ටවත් මවන්ටවත් ජනකකරන්ටවත් යෙදුනේ නැත.

මෙසේ එකම පියෙක් මිස පියානන්වහන්සේලා තුන්දෙනෙක්වත්, එකම පුත්‍රයෙක් මිස පුත්‍රයානන්වහන්සේලා තුන්දෙනෙක්වත්, එකම ශුද්ධාත්ම කෙනෙක් මිස ශුද්ධාත්මයානන්වහන්සේලා තුන්දෙනෙක්වත් නැත.

මේ ත්‍රිත්වයේ කිසි කෙනෙක් පෙර පසු නැත, උත්තම අධම නැත.



මේ තුන්දෙනම එක ලෙස සදාකාලිකය, එක සමානය.

මෙසේ සියලු ආකාරයෙන්ම ඉහත කී ලෙස ත්‍රිත්වයේ ඒකත්වයටත් ඒකත්වයේ ත්‍රිත්වයටත් නමස්කාර කටයුතුය.

එබැවින් ගැලවෙන්ට කැමති කවුරුනුමුත් ත්‍රිත්වය ගැණ මෙලෙස කල්පනාකරන්ට ඕනෑය.

තවද සදාකාලවූ ගැලවීම ලබන පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරගතවීම හරියාකාර අදහගන්ට ඕනෑය.

හරියාකාර ඇදහිල්ල නම්, දෙවියන්වහන්සේගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියොත් මනුෂ්‍යයත් බවද

පියානන්ගේ භාවයෙන් දෙව්වූ උන්වහන්සේ, ලෝකවල් මැවීමට පළමු ජනව, තමන්ගේ මව්ගේ භාවයෙන් මනුෂ්‍යයාව ලෝකයෙහි ඉපිද

සම්පූර්ණයෙන්ම දෙව්ව ප්‍රඥාවන්ත ප්‍රාණයත් මනුෂ්‍ය ශරීරයත් ඇතිව සම්පූර්ණයෙන් මනුෂ්‍යව තමන්ගේ දෙවිකමෙන් පියානන්ට සමානව තමන්ගේ මනුෂ්‍යකමෙන් පියානන්ට කුඩාව

දෙව්ව මනුෂ්‍යව සිටිතත් දෙන්නෙක් නොව එකම ක්‍රිස්තුස්වහන්සේව

දෙවිකම මාංසයට පෙරළීමෙන් නොව, දෙවිකම පිටට මනුෂ්‍යකම ගැණීමෙන් එක්කෙනෙක්ව

භාවය මිශ්‍රකිරීමෙන් නොව, දේව ස්වභාවේ ඒකත්වයෙන් සියලු ආකාරයෙන්ම එක්කෙනෙක්ව

ඥාණවන්ත ප්‍රාණයත් ශරීරයත් එක මනුෂ්‍යයෙක් වෙන්නාසේ දෙවියොත් මනුෂ්‍යයත් එකම ක්‍රිස්තුස්ව සිට

අපේ ගැලවීම පිණිස වධවිඳ පරලොවට ගොස් තුන්වෙනිදා මළවුන්ගෙන් නැවත නැගිට

ස්වර්ගයට නැගී සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉන්න බවද, ජීවතුන්

හා මළවුන් විනිශ්චයකරණ පිණිස එතැනින් එන බවද,

උන්වහන්සේ එනකල සියලු මනුෂ්‍යයෝ තම තමුන්ගේ ශරීර සහිතව නැවත නැගිට තම තමුන්ගේ ක්‍රියාවල් ගැණ ගණන්දෙන බවද,

යහපත් ක්‍රියා කළවුන් සදාකාල ජීවනයටත් නපුරු ක්‍රියාකළවුන් සදාකාල ගින්නටත් යනබවද, අදහාගැණීම සහ ප්‍රකාශකිරීමය.

මේ සර්වසාධාරණවූ ඇදහිල්ලය. මේ ඇදහිල්ල යමෙක් අවංකලෙස අදහා නොගත්තොත් ඔහුට ගැලවෙන්ට බැරිය.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

---

# ලිතනිය.

¶ ඉරිදා බදාදා සිකුරාදා දවස්වලත් නායකයා විසින් නියමකරණ වෙන දවස්වලත්, උදය යාච්ඤාව කෙළවරදී ගායනාකරන්ටවත් කියන්ටවත් සුදුසු ලිතනිය, නොහොත් සාමාන්‍ය යාච්ඤාව මෙසේය.

ස්වර්ගයේ හිටින පියවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

ස්වර්ගයේ හිටින පියවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

ලෝකයාගේ ගැලවුම්කාර පුත්‍රවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

ලෝකයාගේ ගැලවුම්කාර පුත්‍රවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.



පියානන්ගෙනුත් පුත්‍රයානන්ගෙනුත් නික්මෙනනාවූ ශුද්ධාත්මවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

පියානන්ගෙනුත් පුත්‍රයානන්ගෙනුත් නික්මෙනනාවූ ශුද්ධාත්මවූ දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

පිරිසිදුවූ ප්‍රශංසනීයවූ තේජවන්තවූ ත්‍රිත්වයවූ තුන්දෙනෙකුගෙන් යුක්තවූ එකම දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

පිරිසිදුවූ ප්‍රශංසනීයවූ තේජවන්තවූ ත්‍රිත්වයවූ තුන්දෙනෙකුගෙන් යුක්තවූ එකම දෙවියන්වහන්ස, කාලකණ්ණි පවුකාරයෝවූ අපට කරුණාකළ මැනව.

ස්වාමිනි අපේවත් අපේ පියමුතුන්ගේවත් වරදවල් සිහිනොකොට අපේ පාපවලට නිසි අච්චු අපට නොදී හැරිය මැනව. යහපත්වූ ස්වාමිනි අපට අච්චු නොදී හැරිය මැනව. ඔබගේ ඉතා අනර්ඝවූ ලෙයින් නිදහස්කරගත්තාවූ ඔබගේ සේනාවවූ අපට අච්චු නොදී අපට විරුද්ධව නිතර උදහස්නූනා මැනව.

යහපත්වූ ස්වාමිනි අපට අච්චුනොදී හැරියමැනව.

සියලු නපුරෙනුත් දුෂ්ටකමෙනුත් පාපයෙනුත් යක්ෂයාගේ මායම්වලින් සහ බලාත්කාරකම්වලිනුත් ඔබගේ උදහසිනුත් සදාකාල අච්චුවෙනුත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

හිතේ සියලු අන්ධකමෙනුත් උඩඟුකම්නුත් නිෂ්ඵල අහංකාරයෙන් සහ වංචාකමෙනුත් ඊර්ෂ්‍යාවෙනුත් වෛරයෙනුත් කුඩුකේඩුකම්නුත් සියලුම සෙන්හනැතිකම්නුත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

වේශ්‍යාකම්නුත් මරණීයවූ අනික් සියලු පාපවලිනුත් ලෝකයෙන්ද මාංසයෙන්ද යක්ෂයාගෙන්ද පැමිණෙන සියලු මායම්වලිනුත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

හෙනවලිනුත් කුනාටුවෙනුත් උවදුරෙනුත් වසං
ගතායෙනුත් සාගතයෙනුත් යුද්ධයෙනුත් මිනීමැරී
මෙනුත් හදිස්සි මරණයෙනුත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

සියලු රාජ අපක්ෂාවාදීකම්නුත් ආණ්ඩුවට විරුද්ධව
රහස් මන්ත්‍රණයෙනුත් කැරලිගැසීමෙනුත් සියලු
මිථ්‍යා ගුරුකම්වලිනුත් ආගම වරදවාගැන්මෙනුත්
ආනම් භේදයෙනුත් සිත් මුරණ්ඩුකම්නුත් ඔබගේ
වචනයට හා ආඥාවට නින්දාකිරීමෙනුත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

ඔබගේ ශුද්ධවූ ශරීරගතවීමේ මවිතයත් ඔබගේ
පිරිසිදුවූ ඉපදීම හා චර්මඡේදනයත් ඔබගේ බව්තිස්
මය හා උපවාසයත් පරීක්ෂාවීමත් නිසා

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

ඔබගේ දුක් වේදනා සහ ලේ වැනි දාඩියත්
ඔබගේ කුරුසිය සහ වධවිඳීමත් ඔබගේ අනාගීවූ
මරණය සහ වැලලීමත් ඔබගේ තේජවන්තවූ
නැවත නැගිටීම සහ ස්වර්ගයට නැගීමත්
ශුද්ධාත්මයානන්ගේ ඊමත් නිසා

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

අපේ සියලු විපත්ති කාලයෙත් අපේ සියලු
සම්පත්ති කාලයෙත් මරණාසන්නයෙත් විනිශ්චය
දවසෙත්

යහපත්වූ ස්වාමිනි අප ගලවාගත මැනව.

ස්වාමිවූ දෙවියන්වහන්ස පව්කාරවූ අපි අපේ
වචන අසනමෙන් ඔබට යාච්ඤාවෙමුව. තවද ඔබ
ගේ පිරිසිදුවූ සර්වසාධාරණ සභාව හරිමාර්ගයේ
පිහිටුවා ආණ්ඩුකරවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුව මැනව.

ඔබගේ මෙහෙකරුවූ අපේ ඉතා කරුණාවන්ත
ආණ්ඩුකාර වික්ටෝරියානම් මහේසිකාව ධර්මිෂ්ඨ
කමෙනුත් පිරිසිදු හැසිරීමෙනුත් ඔබගේ සැබෑවූ
ඇදහීමේ ස්ථිරකොට ආරක්ෂාකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.



ඔබ කෙරෙහි ශ්‍රද්ධාවටත් ඔබට භයවීමට හා
ප්‍රේමවීමටත් උන්වහන්සේගේ හිත නමන පිණි
සද නිතර ඔබ විශ්වාකරමින් ඔබගේ ගෞරවයත්
මහිමතාවයත් සෑමදම සොයන්ට උන්වහන්සේට
පුළුවන්කර වදාරණ පිණිසද

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුව මැනව.

උන්වහන්සේගේ සියලු සතුරන්ගෙන් ජයගෙ
ණදෙමින් උන්වහන්සේ රක්ෂාකොට ආවරණය
කර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

අල්බර්ත් ඇඩ්වර්ඩ් නම් වේල්ස්හි කුමාරයානන්ද
වේල්ස්හි කුමාරිකාවින්ද ඇතුළුව මුලු රාජවංශයට
ආශිර්වාදකොට ආරක්ෂාකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

සියලු බිස්කොප්වරුද ප්‍රෙස්බිතර්වරුද දීයා
කොන්වරුද ඔබගේ වචනය සැබෑ ලෙස දැන
ගැණීමෙන් හා තේරුම් ගැණීමෙන් එලියකරණු
ලබන පිණිසත් ඔවුන්ගේ දේසනාකිරීමෙන් හා
හැසිරීමෙන් ඒ වචනය යුතුලෙස දන්වමින් ප්‍රකාශ
කරන්ට පුළුවන්කර වදාරණ පිණිසත්

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීස්වරුන්ද සියලු නිලමක්
කාරයින්ද හකාහියෙනුත් ප්‍රඥාවෙනුත් තේරුම්නැ
ණීමෙනුත් සරසා වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

විනිශ්චයකාරයින්ට ආශිර්වාදකොට ආරක්ෂාකර
මින් ධර්මිෂ්ඨකමින් විනිශ්චයකරන්ටත් සැබෑව
රක්ෂාකරන්ටත් ඔවුන්ට පිහිටවී වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

ඔබගේ සියලු සේනාවට ආශිර්වාදකොට ඔවුන්
ආරක්ෂාකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

සියලු ජාති මනුෂ්‍යයින්ට ඒකඟවීමත් සමාදානයත් එක්සිත්වීමත් දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

ඔබට සෙන්හවෙන්ටත් භයවෙන්ටත් ඔබගේ ආඥාවලට ඒකඟලෙස හැසිරෙන්ටත් කැමතිවූ සිත් අපට දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

ඔබගේ වචනය යටහත් සිතෙන් අසන්ටත් පිරිසිදු සෙන්හයෙන් පිළිගන්ටත් ආත්මික ඵල ධරන්ටත් ඔබගේ සියලු සේනාවට කරුණාව බොහෝසෙයින් දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

මුළාභාවයටත් වඤ්චාවටත් පැමිනි සියල්ලන් සත්‍යවූ මාර්ගයේ පිහිටුවා වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුව මැනව.

කෙලින් සිටිනාවුන් සවිකරන්ටද, දුර්වල සිත් ඇත්තාවුන් සනසා පිහිටවෙන්ටද, වැටෙන්නාවුන් නැගුටුවන්ටද, අනතිමේ සාතන් අපේ පාදවල් යට මැඩපවත්වන්ටද, කරුණාකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

උපද්‍රවේද හිගකමේද දුක්පීඩාවලද සිටිනා සියල්ලන්ට මිදීමත් උපකාරයත් සැනසීමත් දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

ගොඩින්හෝ වතුරෙන්හෝ ගමන් යන සියල්ලන්ද වැදීමට සම්ප්‍රාප්තවූ සියලු ස්ත්‍රීන්ද සියලු රෝගාතුරයින් හා ළදරුවන්ද රක්ෂාකොට සියලු සිරකාරයින්ටත් වහල්වූවන්ටත් ඔබගේ අනුකම්පාව පෙන්වා වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

පියා නැති දරුවන්ද වැන්දඹු ස්ත්‍රීන්ද සියලු අසරණයන්ද පීඩිතයන්ද රක්ෂාකොට ආවරණයකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.



සියලු මනුෂ්‍යයන්ට කරුණාකර වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

අපේ සතුරන්ටත් කේලාම් කියන්නන්ටත් අපට පීඩා කරන්නන්ටත් කමාවෙමින් ඔවුන්ගේ සිත් හරවා වදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

සැහෙන කාලයේ අපේ ප්‍රයෝජනය පිණිස පොළවේ භවභෝග රක්ෂාකොට අපට දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

සැබෑවූ පසුතැවිලිවීම දී අපේ සියලු පාපවලටත් ප්‍රමාදවලටත් අඥානකම්වලටත් කමාවී ඔබගේ ශුද්ධවූ වචනය ලෙස අපේ කල්ක්‍රියාව හරිගස්සාගැණීමට ඔබගේ ශුද්ධාත්මයානන්ගේ පිහිට දෙවාවදාරණ පිණිස

යහපත්වූ ස්වාමිනි අපේ වචන ඇසුවමැනව.

දේව පුත්‍රයානනි අපේ වචන ඇසුවමැනව.

දේව පුත්‍රයානනි අපේ වචන ඇසුවමැනව.

ලෝකයාගේ පව් දුරුකරණ දෙවියන්වහන්සේගේ බැටළු පැටවානෙනි

ඔබගේ සමාදානය අපට දුනමැනව.

ලෝකයාගේ පව් දුරුකරණ දෙවියන්වහන්සේගේ බැටළු පැටවානෙනි

අපට කරුණාකළ මැනව.

ක්‍රිස්තුස්වහන්ස අපේ වචන ඇසුවමැනව.

ක්‍රිස්තුස්වහන්ස අපේ වචන ඇසුවමැනව.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

ක්‍රිස්තුස්වහන්ස අපට කරුණාකළ මැනව.

ක්‍රිස්තුස්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

එවිට දේවගැතියා සහ සමූදුවත් ස්වාමින්වහන්සේගේ යාච්ඤාව කියත්වා.

ස්වර්ගයේ සිටින අපේ පියාණෙනි—ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා—ඔබගේ රාජ්‍යය ඒවා—ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණු ලැබේවා—අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව—අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ—අපේ වැරදිවලටත් කමාවුව මැනව—අප පරීක්ෂාවීමට නොපමුනුවා—නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

දේ. ස්වාමින්වහන්ස අපේ පාපවල්වල ප්‍රකාර අපට නොකළ මැනව.

උ. අපේ අධර්මිෂ්ඨකම් ලෙස අපට විපාක නුදුන මැනව.

අපි යාච්ඤාවෙමු.

තැළුන සිත් ඇත්තවුන්ගේ සුසුම්ලෑමවත් ශෝක ඇත්තවුන්ගේ ආශාවවත් සැහැල්ලුකොට නොසිතන්නාවූ කරුණාවන්ත පියවූ දෙවියන්වහන්ස, කොයිවිටක නුමුත් අපට පීඩා සහ විපත්ති පැමිනුනාම, අපි ඔබ ඉදිරියේ කරණ යාච්ඤාවලට කරුණාවෙන් උදව්වුව මැනව. යක්ෂයාගේවත් මනුෂ්‍යයන්ගේවත් මායාවෙන් සහ වංචාවෙන් අපට වෙන්නාවූ උපද්‍රවයන් ඔබගේ යහපත්වූ දේව ආරක්ෂාවෙන් විසිරගොස් හිස්වෙන පිණිසද, ඔබගේ දාසවූ අපි කිසි පීඩාවකින් වෙහෙස නොවී ඔබගේ ශුද්ධවූ සභාවේ නිතර ඔබට ස්තුතිකරණ පිණිසද, අපේ ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ වචන කරුණාවෙන් ඇසුව මැනව.

ස්වාමින්වහන්ස නැගිට අපට පිහිටවී ඔබගේ නාමය උදෙසා අප ගලවාගත මැනව.

දෙවියන්වහන්ස, අපේ පියමුතුන්ගේ දවස්වල දීත් ඔවුන්ට පළමු කාලවලදීත් ඔබ කළාවූ ශ්‍රේෂ්ඨ ක්‍රියාවල් ඔවුන්ගෙන් ප්‍රසිද්ධව අපි ඇසීමුව.



ස්වාමිනි නැගිට අපට පිහිටවී ඔබගේ ගෞරවය උදෙසා අප ගැලෙව්ව මැනව.

පියාතන්ටත් පුත්‍රයාතන්ටත් ශුද්ධාත්මයාතන්ටත් ප්‍රශංසාවේවා.

උ. පටන්ගැන්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

ක්‍රිස්තුස්වහන්ස අපේ හතුරන්ගෙන් අප ආරක්ෂාකළ මැනව.

අපේ හිංසාවල් කරුණාවෙන් බැලුව මැනව.

අපේ හිත්වල තිබෙන දුක් අනුකම්පාවෙන් බැලුවමැනව.

ඔබගේ සේනාවගේ පාපවල් කරුණාවෙන් කමාකළ මැනව.

කරුණා ඇතුව උපකාරයෙන් අපේ යාච්ඤාවල් ඇසුව මැනව.

දාවිත්ගේ පුත්‍රයාතනි අපට කරුණාකළ මැනව.

ක්‍රිස්තුස්වහන්ස දැන් සහ මතු සදාකාලයටම අපේ වචන කරුණාවෙන් ඇසුවමැනව.

ක්‍රිස්තුස්වහන්ස කරුණාවෙන් අපේ වචන ඇසුව මැනව.

ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්ස කරුණාවෙන් අපේ වචන ඇසුවමැනව.

ස්වාමින්වහන්ස අපි ඔබ විශ්වාසකරණ බැවින් ඔබගේ කරුණාව අපට දක්වුවමැනව.

අපි යාච්ඤාවෙමු.

පියාණෙනි අපේ දුර්වලකම් කරුණාවෙන් බලා, අප විසින් විඳින්ට ඉතාම යුතුවූ සියලු හිංසාවල් ඔබගේ නාමයේ ගෞරවය උදෙසා අපෙන් දුරුකළ මැනව. තවද අපේ සියලු විපත්තිවලදී අපේ මුලු විශ්වාසයත් ඇදහීමත් ඔබගේ කරුණාව පිට තබා, ඔබට ගෞරවයත් තේජසත් පැමිනෙන පිණිස ශුද්ධකමින්ද පිරිසිදු හැසිරීමෙන්ද ඔබට නිතර සේවය කරන්ට අපට පුළුවන්කරණ හැටි

යට, අපේ එකම මැදහත්කාර ආධාරකාර ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යටහත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

ශුද්ධ ක්‍රිසොස්තොම්ගේ යාච්ඤාවක්ය.

සියලු බල ඇත්තාවූ දෙවියන්වහන්ස, දැන් අපි සියල්ලෝම එක්සිත්ව ඔබට අපේ සාමාන්‍යවූ යාච්ඤාවල් පවත්වන පිණිස ඔබ අපට කරුණාකළාය. ඔබගේ නාමයෙන් දෙන්නෙක්වත් තුන්දෙනෙක්වත් එක්වූකල ඔවුන්ගේ යාච්ඤාවල් සම්පූර්ණකරණලෙස ඔබ පොරොන්දුවූනාය. එබැවින් ස්වාමිනි ඔබගේ දැසවූ අපේ ප්‍රාර්ථනාවලුත් යාච්ඤාවලුත් අපේ ප්‍රයෝජනයට නිසි හැටියට සම්පූර්ණකරමින් මෙලොවදී ඔබගේ සත්‍යකම දැනගැණිමත් පරලොවදී සදාකාල ජීවනයත් අපට දුනමැනව. ආමෙන්.

2 කොරින්ති xiii.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවත්, දෙවියන්වහන්සේගේ ආදරයත්, ශුද්ධාත්මයානන්වහන්සේගේ සමගිකමත්, සදාකාලේටම අප සියල්ලන් සමග වේවා. ආමෙන්.

ලිතනිය මෙහි තීන්දුය.

ලිතනියේ සහ උදේ සවස යාච්ඤාවීමේ ක්‍රමයේ අන්තිම යාච්ඤා දෙක කියන්ට පළමුවෙන් ඒ ඒ ප්‍රස්තාවලදී පවත්වන්ටයුතු යාච්ඤාවල් සහ ස්තුතිකිරීමවල්ය.

## යාච්ඤාවල්ය.

වර්ෂාව ඉල්ලන යාච්ඤාවය.

දෙවියන්වහන්ස, තමන්වහන්සේගේ රාජ්‍යයත් එහි ධර්මිෂ්ඨකමත් සොයන සියල්ලන්ට ඔවුන්ගේ ජීවිත රක්ෂාවට යුතු සියලු දේ ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා දෙවන ලෙස පොරොන්දුවූනාවූ ස්වර්ගීය පියානන්වහන්ස, අපේ සැනසීම



පිණිසත් ඔබගේ ගෞරවය පිණිසත් භවභෝග අපට ලැබෙන හැටියට මේ ඍතුවේදී අපට ඕනෑව තිබෙන සෑහෙන පමණ වැහි වර්ෂාව අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට එව්ව මැනව. ආමෙන්.

වර්ෂාව පෑවීම පිණිස යාච්ඤාවය.

මනුෂ්‍යයන්ගේ පව් උදෙසා අටදෙනෙක් ඇර මුලු ලෝකයා වරක් වතුර ගැල්මෙන් විනාශකොට මතු කොයි කලකවත් ඒ ප්‍රකාර ලෝකයා විනාශ නොකරණ ලෙස තමන්ගේ මහත් කරුණාවෙන් පොරොන්දුවූනාවූ සියලු බලඇති දෙවි ස්වාමිනි, අපේ නපුරුකම් නිසා වර්ෂාවෙන් සහ වතුරෙන් අපට අච්චු ලැබෙන්ට ඉතාම සෑහෙන නුමුත්, අපේ සැබෑලෙස පසුතැවිලිවීමෙහිදී භවභෝග ලැබීමට සෑහෙන කාලය අපට දෙනහැටියටත්, ඔබගේ මේ අච්චුවෙන් අපේ හැසිරීම හරිගස්සාගෙණ ඔබගේ කරුණාව උදෙසා ඔබට ස්තුති ගෞරව කරන්ට අපට ඉගෙණගන්ට පුළුවන්කරණ හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුන්වහන්සේ නිසා යටත්භාවයෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

දුර්භික්ෂවූ සාගතවූ කාලයේ කියන යාච්ඤාවය.

දෙවියන්වහන්ස, තමන්වහන්සේගේ දයාවෙන් වැසි වස්වා භවභෝග දී සිව්පාවුන් වැඩිකොට මනුෂ්‍යයන් බෝකරවන්නාවූ ස්වර්ගීය පියානන්වහන්ස, ඔබගේ සේනාවවූ අපේ විපත්ති බලන හැටියටත්, අපේ අයුතුකම් නිසා අපි දැන් නිසිලෙස විඳින්නාවූ හිගකම් සහ සාගතයේ දුක් නැතිකොට, ඔබගේ යහපත්කමෙන් භවභෝග ඇති කාලේ සමෘද්ධවූ සැපත කරුණාවෙන් පමුනුවන හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තිබෙන ස්නේහය නිසා ඉල්ලාසිටිමුව. උන්වහන්සේට හා ඔබවහන්සේටද ශුද්ධාත්මයානන්වහන්සේටද දැන් සහ මතු සදාකාලේටම සියලුම ගෞරවයත් තේජසත් වේවා. ආමෙන්.

නොහොත් මේක.

එලිෂානම් ප්‍රොපේතයාගේ කාලයේ සමාරියේ හටගත් භිගකම සහ සාගතය නැතිකොට භව භෝග ඇතිකාලේ සමෘධවූ සැපත හදිස්සියෙන් පැමිනෙව්වාවූ කාරුණාවන්ත පියවූ දෙවියන්වහන්ස අපේ පව් නිසා එබඳු විපත්තියකින් දැන් අච්වූ විදින්නාවූ අපටද මෙකලට සුදුසුවූ අස්වැසිල්ලක් එලෙසම දුනමැනව. ඔබගේ සවර්ගීයවූ ආශිර්වාදයෙන් පොළවේ භවභෝග වැඩිකොට, අපට ලැබෙන ඒ සම්පත් ඔබගේ ගෞරවයටද දිලිඳුන්ට පිහිටවීමටද අපේ සැනසීමටද පාවිච්චිකරණ පිණිස, අපේ සවාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පිහිටවූව මැනව. ආමෙන්.

යුද්ධ කෝලාහල කාලයේ කියන යාච්ඤාවය.

සියලු රජුන්ට රජවූ, සියලු දේවල ආඥාකාරවූ, කිසි මැවිල්ලකට විරුද්ධව සිටින්ට නුපුළුවන් තරම් බල ඇත්තාවූ, පව්කාරයින්ට අච්චූකරන්ටත් සැබෑලෙස පසුතැවිලි වෙන්නාන්ට කාරුණාව පෙන්වන්ටත් යෝග්‍ය කෙනෙක්වූ, සියලු බලඇති දෙවියන්වහන්ස, අපි ඔබගේ ආරක්ෂාවෙන් සැරසී, සියලු උපද්‍රවලින් නිතරම ගැලවී, ජයගෙණදෙන එකම තැනැත්තාවන ඔබටම ගෞරවකරණ පිණිස අපේ හතුරන්ගේ අත්වලින් අප ගලවා, ඔවුන්ගේ අහඞ්කාරකම් මර්දනයකොට, ඔවුන්ගේ කුඩුකෝඩුකම් දුරුකොට, ඔවුන්ගේ උපායවල් වියවුල්කරණමෙන් ඔබගේ එකම පුත්‍රවූ අපේ සවාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් නිසා යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

වසංගතරෝග ඇති කාලයේ කියන යාච්ඤාවය.

වනාන්තරයේදී මෝසෙස්ට සහ ආරොන්ට නොහික්මී තමන්වහන්සේගේ සේනාව ගැසූ තද



කැරැල්ල නිසා තමන්ගේ උදහසින් වසංගතයක් ඔවුන් අතරට පැමිනෙව්වාවූ, දාවිත් රජුගේ කාලයේදී වසංගතයෙන් සැත්තෑ දහසක් විනාශකොට සෙස්සන් කාරුණාවෙන් ඉතුරුකළාවූ, සියලු බල ඇති දෙවියන්වහන්ස, මහත් කාලකණ්ණි පවුකාරවූ අපට දැන් අනුකම්පාකොට, ඒ කාලවලදී ඔබ පව් වසන පූජාවක් පිළිගෙණ රෝගාතුරකම් සහ මරණයෙන් පීඩිතවූ ඔවුන්ට අච්වූකිරීමෙන් වලකින්ට විනාශකරණ දූතයාට ආඥාකළාවාගේම, අපට පැමිනි තිබෙන මේ දුඃඛිත වසංගතරෝගය අපේ සවාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපෙන් දුරුකළ මැනව. ආමෙන්.

¶ ශුද්ධවූ තනතුරුවලට පත්වෙන්ට සිටින්නවුන් උදෙසා ඈම්බර් සතිවලදී දවස්පතා කියන්ට සුදුසු යාච්ඤාවය.

සියලු බල ඇති දෙවියන්වහන්ස, තමන්වහන්සේගේ ප්‍රේම පුත්‍රයාගේ අනර්ඝවූ ලේ නැමති මිලයෙන් සර්වසාධාරණ සභාවක් තමන්ට ගත්තාවූ අපේ සවර්ගීය පියානන්වහන්ස, මේ ප්‍රසතාවේ එම සභාව කාරුණාවෙන් බලා, ඔබගේ දාසවූ බිෂොප්වරුන් සහ ඔබගේ රැලේ එඬේරුන් විසින්, ඔබගේ සභාවේ ශුද්ධවූ සේවයකිරීමට ඔබිත මනුෂ්‍යයන් අගති නැතුව ප්‍රඥාවන්තකමින් තෝරා ගන්නවා මිස කිසි කෙනෙක් පිට නොවිමසා අත් නොතබන පිණිස ඔවුන්ගේ සිත් නමා ඔවුන්ට හරි මාර්ගය පෙන්නුව මැනව. තවද යම් ශුද්ධවූ තනතුරකට පත්කරන්ට යෙදෙන්නාවූ අයවල් තමුන්ගේ හැසිරීමෙන් හා ඉගැන්වීමෙන් ඔබගේ ගෞරවය ප්‍රකාශකරණ පිණිසද, සියලු මනුෂ්‍යයන්ගේ ගැලවීම දියුණුකරණ පිණිසද, ඔබගේ කාරුණාව හා සවර්ගීයවූ ආශිර්වාදය ඔවුන්ට දෙන හැටියට, අපේ සවාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

නොහොත් මේක.

සියලු යහපත් දීමනා දෙන්නාවූ, තමන්ගේ දේව ආරක්ෂාවෙන් තමන්ගේ සභාවේ නොයෙක් තානතුරු පිහිටෙව්වාවූ, සියලු බලඇති දෙවියන්වහන්ස, එම සභාවේ යම් තානතුරකටවත් සේවයකටවත් කැඳවාගන්ට යෙදෙන්නාවූ සියල්ලන්ට ඔබගේ කරුණාව දුන මැනව. තවද ඔබගේ මහත්වූ නාමයේ ගෞරවයද ඔබගේ ශුද්ධවූ සභාවේ ප්‍රයෝජනයද උදෙසා, ඔබ ඉදිරියේ විශ්වාසව සේවය කරන්ට පුළුවන්වෙන පිණිස ඔබගේ සත්‍යවූ ගුරුකම්වලින් ඔවුන් පූර්ණකොට, නිදෝස්ව හැසිරෙන්ට ඔවුන්ට සලස්වන මෙන්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි යටහත්භාවයෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ ඉහත යාච්ඤාවලින් කොයි එකක් නුමුත් කියෙව්වාට පසු කියන්ට ඕනු යාච්ඤාවය.

කාරුණකාරණ ක්ෂමාවෙන ස්වභා ගුණයක් නිතර දරන්නාවූ දෙවියන්වහන්ස, අපේ යටහත් ඉල්ලීම් පිළිගත මැනව. අපේ පාප බන්ධනවලින් අපි බැඳී වෙළී සිටින නුමුත් ඔබගේ මහත් අනුකම්පාවෙන් අපේ මැදහත්කාරද ආධාරකාරදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෞරවය පිණිස අප මිදුව මැනව. ආමෙන්.

¶ උතුමානන්වහන්සේ සහ මන්ත්‍රණ සභාවල් ගැන යාච්ඤාවය.

ඉතා කාරුණාවන්තවූ දෙවියන්වහන්ස, බ්‍රිතානියේ ආණ්ඩුවට යටහත් සියලු රාජ්‍යවල් ගැනද, ප්‍රධානකොට අපේ ඉතා භක්තිවන්තවූ දයාවන්තවූ මහේසිකාව යටතේ රැස්වෙන මහා මන්ත්‍රණ සභාව ගැනද, මේ ලංකාද්වීපය ගැනද, මෙහි ආණ්ඩුකාරයත් උතුම් නාඩුසභාවත් මන්ත්‍රණ සභාවත් සියලුම නිලමක්කාරයින්නුත් ගැනද, අපි ඔබට යටහත්භාවයෙන් යාච්ඤාවෙමුව. ඔවුන් විසින්



කරණ සියලුම නියෝගවලදී ඔබගේ ගෞරවයත්, ඔබගේ සභාවේ යහපතත්, අපේ ප්‍රධාන ආණ්ඩුකාර මහේසිකාවගේ සහ උන්වහන්සේගේ සියලු යටත්වාසින්ගේ ආරක්ෂාවත් නම්බුවත් ශුභසිද්ධිමත් වර්ධනවෙන හැටියටද, අප අතරේ සියලු පරම්පරවල් දක්වා සමාදානය සහ සැපතත් සත්‍යකම සහ ධර්මිෂ්ඨකමත් ඇදහිල්ල සහ භක්තියත් පිහිටන හැටියටද, සියලු දේම යුතුවූ ස්ථිරවූ අඩිතාලමක් පිට නිසි පිළිවෙළට තබන්ට ඔවුන්ගේ උත්සාහයෙන් පුළුවන්වෙන පිණිස, ඔවුන්ට හරි මාර්ගය පෙන්නා ඔවුන්ගේ ඒ නියෝගවල් සඵලකළ මැනව. තවද ඔවුන්ටත් අපටත් ඔබගේ මුළු සභාවටත් ඕනෑකරණ මේ දේවල් සහ අනිකුත් සියලුම දේත්, අපේ ඉතා ප්‍රශංසනීය ගැලවුම්කාර ස්වාමිද මැදහත්කාරදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා ලැබෙනමෙන් යටත්භාවයෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ සියලුප්‍රකාර මනුෂ්‍යයින් ගැන ඕනුවූ යාච්ඤාවය. ලිතනිය කියවන්ට නියම නැති ප්‍රස්තාවලදී මේ යාච්ඤාව කියයුතුය.

සියලු මනුෂ්‍යවර්ගයා මවා ආරක්ෂාකරන්නාවූ දෙවියන්වහන්ස, ඔබගේ නියෝගවල් සියලු වර්ගවල සියලුප්‍රකාර මනුෂ්‍යයින්ටත්, ඔබගේ සැපදායක ගැලවීම සියලු ජාති මනුෂ්‍යයින්ටත්, කාරුණාවෙන් දන්වන ලෙස අපි ඔවුන් ගැන ඔබට යටහත්භාවයෙන් යාච්ඤාවෙමුව. ප්‍රධානකොට ඔබගේ සර්වසාධාරණ සභාවේ අභිවෘද්ධිය සඳහා අපි යාච්ඤාවෙමුව. තමුන් ක්‍රිස්තියානිකාරයෝයයි කියන්නාවූ සියල්ලෝම සැබෑවූ මාර්ගයට පමුනුවනුලැබ ඒකඟසිතිනුත් සමාදන බැම්මෙනුත් ධර්මිෂ්ඨ හැසිරීමෙනුත් ඇදහිල්ල වැලඳගන්නා පිණිස, ඔබගේ යහපත් ආත්මයානන් විසින් මාර්ගය පෙන්නා ඒසභාව ආණ්ඩුකළ මැනව. තවද සිතින්වත් ශරීරයෙන්වත් වස්තුවෙන්වත් දුක්වේදනාවට පැමිනි සියල්ලන්

[* ප්‍රධානකොට අපේ යාච්ඤා ඉල්ලා සිටින්නාන්] ඔබගේ පියගතිවූ සෙන්හයට අපි භාර දෙමුව. ඔවුන්ගේ ඒ ඒ ඕනෑකම්වලදී ඔවුන්ට පිහිටාධාර වෙමින් ඔවුන් සනසා, දුක්විඳිමෙහි ඉවසීමද සියලු පීඩාවලින් යහපත් මිදීමද ඔවුන්ට දුනමැනව. මෙකී ආශිර්වාදවල් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඉල්ලාසිටිමුව. ආමෙන්.

# සතුතිකිරීම්ය.

¶ සාමාන්‍ය සතුතිකිරීමය.

සියලු බලඇති දෙවියන්වහන්ස, සියලු කරුණාවෙහි පියානන්වහන්ස, අපට හා සියලු මනුෂ්‍යයින්ට [† ප්‍රධානකොට ඔබගෙන් අලුත ලැබුනු කරුණාවල් ගැණ ඔබට සතුති ප්‍රශංසාකරන්ට කැමතිව සිටින්නන්ට] ඔබගෙන් ලැබුනු සියලු යහපත ගැනත්, ප්‍රේමවූ දයාවන්තකම ගැණත්, ඔබගේ නොවටිනා දාසයෝ වන අපි අපේ හිත්වලින් ඉතා යටත්භාවයෙන් ඔබට සතුතිකරමුව. ඔබවහන්සේ විසින් අප මැව්නිසත්, ආරක්ෂාකළනිසත්, මේ ජීවිතයට නිසි සියලු ආශිර්වාද දුන්නිසත් ඔබට සතුතිකරමුව. ප්‍රධානකොට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා ලෝකයා ගලවාගන්නා පිණිස ඔබගේ අනර්ඝවූ ප්‍රේමය පැවැත්තූ නිසත්, කරුණාව ලබන මාර්ගවල් සහ තේජසට පැමිනීමේ ප්‍රාර්ථනාව දුන් නිසත් අපි ඔබට සතුතිකරමුව. අපේ ජීවිතය මුලුල්ලේම ඔබගේ මෙහෙයට අපි භාරවී

* යමෙකු විසින් සෙනගගේ යාච්ඤා ඉල්ලාසිටින විට මේක කියයුතුය.

† යාච්ඤාකරවාගත් යමෙක් සතුතිදීමට කැමති විට මේක කියයුතුය.



සිට, පිරිසිදුකමින්ද ධර්මිෂ්ඨකමින්ද ඔබ ඉදිරියේ හැසිර, අපේ හිත්වලින් අවධානව ඔබට සතුතිකරණ පිණිසත්, අපේ මුඛවලින් පමණක් නොව අපේ කල්කිරීමෙන් ඔබගේ කීර්තිය ප්‍රකාශකරණ පිණිසත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගේ සියලු කරුණාවල් හරියාකාර අපට අගවා දෙනමෙන් යාච්ඤාවෙමුව. ඔබ හා ශුද්ධාත්මයානන් ඇතුළුව උන්වහන්සේට සියලු ගෞරවයත් තේජසත් සදාකාලේටම වේවා. ආමෙන්.

වර්ෂාව ලැබුනාට සතුතිකිරීමය.

අපේ ස්වර්ගීය පියානනි, මනුෂ්‍යයින්ගේ ප්‍රයෝජනයට පොළවේ භෝග අටගන්නා පිණිස තමන්ගේ කරුණාවන්ත නියෝගයෙන් පෙර වැසි හා පසු වැසි වස්වන්නාවූ දෙවියන්වහන්ස, ඔබගේ නොවටිනා දාසයෝවන අපේ මහත්වූ සැනසීම උදෙසාත්, ඔබගේ පිරිසිදු නාමයේ ගෞරවය උදෙසාත්, ඔබට හිමිවූ භූමිය වියලී අපි මහත්වූ භයට පත්ව සිටිකල ඒක සශ්‍රීක කරණ පිණිස ප්‍රියවූ වර්ෂාවක් ඔබ විසින් වැස්සෙව්හෙයින් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ ඇත්තාවූ ඔබගේ කරුණාවල් ගැණ අපි ඔබට යටහත්භාවයෙන් සතුතිකරමුව. ආමෙන්.

වර්ෂාව පෑව්වාට සතුතිකිරීමය.

බොහෝ වර්ෂාව හා වතුර එවා නොබෝද අපට යුතුලෙස පීඩාකොට අප යටත්කළාවූ ස්වාමිවූ දෙවියන්වහන්ස, දැනට මේ යෝග්‍යවූ හොඳ කාලය පමුනුවමින් ඔබගේ කරුණාවෙන් පිහිටවී අපේ හිත් සැනසූවාය. එබැවින් ඔබගෙන් ලැබුනු මේ පිහිට උදෙසා ඔබගේ ශුද්ධවූ නාමයට සතුති ගෞරව පවත්වමුව. තවද අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මේ ඔබගේ මහත් දයාවන්තකම පරම්පරාවෙන් පරම්පරාවට නිතර ප්‍රකාශකරමුව. ආමෙන්.

සුභික්ෂය ලැබුනාට සතුතිකිරීමය,

තමන්ගේ දයානුකම්පාවෙන් තමන්ගේ සභාව විසින් කරණ භක්තිවන්ත යාච්ඤාවල් අසා, අපේ දුර්භික්ෂය සුභික්ෂයටත් ආහාරයෙහි හීනකම සමෘඩයටත් පැමිණෙව්වාවූ ඉතා කරුණාවන්තවූ පියාණනි, මේ ඔබගෙන් ලැබුනාවූ ඒ ප්‍රධානවූ ආශීර්වාදය ගැන අපි ඔබට යටහත්භාවයෙන් සතුතිකරමුව. තවද ඔබගේ ගෞරවය සහ අපේ සැනසීමට අපේ ගම්බිම් සාරවත්ව ඵලදෙන පිණිස ඔබගේ මහත්වූ දයාවන්තකම අප කෙරෙහි පවත්වන ලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉල්ලමුව. ආමෙන්.

සමාදානය සහ අපේ සතුරන්ගෙන් ගැලවීම ලැබුනාට සතුතිකිරීමය,

තමන්ගේ දූසයෝවන අපට අපේ සතුරන්ගෙන් ජය ලැබීමට බලකොටුවක් සහ රක්ෂාස්ථානයක්වූ සියලු බලඇති දෙවියන්වහන්ස, අප වටකරින් අපට අනතුරු වශයෙන් පැමිණෙන්ට තිබුනාවූ මහත් උපද්‍රවලින් ඔබ අප ගලවාගත් නිසා අපි ඔබට සතුත් ප්‍රශංසා පවත්වමුව. ඒ උපද්‍රවලට අපි අසු වෙන්ට නොයෙදුනේ ඔබගේ යහපත්කමෙන් බව අපි ඒත්තුගණිමුව. ඔබ අපේ ගැලවුම්කාරයා සහ බලවන්තවූ ආරක්ෂාකාරයා බව සියලු ලෝවැසියෝ දැනගන්නා පිණිස එබඳු ඔබගේ කරුණාවල් අප කෙරෙහි පවත්වන හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි යාච්ඤාවෙමුව. ආමෙන්.

සියරටට සමගිකම ලැබුනාට සතුතිකිරීමය.

ගෙයක වැසියන් එකඟබවට පමුනුවන්නාවූ, අතිකාරු මුරන්ඩුවන්ගේ කෝලාහල නවත්වන්නාවූ, අපේ ස්වර්ගීය පියවූ සදාකාල දෙවියනි, අප අතරේ නොබෝද පැමුනුන කැරලි කෝලාහලවල් ඔබ සංසිඳුවන්ට යෙදුනහෙයින් අපි ඔබගේ ශුද්ධවූ නාමයට සතුතිකරමුව. මින්මතු ඔබගේ ශුද්ධවූ ආඥාවල කීකරු ලෙස හැසිර සියලු භක්තියෙනුත් ශුද්ධකමෙනුත් නිශ්චලව සමාදානව කල්යවමින් අපට ඔබගෙන් ලැබුනාවූ කරුණාවල් උදෙසා අපේ සතුති ප්‍රශංසා නැමති යාගය අපි ඔබට නිතර පූජාකරණ පිණිස අප සියල්ලන්ට පිහිටවෙන හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉතා යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.



¶ වසංගතයෙන් නොහොත් වෙන සාමාන්‍ය රෝගයකින් ගැලවුනාට සතුතිකිරීමය.

නොබෝද ඔබ විසින් පැමිණෙව් බරපතල භයානකවූ අව්වුවෙන් අපේ පව් උදෙසා අප තුවාල කොට අපේ වරදවල් උදෙසා අප විනාශකළාවූ, අව්වු විඳින අතරේදී කරුණාව සිහිකරමින් අපේ ප්‍රාණ මරණ මුඛයෙන් ගලවාගත්තාවූ, දෙවිස්වාමිනි, අපි ඔබගේ සභාවේ ඔබගේ කරුණාවල් ගැන නිතර සතුතිකරමින්ද වර්ණනාකරමින්ද ඔබට ජීවමානවූ පූජාවක් වෙන පිණිස ඔබ ගලවාගත් අපේ ශරීර ප්‍රාණ ඔබගේ පියගතිවූ සෙන්හයට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා භාරදෙමුව. ආමෙන්.

නොහොත් මේක.

ඉතා කරුණාවන්තවූ පියාණෙනි, 'අපේ නොයෙක් ආකාර වරදවල් සහ සිත් තදකම් නිසා ඔබගේ නීතියේ නියමකර තිබෙන සියලු අව්වු අපට පැමිණෙන්ටම නිසි බව ඔබ ඉදිරියේ යටත්භාවයෙන් කියාදෙමුව. නුමුත් ඔබ අපේ දුර්වලකමත් බැගෑපත් යටහත්වීමත් බලා, නොබෝද අපට මහත් පීඩා ලැබුන වසංගත රෝගය නවතා, අපේ වාසස්ථානවලට ප්‍රීතියේ සහ සනීපයේ ශබ්දය ඔබගේ මහත්වූ දයාබරකමින් දෙවනු පමුනුවන්ට

කාරුණ්‍යකළහෙයින්, අපට ලැබුන ඔබගේ ආරක්ෂාව සහ ගැලවීම නිසා ඔබගේ දිව්‍යවූ මහිමතාවයට ස්තුතිප්‍රශංසා නැමති පූජාවල් කරමින්, ඔබගේ තේජවන්තවූ නාමයට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ගෞරව වර්ණනා කරමුව. ආමෙන්.

---

අවුරුද්ද මුළුල්ලේ කියවීම පිණිස නියමවූ ලුහුඬු යාච්ඤා සහ යැවුම්පත්‍රද ශුභාරංචිද මේය.

¶ ඒ ඒ ඉරිදා දවස්වලදී, නොහොත් මෙහෙය පවත්වන්ට නියමවූ සවසක් පෙරටුවෙන් ඇත්තාවූ ශුද්ධ දවස්වලදී කියවන්ට නියමකර තිබෙන ලුහුඬු යාච්ඤාවල් ඊට ඉස්සරින්ද සවස යාච්ඤා පැවැත්වීමේදී කියන්ට නිසිබව දැනගතයුතුයි.

ක්‍රිස්තුස්වහන්සේගේ ලොවපහළවීමේ පළමුවෙනි ඉරිදා.

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප අතරේ ගැවසෙන පිණිස ඉතා යටත්භාවයෙන් පහළවූ මේ මරණීය ජීවිතයත් ඇති කාලයේ අන්ධකාරයේ ක්‍රියාවල් දුරුකරන්ටත්, ආලෝකයේ සන්නාහයෙන් සැරසෙන්ටත්, අපට පිහිටවුව මැනව. තවද ජීවත් වෙන්නන්හා මළවුන් විනිශ්චයකරණ පිණිස ස්වකීය තේජස් මහිමතාවයෙන් යුක්තව අන්තිම දවසේ උන්වහන්සේ නැවත එනකල අමරණීයවූ ජීවනයට අපි පැමිණෙන පිණිස, ඔබ හා ශුද්ධාත්මයානන් සමග දැන් සහ සදාකාලේටම ආණ්ඩුකරමින් සිටින්නාවූ උන්වහන්සේ නිසා අපට කාරුණ්‍යකළ මැනව. ආමෙන්.

¶ ක්‍රිස්තුස්වහන්සේගේ පහළවීමේ කාලයේදී කියන්ට නියමකළ අනිත් ලුහුඬු යාච්ඤාවල් සමග උන්වහන්සේගේ උත්පත්තියට ඉස්සර දා සවස වෙනතුරු මේ ලුහුඬු යාච්ඤාවත් සියලු දවස්වල කියන්ට යුතුය.

යැවුම්පත්‍රය. රෝම 13. 8—14.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 21. 1—13.



ක්‍රිස්තුස්වහන්සේගේ ලොවපහළවීමේ දෙවෙනි ඉරිදා ලුහුඬු යාච්ඤාවය.

අපේ ඉගෙණගැණීම පිණිස සියලුම ශුද්ධ ලියවිලි ලියෙව්වාවූ ප්‍රශංසනීය ස්වාමිනි, ඔබගේ ශුද්ධවූ වචනයෙන් අටගන්නා ඉවසීමෙන් හා සැනසිල්ලෙන් අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබ විසින් අපට දුන්නාවූ සදාකාල ජීවිතයට පැමිනීමේ ආශිර්වාදලත් ප්‍රාර්ථනාව වැලඳගෙණ නිතර සවියෙන් අල්ලා ගන්නා පිණිස, එම ශුද්ධ ලියවිලි අහන්ටත් කියවන්ටත් සිහියටගන්ටත් ඉගෙණගන්ටත් සිත්වල පත්තියම්කරගන්ටත් අපට පුළුවන් කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 15. 4—13.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 21. 25—33.

---

ක්‍රිස්තුස්වහන්සේගේ ලොව පහළවීමේ තුන්වෙනි ඉරිදා ලුහුඬු යාච්ඤාවය.

යේසුස් ක්‍රිස්තුස්වහන්ස, තමන්ගේ පළමුවෙනි ඊමේදී තමන්ගේ මාර්ගය පිළියෙලකරණ පිණිස ස්වකීය දූතයා තමන්ට පෙරටුව එව්වාවූ ස්වාමිනි, ලෝකයා විනිශ්චයකරණ පිණිස ඔබගේ දෙවනු ඊමේදී ඔබ ඉදිරයේ අපි පිළිගන්ට යුතුවූ සේනාවක් වෙන පිණිස ඔබගේ ධර්මය භාරවී සිටින ගබඩාකාරයන් සහ දේවගැතියන් විසින්ද, අකීකරුවන්ගේ හිත් ධර්මිෂ්ඨයන්ගේ නුවනට හරවා, එසේම ඔබගේ මාර්ග සාදා පිළියෙලකරන්ට පුළුවන් කරණමෙන්, පියානන් හා ශුද්ධාත්මයානන් සමග සදාකල් ආණ්ඩුකරමින්වසන්නාවූ ඔබගෙන් ඉල්ලා සිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 4. 1—5.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 11. 2—10.

---

ක්‍රිස්තුස්වහන්සේගේ ලොවපහළවීමේ හතරවෙනි ඉරිදා ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි අප ඉදිරියේ තබා තිබෙන මාර්ගයේ දිවීමෙන් අපේ පාපවලුත් දුෂ්ටකමුත් නිසා අපි

බොහෝකොට වලකින්නටත් හාවතින්නටත් යෙදෙ
නහෙයින්, ඔබගේ මහත්වූ පිහිටෙනුත් කරුණා
වෙනුත් අපි නොපමාව උපකාර සහ ගැලවීම ලබා
ගන්නා පිණිස, ඔබගේ බලය පතළකරමින් අප
වෙතට ඇවිත් මහත්වූ ආනුභාවෙන් අපට පිහිට
වෙන හැටියට, ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමි විසින්
කළ පව් ගෙවීමේ යාගය උදෙසා අපි යාච්ඤා වෙමුව.
ඔබ හා ශුද්ධාත්මයානන් ඇතුළුව උන්වහන්සේට
සදාකාලේටම තේජසත් ගෞරවයත් වේවා.
ආමෙන්.

යැවුම් පත්‍රය. පිලිප්පි 4. 4—7.

ශුභාරංචි ශුද්ධවූ යොහන් 1. 19—28.

---

අපගේ ස්වාමින්ගේ ජාත දිනය, නොහොත් ව්‍යවහාරලෙස
කියන ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්ති දවසය.

ලුහුඬු යාච්ඤාවය.

අපේ ස්වභාව ගන්නා පිණිසත්, මේ කාලයේ පිරි
සිදු කන්‍යාවකුගෙන් උපදින පිණිසත්, තමන්ගේ
ඒකජාත පුත්‍රයා අපට දුන්නාවූ සියලු බලඇති දෙවි
යන්වහන්ස, අපි නැවත ඉපද, ඇතිකරගැනීමෙන්
හා කරුණාවෙන් ඔබගේ දරුවෝව, ඔබගේ
ශුද්ධාත්මයෙන් දවස්පතා අලුත්කරන්ට යෙදෙන
ලෙස, ඔබ හා ශුද්ධාත්මයානන් සමග එකම දෙවි
යන්ව සදාකාලේටම ජීවත්ව ආණ්ඩුකරමින් සිටින්
නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා
යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. හෙබ්‍රෙව් 1. 1—12.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 1. 1—14.

---

ශුද්ධ ස්තෙපාන්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ සත්‍යකම ගැන සාක්ෂිදීම නිසා
මෙලොවදී අපි විඳින සියලු පීඩාවලදී, නිශ්චලව
ස්වර්ගය දෙස බලා, මතු ප්‍රකාශවෙන්නාවූ තේජස



ඇදහිල්ලෙන් දකින්ට අපට පුළුවන්කළ මැනව.
තවද අපේ එකම මැදහත්කාරයන් ආධාරකාර
යන්වූ ඔබ ගැන පීඩා විඳින සියල්ලන්ට උපකාර
කරණ පිණිස, දෙවියන්වහන්සේගේ දකුණුභාග
යේ සිටින්නාවූ ප්‍රශංසනීයවූ යේසුස්වහන්ස, තමන්
මරන්නාවුන් වෙනුවට ඔබට යාච්ඤාකළාවූ ඔබගේ
පළමුවෙනි සාක්ෂිකාරවූ ශුද්ධ ස්තෙපාන්ගේ
ආදර්ශය පිළිගෙණ, ශුද්ධාත්මයෙන් පූර්ණව සිට,
අපට පීඩා කරන්නාවුන්ට සෙත්භව ආශිර්වාද කරන්ට
අපට ඉගැන්නුව මැනව. ආමෙන්.

¶ මේ ලගට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්ති දවසේ
යාච්ඤාව කියන්ට යෙදේ. අලුත් අවුරුද්දට ඉස්සරින්ද සවස
වෙනතුරු සෑම දවස්වලම එම යාච්ඤාව කියයුතුය.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 7. 55—60.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 23. 34—39.

---

ශුභාරංචි ප්‍රකාශකාරවූ ශුද්ධ යොහන්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

කරුණාවන්තවූ ස්වාමිනි, ඔබගේ ආශිර්වාදලත්
අපොස්තුළුවරයෙක්ද ශුභාරංචි ප්‍රකාශකරන්
නෙක්දවූ ශුද්ධ යොහන්ගේ ඉගැන්වීමෙන් ඔබගේ
සභාව එළියවෙන පිණිසත්, ඔබගේ සත්‍යකම
නැමති එළියේ හැසිරීමෙන් අනාගමේදී සදාකාල
ජීවනය නැමති එළියට පැමිණෙන පිණිසත්, ඔබ
ගේ එළියේ දීප්තිමත්වූ රශ්මිය එම සභාවට එවන
මෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා
අපි ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 යොහන් 1. 1—10.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 21. 19—25.

---

නිර්දෝෂයන්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

බාලයන්හා කිරිදරුවන්ගේ මුඛවලින් ස්තුතිකර
වාගත්තාවූ, බාලයන්ගේ මරණයෙන් ඔවුන්ලවා

තමන්ට ප්‍රශංසාකරවානත්තාවූ, සියලු බලඇති දෙවියන්වහන්ස, නිදෙස්වූ හැසිරීමෙන්ද, මැරෙතත් අන්තාරිණතරම් ස්ථිර ඇදහිල්ලෙන්ද, ඔබගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසාකරන්ට අපට පුළුවන්වෙන පිණිස, අපතුළේ තිබෙන සියලු නපුරු ගති මර්දනකොට නසා, ඔබගේ කාරුණ්‍යවෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අප ස්ථිරකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ප්‍රකාශ 14. 1—5.

ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 2. 13—18.

---

ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්ති දවසට පසු ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

අපේ ස්වභාව ගන්නා පිණිසත්, මේ කාලයේ පිරිසිදුවූ කන්‍යාවකුගෙන් උපදින පිණිසත්, තමන්ගේ ඒකජාත පුත්‍රයා අපට දුන්නාවූ, සියලු බල ඇති දෙවියන්වහන්ස, අපි නැවත ඉපදීමෙන්ද, ඇතිකරගැණීමෙන් හා කාරුණ්‍යවෙන්ද ඔබගේ දරුවෝව, ඔබගේ ශුද්ධාත්මයෙන් දවස්පතා අලුත්කරන්ට යෙදෙනලෙස, ඔබ හා ඒම ශුද්ධාත්මයානන් සමග ඒකාත්ම දෙවියන්වහන්සේව සදාකාලේටම ජීවත්ව ආඥාකරන්නාවූ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. ගලාති 4. 1—7.

ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 1. 18—25.

---

ක්‍රිස්තුස්වහන්සේගේ චර්මඡේදනයේ දවස

ලුහුඬු යාච්ඤාවය.

මනුෂ්‍යයන් වෙනුවට තමන්ගේ ප්‍රශංසනීයවූ පුත්‍රයා චර්මඡේදනය ලැබීමටත්, නීතියට කීකරුවීමටත් පැමිණෙව්වාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, අපේ හිත් සහ සියලු අවයව ලෞකික මාංසික සියලු තෘෂ්ණාවලින් සංසිඳී, සියලු දේවලදී ඔබගේ ශුද්ධවූ අභිප්‍රායට කීකරුවෙන පිණිස, ශුද්ධාත්මයේ



සත්‍යවූ චර්මඡේදනය ඒම ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 4. 8—14.

ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 2. 15—21.

¶ මෙවක් පටන් එපිඵෙනිය පැමිණෙනතුරු සියලු දවස්වල මෙම යාච්ඤාවත් යැවුම් පත්‍රයත් ශුභාරඤ්චිත් කියන්ට යුතුය.

---

එපිඵෙනිය, නොහොත් ක්‍රිස්තුස්වහන්සේ පරදේශීන්ට

ප්‍රකාශවූ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තාරකාවකින් මාගීය පෙන්වා තමන්ගේ ඒකජාතක පුත්‍රයා පරදේශීන්ට ප්‍රකාශකළාවූ දෙවියන්වහන්ස, දැන් ඇදහීමෙන් ඔබ අඳුනන්නාවූ අපට මේ ජීවිතයෙන්පසු ඔබගේ තේජවන්ත දේවත්වය සම්පූර්ණයෙන් දැනගන්ට පුළුවන්වෙන හැටියට, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කාරුණ්‍යකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 3. 1—12.

ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 2. 1—12.

---

එපිඵෙනියට පසු පළමුවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමින්වහන්ස, ඔබට යාච්ඤාකරණ ඔබගේ සේනාවවූ අපේයාච්ඤාවල් කාරුණ්‍යවෙන් පිළිගෙණ අප විසින් කරන්ට යුතු දේ දැනගන්ටත් තේරුම් ගන්ටත් පුළුවන්කොට, ඒ දේ විශ්වාසයෙන් ඉෂ්ටකරන්ට, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කාරුණ්‍යව හා බලය දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 12. 1—5.

ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 2. 41—52.

---

එපිඵෙනියට පසු දෙවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වර්ගයෙත් පොළවෙත් ඇති සියල්ල ආඥාකරන්නාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්

වහන්ස, ඔබගේ සේනාවවූ අපේ ඉල්ලීම් කරුණාවෙන් අසා, අපේ ජීවිතයේ සියලු දවස්වලදී ඔබගේ සමාදනය, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 12. 6—16.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 2. 1—11.

---

එපිඵෙනියට පසු තුන්වෙනි ඉරිද

ලුහුඬු යාචඤාවය.

සියලු බලඇති සදකාලවූ දෙවියන්වහන්ස, අපේ දුර්වලකම් කරුණාවෙන් බලා, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ සියලු උපද්‍රවලදීත්, හිගකම්වලදීත්, අපට උපකාරකරණ පිණිසත් අප ආරක්ෂාකරණ පිණිසත් ඔබගේ දකුණු අත දිගුකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 12. 16—21.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 8. 1—13.

---

එපිඵෙනියට පසු හතරවෙනි ඉරිද

ලුහුඬු යාචඤාවය.

අපේ ස්වාභාවේ දුර්වලකම නිසා අපට නිතර කෙලින් සිටින්ට බැරිතරම් ඉතා මහත්වූ නොයෙක් උපද්‍රවයන්හි අපි හිටිනබව දන්නාවූ දෙවියන්වහන්ස, සියලු උපද්‍රවලදී අපට ආධාරවෙන පිණිසත්, සියලු පරීක්ෂාවලින් එතරවෙන්ට පුළුවන්වෙන පිණිසත්, වීර්ය හා ආරක්ෂාව, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 13. 1—7.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 8. 23—34.

---

එපිඵෙනියට පසු පස්වෙනි ඉරිද.

ලුහුඬු යාචඤාවය.

ස්වාමිනි, ඔබගේ ස්වර්ගීයවූ කරුණාව පමණක්ම ආධාරයක්කොට සිතාගෙණ සිටින්නෝ ඔබගේ



මහත් බලයෙන් නිතර ආරක්ෂාවෙන පිණිස, ඔබගේ සභාවත් පවුලත්, ඔබගේ සැබෑවූ ආගමේ සදකල්ම පවත්වන හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. කොලොස්සි 3. 12—17.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 13. 24—30.

---

එපිඵෙනියට පසු හවෙනි ඉරිද

ලුහුඬු යාචඤාවය.

යක්ෂයාගේ ක්‍රියාවල් විනාශකරන්ටත්, අප දෙවියන්ගේ දරුවන්ද සදකාල ජීවනයේ උරුමක්කාරයන්ද කරන්ටත්, තමන්ගේ ආශිර්වාදලත් පුත්‍රයා එළිදරව්කෙරෙව්වාවූ දෙවියන්වහන්ස, මේ ප්‍රාර්ථනාව ඇත්තාවූ අපට, උන්වහන්සේ පිරිසිදුව සිටින්නාවාගේ පිරිසිදුව සිටින්ට දුනමැනව. පියාණෙනි ඔබ සමගත්, ශුද්ධාත්මයාණෙනි ඔබ සමගත්, එකම දෙවියන්ව සදකල් ජීවත්වෙමින් ආණ්ඩුකරන්නාවූ උන්වහන්සේ, ආනුභාවෙන්ද මහත්වූ තේජසින්ද නැවත ප්‍රකාශවෙනකල, අපි උන්වහන්සේගේ සදකාලවූ තේජවත්තවූ රාජ්‍යයේදී උන්වහන්සේට සමානකරන්ට යෙදෙන පිණිස, මේ ඉල්ලීම අපට දෙන හැටියට යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 යොහන් 3. 1—8.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 24. 23—31.

---

සැප්තුවජෙසිම ඉරිද, නොහොත් ලෙන්ත් කාලයට
ඉස්සරින් තුන්වෙනි ඉරිද

ලුහුඬු යාචඤාවය.

ස්වාමින්වහන්ස, ඔබගේ සේනාවවූ අපේ වරදවල් උදෙසා යුතු ලෙස අච්චු ලබන්නාවූ අපි, ඔබගේ නාමයේ ගෞරවය උදෙසා ඔබගේ යහපත්කමින් හා කරුණාවෙන් ගැලවෙන පිණිස, අපේ යාචඤාවල් දයාවෙන් අසනහැටියට, ඔබවහන්සේ හා ශුද්ධාත්මයානන් සමග සදකාලේටම එකම දෙවි

යන්ව ජීවත්වෙමින් ආණ්ඩුකරන්නාවූ අපේ ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 9. 24—27.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 20. 1—16.

---

සැක්ෂජිසිම ඉරිදා, නොහොත් ලෙන්ත් කාලේට ඉස්සරින් දෙවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

අපි කරණ කිසි දෙයක් අපේ සරණකොට නොගන්න බව දකින්නාවූ දෙවි ස්වාමින්වහන්ස, ඔබගේ බලයෙන් සියලුම විපත්තිවලින් අප ආරක්ෂාකරණ මෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 2 කොරින්ති 11. 19—31.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 8. 4—15.

---

කුවින්කුවජිසිම ඉරිදා, නොහොත් ලෙන්ත් කාලේට ඉස්සරින් ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ප්‍රේමය නැත්නම් අපේ සියලු ක්‍රියාවල් නිෂ්ඵල බව අපට ඉගැන්නුවාවූ ස්වාමීන්වහන්ස, ප්‍රේම නැතුව ජීවත්වෙන සියල්ලෝ ඔබ ඉදිරියේ මළවුන් මෙන් සිටිනබැවින්, ඔබගේ ශුද්ධාත්මය අපට එවා, සමාදානයේ හා සියලු යහපත් ගුණවල බැම්මත්වූ ප්‍රේම නැමති ඉතා උත්තම තෑග්ග, ඔබගේ එකම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ හිත්වල පිහිටෙව්ව මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 13. 1—13.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 18. 31—43.

---

ලෙන්ත් කාලයේ පළමුවෙනිදා, නොහොත් අළු බදාදා

ලුහුඬු යාච්ඤාවය.

තමන් විසින් මැව් කිසිවකට වෛරනොවී, පසු තැවිලි වෙන සියල්ලන්ගේ පාපවලට ක්ෂමාවෙන්



නාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, අපි අපේ පාපවල් ගැණ යුතුලෙස වැලපෙමින්ද, අපේ කාලකණ්ණි කම් කියාදෙමින්ද, සියලු කරුණාවේ දෙවිවූ ඔබගෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා සම්පූර්ණ මිදීමත් ක්ෂමාවත් ලබන්ට අපට පුළුවන්වෙන පිණිස, අප තුළේ අලුත්වූ තැළුනාවූ හිත් මැව්ව මැනව. ආමෙන්.

¶ ලෙන්ත් කාලයේ ඒ ඒ දවසට කියන්ට නියමකරපු ලුහුඬු යාච්ඤාව කියෙව් පසු මේ යාච්ඤාව කියන්ට යුතුය.

යැවුම් පත්‍රය වෙනුවට. යෝවෙල් 2. 12—17.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 6. 16—21.

---

ලෙන්ත් කාලයේ පළමුවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

අප උදෙසා දවල් හතළිහකුත් රෑ හතළිහකුත් උපවාසකළාවූ ස්වාමිනි, පියානන් හා ශුද්ධාත්මයානන් සමග එකම දෙවියන්ව සදාකල් ජීවත්ව ආණ්ඩුකරන්නාවූ ඔබගේ ගෞරවය හා ප්‍රශංසාව උදෙසා, අපේ මාංසය දේවාත්මයට යටහත්වී, ධර්මිෂ්ඨකමෙනුත් සැබෑවූ ශුද්ධකමෙනුත් ඔබගේ දිව්‍ය සංඥාවලට නිතර කීකරුවෙන්ට පුළුවන්වෙන ප්‍රකාර උපවාසය නිතර පවත්වන්ට අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 2 කොරින්ති 6. 1—10.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 4. 1—11.

---

ලෙන්ත් කාලයේ දෙවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

අපටම උපකාරකරගන්ට කිසි බලයක් අපට නැතිබව දක්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ශරීරයට වෙන්නාවූ සියලු උපද්‍රවලින්ද, ප්‍රාණයට තුවාලත් වේදනාත් වෙන්නාවූ සියලු නපුරු සිතිවිලිවලින්ද, අප රක්ෂාකරන්ට යෙදෙන පිණිස පිට

තින් අපේ ශරීරවල්ද, ඇතුළතින් අපේ හෘදවල්ද, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා රක්‍ෂා කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 තෙසලෝනික 4. 1—8.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 15. 21—28.

---

ලෙන්ත් කාලයේ තුන්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ යටහත් දැසයන්වන අපේ හිත්වල තිබෙන ආසාවල් බලනා හැටියටත්, අපේ සියලු හතුරන්ට විරුද්ධව අපට ආරක්‍ෂාවක් වෙන පිණිස ඔබගේ තේජවන්තවූ දකුණත දිගුකරණ හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඉල්ලාසිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපිස 5. 1—14.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 11. 14—28.

---

ලෙන්ත් කාලයේ හතරවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති දෙවියන්වහන්ස, අපේ නපුරු ක්‍රියාවල් නිසා අච්චු ලබන්ට නිස්සෝව හිටින අපට ඔබගේ පිහිටෙන් සැනසිල්ලත් ඔබගේ කාරුණාවෙන් නිදහසත් දෙනමෙන් අපේ ගැලවුම්කාර ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤා වෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. ගලාති 4. 21—31.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 6. 1—14.

---

ලෙන්ත් කාලයේ පස්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ සේනාවවූ අප දෙස කාරුණාවෙන් බලා ඔබගේ මහත්වූ යහපත්කමෙන් අපේ ශරීරවල්ද ප්‍රාණවල්ද සඳා



කාලේටම ආණ්ඩුත් ආරක්‍ෂාත් වෙන පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉල්ලාසිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. හෙබ්‍රෙව් 9. 11—15.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 8. 46—59.

---

පස්බා මඞ්ගල්‍යයට පළමු ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

මනුෂ්‍යවර්ගයාට ඇත්තාවූ තමන්ගේ අති සෙනෙහය නිසා, සියලු මනුෂ්‍ය වර්ගයා තමන්ගේ පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත්වූ යටහත්භාවයේ ආදර්ශය ගන්නා පිණිස, අපේ මාංසය උන්වහන්සේ පිටට ගන්ටත් කුරුසිය පිට මරණය විඳින්ටත් උන්වහන්සේ එව්වාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, උන්වහන්සේගේ ඉවසීමේ ආදර්ශය ගන්නා හැටියටත් උන්වහන්සේගේ නැවත නැගිටීමේ පඞ්ගුකාරයෝ වෙන හැටියටත්, එම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කාරුණා කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. පිලිප්පි 2. 5—11.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 27. 1—54.

---

පස්බා මඞ්ගල්‍යයට පළමු සඳුදා

යැවුම් පත්‍රය වෙනුවට. යෙසයියා 63. 1—19.

ශුභාරංචි. ශුද්ධවූ මාර්ක් 14. 1—72.

---

පස්බා මඞ්ගල්‍යයට පළමු අඟහරුවාදා

යැවුම් පත්‍රය වෙනුවට. යෙසයියා 50. 5—11.

ශුභාරංචි. ශුද්ධවූ මාර්ක් 15. 1—39.

---

පස්බා මඞ්ගල්‍යයට පළමු බදාදා

යැවුම් පත්‍රය. හෙබ්‍රෙව් 9. 16—28.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 22. 1—71.

පස්බා මඞ්ගල්‍යයට පළමු බ්‍රහස්පතින්ද

යැවුම් පත්‍රය. 1 කොරින්ති 11. 17—34.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 23. 1—49.

---

## මහ සිකුරාද.

ලුහුඬු යාච්ඤාවල්ය.

සියලු බලඇති දෙවියන්වහන්ස, සදාකාලේටම එකම දෙවිවූ ඔබ හා ශුද්ධාත්මයානන්වහන්සේ සමග දැන් ජීවත්ව ආණ්ඩුකරන්නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, යම් පව්ලක් උදෙසා දුෂ්ට මනුෂ්‍යයන්ගේ අත්වලට අපක්ෂවාදීයෙක්සේ පාවා දෙනු ලබන්ටත් කුරුසියේ මරණ ලබන්ටත් කැමතිවූනාද, ඒ ඔබගේ පව්ලවූ අප කරුණාවෙන් බලනමෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

තමන්වහන්සේගේ ආත්මයෙන් සභාවේ මුලු සමූදුව ආණ්ඩුකරමින් පිරිසිදුකරන්නාවූ සියලු බල ඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ඒ සභාවේ සියලු තරම්වල අයවල් තම තමුන් මෙලොව වශයෙන් පත්ව කරණ වැඩවලදීද පරලොව වශයෙන් කරණ මෙහෙයේදීද, සැබෑවූ භක්තිවූ ආකාරයෙන් ඔබට සේවයකරණ පිණිස එම ඔබගේ ශුද්ධවූ සභාවේ සියල්ලන් උදෙසා ඔබ ඉදිරියේ අපි කරන්නාවූ ඉල්ලීම් සහ යාච්ඤාවල්, අපේ ගැලවුම්කාර ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේනිසා පිළිගන්නමැනව. ආමෙන්.

සියලු මනුෂ්‍යයන් මැව්වාවූ කරුණාවන්තවූ දෙවියන්වහන්ස, තමන් විසින් මැවූ කිසි දේකට වෛර වෙන්නේවත්, කොයි පව්කාරයෙක්වත් හැරී ජීවත් වෙනවාට මිස විනාශවෙනවාට කැමතිවෙන්නේවත් නැත්තාවූ ප්‍රශංසනීයවූ ස්වාමිනි, සියලු යුදෙව්වරුන්ටත් යොනුන්ටත් නොඅදහන්නන්ටත් අගම වරදවාගත්තාවුන්ටත් කරුණාකොට සියලු අඥානකම්ද සිත්දැඩිකම්ද ඔබගේ වචනයට අපහාසයද ඔවුන්ගෙන් පහකොට, සත්‍යවූ ඊශ්‍රායෙල්ගේ සෙස්සන් සමග ගලවනු ලබන පිණිසත්



ඔබ හා ශුද්ධාත්මයානන් සමග එකම දෙවියන්ව සදාකල් ජීවත්වෙමින් ආණ්ඩුකරන්නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් නම් එකම බැටළු එඬේරයටත් එකම රැළක් වෙන පිණිසත්, ඒ ඔබගේ රැළට ඔවුන් එකතුකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. හෙබ්‍රෙව් 10. 1—25.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 19. 1—37.

---

පස්බා මඞ්ගල්‍යයට පළමු සවස

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමීන්වහන්ස, ඔබගේ ප්‍රශංසනීය පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය කෙරෙහි අපි බව්තිස්ම ලැබූ ලෙස, අපේ නපුරු තෘෂ්ණාවල් නිතර මැඩපවත්වමින් උන්වහන්සේ සමග තැන්පත්කරණු ලබන්ටත්, සොහොන් ගෙයත් මරණ වාරයත් පසුකොට ප්‍රීතිවූ නැවත නැගිටීමට පැමිණෙන්ටත්, අප වෙනුවට මැරී තැන්පත්කරණු ලැබ නැවත නැගිට්ටාවූ අපේ ස්වාමියාද ඔබගේ පුත්‍රයාදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් උදෙසා අපට පිහිටවූව මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 පේතෘස් 3. 17—22.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 27. 57—66.

---

## පස්බා මඞ්ගල්‍යයේ දවස.

¶ උදේ යාච්ඤාවේ ක්‍රමයේදී “යෙහෝවාවහන්සේට ගීතිකාකියා” යනාදී ගීතිකාව වෙනුවට මේ වගන්ති ගීතිකාකරන්ටවත් කියන්ටවත් යුතුය.

ක්‍රිස්තුස් නම් අපේ පාස්කු මඞ්ගල්‍යයේ බැටළු පැටියා අප නිසා යාගකරණු ලැබුවාය, එබැවින් පරණ මුහුන්වලින්වත් කුඹුකොඩුකම හා නපුරුකම නැමැති මුහුන්වලින්වත් මඞ්ගල්‍ය නොපවත්වා, අවඞ්කකම හා සත්‍යකම නැමැති මුහුන් නුමුසු රොටිවලින් පවත්වනු. 1 කොරින්ති 5. 7.

මළවුන්ගෙන් නැගිට්ටාවූ ක්‍රිස්තුස්වහන්සේ තවත් නොමැරෙණබවත්, මරණය උන්වහන්සේ කෙරෙහි මතු බලය නොපවත්වනබවත් දනිමුව.

උන්වහන්සේ මැරීමෙන් පාපයට එක්වරක් මළාය, එහෙත් ජීවත්වීමෙන් දෙවියන්වහන්සේ කෙරෙහි ජීවත්වෙනවාය.

එසේම තොපිත් පාපයට මැරී ඉන්න බවත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කාරණකොටගෙණ දෙවියන්වහන්සේ කෙරෙහි ජීවත්ව සිටිනබවත් හිතටගණිව්. රෝම 6. 9.

ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සැතපෙනවුන්ට නාඹුල් ඵලය වූනාය.

මක්නිසාද මනුෂ්‍යයාගෙන් මරණය වූනාක්මෙන් මනුෂ්‍යයාගෙන් මළවුන්ගෙන් නැගිට්මත් වූනාය.

ආදම් තුළ සියල්ලෝ මරණයට පැමිණෙන්නාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝ ජීවත්කරණු ලබනවා ඇත. 1 කොරින්ති 15. 20.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසාවේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ ඒකජාත පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා මරණය පරාජය කරවා සදාකාල ජීවනයේ දොර අපට ඇරෙවවාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ අසම සමවූ කරුණාව අප පෙරටුවට පැමිනවීමෙන් අපේ හිත්වල යහපත් ආසාවල් පිහිටුවන්නාක්මෙන්, ඔබගේ නිරන්තරවූ පිහිටෙන් එම යහපත් ආසාවල් ඉෂ්ටකරන්ටත් අපට පුළුවන්කරණමෙන්, සදාකල් එකම දෙවිවූ ඔබ හා ශුද්ධාත්මයානන් සමග ජීවත්ව ආණ්ඩුකරණ අපේ



ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ පස්බා මඞ්ගල්‍යයට පසු සඳුද සහ අඟහරුවාදත් මෙම යාච්ඤාවම කියන්ට යුතුය.

යැවුම් පත්‍රය. කොලොස්සි 3. 1—7.
ශුභාරංචි. ශුද්ධවූ යොහන් 20. 1—10.

---

පස්බා මඞ්ගල්‍යයට පසු සඳුද.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 10. 34—43.
ශුභාරංචි. ශුද්ධවූ ලූක් 24. 13—35.

---

පස්බා මඞ්ගල්‍යයට පසු අඟහරුවාද.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 13. 26—41.
ශුභාරංචි. ශුද්ධවූ ලූක් 24. 36—48.

---

පස්බා මඞ්ගල්‍යයට පසු පළමුවෙනි ඉරිද
ලුහුඬු යාච්ඤාවය.

අපේ පාපවල් උදෙසා නසින්ටත් අපේ ධර්මිෂ්ඨවීම පිණිස නැවත නැගිටින්ටත් තමන්ගේ එකම පුත්‍රයා අපට දුන්නාවූ සියලු බලඇති පියානනි, පිරිසිදුවූ හැසිරීමෙන්ද සැබෑකමෙන්ද ඔබට නිතර වැඩකරණපිණිස, දුෂ්ටකම සහ නපුරුකම නැමති මුහුන් අපෙන් දුරුකරන්ට පුළුවන්කම, ඔබගේ එම පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් නිසා අපට දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 යොහන් 5. 4—12.
ශුභාරංචි. ශුද්ධවූ යොහන් 20. 19—23.

---

පස්බා මඞ්ගල්‍යයට පසු දෙවෙනි ඉරිද
ලුහුඬු යාච්ඤාවය.

පාපයට යාගයක් වෙන පිණිසත් භක්තිවූ හැසිරීමේ ආදර්ශයක් වෙනා පිණිසත් තමන්ගේ එකම පුත්‍රයා අපට දුන්නාවූ සියලු බලඇති දෙවියන්ව

වහන්ස, උන්වහන්සේගෙන් ලැබෙන්නාවූ ඒ අනර්ඝ ප්‍රයෝජන නිතර ඉතා ස්තුතියෙන් පිළිගන්ටත්, උන්වහන්සේගේ ඉතා පිරිසිදුවූ හැසිරීමේ උත්තම ආදර්ශය ලෙස දවස්පතා කල්අරින්ට උත්සාහකරන්ටත් අපට පුළුවන්වෙන පිණිස, එම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පිහිටවුව මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 පේත්‍රුස් 2. 19—25.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 10. 11—16.

---

පාස්කා මඞ්ගල්‍යයට පසු තුන්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

මුළාවූවන් ධර්මිෂ්ඨකමේ මාර්ගයට හැරෙණ පිණිස තමන්ගේ සැබෑකමේ ආලෝකය ඔවුන් කෙරෙහි පතුරුවන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ක්‍රිස්තුස්වහන්සේගේ ආගමේ පඞ්ගුකාරකමට ඇතුළත්වූ සියල්ලන්ට තමුන්ගේ ආගමට විරුද්ධවූ දෙයින් දුරුවෙන්ටත්, ඊට යුතුව තිබෙන සියලු දේ කරන්ටත් පුළුවන්වෙන හැටියට, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 පේත්‍රුස් 2. 11—17.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 16. 16—22.

---

පාස්කා මඞ්ගල්‍යයට පසු හතරවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

පව්කාරයන්ගේ මුරන්ඩුවූ අභිප්‍රාවල් සහ තෘෂ්ණාවල් මැඩපවත්වන්ට පුළුවන් එකම තැනැත්තාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ලෝකයේ නොයෙක් අන්දම් විප්‍රකාරවල් මැද සිටිද්දීම, අපේ හිත් සැබෑ ප්‍රීති සම්බවෙන්ට පුළුවන් ස්ථානයේ ස්ථිරව පිහිටාතිබෙන පිණිස, ඔබගේ සෙනගවූ අපට, ඔබ ආඥාකරණ දේට ප්‍රේමවෙන්ටත් ඔබ පොරොන්දුවෙන දේට ඇලුම්වෙන්ටත් අපේ ස්වාමිවූ යේසුස්



ක්‍රිස්තුස්වහන්සේ නිසා පුළුවන්කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. යාකොබ් 1. 17—21.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 16. 5—14.

---

පාස්කා මඞ්ගල්‍යයට පසු පස්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

සියලු යහපත් දේ තමන්ගෙන් නික්මවන්නාවූ ස්වාමිනි, ඔබගේ පිරිසිදු ආනුභාවෙන් යහපත්ව තිබෙන දේ සිහිකරන්ටත් ඔබගේ කරුණාවනත්තාවූ දනුමැතිකමෙන් ඒ දේ පිළිපදින්ටත් ඔබගේ යටහත් දාසයන් වන අපට පුළුවන්වෙන පිණිස, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. යාකොබ් 1. 22—27.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 16. 23—33.

---

## ස්වර්ගයට නැගීමේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ ඒකජාත පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට නැගුනුබව අපි විශ්වාසකරන්නාක්මෙන්, අපිද හිතෙනුත් බුද්ධියෙනුත් එම ස්ථානයට නැගී, සියලු කාලයේ එකම දෙවිවූ ඔබහා ශුද්ධාත්මයානන් සමග ජීවත්ව ආණ්ඩුකරණ උන්වහන්සේ සමග නිතර වසන පිණිස, අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 1. 1—11.

ශුභාරංචි. ශුද්ධවූ මාර්ක් 16. 14—20.

---

ස්වර්ගයට නැගීමේ දවසට පසුව ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ එකම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මහත්වූ ජයගැන්මකින් තමන්ගේ ස්වර්ගීයවූ රාජ්‍යයට උසස්කළාවූ තේජසේ රජවූ දෙවියන්වහන්ස,

අපට සැනසිල්ලනොදී නැර අප සනසන පිණිසත්, සියලු කාලයේ එකම දෙවිවූ ඔබහා ශුද්ධාත්මයානන් සමග ජීවත්ව ආණ්ඩුකරණ අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ යම් ස්ථානයකට පෙරටුව ගියාද එම ස්ථානයට අප උසස්කරණ පිණිසත්, ඔබගේ ශුද්ධාත්මය අපට එවනමෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 පේතෘස් 4. 7—11.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 15. 26—27. 16. 1—4.

---

## පෙන්තකොස්ත යන ඉරිද.

ලුහුඬු යාච්ඤාව.

මෙවැනි ප්‍රස්තාවකදී තමන්ගේ ශුද්ධාත්මයානන්ගේ ආලෝකය එවීමෙන් තමන්ගේ විශ්වාස සෙනගට ඉගැන්නුවාවූ දෙවියන්වහන්ස, එම ආත්මයානන්ගෙන් සියලු කාරණා ගැණ හරිවූ ප්‍රඥාව ලබන්ටත්, උන්වහන්සේගේ පිරිසිදුවූ සැනසීමේ නිතරම ප්‍රීතිවෙන්ටත් අපට පුළුවන්වෙන පිණිස, එම ආත්මයානන් සමග ඒකත්වයක්ව සදාකල් එකම දෙවියන්ව ඔබ හා ජීවත්ව ආණ්ඩුකරණ අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ කුසල් උදෙසා අපට කාරුණාකළ මැනව. ආමෙන්.

¶ පෙන්තකොස්ත දවසින් පසු සඳුදත් අඟහරුවාදත් මෙම යාච්ඤාවම කියන්ට යෙදේ.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 2. 1—11.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 14. 15—31.

---

පෙන්තකොස්ත දවසෙන් පසු සඳුද
යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 10. 34—48.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 3. 16—21.

---

පෙන්තකොස්ත දවසෙන් පසු අඟහරුවාද
යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 8. 14—17.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 10. 1—10.



## ත්‍රිත්වයේ ඉරිද.

ලුහුඬු යාච්ඤාව.

තමන්ගේ දාසයෝ වන අපි සැබෑවූ ඇදහිල්ල ප්‍රකාශකිරීමෙන් සදාකාලවූ ත්‍රිත්වයේ තේජස ඇදිනගන්නා පිණිසත්, දේව මහිම භාවයේ බලයෙන් ඒකත්වයට නමස්කාරකරණ පිණිසත් අපට කාරුණාකළාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, මේ ඇදහිල්ලේ අප ස්ථිරකරණ පිණිසත් සියලු නපුරුවලින් නිතර අප ආරක්ෂාකරණ පිණිසත්, සියලු කාලයේ ජීවත්ව ආණ්ඩුකරණ එකම දෙවිවූ ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ප්‍රකාශකිරීම 4. 1—11.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 3. 1—15.

---

ත්‍රිත්වයට පසු පළමුවෙනි ඉරිද
ලුහුඬු යාච්ඤාව.

තමන් කෙරෙහි විශ්වාසකරණ සියල්ලන්ගේ සවියවූ දෙවියන්වහන්ස, අපේ යාච්ඤාවල් කාරුණාවෙන් පිළිගත මැනව. අපේ මරණීයවූ ස්වභාවේ දුර්වලකම නිසා ඔබ නැතුව අපට කිසි යහපතක් කරන්ට බැරිබැවින්, ඔබගේ ආඥා රක්ෂාකොට හිතෙන් සහ ක්‍රියාවෙන් ඔබ සතුටුකරන්ට අපට පුළුවන්වෙන පිණිස, ඔබගේ කාරුණාවේ පිහිට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා දුන මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 යොහන් 4. 7—21.
ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 16. 19—31.

---

ත්‍රිත්වයට පසු දෙවෙනි ඉරිද
ලුහුඬු යාච්ඤාව.

තමන් කෙරෙහි ස්ථිරවූ භයවීමේද ප්‍රේමවීමේද තමන් විසින් ඇතිකරගන්නාවූ සියල්ලන්ට නිතර උපකාරකොට ඔවුන් ආණ්ඩුකරන්නාවූ ස්වාමිනි,

ඔබගේ යහපත්වූ දේවාරක්ෂාව යටතේ අප ප්‍රවේසම්කරණමෙන්ද, ඔබගේ ශුද්ධවූ නාමයට නිතර භයවෙන්ට සහ සෙනහවෙන්ට අපට සලස්වනමෙන්ද, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

ඇවුම් පත්‍රය. 1 යොහන් 3. 13—24.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 14. 16—24

---

ත්‍රිත්වයට පසු තුන්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි අපේ වචන කාරුණාවෙන් ඇසුව මැනව. තවද යාච්ඤාවෙන්ට මහත් ආසාවක් ඔබවහන්සේ අපට දුන් නිසා, සියලු උපද්‍රවලදීද වේදනාවලදීද ඔබගේ බලවත්වූ උපකාරෙන් ආරක්ෂාව සහ අස්වැසිල්ලද අපට දෙනමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

ඇවුම් පත්‍රය. 1 පේත්‍රුස් 5. 5—11.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 15. 1—10.

---

ත්‍රිත්වයට පසු හතරවෙනි ඉරිදු

ලුහුඬු යාච්ඤාවය.

තමන් කෙරෙහි විශ්වාසකාරණ සියල්ලන් ආරක්ෂාකරන්නාවූ දෙවියන්වහන්ස, ඔබ නැතුව කිසිවක් ස්ථිර ඇත්තේවත් පිරිසිදු ඇත්තේවත් නැත. එබැවින් ඔබ අපේ ආණ්ඩුකාරයත් මග පෙන්වන්නත් වෙමින්, අනාත්මේදී සදාකාලයේ අපෙන් නැති නොවෙන ප්‍රකාරයට මෙලොව දේවල අපට හැසිරෙන්ට පුළුවන්වෙන පිණිස, ඔබගේ කාරුණාව අප කෙරෙහි වඩ වඩා බෝකළ මැනව. ස්වර්ගීය පියාණෙනි මේ ඉල්ලීම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

ඇවුම් පත්‍රය. රෝම 8. 18—23.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 6. 36—42.



ත්‍රිත්වයට පසු පස්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ සභාව සියලු නිශ්චලවූ භක්තියෙන් ප්‍රීති ලෙස ඔබට වැඩකරන්ට හැකිවෙන පිණිස, ඔබගේ අනුශාසනාවෙන් මේ ලෝකයේ කාරණ සමාදානයෙන් පිළියෙලකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉල්ලා සිටිමුව. ආමෙන්.

ඇවුම් පත්‍රය. 1 පේත්‍රුස් 3. 8—15.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 5. 1—11.

---

ත්‍රිත්වයට පසු හයවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

තමන්ට සෙනහවෙන්නන්ට මනුෂ්‍ය නුවණින් දැනගන්ට බැරිතරම් යහපත් දේ සූදානම්කළාවූ දෙවියන්වහන්ස, සියල්ලටම වඩා අපි ඔබට සෙනහවෙමින්, අපි ආසාවෙන සියලු දේටම වඩා ඔබගේ පොරොන්දුවල් ලබාගන්නා පිණිස ඔබ කෙරෙහි සෙනහය, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ හිත්වල පිහිටෙව්ව මැනව. ආමෙන්.

ඇවුම් පත්‍රය. රෝම 6. 3—11.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 5. 20—26.

---

ත්‍රිත්වයට පසු හත්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

සියලු පරාක්‍රමයද බලයද ඇත්තාවූ, සියලු යහපත් දේවල කර්තෘද දායකද්වූ ස්වාමින්වහන්ස, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගේ නාමයට ප්‍රේමය අපේ හිත්වල රෝපනයකළ මැනව. සැබෑවූ ඇදහිල්ල අප තුළේ වර්ධනකළ මැනව. සියලු යහපත්කමෙන් අප පෝෂ්‍යයකොට, ඔබගේ මහත් කාරුණාවෙන් අප එහිම රක්ෂාකළ මැනව. ආමෙන්

ඇවුම් පත්‍රය. රෝම 6. 19—23.

ශුභාරංචි. ශුද්ධවූ මාක් 8. 1—9.

ත්‍රිත්වයට පසු අටවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ නොකඩව පවතින්නාවූ දේවාරක්ෂාවෙන් ස්වර්ග්ගයෙත් පොළවෙත් සියල්ල පිළිවෙළට හසුරුවන්නාවූ දෙවියන්වහන්ස, උපද්‍රව සහිතවූ සියලු දේ අපෙන් දුරුකොට, අපට ප්‍රයෝජනවත් දේ අපට දෙනමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යටත්භාවයෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 8. 12—17.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 7. 15—21.

---

ත්‍රිත්වයට පසු නවවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමීනි, ඔබවහන්සේ නැතුව කිසි යහපතක් කරන්ට නුපුළුවන්වූ අපට, ඔබගේ උපකාරයෙන් ඔබගේ කැමැත්ත ලෙස හැසිරෙන්ට පුළුවන්වෙන පිණිස, සැම විටම හරිවූ දේ සිතන්ටත් කරන්ටත් අභිප්‍රාව අපට දෙනමෙන්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1කොරින්ති 10. 1—13.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 16. 1—9.

---

ත්‍රිත්වයට පසු දහවෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ යටහත් දාසයන් වන අපේ යාච්ඤාවලට කරුණාවෙන් කන් දුන මැනව. අපේ ඉල්ලීම් අපට ඉෂ්ටවෙන පිණිස, ඔබට ප්‍රශනන දේ ඔබගෙන් ඉල්ලන්ට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පුළුවන්කළමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 12. 1—11.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 19. 41—47.

---

ත්‍රිත්වයට පසු එකොළොස්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ කරුණාව සහ අනුකම්පාව පෙන්වීමෙන් තමන්ගේ සියලු බලය ප්‍රධානකොටම



ප්‍රකාශකරන්නාවූ දෙවියන්වහන්ස, අපි ඔබගේ ආඥා මාර්ග්ගයේ හැසිර ඔබගේ දයාවනතවූ පොරොන්දුවල් ලබාගන්ටත් ඔබගේ ස්වර්ග්ග සම්පත්තියේ පංගුකාරයෝ වෙන්ටත් අපට පුළුවන්වෙන පිණිස ඊට නිසි පමණ ඔබගේ පිහිට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාවෙන් දුනමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 15. 1—11.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 18. 9—14.

---

ත්‍රිත්වයට පසු දොළොස්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

අපි යාච්ඤාවෙනවාට වඩා අහන්ට නිතර සැදී සිටින්නාවූ, අපි ලබාගන්ට ආසාවෙනවාටත් වටිනවාටත් වඩා දෙන්නාවූ, සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, අපේ හෘදසාක්ෂියෙන් භයවෙන්නාවූ දේ අපට කමාවෙමින්ද ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් හා මැදහත්කම උදෙසා මිස වෙන හැටියකින් ඉල්ලන්ට නොවටින්නාවූ යහපත් දේ අපට දෙමින්ද ඔබගේ කරුණාධාරාව අප කෙරෙහි වත්කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 2 කොරින්ති 3. 4—9.

ශුභාරංචි. ශුද්ධවූ මාර්ක් 7. 31—37.

---

ත්‍රිත්වයට පසු දහතුන්වෙනි ඉරිද

ලුහුඬු යාච්ඤාවය.

තමන්ට සැබෑවූ ප්‍රශංසනීයවූ වැඩකෙරීමට තමන්ගේ විශ්වාස සේනාවට උපකාරවෙන ඒකම තැනන්වහන්සේවූ සියලු බලඇති කරුණාවනතවූ දෙවියන්වහන්ස, ඔබගේ ස්වර්ගීයවූ පොරොන්දුවල් අනාතිමේ නොවරදීම අපට ලබාගන්ට හැකිවන ප්‍රකාරයට මේ ජීවිතයේදී ඔබට විශ්වාසයෙන් වැඩකරන්ට පුළුවන්කම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්

වහන්සේගේ කුසල් උදෙසා අපට ලැබෙනමෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. ගලාති 3. 16—22.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 10. 23—37.

---

ත්‍රිත්වයට පසු දහහතරවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස ඇදහිල්ලත් පැතීමත් ප්‍රේමයත් අප කෙරෙහි වැඩිකළ මැනව. ඔබ පොරොන්දු වෙන්නාවූ දේ අපි ලබාගන්නා පිණිස ඔබ ආඥාකරණ දේට ඇලුම්වෙන්ට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පුළුවන්කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. ගලාති 5. 16—24.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 17. 11—19.

---

ත්‍රිත්වයට පසු පහලොස්වෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ නිරන්තරවූ කරුණාවෙන් ඔබගේ සභාව රක්ෂාකළ මැනව. මනුෂ්‍යයාගේ දුර්වලකම නිසා ඔබ නැතුව ඔහුට නොවැටී සිටින්ට බැරිහෙයින් ඔබගේ පිහිටෙන් අපට උපද්‍රවවූ සියලු දේ නිතර අපෙන් අහක්කොට අපේ ගැලවීමට ප්‍රයෝජනවූ සියලු දේවලට අප පමුනුවනමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. ගලාති 6. 11—18.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 6. 24—34.

---

ත්‍රිත්වයට පසු දහසයවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ නිරන්තරවූ අනුකම්පාවෙන් ඔබගේ සභාව පිරිසිදුකොට ආරක්ෂාකළ මැනව. ඔබගේ උපකාරය නැතුව ඒ සභාවට නිරුපද්‍රව



පවතින්ට බැරිහෙයින් ඔබගේ පිහිටෙන් හා යහපත්කමෙන් ඒක සදාකාලේටම රක්ෂාකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 3. 13—21.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 7. 11—17.

---

ත්‍රිත්වයට පසු දහහත්වෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ඔබගේ කරුණාව නිතර අප හාත්පසින් පවත්වමින් සියලු කාලයේ සියලු යහපත් ක්‍රියාවල් කෙරීමෙහි අප යොදනමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 4. 1—6.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 14. 1—11.

---

ත්‍රිත්වයට පසු දහඅටවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

ස්වාමිනි ලෝකයෙනුත් මාංසයෙනුත් යක්ෂයාගෙණුත් පැමිනෙන්නාවූ පරීක්ෂාවලට විරුද්ධව ස්ථිරව සිටින්ටත් පිරිසිදුවූ සිත්වලින්හා අභිප්‍රාවලින් එකම දෙවිවූ ඔබ පස්සේ යන්ටත් තමන්ගේ සේනාවවූ අපට ඔබගේ පිහිට දෙන ලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. 1 කොරින්ති 1. 4—8.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 22. 34—46.

---

ත්‍රිත්වයට පසු දහනවවෙනි ඉරිදා

ලුහුඬු යාච්ඤාවය.

දෙවියන්වහන්ස ඔබගේ පිහිට නැතුව ඔබ සතුටුකරන්ට අපට බැරිහෙයින් සියලු දේවලදී ඔබගේ ශුද්ධාත්මයානන් විසින් අපේ හිත් නමා ආණ්ඩු

කාරණා පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 4. 17—32.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 9. 1—8.

---

ත්‍රිත්වයට පසු විසිවෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

සියලු බලඇති ඉතා කරුණාවන්තවූ දෙවියන්වහන්ස, අපේ ශරීරයෙන්හා සිතෙන් සැදීසිට ඔබවහන්සේ අපි යම් දෙයක් කරණවාට කැමතිද ඒ දේ ප්‍රීතියෙන් කරණ පිණිස අපට උපද්‍රවවූ සියලු දේ අපෙන් දුරුකොට ඔබගේ මහත්වූ යහපත්කමින් අප ආරක්ෂාකරණ හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 5. 15—21.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 22. 1—14.

---

ත්‍රිත්වයට පසු විසිඑක්වෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

කරුණාවන්තවූ ස්වාමිනි ඔබගේ විශ්වාස සේනාවවූ අපට අපේ සියලු පාපවලින් දුරුව පිරිසිදුවෙන්ටත් නිශ්චලවූ හිතෙන් ඔබට වැඩ කරන්ටත් පුළුවන්වෙන පිණිස කමාව හා සමාදානය අපට දෙනමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 6. 10—20.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 4. 46—54.

---

ත්‍රිත්වයට පසු විසිදෙවෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

ස්වාමිනි ඔබගේ පව්ලවූ සභාව ඔබගේ ආධාරකරණකොටගෙණ සියලු උපද්‍රව වලින් නිදහස්වෙන පිණිසත්, ඔබගේ නාමයේ ගෞරවය සඳහා



යහපත්වූ ක්‍රියාවලින් යුක්තව ඔබට වැඩකිරීමෙහි ඇලුම්ව යෙදීසිටින පිණිසත් ඒක ඔබගේ නිරන්තරවූ භක්තියේ රක්ෂාකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය. පිලිප්පි 1. 3—11.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 18. 21—35.

---

ත්‍රිත්වයට පසු විසිතුන්වෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

අපේ සරණද ස්වියද සියලු භක්තියේ කාරකදවූ දෙවියන්වහන්ස, ඔබගේ සභාව කරණ භක්තිවූ යාචඤාවල් අහන්ට සැදී සිටින හැටියටත්, අපි ඇදහිල්ලෙන් ඉල්ලන දේ සාර්ථකයෙන් ලබන පිණිස අපට කරුණාකරණ හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාවෙමුව. ආමෙන්.

යැවුම්පත්‍රය. පිලිප්පි 3. 17—21.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 22. 15—22.

---

ත්‍රිත්වයට පසු විසිහතරවෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

ස්වාමිනි අපේ දුර්වලකම නිසා අපි කරගත් පාප බන්ධනවලින් ඔබගේ අති දයාව කරණකොටගෙණ අපි සියල්ලෝම මුදනුලබන පිණිස ඔබගේ සේනාවවූ අපේ වරදවලින් නිදහස්කරණමෙන් ඉල්ලමුව. ස්වර්ගීය පියාණනි, අපේ ප්‍රශංසනීය ගැලවුම්කාර ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මේ යාචඤාව අපට ඉෂ්ටකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. කොලොස්සි 1. 3—12.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 9. 18—26.

---

ත්‍රිත්වයට පසු විසිපස්වෙනි ඉරිදා

ලුහුඬු යාචඤාවය.

ස්වාමිනි ඔබගේ විශ්වාස සේනාවවූ අපි බොහෝ සෙයින් යහපත්වූ ක්‍රියාවල් නැමති ඵල බරව ඊට

බොහෝකොට ඔබගෙන් විපාක ලබන පිණිස අපේ හිත් පුබුදුකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. යෙරෙමියා 23. 5—8.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 6. 5—14.

---

¶ ක්‍රිස්තුස්වහන්සේගේ ලොවපහළවීමේ ඉරිදා පැමිණෙන්ට පළමුවෙන් ඉරිදා දවස් මීට වඩා තිබේනම්, ඒ වැඩි දවස්වලදී එපිඵනියට පසු අත්ඇරිය ඉරිදා දවස්වල යාච්ඤා යනාදිය කියවන්ට යුතුය. නුමුත් මීටවඩා ඉරිදා දවස් නැත්නම් ඉතුරුවෙන යාච්ඤාවල් අත්අරින්ට යුතුය. එසේවී නුමුත් මේ අන්තිමේ කී යාච්ඤාවත් යැවුම් පත්‍රය හා ශුභාරංචියත් ක්‍රිස්තුස්වහන්සේගේ ලොවපහළවීමට පළමු ඉරිදා නොවරදවා කියන්ට යුතුය.

---

ශුද්ධවූ අන්දෘගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තාමන්ගේ ශුද්ධ අපොස්තුළුවූ අන්දෘට තමන්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් අඬගැසූකල එවේලෙහිම ඊට කීකරුවෙමින් අප්‍රමාදව උන්වහන්සේ පස්සේ යනාහැටියට පිහිටවූනාවූ සියලු බල ඇති දෙවියන්වහන්ස, අපි සියල්ලෝම ඔබගේ ශුද්ධවූ වචනයෙන් කැඳවනුලැබ, ඔබගේ ශුද්ධවූ ආඥාවල් වහාම කීකරුව පැවැත්වීමෙහි යෙදී සිටින පිණිස, එම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. රෝම 10. 9—21.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 4. 18—22.

---

අපොස්තුළුවූ ශුද්ධ තෝමස්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

ඇදහිල්ල වඩා ස්ථිරවෙන පිණිස තමන් පුත්‍රයාගේ නැවත නැගිට්ටීම ගැන සැකිය ශුද්ධ අපොස්තුළුවූ තෝමස්ට අනුමාන හිතන්ට ඉඩ ඇරියාවූ සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස,



ඔබ ඉදිරියේ අපේ ඇදහිල්ල ගැන කිසි කලක අපට දෝස නොපැමිණෙන පිණිස තමන්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සම්පූර්ණව කිසි අනුමානයක් නැතුව විශ්වාසකරන්ට අපට පුළුවන්කළ මැනව. ස්වාමිනි එම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ මේ ඉල්ලීමට කන්දුනමැනව. ඔබ හා ශුද්ධාත්මයානන් ඇතුළුව උන්වහන්සේට සියලු ගෞරවයත් තේජසත් දැන් සහ සදාකාලේටම වේවා. ආමෙන්.

යැවුම් පත්‍රය. එපිස 2. 19—22.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 20. 24—31.

---

ශුද්ධ පාවුල් ක්‍රිස්තියානි ආගමට හැරුණු දවස.

ලුහුඬු යාච්ඤාවය.

ආශිර්වාදලත් අපොස්තුළුවූ ශුද්ධ පාවුල්ගේ දේශනා කිරීමෙන් ශුභාරංචි එලිය මුළු ලෝකයේ බැබලෙව්වාවූ දෙවියන්වහන්ස, අපි ඔහුගේ ආශ්චර්‍ය්‍යමත් පැහැදීම සිහිකරමින් ඊට ස්තුතිකරණ බව ඔබට පෙන්වන පිණිස, ඔහු ඉගැන්නූ පිරිසිදු ඉගැන්වීම්වල ප්‍රකාර හැසිරෙන්ට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකරණමෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 9. 1—22.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 19. 27—30.

---

ක්‍රිස්තුස්වහන්සේ දේවමාලිගාවේදී දැක්වූ දවස නොහොත් ව්‍යවහාරයෙන් කියන හැටියට ශුද්ධ මරියානම් කන්‍යාවගේ පිරිසිදුවීමේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස, ඔබගේ ඒකජාත පුත්‍රයා මේ දවසේ මනුෂ්‍ය වේසයෙන් දේවමාලිගාවේදී දක්වන්ට යෙදුනා වාගේ, එම ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් අප ශුද්ධවූ පිරිසිදුවූ

සිත් ඇතුව ඔබට දක්වන්ට යෙදෙනමෙන් මහෝත්තමයානනි යටහත්භාවයෙන් ඔබගෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. මලකියා 3. 1—5.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 2. 22—40.

---

ශුද්ධවූ මත්තියස්ගේ දවස.

ලුහුඬු යාච්ඤාව.

අපොස්තුළුවරු දොළොස්දෙනාගෙන් එක්කෙනෙක් වෙන පිණිස යුදස්නම් ද්‍රෝහියා වෙනුවට තමන්ගේ විශ්වාස දාසයාවන මත්තියස් තෝරාගත්තාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ සභාව බොරු අපොස්තුළුවරුන්ගෙන් නිතර වැලකී විශ්වාසවූ සැබෑවූ එඬේරුන් විසින් ආණ්ඩු කරන්ටත් මග පෙන්වාදෙනු ලබන්ටත් යෙදෙන පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 1. 15—26.

ශුභාරංචි. ශුද්ධවූ මතෙව් 11. 25—30.

---

ආශීර්වාදලත් කන්නිමරියාට

දරු උපතක් ලැබෙනබව දැන්නෙව් දවස.

ලුහුඬු යාච්ඤාව.

ස්වාමිනි දේවදූතයෙකුගේ පණිවිඩයෙන් තමන්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරගතවීම අපි දැනගත්හෙයින්, උන්වහන්සේගේ කුරුසියහා වධවිඳීම කාරණකොටගෙණ උන්වහන්සේගේ නැවත නැගිට්ටීමේ තේජසට අපි පමුනුවනු ලබන පිණිස, එම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගේ කරුණාව අපේ සිත්වල වගුරුවනමෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. යෙසායියා 7. 10—15.

ශුභාරංචි. ශුද්ධවූ ලූක් 1. 26—38.



ශුද්ධවූ මාක්ගේ දවස.

ලුහුඬු යාච්ඤාව.

ශුභාරංචි ප්‍රකාශකරන්නාවූ ශුද්ධ මාක්ගේ ස්වර්ගීයවූ ඉගැන්වීමෙන් තමන්ගේ පිරිසිදුවූ සභාවට ඉගැන්නුවාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, දරුවන්මෙන් අපි නිෂ්ඵල ඉගැන්වීම් නැමති කුනාටුවෙන් ගෙනයනු නොලැබ ඔබගේ පිරිසිදු ශුභාරංචියේ සැබෑකමේ ස්ථිරවෙන පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. එපීස 4. 7—16.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 15. 1—11.

---

ශුද්ධවූ පිලිප් හා ශුද්ධවූ යාකොබ්ගේ දවස.

ලුහුඬු යාච්ඤාව.

තමන් සැබෑලෙස ඇඳිනගන්නාන්ට සදාකාල ජීවනය දෙන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, අපි ඔබගේ ශුද්ධ අපොස්තුළුවූ ශුද්ධ පිලිප් හා ශුද්ධ යාකොබ්ගේ ආදර්ශය පසුව යමින් සදාකාල ජීවනයට පමුනුවන මාර්ගයේ ස්ථිරව හැසිරෙණ පිණිස, තමන්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාර්ගයත් සැබෑකමත් ජීවනයත් බව සම්පූර්ණ ලෙස දැනගන්ට එම ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පුළුවන්කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. යාකොබ් 1. 1—12.

ශුභාරංචි. ශුද්ධවූ යොහන් 14. 1—14.

---

ශුද්ධ අපොස්තුළුවූ බර්ණබස්ගේ දවස.

ලුහුඬු යාච්ඤාව.

ශුද්ධාත්මයානන්ගේ අපූර්වවූ තෑගි තමන්ගේ ශුද්ධ අපොස්තුළුවූ බර්ණබස්ට දී පොහොසත්කළාවූ සියලු බලඇති දෙවි ස්වාමිනි, තමන්ගේ නොයෙක් ප්‍රකාර තෑගි දීම අපෙන් නොවැලකුව

මැනව. ඔබගෙන් ලැබෙන තෑගි ඔබගේ නම්බුවත් ගෞරවයත් පිණිස නිතර පාවිච්චිකරණ හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 11. 22—30.

ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 15. 12—36.

---

ශුද්ධශුවූ යොහන් බව්තිස්තගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ ආනුභාවෙන් තමන් දසවූ යොහන් බව්තිස්ත අපූර්වලෙස උපදවා පශ්චාත්තාපවීම ප්‍රකාශකිරීමෙන් තමන්ගේ පුත්‍රවූ අපේ නැලවුම්කාරයාණන්ගේ මාර්ගය පිළියෙලකරන්ට ඔහු එව්වාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, අපි ඔහුගේ ඉගැන්වීමහා ශුද්ධවූ හැසිරීම ලෙස කල්යවන පිණිස ඔහු ප්‍රකාශකළ හැටියට සැබවින් පශ්චාත්තාපවෙන්ටත් ඔහු වාගේම නිතර සැබෑව කථාකරන්ටත් භයනැතුව නපුරුකමට තරවටුකරන්ටත් සත්‍යකම උදෙසා සංසුංව දුක් විඳින්ටත් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට පුළුවන්කළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. යෙසයියා 40. 1—11.

ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 1. 57—80.

---

ශුද්ධවූ පේත්‍රුස්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා තමන්ගේ ශුද්ධ අපොස්තුළුවූ පේත්‍රුස්ට නොයෙක් උතුම් තෑගි දෙවා තමන්ගේ රැළ රක්ෂාකරණ පිණිස ඔහුට උදක්ම ආඥාකළාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, සදාකාල තේජස නැමති ඔටුන්න ලබාගන්නා පිණිස සියලු බිස්කොප්වරුන්ට සහ අනිකුත් දේවගැතියන්ට ඔබගේ ශුද්ධ වචනය කඩිසරව ප්‍රකාශකරන්ටත්, සෙනගට ඒ වචනයට



කීකරුව පිළිපදින්ටත් පුළුවන්කරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 12. 1—11.

ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 16. 13—19.

---

අපොස්තුළුවූ ශුද්ධ යාකොබ්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

දයාවන්තවූ දෙවියන්වහන්ස, ඔබගේ ශුද්ධ අපොස්තුළුවූ යාකොබ් තමාගේ පියාත් තමා සනාතක සියල්ලත් අත්හැර ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීමට කීකරුව අප්‍රමාදව උන්වහන්සේ පසුව ගියාවාගේ, අපිත් සියලු ලෞකික මාංසික ආසාවල් අත්හැර ඔබගේ ශුද්ධවූ ආඥාමාර්ගයේ යන්නට නිතර සැදීසිටින හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 11. 27—12—3.

ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 20. 20—28.

---

අපොස්තුළුවූ ශුද්ධ බතීලමෙවුගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ වචනය සැබවින් අදහන්ටත් ප්‍රකාශකරන්ටත් තමන්ගේ අපොස්තුළුවූ බතීලමෙවුට කරුණාකළාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ඔහු අදහගත් වචනයට සෙන්හවෙන්ටත් එම වචනය ප්‍රකාශකරන්ටත් පිළිගන්ටත් ඔබගේ සභාවට පුළුවන්කම දෙන හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි යාච්ඤාවෙමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ක්‍රියා 5. 12—16.

ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 22. 24—30.

---

අපොස්තුළුවූ ශුද්ධ මතෙව්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ ප්‍රශංසනීය පුත්‍රයා ලවා අපොස්තුළුවරයෙක්හා ශුභාරඤ්චි ප්‍රකාශකරන්නෙක් වෙන

පිණිස ආදායම් අයකරණ ස්ථානෙන් මතෙව් කැඳෙව්වාවූ සියලු බලඇති දෙවින්වහන්ස, අපි සියලු ලෝකාවූ ආසාවල්ද වස්තුවට අධික ආලයද අත්ඇර එසාම දෙවිවූ ඔබ හා ශුද්ධාත්මයානන් සමග සියලු කාලයේ ජීවත්වෙමින් රජකම්කරන්නාවූ එම ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පසුව යනහැටියට අපට කරුණාකළමැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 2 කොරින්ති 4. 1—6.
ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 9. 9—13.

---

ශුද්ධවූ මිකායෙල්හා සියලු දේවදූතයන්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

දේවදූතයන්ගෙත් මනුෂ්‍යයන්ගෙත් මෙහෙවර ආශ්චර්යශීලෙසින් පංගාඬම්කොට නියමකළාවූ සදාකාලවූ දෙවියන්වහන්ස, ඔබගේ ශුද්ධවූ දූතයෝ ස්වර්ගයේදී ඔබට නිතර සේවයකරණහෙයින් ඔවුන්ට නියමව තිබෙනලෙස ඔවුන් ලවා මෙලොවදී අපට උපකාරකොට අප ආරක්ෂාකරවන්ට කරුණාකරණ හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ප්‍රකාශ 12. 7—12.
ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 18. 1—10.

---

ශුභාරඤ්චි ප්‍රකාශකරන්නෙක්ව සිටි ශුද්ධවූ ලූක්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

ශුභාරඤ්චි ප්‍රකාශකරන්නෙක්ද ප්‍රාණවල වෛද්‍යාචාර්යයෙක්ද වෙනපිණිස ශුභාරඤ්චිවල ප්‍රශංසාකර තිබෙන වෛද්‍යාචාර්යවූ ලූක් කැඳවාගත් සියලු බලඇති දෙවියන්වහන්ස, ඔහු දුන් ඉගැන්වීම් නැමති ශුභ ඖෂධවලින් අපේ ප්‍රාණවල සියලු රෝගවල් සුවවෙන්ට පුළුවන්වෙනලෙස ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යෝග්‍යකම නිසා කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. 2 තිමෝතියස් 4. 5—15.
ශුභාරඤ්චි. ශුද්ධවූ ලූක් 10. 1—6.



අපොස්තුළුවරුවූ ශුද්ධ සීමොන් හා ශුද්ධ යූදස්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කොණේ ප්‍රධාන ගලකොට තබා අපොස්තුළුවරුන් හා ප්‍රොපේතයන් නැමති අඩිතාලම පිට තමන්ගේ සභාව ගොඩනැගුවාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ඔවුන්ගේ ඉගැන්වීම නිසා අපි එකඟවූ අභිප්‍රාවෙන් යුක්තව ඔබට ප්‍රියවූ ශුද්ධවූ මාලිගාවක් වෙන හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය. යූදස් 1—8.
ශුභාරඤ්චි. ශුද්ධවූ යොහන් 15. 17—27.

---

සියලු ශුද්ධවන්තයින්ගේ දවස.

ලුහුඬු යාච්ඤාවය.

තමන්ගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේගේ සංඝ ශරීරය තුළේ තමන්ගේ තෝරාගත්තවුන් එක සාධාරණකමේ හා පංගුකාරකමේ සම්බන්ධකොට පිහිටෙව්වාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, සියලු ගුණයෙන්හා දේවභක්තිවූ හැසිරීමෙන් තමන්ගේ ආශිර්වාදලත් ශුද්ධවන්තයින් පසුවගොස් තමන්ට අවංකව ප්‍රේමවෙන්නන්ට ඔබ සැලැස්වූ කියා නිමකළ නොහැකි ප්‍රීතිවලට අපි පැමිණෙන ලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට කරුණාකළ මැනව. ආමෙන්.

යැවුම් පත්‍රය වෙනුවට. ප්‍රකාශ 7. 2—12.
ශුභාරඤ්චි. ශුද්ධවූ මතෙව් 5. 1—12.

# ස්වාමීන්ගේ රාත්‍රිභෝජනය.

නොහොත්

## ශුද්ධවූ සහභාගිකම පැවැත්වීමේ ක්‍රමය.

¶ ප්‍රෙස්බිතර් ශුද්ධ භෝජනය බෙදන මේසේ උතුරුපැත්තෙන් සිට ස්වාමීන්ගේ යාච්ඤාවත් ඊලඟ ලුහුඬු යාච්ඤාවත් කියාවා, සෙනගද දනගසා ඉඳිත්වා.

ස්වර්ගයේ සිටින අපේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා, ඔබගේ රාජ්‍යය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණු ලැබේවා, අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව, අපට වැරදිකළවුන්ට අපි කමා වෙන්නා වාගේ, අපේ වැරදිවලටත් කමාවූව මැනව, අප පරීක්ෂාවීමට නොපමුනුවා, නපුරෙන් අප ගලවාගත මැනව. ඈමෙන්.

ලුහුඬු යාච්ඤාවය.

සියලු හිත් දකින්නාවූ සියලු ආසාවල් දන්නාවූ සියලු රහස් පෙණෙන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, අපේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඔබට සම්පූර්ණලෙස ප්‍රේමවෙන පිණිසත් ඔබගේ ශුද්ධවූ නාමය යුතුලෙස වර්ණනාකරණ පිණිසත් ඔබගේ ශුද්ධාත්මයේ ආනුභාවෙන් අපේ හිත්වල කල්පනාවල් පිරිසිදුකළ මැනව. ආමෙන්.

¶ එවිට ප්‍රෙස්බිතර් සමූදුව දිසාවට හැරී ආඥාවල් දශයම බේරුම්ලෙස කියාවා, සමූදුවද දනගසා සිට එක එක ආඥාවෙන් පසු තමුන් ඒවා කඩකළ නිසා දෙවියන්වහන්සේගෙන් කමාවත් මතු ඒවාට කීකරුවෙන පිණිස කරුණාවත් ලැබෙනමෙන් මෙහි පහළ පෙණෙනලෙස ඉල්ලාසිටිත්වා.

දේවගැතියා.

දෙවියන්වහන්සේ මේ වචන වදාරමින් මෙසේ කීසේක.

තාගේ දෙවිවූ යෙහෝවඃ මමය, මා ඇර වෙන දෙවිකෙනෙක් තට නොගණුව.



සමූදුව. ස්වාමිනි අපට කරුණාකොට මේ ආඥාව රක්ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේව. කැපූ යම් රූපයක් හෝ, උඩ අහසේවත් පාත පොළවේවත් පොළවෙන් යට වතුරේවත් තිබෙන දේට සමානවූ කිසිදෙයක් හෝ, තට සාදනොගණුව, ඒ දේට වැඳිමක්වත් වැඩක්වත් නොකරව. මක්නිසාද තාගේ දෙවිවූ යෙහෝවඃනම් මම අන්‍යභක්ති නොඉවසන්නාවූ දෙවිකෙනෙක. මට වෛරවෙන්නන්ගේ පාප ගැණ තුන්වෙනි හතරවෙනි පරම්පරව දක්වා ඔවුන්ගේ දරුවන්ට අච්චු කරන්නාවූ, මට සෙනෙහවෙන්නන්ගෙත් මාගේ ආඥාවල් පවත්වන්නන්ගෙත් පරම්පරා දහස්ගණනකට කරුණාව පෙන්වන්නාවූකෙනෙක.

සමූ. ස්වාමිනි අපට කරුණාකොට මේ ආඥාව රක්ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේව. තාගේ දෙවිවූ යෙහෝවඃගේ නාමය නිරර්ථකයේ නොකියව, මක්නිසාද යෙහෝවඃගේ නාමය නිරර්ථකයේ කියන්නා යෙහෝවඃ විසින් නිවරදි කාරයෙක්කොට ගන්නේ නැත.

සමූ. ස්වාමිනි අපට කරුණාකොට මේ ආඥාව රක්ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. සබත් දවස පිරිසිදුකොට පවත්වන්ට සිහිකරගණුව. සදවසක් වැඩකොට තාගේ සියලු කර්මාන්ත කරගණුව. සත්වෙනි දවස තාගේ දෙවිවූ යෙහෝවඃගේ නිවාඩු දවසය, ඒ දවසේ තෝ කිසිවැඩක් නොකරව. තාවද තාගේ පුතාවත් දුවවත් දාසයාවත් දාසිවත් සිව්පාත්තින්වත් තාගේ සීමාවතුළ සිටින ආගන්තුකයාවත් ඒ දවසේ වැඩ නොකරත්වා, මක්නිසාද යෙහෝවඃ ස්වර්ගයත් පොළවත්, මුහුදත් එහි තිබෙන සියල්ලත් සදවස ඇතුළත මවා සත්වෙනිද නිවාඩුකළ බැවින් සත්වෙනි දවසට ආශීර්වාදකොට පිරිසිදුකළාය.

සමූ. ස්වාමිනි අපට කරුණාකොට මේ ආඥාව රක්ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. තාගේ පියාටත් මව්ටත් ගෞරවකරව, එසින් තාගේ දෙවිවූ යෙහෝවඃ තට දෙන රටේදී තාගේ දවස් බෝවෙයි.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට මේ ආඥව රක්‍ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. මිනී නොමරව.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට මේ ආඥව රක්‍ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. කාමමිථ්‍යාචාරය නොකරව.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට මේ ආඥව රක්‍ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. හොරකම් නොකරව.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට මේ ආඥව රක්‍ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. තාගේ අසල්වාසීන්ට විරුද්ධව බොරු සාක්‍ෂි නොකියව.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට මේ ආඥව රක්‍ෂාකරන්ට අපේ හිත් කැමතිකළ මැනව.

දේ. තාගේ අසල්වාසියාගේ ගෙදරට ආසා නොවව. තාගේ අසල්වාසියාගේ ස්ත්‍රියටවත් ඔහුගේ දාසයාටවත් දාසිටවත් ගොනාටවත් කොටළුවාටවත් වෙන කොයි දේකටවත් ආසානොවව.

සමූ. ස්වාමිනි අපට කාරුණ්‍යකොට ඔබගේ මේ සියලු ආඥවල් අපේ හිත්වල ලියන හැටියට අපි ඔබට යාච්ඤාවෙමුව.

¶ මහේසිකාව ගැණ මේ ලුහුඬු යාච්ඤා දෙකෙන් එකක් ප්‍රෙස්බිතර් පළමුලෙස හිටගෙණ කියාවා.

අපි යාච්ඤාවෙමු.

සදාකල් පවතින රාජ්‍යයද අනන්තවූ බලයද ඇති සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්ස, මුලු සභාවට කාරුණ්‍ය කළමැනව. ඔබගේ තෝරාගත් දාසිවූ වික්ටෝරියා නම් අපේ ආණ්ඩුකාරීවූ මහේසිකාව විසින් ඔබගේ සේවකියක් බව දැනගෙණ, සියල්ලටම වඩා ඔබගේ



මානනය සහ ගෞරවය සොයන්ට උන්වහන්සේට පුළුවන්වෙන පිණිසත්, අපි සහ උන්වහන්සේගේ සියලු යටත් වැසියෝ, උන්වහන්සේට ඔබගෙන් බලය ඇතැයිහරියාකාර කල්පනාකරමින් ඔබගේ සැපදායක වචනය හා නියෝගය ලෙස, ඔබගේ නාමින් ඔබ උදෙසා උන්වහන්සේට විශ්වාසව සේවයත් ගෞරවයත් කරමින් යටහත්භාවයෙන් කීකරුවෙන පිණිසත්, උන්වහන්සේගේ හිතේ රජකම් කළමැනව. සදාකල්ම එකම දෙවිවූ ඔබ හා ශුද්ධාත්මයානන් සමග ජීවත්ව ආණ්ඩුකරණ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මෙසේ කළමැනව. ආමෙන්.

නොහොත් මේ යාච්ඤාව.

සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, රජුන්ගේ හිත් ඔබගේ අණටහා ආණ්ඩුවට යටහත් වෙනබවත්, ඔබගේ දිව්‍යඥානයට යහපත්ව පෙණෙනලෙස ඒ හිත් නමා හරවනබවත්, ඔබගේ ශුද්ධවූ වචනවලින් අපි ඉගෙණගනිමුව. එබැවින් ඔබගේ දාසිවූ වික්ටෝරියා නම් අපේ ආණ්ඩුකාරීවූ මහේසිකාව, තමන්ගේ සියලු කල්පනාවලින්ද වචනවලින්ද ක්‍රියාවලින්ද ඔබගේ මානනයත් ගෞරවයත් සොයමින් තමන්ට භාරදී සිටිනා ඔබගේ සේනාව සැපයෙන්ද සමගිතාවෙන්ද භක්තියෙන්ද රක්‍ෂාකරන්ට උත්සාහකරණ පිණිස උන්වහන්සේගේ හිත නමා ආණ්ඩුකළ මැනව. කාරුණ්‍යවන්තවූ පියානනි ඔබගේ ප්‍රිය පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඉල්ලාසිටිනා මේ අපේ යටහත් ඉල්ලීම ඉෂ්ටකළ මැනව. ආමෙන්.

¶ එවිට ඒ දවසට නියමිවූ ලුහුඬු යාච්ඤාව කියන්ට යෙදේ. ඊලඟට ප්‍රෙස්බිතර් යැවුම්පත්‍රයත් ශුභාරංචියත් කියාවා, ශුභාරංචි කියනවිට සමූදව කෙලින් සිටින්වා, ශුභාරංචි කියෙව් පසු සමූදව කෙලින් සිටිද්දී මේ ඇදහිල්ලේ ක්‍රමය ගායනාකරන්ට නොහොත් කියන්ට යෙදේවා.

ස්වර්ගයත් පොළවත් පෙණෙන නොපෙණෙන සියලු දේත් මැව්, සියලු බලඇති පියවූ එකම දෙවියන්වහන්සේ අදහමි.

තවද දෙවියන්වහන්සේගේ ඒකජාත පුත්‍රවූ, සියලු ලෝකවලට පළමු තමන්ගේ පියානන්ගෙන් ජාතකවූනාවූ, දෙවියන්ගෙන් දෙවිවූ, ආලෝකයෙන් ආලෝකයවූ, සැබෑ දෙවියන්ගෙන් සැබෑ දෙවිවූ, මවනු නොලැබ ජාතකකරන්ට යෙදුනාවූ, පියානන් හා එකම ස්වභාවක් ඇත්තාවූ, සියලු දේ මැව්වාවූ, මනුෂ්‍යයෝ වන අප උදෙසාත් අපේ ගැලවීම පිණිසත් ස්වර්ගයෙන් බැස, ශුද්ධාත්මය කාරණකොටගෙණ මරියානම්වූ කන්‍යාවගෙන් මාංසව මනුෂ්‍යයා වූනාවූ, අප උදෙසා පොන්තිවුස් පිලාත් යටතේ කුරුසියේ ඇනගැසුම්කා, වධවිඳ වළලනු ලැබ, නැවත තුන්වෙනිද ලියවිලි හැටියට නැගිට, ස්වර්ගයට නැගුනාවූ, පියානන්ගේ දකුණු භාගයේ ඉන්නාවූ, ජීවත්වෙන්නවුන්ද මළවුන්ද විනිශ්චයකරණ පිණිස තේජසින් නැවත එන්නාවූ, කෙළවරක් නොවන රාජ්‍යයක් ඇත්තාවූ, එකම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද අදහමි.

ජීවනදායක ස්වාමියාවන, පියානන් හා පුත්‍රයානන් කෙරෙන් නික්මෙන්නාවූ, පියානන් හා පුත්‍රයානන් සමග නමස්කාරත් ගෞරවත් ලබන්නාවූ, ප්‍රොපේතයන් ලවා කථාකෙරෙව්වාවූ, ශුද්ධාත්මයානන්වහන්සේද අදහමි, තවද එකම සර්වසාධාරණවූ අපොස්තුළුවූ සභාවක්ද ඇතෙයි කියා අදහමි. පාපක්ෂමාව පිණිස එකම බව්තීස්මයක් ඇතිබව ඒත්තුගණිමි. මළවුන්ගේ නැවත නැගිට්මත්, පරලොව ජීවිතයත් බලාසිටිමි. ඇමෙන්.

¶ ඉන්පසු ප්‍රෙස්බිතර් ස්වාමින්ගේ මේසේ ලඟට නැවත ගොස් තමා කැමති හැටියකට මේ පහළ ලියවී තිබෙන පදවලින් එකක්වත් ඊට වැඩියවත් කියාවා. ඒ අතර දනපූජාවල් පිළිගන්ට යෙදේ.



මනුෂ්‍යයෝ තුඹලාගේ හොඳ ක්‍රියාවල් දැක ස්වර්ගයේ සිටින තුඹලාගේ පියානන්ට ප්‍රශංසාකරණ පිණිස තුඹලාගේ එළිය ඔවුන් ඉදිරියේ දිලිහේවා. ශුද්ධවූ මතෙව් 5.

භූමියෙහි තමුන්ට වස්තු රැස්කර නොගණිව්, එහිදී කාවෝද මලකඩද ඒවා විනාශ කරති, සොරුද ඒවා උමන්කැන ගණිති. තුමූත් ස්වර්ගයෙහි තමුන්ට වස්තු රැස්කරගණිව්, එහිදී කාවෝද මලකඩද ඒවා විනාශ නොකරති, සොරුද ඒවා උමන්කැන නොගණිති. ශුද්ධවූ මතෙව් 6.

මනුෂ්‍යයෝ තුඹලාට යමක් යමක් කරණවාට තුඹලා කැමතිනම් ඒ ඒ දේ ඔවුන්ටත් එසේම කරව්, නීතියත් ප්‍රොපේතවරුත් මේකමය. ශුද්ධවූ මතෙව් 7.

ස්වර්ගයේ සිටින මාගේ පියානන්ගේ කැමැත්ත කරන්නෙක් මිස මට ස්වාමිනි ස්වාමිනි කියන්නාවූ සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවෙති. ශුද්ධවූ මතෙව් 7.

සබෙවුස් නැගිට සිට ස්වාමිනි මාගේ වස්තුවෙන් දෙකොන් පඞගුවක් දිළිඳුන්ට දෙමි, යමෙකුගෙන් වඤ්චාවෙන් මොකවත් ගත්තානම් ඔහුට සතර පඞගුවක් නැවත දෙමියි ස්වාමින්වහන්සේට කීවාය. ශුද්ධවූ ලූක් 19.

කව්රුවත් තමාගේ වියදමෙන් කිසි කලක යුද්ධකරණවා ඇද්ද, මුද්‍රික වත්තක් වවා එහි ඵල නොකන්නා කව්ද, නොහොත් එළු රැළක් කැමකවා උන්ගේ කිරි නොකන්නා කව්ද. 1 කොරින්ති 9.

අපි තුඹලාට ආත්මිකදේ වපුළෙමුනම් තුඹලාගේ ලෞකික දේ කපාගැන්ම මහත් එකක්ද. 1 කොරින්ති 9.

දිව්‍ය සේවය කරන්නෝ දේවස්ථානෙන් කන බවද, පූජාසනය ලඟම සේවය කරන්නෝ පූජාසනයට පඞගුකාරයෝ වෙනබවද නොදනිව්ද. එසේම

ශුභාරඤ්චි ප්‍රකාශකරන්නෝ ශුභාරඤ්චියෙන් ජීවිකාව ලබන්ට ස්වාමින්වහන්සේ නියමකළාය. 1 කොරින්ති 9.

ටිකක් වපුරන්නාට ටිකක් ලැබේ, බොහොම වපුරන්නාට බොහොම ලැබේ. සතුටු සිතින් දෙන්නාට දෙවියන්වහන්සේ ආදරේය, එබැවින් කනගාටුවෙන්වත් බලාත්කාරය නිසාවත් නොදී, එකඑකා තම තමාගේ හිතට ඡ්තෙනා හැටියට දේවා. 2 කොරින්ති 9.

වචනය ඉගෙණගන්නා තැනැත්තා තමාගේ සියලු සම්පතෙන් උගන්වන්නාට දේවා. නොරැවටෙව් දෙවියන්වහන්සේ රවටන්ට බැරිය. මනුෂ්‍යයෙක් තමා වපුරණ දේවල හැටියටම කපාගන්නවාඇත. ගලාති 6.

අපට ප්‍රස්තා ඇතිහැටියට සියල්ලන්ටම යහපත්කම් කරමුව, ප්‍රධානකොට ශ්‍රද්ධාවේ පවුලට යහපත්කම් කරමුව. ගලාති 6.

අපි ලෝකයට කිසි දෙයක් ගෙණාවේ නැත සැබැවටම අපට එයින් කිසි දෙයක් ගෙණයන්ටත් බැරිය, එබැවින් ලත් පමණකින් සතුටුවීම සමග දේවභක්තිය මහත් ලාභයක්වේ. 1 තිමෝති 6.

මේ ලෝකයේ වස්තුකාරයින්ට ත්‍යාගිවන්තයන් වෙන්ටද, දෙන්නට කැමැත්තන් වෙන්ටද, සදාකාල ජීවනය අල්වාගන්නා පිණිස මත්තට යහපත් අත්තිවාරමක් තබාගන්ටද ආඥා කරව. 1 තිමෝති 6.

නුඹලා පිරිසිදුවූවන්ට කළාවූද දැන් කරන්නාවූද සත්කාර, ඒනම් දෙවියන්වහන්සේගේ නාමයට නුඹලා විසින් පෙන්වන්ට යෙදුනාවූ ප්‍රේමය සහ වෙහෙස සිහිනොකරන්ට දෙවියන්වහන්සේ අධර්මිෂ්ඨකෙනෙක් නොවේය. හෙබ්‍රෙව් 4.

යහපත්කම් කරන්ටත් දානය දෙන්ටත් සිහිනැති නොකරව්, ඒ ප්‍රකාර පූජාවලට දෙවියන්වහන්සේ සතුටුය. හෙබ්‍රෙව් 13.



මේ ලෝකේ වස්තුව ඇත්තාවූ යමෙක් තමාගේ සහෝදරයා අසරණව ඉන්නවා දැකලත් ඔහුට අනුකම්පා නොකලොත් දෙවියන්වහන්සේට ප්‍රේමය ඔහු කෙරෙහි පවතින්නේ කොහොමද. 1 යොහන් 3.

නුඹ සන්තක දෙයින් දන් දීපන්න, කිසි දිළිඳෙකුගෙන් නුඹේ මූන කිසි කලක හරවා නොගන්න එවිට ස්වාමින්වහන්සේගේ මූන නුඹෙන් හරවාගන්ට නොයෙදේ. තොබියස් 4.

නුඹේ පොහොසත්කම ලෙස පිහිටවෙයන්න, නුඹට බොහොම ඇත්නම් බොහෝසෙයින් දීපන්න, නුඹට ස්වල්පයක් ඇත්නම් ඒ ස්වල්පයෙන් සන්තොෂව දෙන්ට උත්සාහ කරපන්න, එසේ කළාම හිඟ දවසට යහපත්වූ විපාක නුඹ එකතුකරගන්නානම් වේ. තොබියස් 4.

දිළිඳුන්ට අනුකම්පාකරන්නා යෙහෝවඃවහන්සේට නයට දුන්නානම්වේ, යෙහෝවඃවහන්සේද ඔහු දුන්දේ දෙවනු ඔහුට ගෙවනවා ඇත. හිතෝපදේශ 19.

දිළිඳුව රෝගාතුරව සිටින්නන් සලකන්නා ආශීර්වාදලත්තෙක්ය, පීඩා කාලේදී යෙහෝවඃවහන්සේ ඔහු ගලවාගන්නවා ඇත. ගීතිකා 41.

¶ මේ පද කියවන කල දියාකොන්වරු හා දේවස්ථානය ප්‍රවේසම්කරන්නෝවත් නියමකරණලද වෙන සුදුසු අයවල්වත්, දිළිඳුන් උදෙසා දෙන දේ හා සමුදාව කරණ අනිකුත් පූජාවලුත් පිරිස විසින් සම්පාදනයකර දුන් සුදුසු භාජනයකින් පිළිගෙණ ප්‍රෙස්බිතර් ලඟට ගෞරවයෙන් ගෙණත්වා ඔහුද ඒක ඔබිනලෙස පිළිගෙණ ශුද්ධවූ මේසේපිට තබාවා.

¶ තවද සහභාගිකම පැවැත්වීමක් ඇතිකල ප්‍රෙස්බිතර් ඊට සෑහෙන පමණ රොටි හා මුද්‍රිකපානය මේසේපිට තබාවා නැවතද මෙසේ කියාවා.

ක්‍රිසතුස්වහන්සේගේ මෙලොව යුද්ධකාරණ සභාවේ සියලු අන්දම් අයවල් උදෙසා අපි යාච්ඤාකරමු.

සියලු මනුෂ්‍යයන් උදෙසා යාච්ඤාද ඉල්ලීම්ද සතුතිද පවත්වන්ට තමන්ගේ ශුද්ධ අපොසතුද්වරයාලවා අපට ඉගැන්වූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, සර්ව සාධාරණ සභාව සැබෑවූ අභේදවූ අභිප්‍රාය ලැබ නිතර පවත්නා පිණිසද, මහොතතාම දෙව්වූ ඔබට අපි ඔප්පුකරණ [* අපේ දානවල් හා පූජාවල් සමග]අපේ යාච්ඤා ඉතා කාරුණාවෙන් පිළිගන්නා පිණිසද යටත්භාවයෙන් ඉල්ලමුව. ඔබගේ ශුද්ධවූ නාමය පිළිගන්නා සියල්ලන් ඔබගේ ශුද්ධවූ වචනයේ සැබෑකමට එක්සිත්කරවමින්, අභේදකමෙන් භක්තිවූ ප්‍රේමයෙන් හැසිරෙව්ව මැනව. ඔබගේ දාසිවූ වික්ටෝරියානම් අපේ රාජ මහේසිකාව යටතේ අපි භක්තියෙන් හා සමගිකමෙන් ආණ්ඩුකරණු ලබන පිණිස, උන්වහන්සේ ප්‍රධානකොට සියලු ක්‍රිස්තියානි රජවරුන්ද රාජ කුමාරයන්ද ආණ්ඩුකාරයන්ද ආරක්ෂාකොට ගලවන හැටියට අපි යාච්ඤා වෙමුව. උන්නාන්සේගේ මන්ත්‍රණසභාවේ සියල්ලන් හා උන්නාන්සේ යටතේ බලේලත් සියල්ලන්ද විසින්, නපුරුකම් සහ දුෂ්ටකම්වලට නිසි දඬුවම් ලැබෙන පිණිසද ඔබගේ සැබෑවූ ආගමත් මනුෂ්‍යයින්ගේ සුචරිතයත් රක්ෂාවෙන පිණිසද, සැබෑලෙස අගති නැතුව ධර්මතාවය පතුරුවන්ට පුළුවන්කළ මැනව. සර්වඥයිවූ පියානනි සියලු බිස්කොප්වරු සහ අනිකුත් දේවගැතියන් විසින්, තමන්ගේ හැසිරීමෙන් හා ඉගැන්වීමෙන් ඔබගේ සැබෑවූ ජීවනදායක වචනය ප්‍රකාශකරණ පිණිසත්, ඔබගේ ශුද්ධවූ සක්‍රමේන්තුවල් හරියාකාර විධිලෙස පවත්වන පිණිසත් ඔවුන්ට කාරුණා කළ මැනව. තවද මෙහි ඉදිරිපිට සිටින සමූහයා

* දානවල්හා පූජාවල් නොතිබිනම් (අපේ දානවල් හා පූජාවල් සමග) යන වචන නොකියවා හැරියයුතුය.



ප්‍රධානකොට ඔබගේ සියලු සේනාව විසින්, මොලොක් සිතින් හා නිසි ගෞරවයෙන් ඔබගේ ශුද්ධවූ වචනය අසා පිළිගන්ටත්, ඔවුන් ජීවත්ව සිටින සියලු දවස්වල පිරිසිදුකමින්හා ධර්මිෂ්ඨකමින් ඔබට සැබෑලෙස සේවයකරන්ටත්, ඔවුන්ට පුළුවන්වෙන පිණිස ඔබගේ සර්වඥයිවූ කාරුණාව දුනමැනව. තවද සවමිනි මේ තිරනැති ජීවිතයේදී හිංසාවෙන්වත්, දුකින්වත් හිඟකමෙන්වත් රෝගාතුරකමෙන්වත් වෙන කොයියාකාර විපත්තියකින්වත් පීඩා විඳින්නාවූ සියල්ලන් ඔබගේ යහපත්කමෙන් සනසා ඔවුන්ට පිහිටවෙන මෙන් ඉතා යටත්භාවයෙන් ඉල්ලමුව. තවද ඔබ අදහමින් ඔබට භයවෙමින් සිට මේ ජීවිතයෙන් තුරන්ව ගිය ඔබගේ සියලු දාසයන් උදෙසා අපි ඔබගේ ශුද්ධවූ නාමයට සතුතිකරණවත් ඇර, ඔවුන් සමග ඔබගේ සර්වඥයිවූ රාජ්‍යයේ පඞගුකාරයන් වෙන පිණිස ඔවුන්ගේ යහපත්වූ ආදර්ශය පසුව යන්ට අපට කාරුණාකරණමෙන්ද ඉල්ලමුව. පියානනි මේ සියල්ල අපේ එකම මැදහත්කාරද ආධාරකාරදවූ යේසුස් ක්‍රිසතුස්වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

¶ ශුද්ධ රාත්‍රිභෝජනය පැවැත්වීමක් තිබෙනකල, ඊට ප්‍රථම ඉරිදාවත් ශුද්ධ දවසකවත්, දේශනාව නොහොත් හොම්ලි කියවීම ඉවරවූනාම, දේවගැතියා විසින් ඒ බව දන්වන විට, මේ අවවාදය කියාවා.

ප්‍රිය තැනැත්තෙනි, අපේ පාපවලට කමාව ලබන්ටත් සර්වඥරාජ්‍යයේ පඞගුකාරයන්කරණු ලබන්ටත් එකම හේතුවක්වූ, ක්‍රිසතුස්වහන්සේගේ පූර්ණවනත කුරුසියේ වධවිදීම සිහිවෙන පිණිස, [අහවල්දවසේ]උන්වහන්සේගේ ශරීරයහා ලේවල මහත් සැපදායක සක්‍රමේන්තුව, සියලු භක්තිවනත ඇදහිලිකාරයන්ට දෙන්නට, දෙවියන්වහන්සේගේ පිහිටෙන් කල්පනාකරමි. එසේ හෙයින් අපේ සර්වඥයිය පියවූ සියළු බලඇති දෙවියන්වහන්සේ,

තමන්ගේ පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, අප වෙනුවට නසින්ට දුන්නා පමණක් නොව, ඒ ශුද්ධවූ සක්‍රමේන්තුවෙන් අපේ ආත්මික භෝජනය සහ රක්ෂාව වෙන්ටත් දුන් නිසා, අප විසින් උන්වහන්සේට ඉතා යටහත්භාවයෙන් හිතෙන්ම සතුතිකළයුතුය. ඒ ශුද්ධ භෝජනය සුදුසු ලෙස පිළිගන්නන්ට දිව්‍යවූ සැනසිලිවූ කාරණයක්ද, නුසුදුසුලෙස පිළිගන්නන්ට මහත් අනතුරුවූ කාරණයක්ද වන බැවින්, එම පිරිසිදු සංඥවේ උතුම්කමත්, ඒක නුසුදුසු ලෙස පිළිගන්නන්ගේ මහත් උපද්‍රවයත් හිතටගන්නා පිණිසද, දෙවියන් වහන්සේ ශුද්ධලියවිල්ලේ නියමකර තිබෙන මඞ්ගල්‍යවස්ත්‍ර ඇඳ නිර්මලවූ ශුද්ධකමින් ඒ ස්වර්ගීය මඞ්ගල්‍යයට පැමිණෙන පිණිසද, ඒ ශුද්ධ මේසයේදී ඔබින පඞ්ගුකාරයන්සේ පිළිගන්ට යෙදෙන පිණිසද, දෙවියන් ඉදිරියේ වඤ්චාකාරයන් ලෙස නොව යුතු ආකාරයෙන් නුඹලාගේ හෘද, ඉන් මෙදතුරේදී, විමසා බලන්ටෙයි කියා, මා විසින් නුඹලාට අවවාද කළ යුතුය.

මීට පැමිණෙන්ට නිසි ආකාරයනම්: පළමුකොට, තමුන් කළ ක්‍රියා දෙවියන්ගේ ආඥවලට එකඟද කියා පරීක්ෂාකොට, අභිප්‍රායෙන්වත් වචනයෙන්වත් ක්‍රියාවෙන්වත්, වරදකළබව දැනුනාම, යුතු ආකාරයෙන් මතු හැසිරෙන්ට ස්ථිරයෙන්ම නියමකරගෙණ, නුඹලාගේ වැරදි ගැණ දුක්ව, සියලු බල ඇති දෙවියන් ඉදිරියේ ඒවා උච්චාරණය කිරීමෙන් සහ

දෙවනුව, දෙවියන්වහන්සේට පමණක් නොව නුඹලාගේම අසල්වාසීන්ට නුඹලා වදරකළ බව දැනුනාම, ඔවුන් සමග එකඟව, නුඹලා විසින් ඔවුන්ට කළ සියලු අලාභ සහ නපුරුකම් ගැණ පුළුවන් පමණට එකට එක දී යුතුකම් කරන්ට සෑදී සිට, නුඹලා තමන්ගේ වැරදිවලට දෙවියන් අතින් කමාව ලබන්ට කැමතිව සිටිනලෙසම, තමන්ට



වැරදිකළවුන්ටත් කමාවෙන්ට සෑදී සිටිමෙන්ය. මෙලෙසට නොවීනම්, ඒ ශුද්ධවූ භෝජනය පිළිගැණීමෙන් නුඹලාගේ අච්වුව බරපතළකරගන්නවා පමණක්ය. එසේහෙයින් නුඹලාගෙන් යමෙක්, දෙවියන්වහන්සේට නිග්‍රහකරන්නෙක්වත්, උන්වහන්සේගේ වචනය වලක්වන්නෙක් නොහොත් එයට අපහාසකරන්නෙක්වත්, පරදාරිකයෙක්වත්, ක්‍රෝධයෙන් හෝ ඊර්ෂ්‍යාවෙන් හෝ වෙන යම් බලවත් වරදකින් හෝ සිටින්නෙක්වත් වීනම්, ඔහු ඒ ශුද්ධ සක්‍රමේන්තුව ගත් පසු, යක්ෂයා යූදස් තුළට පැමින්නා වාගේ ඔහු තුළටද පැමිණ, සියලු දුෂ්ටකම්වලින් ඔහු පූර්ණකොට, ඔහුගේ ශරීර ප්‍රාණ දෙක විනාශයට පත්කරණවා ඇත. එබැවින් නුඹලා තමන්ගේ පව් ගැණ පසුතැවිලිව මිස ඒ ශුද්ධවූ භෝජනයට ලංනොවෙල්ලාය.

තවද දේව කරුණාව විශ්වාසයට ගෙණ, සමාදාන හෘදයකින් මිස, ශුද්ධ භෝජනයට ලඟාවීම නොනිසි බැවින්, තමාගේ සිත නිශ්චලකරගන්ට බැරිව වැඩිදුර සැනසීම හා දැනුමැතිකම් ලබන්ට ඕනෑවූ කෙණෙක් නුඹලා අතරේ සිටිනම්, ඔහු තමාගේ සිත නිශ්චලකරගන්නා පිණිසද, සියලු සැක අනුමාන දුරුකරගන්නා පිණිසද, දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනයේ මෙහෙය කරණකොටගෙණ, නිදොස්වීමේ ගුණයත් දැනුමැතිකම් සහ අවවාදත් ලබන පිණිසද, මා ලඟටවත් දෙවියන්වහන්සේගේ වචනයේ නිපුණවූ ප්‍රඥවන්ත වෙන දේවගැතියෙක් ලඟටවත් ඇවිත් ඔහුගේ දුක් කියාදේවා.

¶ සහභාගිකම පැවැත්වීමේදී පඞ්ගුකාරයෝ ඒ ශුද්ධ සක්‍රමේන්තුව පිළිගැණීමට පහසුලෙස ඉන්නවිට ප්‍රෙස්බිතර් මේ අවවාදය කියාවා.

ස්වාමි තුළ අතිශයින් ප්‍රියවූ තැනැත්තෙනි, අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙත් ලේවලත් ශුද්ධවූ පඞ්ගුකාරකමට පැමිණෙන්ට කැම

තිවූ නුඹලා, ඒ රොට්ටියෙන් කන්නටත් ඒ කුසලා
නෙන් බොන්නටත් ලභාවෙන්ට පළමුවෙන්, තම
නමුන්ම තීක්ෂණලෙස පරීක්ෂාකොට විභාගකර
ගන්නා පිණිස ශුද්ධවූ පාවුල් විසින් සියල්ලන්ට අව
වාද කළහැටි කල්පනාවට ගන්ට නුඹලාට යුතුය.
සැබෑවූ පශ්චාත්තාපයෙන්ද ජීවමාන ඇදහිල්
ලෙන්ද මේ ශුද්ධවූ සක්‍රමේන්තුව අපි පිළිගණ්ණිමුනම්
මහත් ප්‍රයෝජන ලැබේ. ඒ ප්‍රයෝජන මේය—අපි
ආත්මික අර්ථයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ මාංසය
කනාවාය, උන්වහන්සේගේ ලේ බොනාවාය, අපි
ක්‍රිස්තුස්වහන්සේ තුළෙත් ක්‍රිස්තුස්වහන්සේ අප
තුළෙත් වාසයකරණවාය, අපි ක්‍රිස්තුස්වහන්සේ
සමගත් ක්‍රිස්තුස්වහන්සේ අප සමගත් එකගවෙන
වාය. එසේම මේ ශුද්ධවූ සක්‍රමෙන්තුව අපි අයුතු
ලෙස පිළිගණ්ණිමුනම් මහත් උපද්‍රවයක්වේ. ඒ උපද්‍ර
වය මේය—අපි අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ
ගේ ශරීරය හා ලේ ගැණ වරදකාරයෝ වෙමුව.
ස්වාමින්වහන්සේගේ ශරීරය නොවිමසා අපේම
වරද කමින් බොමින් සිටින්නෝ වෙමුව. අපට
විරුද්ධව දෙවියන්වහන්සේ උදහස්කරගණිමින්
නොයෙක් ආකාර රෝගවලින්ද මරණවලින්ද අපට
අච්චුකරවා ගන්ට උන්වහන්සේ සලස්වමුව. එබැ
වින් සහෝදරයෙනි ස්වාමින්වහන්සේ විසින්
විනිශ්චයකරන්ට නොයෙදෙන පිණිස නුඹලාම
විනිශ්චයකර ගණිල්ලා. නුඹලාගේ පසුගිය පව් නැ
ණ සැබෑලෙස පශ්චාත්තාපවෙල්ලා. අපේ ගැලවුම්
කාර ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ජීවමානවූ ස්ථිරවූ
ඇදහිමක් ඇතුව සිටිල්ලා. නුඹලාගේ හැසිරීම හරි
ගස්සාගණ සියලු මනුෂ්‍යයන් සමග සම්පූර්ණවූ ප්‍රේ
මයෙන් සිටිල්ලා. එවිට නුඹලා මේ ශුද්ධවූ සංඝවල
ඔබිනා පඞ්ගුකාරයෝ වෙති. තවද සියල්ලටම ප්‍රධා
නකොට අන්ධකාරයේද මරණුගේ සෙවනේද සිටි
කාලකණ්ණි පව්කාරයෝවූ අප, දෙවියන්වහන්සේ
ගේ දරුවන්කොට සදාකාල ජීවනයට උසස්කරණ



පිණිස කුරුසියේ මරණය අත්වා යටත්වූ, දෙවියන්
වහන්සේද මනුෂ්‍යයාදවූ, අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්
වහන්සේගේ මරණයෙන් හා වධවිඳිමෙන් ලෝක
යාට ලැබුනු ගැලවීම ගැණ, පියානන්ද පුත්‍රයානන්ද
ශුද්ධාත්මයානන්ද යන දෙවියන්වහන්සේට ඉතා
යටහත්භාවයෙන් හිත්වලින්ම සතුතිකරන්ට නුඹ
ලාට යුතුය. තවද අප උදෙසා මළාවූ අපේ ආචාර්යවූ
එකම ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ,
අපට මහත්වූ අනන්තවූ සැනසීම ලැබෙන පිණිස
තමන්ගේ ඉතා මහත්වූ සෙනේහයෙන් අප උදෙසා
වැගිරෙව් උන්වහන්සේගේ අනර්ඝවූ ලේවලින් ලැ
බුනු අප්‍රමාණ ප්‍රයෝජනත් අපි නිතර සිහිකරණ
පිණිස, තමන්ගේ සෙනෙහයේ උගස්වශයෙන්
ශුද්ධවූ සංඝ පිහිටුවා නියමකළාය. එබැවින් උන්ව
හන්සේගේ ශුද්ධවූ කැමැත්තට හා අභිප්‍රායට අපි සි
යලු ආකාරයෙන්ම යටහත්වෙමින්ද, අපේ ජීවිතයේ
සැම දවස්වල සැබෑවූ පිරිසිදුකමින් හා ධර්මිෂ්ඨක
මින් උන්වහන්සේට වැඩකරන්ට උත්සාහකර
මින්ද, උන්වහන්සේටත් පියානන්ටත් ශුද්ධාමයා
නන්ටත් නිතර සතුතිකරන්ට අපි අත්ශයින් බැඳී
සිටිනාලෙසම සතුතිකරමු. ආමෙන්.

¶ පසුව ශුද්ධ සහභාගිකම ලබන පිණිස ආවුන්ට ප්‍රෙස්බි
තර් මෙසේ කියාවා.

තමුන්ගේ පාපවල් උදෙසා සැබෑලෙස හිතෙන්ම
පසුතැවිලිවෙන්නාවූ,අසල්වාසීන් සමග ප්‍රේමයෙන්ද
ආදරයෙන්ද යුක්තව සිටින්නාවූ, මෙතැන් පටන්
දෙවියන්වහන්සේගේ ආඥාවල් පවත්වමින් උන්ව
හන්සේගේ ශුද්ධවූ මාර්ගවල හැසිරෙමින් අලුත්
ජීවිතයකින් පසුවෙන්ට කැමැත්තෙනි, නුඹලාගේ
සැනසීම පිණිස මේ ශුද්ධවූ සක්‍රමේන්තුව පිළිගන්ට
ශ්‍රද්ධාවෙන් ලංව, සංසුන්වූ දනනමස්කාරයෙන්,
සියලු බලඇති දෙවියන්වහන්සේට යටහත්ලෙස
නුඹලාගේ පාපොච්චාරණය කරපල්ලා.

¶ එවිට ශුද්ධවූ සහභාගිකම පිළිගන්ට කැමති සියල්ලන්ගේ නාමයෙන් දේවගැතියෙක් සියලු සමූහුව සමග තමනුත් යටහත්භාවයෙන් දනගසා මේ සාමාන්‍යවූ පාපොච්චාරණය කරමින් මෙසේ කියාවා.

සියළු බලඇති දෙවියන්වහන්ස, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියානන්වහන්ස, සියලු දේවල මැවුම්කාරයානන්වහන්ස, සියලු මනුෂ්‍යයන්ගේ විනිශ්චයකාරයානන්වහන්ස, මහෝත්තම දෙවිවූ ඔබවහන්සේට විරුද්ධව, වරින් වර සිතින් වචනෙන් ක්‍රියාවෙන් බරපතළ ලෙස අප විසින් කරන්ට යෙදුනු, නොයෙක් පාපවලුත් දුෂ්ටකමුත් නිසා, අපට විරුද්ධව ඔබගේ නිසිවූ උදහසත් ක්‍රෝධයත් පමුණුවාගත් අපි, ඒ පාපවලුත් දුෂ්ටකමුත් ප්‍රකාශකොට වැලපෙමුව. ඒ අපේ වැරදි ගැණ බලවත් ඕනෑකමකින් පසුතැවිලිවෙමින්, හිතෙන්ම දුක්වෙමුව. ඒවා සිහිකරමින් වැලපෙමුව. ඒවා ඉවසන්ට බැරි තරම් බරය. ඉතා කරුණාවන්තවූ පියාණෙනි, අපට කරුණාකළ මැනව. අපට කරුණාකළ මැනව. ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා, අපේ පසුගිය සියලු පව් කමාකොට, මින්මතු ඔබගේ නාමයේ තේජස හා ගෞරවය පිණිස, අලුත්වූ හැසිරීමකින් නිතර ඔබට සේවයකරන්ටත්, ඔබ ප්‍රශන්න කරන්ටත්, පුළුවන්කම අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට දුනමැනව. ආමෙන්.

¶ එවිට බිස්කොප් සිටිනොත් උන්වහන්සේවත් එසේ නැත්නම් ප්‍රෙස්බිතර්වත් නැගිට සිට සමූහුව දිසාවට හැරී මේ නිශ්ශේෂකිරීම කියාවා.

හිතෙන්ම පසුතැවිලිවෙමින් සැබෑවූ ශ්‍රද්ධාවෙන් තමන් දෙසට හැරෙණ සියල්ලන්ගේ පව් කමාකරණවාය කියා තමන්ගේ මහත් කරුණාවෙන් පොරොන්දුවූ අපේ ස්වර්ගීය පියවූ සියලු බලඇති දෙවියන්වහන්සේ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්ව



හන්සේ නිසා තුඹලාට කරුණාකරත්වා. තුඹලාගේ සියලු පාපයන් කමාකොට තුඹලා මුදහරින්වා. සියලු යහපත්කමේ තුඹලා ස්ථිරකොට පිහිටුවත්වා. සදාකාල ජීවනයටද තුඹලා පමුණුවත්වා. ආමෙන්.

¶ ඊළඟට ප්‍රෙස්බිතර් මෙසේ කියාවා.

අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ දෙසට සැබෑ ලෙස හැරෙණ සියල්ලන්ට උන්වහන්සේ කියන සැනසිලි වචන අසාපල්ලා.

වෙහෙසවූ ඉතා බරඋසුලන සැම දෙනම මා ලඟට වරෙව් මම තොපට සැනසීම දෙමි. මතෙව් 11. 28.

දෙවියන්වහන්සේ තමන්ගේ ඒකජාත පුත්‍රයා අදහගන්නා සියල්ලෝම විනාශ නොව සදාකාල ජීවනය ලබන පිණිස උන්වහන්සේ දෙනතරම් ලොවට කරුණාකළාය. යොහන් 3. 16.

තවද ශුද්ධවූ පාවුල් කියන හැටිද අසාපල්ලා.

පව්කාරයන් ගලවන්ට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආවාය කීම සත්‍යවූ සියලු මනුෂ්‍යයන් විසින් පිළිගන්ට යුතුවූ කීමක්ය. 1 තිමෝති 1. 15.

තවද ශුද්ධවූ යොහන් කියන හැටිද අසාපල්ලා.

යමෙක් පව් කළොත් පියානන් වෙත ධර්මිෂ්ඨවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේනම් මැදහත්කාරයෙක් අපට ඇත උන්වහන්සේ අපේ පව් නසන පූජාවය. 1 යොහන් 2. 1.

¶ ඉන්පසුද ප්‍රෙස්බිතර් මෙසේ කියාවා.

ප්‍රෙස්බිතර්—තුඹලාගේ හෘදයන් ඔසවාපල්ලා.

උත්තරය—ස්වාමීන් කෙරෙහි අපි ඒවා ඔසවමුව.

ප්‍රෙස්බිතර්—අපේ ස්වාමිවූ දෙවියන්වහන්සේට ස්තුති කරමු.

උත්තරය—එසේ කිරීම අපට නිස්සන්දේහ සුදුසු සන්ද වේ.

¶ එවිට ප්‍රෙස්බිතර් ස්වාමීන්ගේ මේසය දෙසට හැරී මෙසේ කියාවා.

ශුද්ධ පියවූ * සියලු බලඇති සදාකාල දෙවිවූ ස්වාමීනි, අප විසින් සියලු කාලවලදීද සියලු ස්ථානවල දීද ඔබට ස්තුතිකරන්ට සුදුසුද යුතුද කටයුතුදවේ.

¶ ඒ ඒ කාලවලට නියමවූ ආරම්භවල් තිබෙනවානම් මේ ලඟට කියන්ට යෙදේ, නැත්නම් එකෙණෙහිම මෙහි පහළ ලියවී තිබෙන ලෙස කියාවා.

එබැවින් ශුද්ධවූ, ශුද්ධවූ, ශුද්ධවූ, සේනාවන්ගේ දෙවි ස්වාමීනි, ස්වර්ගයත් පොළවත් ඔබගේ තේජසෙන් පූර්ණය කියාත්, මහෝත්තමවූ ස්වාමීනි ඔබවහන්සේට ගෞරව වේවයි කියාත් නිතරම ප්‍රශංසාකරමින්, දූතයන්ද නායක දූතයන්ද සියලු ස්වර්ගීය සමූහයද සමග ඔබගේ ප්‍රශංසනීයවූ නාමයට ස්තුති වර්ණනා කරමුව. ආමෙන්.

---

## නියමවූ ආරම්භවල්ය.

ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්ති දිනදීත් ඉන්පසු සත් දවසක් යනතුරුත් කියන්ට යුතු ආරම්භය.

ඒ මක්නිසාද කිවොත් ඔබගේ එකම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මෙබඳු කාලයේ උපදින පිණිස ඔබ දුන් නිසාය. උන්වහන්සේ සියලු පාපවලින් අප මුදා පිරිසිදුකරණ පිණිස ශුද්ධාත්මයානන්ගේ කාර්යකාමින් තමන්ගේ මව් වන මරියානම්වූ කන්‍යාවගේ ස්වභාවෙන් සැබෑවූ මනුෂ්‍යයෙක්ව පව් කිලුටු නැත්තෙක්විය.

පස්ඛාමංගල්‍ය දවසෙත් ඉන් පසු සත් දවසක් යනතුරුත් කියන්ට යුතු ආරම්භය.

ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තේජවන්තවූ නැවත නැගිට්ම උදෙසා ප්‍රධානකොට ඔබට ස්තුතිකරන්ට අපට යුතුය.

---

* ශුද්ධ පියවූ යන වචන ත්‍රිත්වයේ ඉරිදා අත්අරින්ට යුතුය.



අප උදෙසා පූජාවී ලෝකයාගේ පාපය දුරුකළ සැබෑවූ පස්ඛාමංගල්‍යයේ බැටළු පැටවා උන්වහන්සේය. උන්වහන්සේ මැරුම්කෑමෙන් මරණය විනාශකොට තමන්වහන්සේගේ නැවත නැගිටීමෙන් සදාකාල ජීවනය අපට පැමිණෙව්වාය.

ස්වර්ගයට නැගීමේ දවසෙත් ඉන් පසු සත් දවසක් යනතුරුත් කියන්ට යුතුවූ ආරම්භය.

ඔබගේ ඉතා ප්‍රිය පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අප විසින් එසේ කරන්ට යුතුය. උන්වහන්සේගේ තේජවන්තවූ නැවත නැගිටීමෙන් පසු තමන්ගේ සියලුම අපොස්තුළුවරුන්ට ප්‍රකාශයෙන් පෙණී, තමන්වහන්සේ හිටින ස්ථානයට අපිත් නැගී උන්වහන්සේ සමග තේජසේ රජකම්කරණ පිණිස අපට ස්ථානයක් සදා දීමට ඔවුන් බලා සිටිද්දී ස්වර්ගයට නැගුණාය.

පැන්තකොස්ත දවසෙත් ඉන්පසු හදවසක් යනතුරුත් කියන්ට යුතුවූ ආරම්භය.

අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අප විසින් එසේ කරන්ට යුතුය. උන්වහන්සේගේ ඉතා සත්‍යවූ පොරොන්දුව ලෙස මෙවැනි කාලයේදී අදිස්සි තද සුළඟක මහත් ශබ්දයෙන් ශුද්ධාත්මය ස්වර්ගයෙන් පහළව අපොස්තුළුවරුන්ට උගන්වන පිණිසත් සියලු සත්‍යකමට ඔවුන් පමුණුවන පිණිසත් ගිනි දිව් මෙන් ඔවුන් මත්තට බැස ශුභාරංචි සියලු ජාති මනුෂ්‍යයන්ට නිතර ප්‍රකාශකරණ පිණිස, නොයෙක් භාෂාවල් කථාකිරීමත් නිර්භීතකමත් ස්ථිරවූ භක්තිවන්තකමත් ඔවුන්ට දුන්නාය. ඒ ශුභාරංචිය කරණකොටගෙණ අපි අන්ධකාරයෙන් හා මුළාවීමෙන් ගැලවී දීප්තිමත්වූ ආලෝකයටත් ඔබ සහ ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැණ සත්‍යක ලෙස දැනගැන්මටත් පැමිණුනෙමුව.

### ත්‍රිත්වයේ මඞ්ගල්‍ය දවසේ පමණක් කියන්ට යුතු ආරම්භය.

ඔබවහන්සේ එකම දෙවියන්වහන්සේය, එකම ස්වාමීන්වහන්සේය, නුමුත් එක්කෙනෙක් නොව එකම භාවයේ තුන්දෙනෙක්ය. පියානන්ගේ තේජස ගැණ අපි විශ්වාසකරණ දේ වෙනසක්වත් අසමාන කමක්වත් නැතුව පුත්‍රයානන්ගේ හා ශුද්ධාත්මයානන්ගේ තේජස ගැණත් අපි විශ්වාසකරමුව.

¶ මේ ආරම්භවලින් කොයි එකක් නුමුත් කියෙව් කඩිනමින් මෙහි පහළ පෙණෙන ලෙස කියන්ට නොහොත් ගීතිකාකරන්ට යෙදේවා.

එබැවින් ශුද්ධවූ, ශුද්ධවූ, ශුද්ධවූ, සේනාවන්ගේ දෙවි ස්වාමීනි ස්වර්ග්ගයත් පොළවත් ඔබගේ තේජසෙන් පූර්ණ්ණය කියාත්, මහෝත්තමවූ ස්වමීනි ඔබට ගෞරව වේවයි කියාත් නිතරම ප්‍රශංසා කරමින් දූතයන්ද නායක දූතයන්ද සියලු ස්වර්ග්ගීය සමූහයද සමග ඔබගේ ප්‍රශංසනීයවූ නාමයට සතුති වර්ණ්ණනා කරමුව. ආමෙන්.

¶ ඉත්පසු ප්‍රෙස්බිතර් ස්වාමීන්ගේ මේසේ ලඟ දනගසා සහභාගිකම ලබන්ට ආ සියල්ලන් වෙනුවෙන් මේ යාච්ඥාව කියාවා.

කරුණාවනතවූ ස්වාමීනි, ඔබගේ අනේකාකාර මහත් කරුණාවල් විශ්වාසකරමින් මිස අපේ ධර්ම්මිෂ්ඨකම් විශ්වාසකර ඔබගේ මේසේට ලඟාවෙන්ට හිත් දැඩිකම් නොගතිමුව. අපි ඔබගේ මේසේ යට තිබෙන කෑබලිවත් එකතුකරගන්ට නොවටින්නෝය. නුමුත් ඔබ නිතර කරුණා කරණ ස්වභාවක් ධරන්නාවූ වෙනස් නොවෙන්නාවූ ස්වාමීන්ය. එබැවින් දයාවනතවූ ස්වාමීනි, ඔබගේ ප්‍රේම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසා අපේ පාපවූ ශරීර පිරිසිදුවෙන ලෙසටත්, උන්වහන්සේගේ ඉතා අනර්ඝවූ ලේ නිසා අපේ ප්‍රාණ



සේදෙන්ට යෙදෙන ලෙසටත්, අපි උන්වහන්සේ තුළේද උන්වහන්සේ අප තුළේද නිතර වාසය කරණ ලෙසටත්, උන්වහන්සේගේ මාංස කන්නටද උන්වහන්සේගේ ලේ බොන්නටද අපට කරුණාකළ මැනව. ආමෙන්.

¶ එවිට ප්‍රෙස්බිතර් මේසේ ලඟ සිට සමුදුව ඉදිරියේ ඔබිනා ලෙස පහසුවෙන් රොටි කඩන්ටත් කුසලාන ගන්ටත් පුළුවන්වෙන හැටියට රොටි හා මුද්‍රිකපානය මේසේපිට තබා පේකිරීමේ යාච්ඥාව පහත පෙණෙන ලෙස කියාවා.

කුරුසියපිටදී තමන්ම එක් වරක් පූජාවීමෙන් මුලු ලෝකයාගේ පව් වෙනුවට සම්පූර්ණ්ණ අඩුඑහුඩක් නැති සෑහෙන යාගයකුත් පූජාවකුත් පඩුරකුත්වී, තමන්ගේ ඒ අනර්ඝ මරණය නිතර සිහිවීමට නියමයක් තබා, නැවත එනතුරු ඒ නියමය පවත්වවිය කියා තමන්ගේ ශුද්ධවූ ශුභාරංචිවල අපට ආඥාකළ, යේසුස් ක්‍රිස්තුස්නම් එකම පුත්‍රයා අපේ ගැලවීම උදෙසා කුරුසියේ මරණය ලබන පිණිස ස්වකීය මහත් කරුණාවෙන් දුන්නාවූ, අපේ ස්වර්ග්ගීය පියවූ සියලු බලඇති දෙවියන්වහන්ස, කරුණාවනතවූ පියානන්වහන්ස, අපේ වචන අසා, ඔබගේ පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධවූ නියෝගය ලෙස උන්වහන්සේගේ මරණය හා වධවිදීම සිහිවීමට, මේ ඔබගේ මැවිලිවූ රොටි සහ මුද්‍රිකපානය පිළිගැණීමෙන්, උන්වහන්සේගේ ඉතා ආශිර්වාදලත් ශරීරයෙත් ලේවලත් පඞ්ගුකාරයෝ වෙන්ට අපට පුළුවන්කරණ මෙන් ඉතා යටත්භාවයෙන් ඉල්ලාසිටිමුව. උන්වහන්සේ පාවාදුන් රාත්‍රියේම (1) රොටි අරගෙණ සතුතිකොට (2) කඩා ගෝලයන්ට දී අරගණ කාපල්ලාය. (3) නුඹලා නිසා දුන් මාගේ ශරීරය මේය, මා සිහිවීම

(1) මෙහිදී ප්‍රෙස්බිතර් රොටිමණ්ඩය අතට ගණීවා.

(2) මෙහිදී රොටි කඩාවා.

(3) මෙහිදී සියලු රොටිවලම අත තබාවා.

පිණිස මේක කරපල්ලායයි කීවාය. එසේම කැවායින් පසු(1) කුසලාන අරගෙණ සතුතිකොට ඔවුන්ට දී නුඹලා සියල්ලෝම මෙයින් බීපල්ලාය. මක්නිසාද නුඹලා උදෙසාත් බොහෝ දෙනා උදෙසාත් පව් මිදීම පිණිස වගුළාවූ අලුත් ගිවිසුමේ මාගේ (2)ලේ මේය. නුඹලා යම් පමණ වර මෙයින් බොනවාද එපමණ වර මා සිහිවීම පිණිස මේක කරපල්ලායයි කීවාය. ආමෙන්.

¶ පසුව සියල්ලෝම සංසුංව දනගසා පළමුකොට දේවගැතියා රාත්‍රිභෝජනයේ දෙවශීභයෙන්ම පෝෂ්‍යව නැගිට, බිස්කොප්වරුවත් ප්‍රෙස්බිතර්වරුවත් දියාකොන්වරුවත් ඉන්නවානම් ඔවුන් අතට දී ඊලඟට සමූදුවගේ අතට ක්‍රමයෙන් දේවා. කාට නුඹුත් රෙටි පිළිගන්වනකොට මෙසේ කියාවා.

නුඹ උදෙසා දුන්නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙන් නුඹේ ශරීරයත් ආත්මයත් සදාකාල ජීවනයට රක්ෂාවේවා. නුඹ උදෙසා ක්‍රිස්තුස්වහන්සේ මළායයි සිහිකරමින් මේක ගෙණ ශ්‍රද්ධාවෙන් හා සතුති පැවැත්වීමෙන් කාමින් නුඹේ හෘදයෙන් උන්වහන්සේ අනුභවකරපන්න.

¶ කුසලාන දෙන දේවගැතියා කාට නුඹුත් ඒක දෙනකොට මෙසේ කියාවා.

නුඹ උදෙසා වගුළාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් නුඹේ ශරීරයත් ආත්මයත් සදාකාල ජීවනයට රක්ෂාවේවා. නුඹ උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ ලේ වගුළායයි සිහිකරමින් මේවා පානයකොට උන්වහන්සේට සතුතිකරන්නෙක් වෙයන්න.

(1) මෙහිදී කුසලාන අතට ගණීවා.

(2) මෙහිදී පේකරන්ට නිසි මුද්‍රිකපානය තිබෙන සියලු භාජනවල අත තබාවා.



¶ සියල්ලෝම පෝෂ්‍යයෙවන්ට පළමුවෙන් පේකරපු රෙටිවත් මුද්‍රිකපානයවත් මදිවුනොත් පළමු නියමකළ ක්‍රමයෙන් ප්‍රෙස්බිතර් අමුතුවෙන් පේකරගණීවා. රෙටිවලට ආශිර්වාද කරන්නේ "අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ පාවාදුන් රාත්‍රියේම රෙටි අරගෙණ" යනාදිය කීමෙන්ය. කුසලානට ආශිර්වාද කරන්නේ "එසේම කෑවායින් පසු කුසලාන අරගෙණ" යනාදිය කීමෙන්ය.

¶ සියල්ලෝම පෝෂ්‍යයවූ පසු දේවගැතියා ස්වාමින්ගේ මේසේ ලඟට හැරී ඇවිත් පේකරපු දෙයින් ඉතිරිවූවා මේසේ පිට ගෞරවයෙන් තබා සුදු රෙද්දකින් වසාවා.

¶ පසුව ප්‍රෙස්බිතර් ස්වාමින්ගේ යාච්ඤාව කියාවා. සෙනගද ඔහු අනුව යාච්ඤා පද එකක් පාසා කියත්වා.

ස්වර්ගයේ සිටින අපේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ, අපේ වැරදිවලටත් කමාවුව මැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා, නපුරෙන් අප ගලවාගත මැනව. මක්නිසාද රාජ්‍යයත් බලයත් මහිමතාවයත් සදාකල්ම ඔබගේය. ආමෙන්.

¶ ඊලඟට මෙහි පහළ පෙණෙන ලෙස කියාවා.

ස්වර්ගීය පියවූ ස්වාමිනි, ඔබගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසලෙන්ද මරණයෙන්ද උන්වහන්සේගේ ලේ විශ්වාසකිරීමෙන්ද, අපි සහ ඔබගේ මුලු සභාව පාපවල කමාවත් උන්වහන්සේගේ වධවිඳිමේ අනික් සියලු ප්‍රයෝජනත් ලබන හැටියට කාරුණකරණමෙන් ඔබගේ යටහත් දාසයෝවන අපි ඔබගෙන් ඉල්ලමින්, මේ අපේ සතුති ප්‍රශංසාකිරීම නැමති පූජාව ඔබගේ පිය සෙන්හය නිසා කාරුණාවෙන් පිළිගන්න ලෙස මුලු හෘදයෙන්ම කැමතිව සිටිමුව. තවද ස්වාමිනි ඔබගේ මේ ශුද්ධවූ රාත්‍රිභෝජනය අනුභවකළාවූ අපි සියල්ලෝ ඔබගේ

පිහිටෙන්ද ස්වර්ගීයවූ ආශිර්වාදයෙන්ද පූර්ණවෙන පිණිස කාරුණාකාරණයෙන් ඔබගෙන් ඉතා යටහත්භාවයෙන් ඉල්ලමින්, අපේ ආත්මවල්ද ශරීරවල්ද ඔබට යුතුවූ පිරිසිදුවූ ජීවමාන යාගයක් වෙන පිණිස පූජාකරමින් බාරදෙමුව. තවද අපේ පව් බෝනිසා කිසි යාගයක් ඔබට පූජාකරන්ට අපි නොවටිනා නුමුත්, අපේ යෝග්‍යකම නොකිරා අපේ වරදවලට අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ක්ෂමාවී, අප විසින් කරන්ටම නිස්සක්වූ මේ අපේ වැඩෙත් සේවයත් පිළිගන්න හැටියට ඔබගෙන් යාච්ඤාව ඉල්ලා සිටිමුව. උන්වහන්සේ කාරණකොටගෙණද උන්වහන්සේ සමගද ශුද්ධාත්මයානන්වහන්සේ සමගද ඒකත්වයක්වූ සියලු බලඇති පියානනි, ඔබට සියලු ගෞරවයත් ප්‍රශංසාවත් සදාකාලේටම වේවා. ආමෙන්.

නොහොත් මේ යාච්ඤාව.

සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස ඔබ මේ ශුද්ධවූ සංඥාවල් යුතු ආකාරයෙන් පිළිගත්තාවූ අප, ඔබගේ පුත්‍රවූ අපේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝවූ ශරීරය හා ලේ නැමති ආත්මික භෝජනයෙන් රක්ෂාකිරීමට කාරුණාකළ නිසාද, ඔබගේ පිහිට සහ යහපත්කම අපට ඇති බවත් ඔබගේ පුත්‍රයාගේ ශරීරයට ආදර්ශවූ ආශිර්වාදලත් සියලු විශ්වාස සේනාව නැමති සත්‍යවූ අවයවයන් කොට අප සම්බන්ධකර තැබූ බවත්, ඔබගේ ප්‍රේම පුත්‍රයාගේ ඉතා අනර්ඝවූ මරණයේ හා වධවිඳීමේ කුසල් නිසා ඔබගේ සදාකාලවූ රාජ්‍යයේ අපි උරුමක්කාරයෝවූ බවත් ප්‍රකාශකළ නිසාද, අපි ඔබට හිතෙන්ම ස්තුති කරමුව. තවද ස්වර්ගීයවූ පියානනි, ඒ ශුද්ධ සමාගමේ නිතර වාසයකරන්ටත් ඔබ විසින් නියමකළාවූ සියලු යහපත් ක්‍රියාවල් කරන්ටත් අපට පුළුවන්වෙන පිණිස ඔබගේ කාරුණාවෙන් අපට පිහිටවෙන ලෙස අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි



ඉතා යටහත්භාවයෙන් ඔබට යාච්ඤාවෙමුව. උන්වහන්සේට සහ ඔබවහන්සේටද ශුද්ධාත්මයානන්වහන්සේටද සියලු ප්‍රශංසාවත් ගෞරවයත් සදාකාලේටම වේවා. ආමෙන්.

¶ පසුව මෙසේ කියාවා නොහොත් ගීතිකා කරවා.

උසස්ථානයේ වසන දෙවියන්වහන්සේට මහිමතාවයත් භූමියෙහි සමාදානයත් මනුෂ්‍යයන්ට කාරුණාවත් වේවා. ස්වාමීවූ දෙවියන්වහන්ස, ස්වර්ගීය රජ්ජුරුවන්වහන්ස, සියලු බලඇති පියවූ දෙවියන්වහන්ස, ඔබගේ මහත්වූ මහිමතාවය උදෙසා අපි ඔබට ප්‍රශංසාත් ස්තුතිත් නමස්කාරත් වර්ණනාත් කරමුව. දෙවියන්වහන්සේගේ ඒකජාත පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්නම් ස්වාමීනි, ලෝකයේ පව් දුරුකරණ ස්වාමීවූ දෙවියන්වහන්ස, දෙවියන්වහන්සේගේ බැටළුපැටියානනි, පියානන්ගේ පුත්‍රයානනි, අපට කාරුණාකළ මැනව. ලෝකයේ පව් දුරුකරන්නානෙනි, අපට කාරුණාකළ මැනව. ලෝකයේ පව් දුරුකරන්නානෙනි, අපේ යාච්ඤාවල් පිළිගත මැනාව. පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ වැඩහිඳින්නානෙනි, අපට කාරුණාකළ මැනාව. ඔබ පමණක්ම ශුද්ධවන්තය, ඔබ පමණක්ම ස්වාමීය. ක්‍රිස්තුස්වහන්ස ශුද්ධාත්මයානන් සමග පියවූ දෙවියන්වහන්සේගේ තේජසේදී ඔබ අතිශයින්ම උතුම්ය. ආමෙන්.

¶ එවිට බිස්කොප් සිටිතොත් උන්නාන්සේ විසින්වත් නැත්නම් ප්‍රෙස්බිතර් විසින්වත් මේ පහත සදහන්වෙන ආශිර්වාදයෙන් සමුදුව යන්ට අරීවා.

සියලුම ඥාන අතික්‍රාන්තවූ දෙවියන්වහන්සේගේ සමාදානය, නුඹලාගේ හෘදයන් හා චිත්තයන් දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ පුත්‍රවූ අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැණීමේ සහ ප්‍රේමවීමේ රක්ෂාකොරේවා. පියානන්ද පුත්‍රයානන්ද ශුද්ධාත්මයානන්ද යන සියලු බලඇති දෙවි

යන්වහන්සේගේ ආශිර්වාදය නුඹලා අතරේ වේවා. නුඹලා සමගද නිතර පවතීවා. ආමෙන්.

¶ සහභාගිකම පැවැත්වීමක් නොතිබෙනොත් දන් දීමට පසු මේ ලුහුඬු යාච්ඤාවලින් එකක්වත් වැඩියක්වත් කියන්ට යුතුය. තවද උදය යාච්ඤාව හෝ සවස යාච්ඤාව හෝ පැවැත්වීමෙදී කියන ලුහුඬු යාච්ඤාවලටවත් සහභාගිකමටවත් ලිතනිය කියවීමටවත් පසු දේවගැතියාට අභිප්‍රායවූ හැටියකින් මේවා කියන්ට යුතුය.

ස්වාමිනි අපේ මේ කන්නලව්කිරීම්වලදීද යාච්ඤාකිරීම්වලදීද කරුණාවෙන් අපට උපකාරකොට, මේ මරණීයවූ ජීවිතයේදී පැමිණෙන සියලුම විප්‍රකාරවල් හා සිද්ධවීම්වලදී, අපි ඔබගේ ඉතා කරුණාවන්තවූ සූදානම්වූ උපකාරයෙන් නිතර ආරක්ෂාකරණු ලැබ, ඔබගේ දාසයෝ වන අපි සදාකාලගැලවීමට පැමිණෙන පිණිස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ මාර්ග සෘජුකළ මැනව. ආමෙන්.

සියලු බලඇති ස්වාමිනි, සදාකාලවූ දෙවියන්වහන්ස, මෙලොවදී සහ පරලොවදී ඔබගේ ඉතා බලවත්වූ ආරක්ෂාවෙන් අපේ ශරීර ප්‍රාණ ප්‍රවේසම්කරන්ට යෙදෙන පිණිස ඔබගේ නීතිය ලෙස පිළිපැදීමෙහිද, ඔබගේ ආඥා ලෙස ක්‍රියාකිරීමෙහිද, අපේ හිත් සහ ශරීර පිහිටුවා පිරිසිදුකොට ආණ්ඩුකරන්ට කරුණාකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

සියලු බලඇති දෙවියන්වහන්ස, අද දවසේ අපේ පිටතවූ කන්වලින් ඇසූ වචන ඔබගේ කරුණාවෙන් අපේ හිත් ඇතුළේ පිහිටුවන්ටයෙදී, ඔබගේ නාමයේ ගෞරවය හා ප්‍රශංසාව පිණිස යහපත් හැසිරීම නැමති ඵල දරන්ට අපට පුළුවන්කරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.



ස්වාමිනි අපේ සියලු ක්‍රියාවල් ඔබ කෙරෙහි පටන්ගැන්මෙන්ද පැවැත්වීමෙන්ද අන්තිමකිරීමෙන්ද ඔබගේ ශුද්ධවූ නාමයට ගෞරවකරන්ටත් පසුව ඔබගේ කරුණාවෙන් සදාකාල ජීවනය ලබන්ටත් අපට පුළුවන්වෙන පිණිස, අපේ සියලු ක්‍රියාවලදී ඔබගේ ඉතා දයාවන්තවූ කරුණාවෙන් අපට පෙරටුව යමින් ඔබගේ නිරන්තරවූ පිහිටෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අප වැඩිදියුණුකළ මැනව. ආමෙන්.

අපි ඉල්ලන්ට පළමුවෙන් අපේ ඕනෑකමුත්, අපි ඉල්ලන කල අපේ අඥානකමත් දන්නාවූ, සියලු ප්‍රඥාවේ උල්පතවූ සියලු බලඇති දෙවියන්වහන්ස, අපේ දුර්වලකම්වලට අනුකම්පාකරණමෙන්ද, අපේ නොවටිනාකම් නිසා ඉල්ලන්ට නොහැකිවූ, අපේ අඥානකම නිසා ඉල්ලන්ට බැරිවූ දේ, ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුසල් නිසා අපට කරුණාවෙන් දෙන මෙන්ද යාච්ඤාවෙමුව. ආමෙන්.

තමන්ගේ පුත්‍රයානන්ගේ නාමයෙන් යාච්ඤාවෙන්නන්ගේ ඉල්ලීම් අසන්ට පොරොන්දුවුනාවූ සියලු බලඇති දෙවියන්වහන්ස. අපි ඔබට දැන් කළාවූ යාච්ඤාවල් හා කන්නලව් කරුණාවෙන් කන්දී අසා අපේ හිඟකම්ත් පහවීම ලබන පිණිසත්, ඔබගේ ගෞරවය පූජාකිරීම පිණිසත්, ඔබගේ අභිප්‍රායට එකඟලෙස ශ්‍රද්ධාවෙන් අපි ඉල්ලූ දේ සාර්ථකයෙන් අපට ලැබෙන මෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ ඉරිදා දවස් සහ අනිත් ශුද්ධවූ දවස්වලදී ශුද්ධ භෝජනය පැවැත්වීමක් නැත්නම් එහි නියමකර තිබෙන ක්‍රමය ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොව ශුද්ධකරණ සභාවේ සියලු අන් දම් අයවල් උදෙසා කියන්ට තිබෙන සාමාන්‍යවූ යාච්ඤාව දක්වා ඉහත ලියවී තිබෙන ලුහුඬු යාච්ඤාවලින් එකක් දෙකක් සමග කියා අගදී ආශීර්වාදකිරීම කියන්ට යුතුය.

¶ තවද ප්‍රෙස්බිතර්ගේ හිත ලෙස ඔහු සමග පිළිගැණීමට සුදුසුවූ ස්වල්පදෙනෙක් සිටිතොත් මිස ස්වාමින්ගේ ශුද්ධ භෝජනය පැවැත්වීමක් සිදුනොවෙයි. ඇරත් ශුද්ධ භෝජනය පිළිගන්ට සුදුසු මනුෂ්‍යයන්ගෙන් විසිදෙනෙකුට වඩා යම් පිරිසක නොසිටින නුමුත් ප්‍රෙස්බිතර් සමග හතරදෙනෙක්වත් ස්වල්පවශයෙන් තුන්දෙනෙක්වත් නොසිටිතොත් ශුද්ධ භෝජනය පැවැත්වීමක් සිදුවෙන්නේ නැත.

¶ තවද බිස්කොප්වරුන්ගේ දේවස්ථානවලදීත් බොහෝ ප්‍රෙස්බිතර්වරු හා දියාකොන්වරු අඩුත්තුවූ දේවස්ථානවලදීත් ශුද්ධ භෝජනය අනුභවකිරීමට යම් වැලැක්මක් නැත්නම් මෙකී සියල්ලෝම ස්වල්ප වශයෙන් සියලු ඉරිදාවල ප්‍රෙස්බිතර් සමග රාත්‍රිභෝජනය පවත්වත්වා.

¶ රොටි හා මුද්‍රිකපානයෙන් යමක් පේනොකොට ඉතුරුව තිබේනම් දේවගැතියාගේ ප්‍රයෝජනයට ගණිවා; නුමුත් පේකළාවූ ඒවා ඉතුරුව තිබේනම් දේවස්ථානයෙන් ගෙණනොගොස් ආශීර්වාදයෙන් පසු දේවගැතියත් ඔහු විසින් කැඳවන්ට යෙදුනු පඬුකාරයොත් සුදුසුවූ ගෞරවයෙන් ඒවා කන්ට යුතුය.

¶ ඒ ඒ පිරිසට අඩුත්තු තැනැත්තෝ අවුරුද්දපතා ස්වල්ප වශයෙන් තුන්වරක් ශුද්ධ භෝජනය පවත්වත්වා, ඒ අතර පස්ඛාමඞ්ගල්‍ය ප්‍රස්තාව එක්වරක්වෙයි, අවුරුදු පතා ඒ ඒ දේවස්ථානයට අඩුත්තු සියලු තැනැත්තෝ දේවගැතියා නොහොත් ඔහු විසින් නියමකර තිබෙන තැනැත්තා සමග තමුන්ගේ ගණන්බලා තමුන් විසින් ගෙවන්ට නිසි දේවස්ථානයේ නියමවල් ගෙවත්වා.

¶ දිව්‍ය මෙහෙයට පසු දන්දීමට එක්කාසුකළාවූ මිල දේවගැතියාගේ සහ දේවස්ථානයේ ප්‍රවේසම්කාරයන්ගේ අභිප්‍රාය හැටියට භක්තිවූ කාරණවලටවත් දිළිඳුන්ට දීමටවත් වියදම්කරත්වා, නමුත් ඔවුන් ඒ ගැණ එකඟනූනොත් නායකතැනගේ කැමැත්ත හැටියට ඒ මිල වියදම්කරන්ට යෙදේ.

දේවස්ථානයේදී

# ළදරුවන්ගේ

## ප්‍රකාශවූ බව්තිස්මකිරීමේ ක්‍රමය.

---

¶ බව්තිස්මකරණවිට පිරිමි ළමයෙකුටනම් ඇපකාර පියවරු දෙන්නෙක්ද ඇපකාර මවෙක්ද ඕනෑබවත්, ගැණු ළමයෙකුටනම් ඇපකාර පියෙක්ද ඇපකාර මව්වරු දෙන්නෙක්ද ඕනෑබවත් දැනගත යුතුය.

¶ බව්තිස්මකරවාගන්ට ළදරුවෝ සිටිනවිට ඔවුන්ගේ මව්පියන් විසින් ඊට ඉස්සරින්දවත් උදය යාච්ඤාව පටන්ගන්ට පළමුවෙන්වත් දේවගැතියාට දැන්වියයුතුය. එවිට දේවගැතියා විසින් තමන්ගේ කල්පනාවෙන් හොඳ හැටියකට නියමකරණ ලෙස උදය යාච්ඤාව පැවැත්වීමේදීවත් සවස යාච්ඤාව පැවැත්වීමේදීවත්, දෙවෙනි කියවීමෙන් පසු, ඇපකාර මව්පියන් සහ ළමයින් සමග ආවුනුත් බව්තිස්ම භාජනය ලඟ සැදී සිටිත්වා. හොඳ වතුරෙන් පූරවා තිබෙන ඒ බව්තිස්ම භාජනය ලඟට ප්‍රෙස්බිතර් ඇවිත් සිටගණ මෙසේ කියාවා.

**මේ ළදරුවා** බව්තිස්ම ලැබුවාද නැද්ද ?

¶ එවිට නැතැයි කිවොත්, ප්‍රෙස්බිතර් මෙහි පහළ පෙණෙන ලෙස කියාවා.

අතිශයින් ප්‍රියවූ තැනැත්තෙනි, සියලු මනුෂ්‍යයන් පාපයෙන් පිළිසිඳ උපන්බැවිනුත්, වතුරෙන්ද ශුද්ධාත්මයෙන්ද දෙවනු ජනිතව අලුත්ව උපන් කෙණෙකුට මිස දෙවියන්වහන්සේගේ රාජ්‍යයට පැමිණෙන්ට වෙන කෙණෙකුට බැරිය කියා අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ කියා තිබෙන බැවිනුත්, මේ **ළදරුවාට** ජම්මයෙන් තිබෙන්ට නුපුළුවන්වූ ඒ ස්වභාව දෙවියන්වහන්සේ තමන්ගේ අනන්ත කරුණාවෙන් **මොහුට** දෙන හැටියටද, වතුරෙන් හා ශුද්ධාත්මයෙන් බව්තිස්ම ලැබීමත්, ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධවූ සභාවට පිළිගැණීමත්, එහි ජීවමානවූ අවයවයක් කරන්ට යෙදීමත්

**මොහුම** සලස්වාදෙන හැටියටද, අපේ ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කාරණකොටගෙණ, අපේ පියවූ දෙවියන්වහන්සේට යාච්ඤාවෙන ලෙස නුඹලාගෙන් ඉල්ලමි.

¶ ඊළඟට ප්‍රෙස්බිතර් මෙසේ කියාවා.

අපි යාච්ඤාවෙමු.

මහත් කාරුණාවෙන් නෝවඃ සහ ඔහුගේ පවුල වතුරෙන් විනාශ නොවෙන පිණිස නැවේ රක්ෂා කළාවූ, තමන්ගේ සේනාව වන ඊශ්‍රායෙල් මනුෂ්‍යයන් රතු මුහුද මැදින් උපද්‍රවයක් නොව ගෙණයාමෙන්, තමන් විසින් නියමකළ ශුද්ධවූ බව්තිස්මයේ ආදර්ශයක් පෙන්නුවාවූ, යොදීන් ගඟේදී තමන්ගේ ප්‍රේම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බව්තිස්මයෙන් පාපය සෝදාදැමීමට සංඥවක් පිණිස වතුර පිරිසිදුකළාවූ, සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ඔබගේ අප්‍රමාණ කාරුණාවල් උදෙසා මේ **ළදරුවා** දෙස කාරුණාවෙන් බැලුව මැනව. **මොහු** ඔබගේ උදහසින් මුදනු ලැබ, ක්‍රිස්තුස්වහන්සේගේ සභාව නැමති නැවට ගන්ට යෙදී ඇදහිල්ලේ ස්ථිරව, ප්‍රාර්ථනාවෙන් ප්‍රීතිව, ප්‍රේමයේ මුල් ඇද, මෙලොව පීඩා නැමති රළ පසුකොට, සදාකාල ජීවන නැමති දිවයිනට පැමිණ, එහි සියලු කාලයේ ඔබ සමග රජකම් කරණ පිණිස, ශුද්ධාත්මයෙන් **මොහු** සෝදා පවිත්‍රකරණ මෙන්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඔබට යාච්ඤාවෙමුව. ආමෙන්.

සියලු අසරණයන්ට සරණවූ, පිහිට ලබන්ට එන සියල්ලන්ට ආධාරකාරවූ, අදහන්නවුන්ට ජීවනදායකවූ මළවුන් නැවත නැගුටුවන්නාවූ, සියලු බලඇති අමරණීයවූ දෙවියන්වහන්ස, මේ **ළදරුවා** ඔබගේ ශුද්ධවූ බව්තිස්මයට පැමිණ, ශුද්ධාත්මිකවූ දෙවනු ජනිතය කාරණකොටගෙණ පාප මිදීම ලබන පිණිස, **මොහු** උදෙසා අපි ඔබට යාච්ඤාවෙමුව.



ස්වාමීනි ඉල්ලව් තොපට ලැබේය කියාත්, සොයව් තොපට සම්භවේය කියාත්, තට්ටුකරව් තොපට දොර හරිණුලැබේය කියාත්, ඔබගේ අති ප්‍රිය පුත්‍රයා ලවා පොරොන්දුකොරෙව් ලෙස **මොහු** පිළිගත මැනව. මේ **ළදරුවා** ඔබගේ ස්වර්ගීය ධෝවනය නැමති සදාකාලවූ ආශීර්වාදය උරුමවෙමින් අපේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබ පොරොන්දුවූ ඔබගේ සදාකාල රාජ්‍යයට පැමිණෙන පිණිස, ඉල්ලන්නාවූ අපට දුන මැනව. සොයන්නාවූ අපට සම්භවෙන්ට සැලැස්සුව මැනව, තට්ටුකරන්නාවූ අපට දොර ඇරිය මැනව. ආමෙන්.

¶ සමූදුව නැගුවූනාම ප්‍රෙස්බිතර් කියාවා.

ශුද්ධවූ මාර්ක් විසින් ලිව් ශුභාරංචිවල දහවෙනි පරිච්ඡේදයේ දහතුන්වෙනි පදේහිට ලියවී තිබෙන වචන අහපල්ලා.

ළදරුවන් පිට ක්‍රිස්තුස්වහන්සේගේ අත තබවාගන්න පිණිස උන්වහන්සේ ළඟට ඔවුන් ගෙණවාය. නුමුත් ගෝලයෝ ඔවුන් ගෙණාවුන්ට සැරකළාය. යේසුස්වහන්සේ ඒ දැක ඉතා අමනාපව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳු අයවලුන්ගේ නිසා, ළදරුවන් නොවලක්වා මා ළඟට එන්ට ඉඩ අරිව්යයි කීවාය. සැබවක් තොපට කියමි යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවෙක් ලෙස පිළිනොගත්තොත් ඔහු එහි නොපැමිණේයයි කීවාය. තවද උන්වහන්සේ ඔවුන් වඩාගෙණ ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශීර්වාද කළාය.

¶ දේවගැතියා මේ ශුභාරංචි කියෙව් පසු එම ශුභාරංචියේ වචනවලින් මේ ලුහුඬු අවවාදය කරවා.

ප්‍රිය තැනැත්තෙනි, අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ ළදරුවන් තමන් ළඟට ගෙණ එන්ට ආඥකළ බවත්, ඔවුන් ගෙණඑන්ට අවකාශ නුදුන්නවුන්ට දෝෂ පැමිණෙව් බවත්, ඒ ළදරුවන්ගේ

අහිංසකකම පසුව යන්ට සියල්ලන්ට අවවාද කළ බවත්, මේ ශුභාරංචියෙන් තුඹලා ඇසුවාය. තවද උන්වහන්සේ ළදරුවන් තමන්ගේ අතින් වඩාගෙණ ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශීර්වාදකළහෙයින් ඔවුන් කෙරෙහි කාරුණා සිතක් ඇති බව උන්වහන්සේ පෙන්නූ හැටි උන්වහන්සේගේ කායික ලීලාවෙන්හා ක්‍රියාවෙන්ම තුඹලාට පෙණෙනවාය. එබැවින් උන්වහන්සේ මේ **ළදරුවා** එසේම කාරුණාවෙන් පිළිගන්න බවත්, උන්වහන්සේගේ කාරුණා නැමති අත්වලින් වඩාගන්න බවත්, සදාකාල ජීවනයේ ආශීර්වාදයදී, මේ **ළදරුවා** උන්වහන්සේගේ සදාකාල රාජ්‍යයේ උරුමක්කාරයෙක් කරගන්නා බවත්. තුඹලා අනුමාන නොකොට ස්ථිරයෙන් විශ්වාසකරපල්ලා. එසේහෙයින් අපේ ස්වර්ගීය පියානන්වහන්සේ තමන් පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා, මේ **ළදරුවා** කෙරෙහි ප්‍රකාශකොරෙව් කාරුණාව අපි මෙලෙස හැබෑවට ඒත්තුගෙණ මේ **ළදරුවා** උන්වහන්සේ නියමකළ ශුද්ධවූ බව්තිස්මයට අප විසින් ගෙණ මේ අපේ ප්‍රේමවන්ත ක්‍රියාව, උන්වහන්සේට ප්‍රශන්නවූ ක්‍රියාවක් බව අනුමාන නොකර විශ්වාසයෙන් සහ භක්තියෙන් යුක්තව උන්වහන්සේට සතුත් කරමින් මෙසේ කියමු.

සියලු බල ඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ස්වර්ගීය පියානන්වහන්ස, ඔබගේ කාරුණාව දැනගැණීමටත් ඔබ ඇදහීමටත් අප කැඳවාගන්ට කාරුණාකළ නිසා අපි ඔබට යටත්භාවයෙන් සතුති කරමුව. මේ දැනගැණීම අපට වැඩිකොට, මේ ඇදහීම අප තුලේ නිතරම ස්ථිරකළ මැනව. මේ **ළදරුවා** දෙවනු ජනිතව සදාකාල ගැලවීමේ **උරුමක්කාරයෙක්** කරන්ට යෙදෙන පිණිස ඔබගේ ශුද්ධාත්මය මේ **ළදරුවාට** දෙන මෙන්, ඔබ හා ශුද්ධාත්මයානන් සමග දැනටත් සදාකාලයටත් ජීවත්ව ආණ්ඩුකරණ අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.



¶ ඊලඟට ප්‍රෙස්බිතර් ඇපකාර මව්පියන්ට මෙසේ කියාවා.

අතිශයින් ප්‍රිය තැනැත්තෙනි, බව්තිස්මකරවන පිණිස තුඹලා මෙහි ගෙණ මේ **ළදරුවා**, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් පිළිගන්නා ලෙසද, පාපයෙන් මුදනලෙසද, ශුද්ධාත්මයෙන් පිරිසිදුකරණ ලෙසද, ස්වර්ග රාජ්‍යය හා සදාකාල ජීවනය දෙන ලෙසද, මොහු ගැණ තුඹලා යාච්ඤාකළාය. තුඹලා ඉල්ලාසිටිය මේ සියලු දේ දෙනවාය කියා අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ ශුභාරංචියේ පොරොන්දුවී තිබෙන බවත් තුඹලා ඇසුවාය. උන්වහන්සේ ඒ පොරොන්දුව සත්‍යකටම නොකඩව ඉෂ්ටකරණවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පොරොන්දුවී තිබෙන බැවින් මේ **ළදරුවාගේ** ඇපකාරයන් වන තුඹලා විසිනුත් මේ **ළදරුවා** වැඩිවිය වයසට පැමිණ මේ පොරොන්දු තමා පිටට ගන්නතුරු මේ **ළදරුවා** ලවා යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල් අත්හරවන හැටියටද, දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනය ස්ථිරයෙන් අදහා උන්වහන්සේගේ ආඥාවල් කීකරුකමින් රක්ෂාකරවන හැටියටද, මොහු වෙනුවෙන් හරියාකාර පොරොන්දුවෙන්ට යුතුය.

එබැවින් තුඹ යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල්ද, ලෝකේ නිෂ්ඵල අහඞ්කාරය හා මානනායද, සියලු ලෝකවූ තණ්හාවල් සහ මාංසවූ තෘෂ්ණාවල්ද, යන දේට එලඹෙන්නේවත් අනුවෙන්නේවත් නැතුව මේ **ළදරුවා** වෙනුවෙන් ඒවා අත්අරිණවාද කියා අසමි.

උත්තරය. ඒ සියල්ල මම අත්අරිමි.

දේවගැතියා. ස්වර්ගයේ සහ පොළවේ මැවුම්කාර සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේ අදහගන්නවාද. උන්වහන්සේගේ ඒකජාත පුත්‍රද අපේ ස්වාමීදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහගන්නවාද. උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ මරියා

නම් කන්‍යාවගෙන් ඉපද පොන්තිවුස් පිලාත් යට ෙත් වධවිඳ කුරුසියේ ඇනගැසුම්කා මැරී වළලනු ලැබ පරලොවට ගොස් තුන්වෙනිද මළවුන්ගෙන් නැවත නැග්ට ස්වර්ගයට නැගී සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳ ගත් බවද ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චය කරණ පිණිස ලෝකාන්තිමේදී එතනින් එන බවද අදහගන්නවාද. ශුද්ධාත්මයානන්වහන්සේ අදහගන්නවාද. ශුද්ධවූ සර්වසාධාරණ සභාවත් පවිත්‍රයන්ගේ එකගකමත් පාපවල කමාවත් ශරීර යාගේ නැවත නැගිට්මත් මරණින් පසු සදාකාල ජීවනයත් ඇතිබවද අදහගන්නවාද?

උත්තරය. මේ සියල්ල ස්ථිරයෙන් අදහගණිමි.

දේවගැතියා. මේ ඇදහිල්ලේ බව්තිස්ම ලබන්ට කැමතිද?

උත්තරය. ඊට මම කැමතිය.

දේවගැතියා. එහෙනම් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කැමැත්තත් අණවලුත් නිකරු ලෙස රක්ෂා කොට නුඹේ ජීවිතාන්තය දක්වා එලෙස හැසි රෙන්ට කැමතිද?

උත්තරය. මම කැමතියි.

¶ එවිට ප්‍රෙස්බිතර් කියාවා.

කරුණාවන්තවූ දෙවියන්වහන්ස, මේ **ළදරුවා** තුළ පිහිටි පුරාණ ආදම් වළලමින් අලුත් මනුෂ්‍යයා **මොහු** තුළ නැගුව මැනව. ආමෙන්.

**මොහු** තුළ සියලු මාංසික ආසාවල් නසමින් ශුද්ධාත්මයට අයිති සියලු දේ ජීවත්කොට වඩින කළ මැනව. ආමෙන්.

යක්ෂයත් ලෝකයත් මාංසයත් පරදවා ජයගන්න පිණිස **මොහුට** බලයත් සවියත් දුනමැනව. ආමෙන්.

සදාකල් ජීවත්ව සියල්ල ආණ්ඩුකරන්නාවූ ප්‍රශංස නීයවූ දෙවිස්වාමිනි, අපේ නිලයෙන් හා සේවයෙන් මෙහිදී ඔබට පූජාකරන්ට යෙදෙන තැනැත්තන්



ස්වර්ගීයවූ ගුණයන්ගෙන් සරසා සදාකාලවූ යහ පත් විපාකය ඔබගේ කරුණාවෙන් ඔවුන්ට දුන මැනව. ආමෙන්.

අපේ පාප කමාව පිණිස තමන්ගේ අනර්ඝවූ ඇල යෙන් වතුර හා ලේ වැගිරෙව්වාවූ, තොපි ගොස් සියලු මනුෂ්‍යයන් මගේ ගෝලයන් කර පියානන් ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් ඔවුන් බව්තිස්මකරව්යයි තමන්ගේ ගෝලයින්ට අඥාකළාවූ, යේසුස් ක්‍රිස්තුස්නම් අති ප්‍රේම පුත්‍රයෙක් ඇති සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස, ඔබගේ සමූදුව කරණ යාච්ඤාවල් පිළිගන්නහැටියටත්, පාපය සෝද දැමීමට සංඥාවක්වූ මේ වතුර පිරිසිදුකරණ හැටියටත්, දැන් එයින් බව්තිස්ම ලබන්ට සිටින මේ **ළදරුවාට** ඔබගේ කරුණාව සම්පූර්ණයෙන් දෙන හැටියටත් ඔබගේ විශ්වාසවූ තෝරාගත් දරුවන් ගේ ගණයෙන් **මොහු** සදාකල් පවත්වන හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබ ගෙන් ඉල්ලාසිටිමුව.

¶ එවිට ප්‍රෙස්බිතර් ළදරුවා වඩාගෙණ ඇපකාර මව්පි යන්ට මෙසේ කියාවා.

## මේ ළදරුවාට නමක් දියල්ලා.

¶ ඔවුන් කියන නාමය ළදරුවාට තබමින් දියේ ගැල්වීම දරන්ට ඒ ළදරුවාට පුළුවනැයි ඔවුන් කීවොත් ඔබින ලෙස ප්‍රවේසමින් ඔහු දියේ ගල්වමින් මෙසේ කියාවා.

න. පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්ම යානන්ගෙත් නාමයෙන් නුඹ බව්තිස්මකරමි. ආමෙන්.

¶ නුමුත් ඇපකාර මව්පියෝ ඒ ළදරුවා දුර්වලය කීවොත් ඉහතකී වචනම කියමින් දිය වක්කළ නුමුත් ඇත. එනම්;

න. පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්ම යානන්ගෙත් නාමයෙන් නුඹ බව්තිස්මකරමි. ආමෙන්.

¶ ඊළඟට ප්‍රෙස්බිතර් කියාවා.

මින්පසු මේ **ළදරුවා** කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිල්ල ප්‍රකාශකරන්ටද, පාපයටත් ලෝකයටත් යක්ෂයාටත් විරුද්ධව ක්‍රිස්තුස්වහන්සේගේ ජයකොඩිය යටතේ දක්ෂ ලෙස යුද්ධකරන්ටද, ජීවිතාන්තය දක්වා උන්වහන්සේගේ විශ්වාස **සේවකයෙක්** හා **දාසයෙක්ව** සිටින්ටද ලජ්ජා නොවෙන පිණිස, අපි **මොහු** ක්‍රිස්තුස්වහන්සේගේ සේනාව නැමති රඤ්චුවට ඇතුළත් කොට කුරුසියේ ලකුණෙන් ලකුණුකරමුව * ආමෙන්.

¶ නැවත ප්‍රෙස්බිතර් කියාවා.

ප්‍රිය සහෝදරයෙනි දැන් මේ **ළදරුවා** දෙවනු ජනිතව ක්‍රිස්තුස්වහන්සේගේ සභාව නැමති ශරීරයේ පිහිටුවනු ලැබූහෙයින් ඒ පිණිස සියලු බලඇති දෙවියන්වහන්සේට ස්තුතිකරමුව. තවද මේ පටන්ගැන්ම ලෙස මේ **ළදරුවාට ඔහුගේ** ජීවිතය මුලුල්ලම පසුකරන්ට පුළුවන්වෙන පිණිස අපි එක්සිත්ව දෙවියන්වහන්සේට යාච්ඤාකරමු.

¶ සියල්ලෝම දනගසා මෙසේ කියත්වා.

ස්වර්ගයේ හිටින අපේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවෙත් කරණු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නාවාගේ, අපේ වැරදිවලටත් කමාවුව මැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා, නපුරෙන් අප ගලවාගන්න මැනව. ආමෙන්.

¶ ඊළඟට ප්‍රෙස්බිතර් කියාවා.

ඉතා කරුණාවන්තවූ පියාණනි මේ **ළදරුවා** ඔබගේ ශුද්ධාත්මයෙන් දෙවනු ජනිතකරන්ටත්

* මෙහිදී ප්‍රෙස්බිතර් ළදරුවාගේ නළලේ කුරුසියේ ලකුණ කරාවා.



ඇතිකරගැනීමෙන් ඔබගේම දරුවෙක් කරගන්ටත්, ඔබගේ ශුද්ධවූ සභාවට ඇතුළත්කරගන්ටත් කැමතිවූ නිසා, අපි ඔබට හිතේන්ම ස්තුතිකරමුව. තවද පාපයට මැරී ධර්මිෂ්ඨකමට ජීවත්ව ක්‍රිස්තුස්වහන්සේ සමග මරණයෙහි තැන්පත්කරණු ලැබූවාවූ **මොහුට**, පුරාණ මනුෂ්‍යයා කුරුසියේ ඇණගසා පාපස්කන්ධය මුලුල්ලම විනාශකරන්ට පුළුවන්කරණ හැටියටත්, **මොහු** ඔබගේ පුත්‍රයාගේ මරණයේ **පංගුකාරයෙක්** වුනුහෙයින්, උන්වහන්සේගේ නැවත නැඟිටීමෙත් **පංගුකාරයෙක්** වෙන්ට **මොහුට** පුළුවන්කරණ හැටියටත්, එසේ කොට, ඔබගේ ශුද්ධවූ සභාවේ අනිකුත් අයවල් සමග ඔබගේ සදාකාල රාජ්‍යයේ **උරුමක්කාරයෙක්** වෙන්ට **මොහුට** සලස්වන හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබට යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ එවිට සියල්ලෝම නැඟිට්ටාම ප්‍රෙස්බිතර් ඇපකාර දෙමව්පියන්ට මේ අවවාදය කියාවා.

මේ **ළදරුවා**, යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල් අත්අරිණ හැටියටද, දෙවියන්වහන්සේ අදහමින් උන්වහන්සේට වැඩකරණ හැටියටද, **මොහුගේ** ඇපකාරවූ නුඹලා ලවා පොරොන්දුකෙරෙව්වාය. එබැවින්, අපේ ඇදහිල්ල ලෙස අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය පසුව යන්ටත්, උන්වහන්සේ හා සමානවෙන්ටත්, උන්වහන්සේ අප උදෙසා මරණු ලැබ නැවත නැඟුටුනු හැටියට, බව්තිස්මවූ අපි පාපයට මැරී, ධර්මිෂ්ඨකමට නැවත නැඟිට, අපේ සියලු නපුරු දුෂ්ට තෘෂ්ණාවල් නිතර නසාගනිමින්, සියලු ගුණයෙන් හා භක්තිවූ ජීවත්වීමෙන් දවස්පතා හැසිරෙන්ට බව්තිස්මයේ අපට ප්‍රකාශකර තිබෙන බව නිතර සිහිකරමින්, මේ

**ළදරුවාට** ඉගෙණගන්ට පුළුවන්වූන කඩිනමින් මෙහිදී නුඹලා ලවා **මොහු** කොරෙව්වේ කොයියාකාර මහත් ගිවිසුමක්ද පොරොන්දුවක්ද ප්‍රකාශයක්ද යනාවග සලකා, **මොහුට** උගන්වන්ට නුඹලාට නිසිබව සිහියටගන්ට යුතුය. **මොහුට** මේ කාරණා වඩා හොඳට දැනගන්ට පුළුවන්වෙන පිණිස දේශනාවල් අහන්ට කැඳවාගණ යන්ටත්, ප්‍රධානකොට ජන්මභාෂාවෙන් ඇදහිල්ලේ ක්‍රමයද, ස්වාමීන්ගේ යාච්ඤාවද, ආඥාවල් දසයද, ප්‍රාණය ගලවාගැණීම පිණිස ක්‍රිස්තියානිකාරයෙක් විසින් දැනගන්ටත් අදහන්ටත්යුතු අනිකුත් සියලු දේද, නුඹලා විසින් **මොහුට** උගන්වන්ටත්, **මොහු** භක්තිවනාත ක්‍රිස්තියානි **කාරයෙක්ව** හැසිරෙණ හැටියට නුඹලා විසින් ධර්ම්තාවයේ ඇතිකරන්ටත් යුතුය.

¶ ඊලඟට මේකත් කියාවා.

මේ **ළදරුවා** ඇදහිල්ලේ ක්‍රමයත්, ස්වාමීන්ගේ යාච්ඤාවත්, ආඥාවල් දසයත්, ජන්මභාෂාවෙන් දැනගණ, ඒවා ගැණ වැඩිදුර තේරුම්ගන්න පිණිස නියමකර තිබෙන සභාවේ කතිකිස්මය ඉගෙණගත් පසු, ස්ථිරකාරණු ලබන පිණිස, බිස්කොප් ලඟට නුඹලා විසින් ගෙණයන හැටියට බලාගන්ට යුතුය.

[බව්තිස්ම ලබාපු ළමයි පව්කරන්නට පළමුවෙන් මැරුනොත් අනුමානයක් නැතුවම ගැලවෙන බව දේව වචනයේ සහතක ලෙස පෙණෙනවාය.]

[බව්තිස්මයේදී කුරුසියේ ලකුණෙන් ලකුණුකිරීමේ සැකනැතිකරණ පිණිස ඒකේ හරි තේරුමත් ඒක පැවැත්වීමට තිබෙන යුතු කාරණත් එක්දස් හසිය හතරවෙනි අවුරුද්දේ පළමුවෙන් ප්‍රසිද්ධකළ තිස්වෙනි නියෝගයේ පෙණී තිබෙනවාය.]

---

# ගෙවල්වලදී ළදරුවන්ගේ

## අප්‍රකාශවූ බව්තිස්මකිරීමේ ක්‍රමය.

¶ ඒ ඒ පිරිස භාරව සිටින දේවගැතියන් විසින් වැසියන්ට ඔවුන්ගේ ළදරුවන් බව්තිස්මකරවාගැන්ම, උපතහි දින පටන් පළමුවෙනි නොහොත් දෙවෙනි ඉරිදාවවත් ඒ අතර ශුද්ධ දවසකටවත් වඩා ප්‍රමාද නොකරණ ලෙස බොහෝවිට ඇනුමැතිකම් දියයුතුය. නුමුත් දේවගැතියාට ඒත්තුයන නිසි වැදගත් කාරණාවක් තිබ්බිනම් ප්‍රමාදකරන්ට පුළුවන.

¶ තවද එබඳු බලවත් කරුණක් සහ උවමනාවක් නැතුව ඔවුන්ගේ ළදරුවන් ගෙවල්වලදී බව්තිස්ම නොකරවන හැටියට දේවගැතියන් විසින් ඔවුන්ට අවවාදකළ යුතුය. නුමුත් බලවත් උවමනාවක් පැමිණ එසේ කරවාගන්ටම ඕනෑවූවිට ගෙවල්වලදී බව්තිස්ම කරණ විධිය මෙසේය.

¶ පළමුවෙනුව, ඒ පිරිස භාරව හිටින දේවගැතියාවත් ඔහු නැති විටක ගෙන්වාගන්ට පුළුවන් වෙන නිසි දේවගැතියෙක්වත්, එහි සිටින්නවුන් සමග දෙවියන්වහන්සේට යාච්ඤාවෙමින් කාලයෙත් පැමිණි කනස්සලුවෙත් හැටියට ඉඩ තිබ්බ නම්, ස්වාමින්ගේ යාච්ඤාව හා ප්‍රකාශවූ බව්තිස්ම කිරීමට නියමකර තිබෙන සමහර යාච්ඤාවල් කියයුතුය. ඊලඟට එහි සිටින කෙනෙක් විසින් ළදරුවාට නම තැබුවාම දේවගැතියා ඒ ළදරුවාට වතුර වත්කරමින් මේ වචන කියයුතුය.

න. පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් නුඹ බව්තිස්මකරමි. ආමෙන්.

¶ එවිට සියල්ලෝම දනගැසුවාම දේවගැතියා දෙවියන්වහන්සේට ස්තුතිකරමින් මෙසේ කියයුතුය.

ඉතා කාරුණාවනතවූ පියානනි, මේ **ළදරුවා** ඔබගේ ශුද්ධාත්මයෙන් දෙවනු ජනිතකරන්ටත්, ඇතිකරගැණීමෙන් ඔබගේම දරුවෙක් කරගන්ටත් ඔබගේ ශුද්ධවූ සභාවට ඇතුළත්කරගන්ටත් කැමතිවූ නිසා අපි ඔබට හිතෙන්ම ස්තුතිකරමුව.

තවද **මොහු** ඔබගේ පුත්‍රයාගේ මරණයේ **පඞ්ගුකාරයෙක්** වූනුහෙයින් උන්වහන්සේගේ නැවතනැගිටීමෙත් **පඞ්ගුකාරයෙක්** වෙන්ට **මොහුට** පුළුවන් කාරණ හැටියටත්, එසේකොට, ඔබගේ අනිකුත් ශුද්ධවරයන් සමග ඔබගේ සදාකාල රාජ්‍යයේ **උරුමක්කාරයෙක්** වෙන්ට **මොහුට** සලස්වන හැටියටත්, එම ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබට යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ මෙසේ බව්තිස්මකළ ළදරුවා නිසි ලෙසින් හා සම්පූර්ණ ලෙසින් බව්තිස්ම ලැබූ බව මනුෂ්‍යයෝ අනුමාන නොකරත්වා. ඒ ළදරුවා නැවත බව්තිස්ම නොකළ යුතුය. එසේ නුමුත් ඒ ප්‍රකාරයෙන් බව්තිස්ම ලැබූ ළදරුවා ජීවත්ව සිටියොත් එම පිරිසේ දේවගැතියා විසින් මෙසේ අප්‍රකාශයෙන් කළාවූ බව්තිස්මය නිසි ආකාරයෙන් කරන්ට යෙදුනබව සෙනගට අන්වන පිණිස එම ළදරුවා දේවස්ථානයට ගෙණ එන්ට යුතුය. එසේ ගෙණවාම දේවගැතියා මෙලෙස කියාවා.

සභාවේ යුතුවූ නියමවූ ක්‍රමය ලෙස [අභවල් කාලයේ අභවල් ස්ථානයේ] නොයෙක් සාක්ෂිකාරයන් ඉදිරියේ මේ ළදරුවා මා විසින් බව්තිස්මකළ බව නුඹලාට සහතිකකරමි.

¶ ඒ ළදරුවා වෙන නිසි දේවගැතියෙක් විසින් බව්තිස්ම කරන්ට යෙදුනානම් ළදරුවා උපන් නොහොත් බව්තිස්ම කරණලැබූ පිරිසේ දේවගැතියා ඒ ළදරුවා යුතු ලෙස බව්තිස්ම ලැබුවාද නැද්ද කියා විභාගකොට පරීක්ෂාකළයුතුය. එවිට ළදරුවා ගෙණ අයවල් එම ළදරුවා බව්තිස්ම ලබාසිටිනබව කියත්නම් දේවගැතියා වැඩිදුර විභාගකරමින් මෙසේ විචාළ යුතුය.

මේ ළදරුවා බව්තිස්මකළේ කාවිසින්ද?

මේ ළදරුවා බව්තිස්මකරද්දී ඉදිරිපිට සිටියේ කවුද?

මේ සක්‍රමේන්තුව පිහිටීමට නිසිවූ සමහර කාරණා භයෙන්වත් ඉක්මන්කමෙන්වත් එබඳු කනස්සලූ



වේදී මතකනැතිවෙන්ට පුළුවන් හෙයින්, මම නුඹලාගෙන් වැඩිදුර අසමි.

මේ ළදරුවා බව්තිස්මකළේ මොන දෙයකින්ද?

මේ ළදරුවා බව්තිස්මකළේ කුමක් කියමින්ද?

¶ තවද සියලූ දේ යෝග්‍ය ලෙස කෙරුණු බව ළදරුවා ගෙණවුන්ගේ උත්තරවලින් දේවගැතියාට දැනුනොත් ඒ ළදරුවා නැවත බව්තිස්ම නොකොට සැබෑවූ ක්‍රිස්තියානි මනුෂ්‍ය සමූහයේ කෙනෙක් මෙන් පිළිගෙණ මෙසේ කිය යුතුය.

ජන්ම පාපය ඇතුව ඉපද දෙවියන්වහන්සේගේ උදහසට යටත්ව සිට, දැන් බව්තිස්මයේදී දෙවනුජනිතවීම නැමති ධෝවනයෙන්, දෙවියන්වහන්සේගේ දරුවන්ගෙත් සදාකාල ජීවනයේ උරුමක්කාරයන්ගෙත් ගණනට ඇතුළත්කරන්ට යෙදුනාවූ මේ ළදරුවාට කළ බව්තිස්මය ගැණ, සියලූ දේ නිසි පිළිවෙළට හරියාකාර කෙරුණු බව නුඹලාට සහතිකකරමි. මෙසේ කීවේ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, තමන්ගේ පිහිටත් කරුණාවත් මේ ප්‍රකාර ළදරුවන්ට නොවලක්වා, ඉතා ප්‍රේමයෙන් තමන් ළඟට ඔවුන් කැඳවාගන්න බව, අපේ සැනසීම පිණිස ශුද්ධවූ ශුභාරංචියේ මෙසේ කියා තිබෙනනිසාය. ඒනම්.

ශුද්ධවූ මාර්ක් 10. 13.

ළදරුවන්පිට ක්‍රිස්තුස්වහන්සේගේ අත තබවාගන්නා පිණිස උන්වහන්සේ ළඟට ඔවුන් ගෙණවාය. නුමුත් ගෝලයෝ ඔවුන් ගෙණාවුන්ට සැරකළාය. යේසුස්වහන්සේ ඒ දැක ඉතා අමනාපව දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙබඳු අයවලූන්ගේ නිසා ළදරුවන් නොවලක්වා මා ළඟට එන්ට ඉඩ අරිව්. සැබවක් තොපට කියමි; යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවෙක් ලෙස පිළිනොගත්තොත් ඔහු එහි නොපැමිණේයයි කීවාය. තවද උන්වහන්සේ ඔවුන් වඩාගෙණ ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශීර්වාදකළාය.

¶ දේවගැතියා මේ ශුභාරංචි කියෙව් පසු එම ශුභාරංචියේ වචනවලින් මේ ලුහුඬු අවවාදය කරාවා.

ප්‍රිය නෑනැන්තෙනි, අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ, ළදරුවන් තමන් ළඟට ගෙණඑන්ට ආඥාකළ බවත් ඔවුන් ගෙණඑන්ට අවකාශ නුදුන්නාවුන්ට දොෂ පැමිණෙව් බවත්, ඒ ළදරුවන්ගේ අහිංසකකම පසුව යන්ට සියල්ලන්ට අවවාදකළ බවත්, මේ ශුභාරංචියෙන් නුඹලා ඇසුවාය. තවද උන්වහන්සේ ළදරුවන් තමන්ගේ අතින් වඩාගෙණ ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශිර්වාදකළහෙයින්, ඔවුන් කෙරෙහි කරුණා සිතක් ඇතිබව උන්වහන්සේ පෙන්නූ හැටි, උන්වහන්සේගේ කායික ලීලාවෙන් හා ක්‍රියාවෙන්ම නුඹලාට පෙණෙනවාය. එබැවින් උන්වහන්සේ මේ **ළදරුවා** එසේම කරුණාවෙන් පිළිගත් බවත්, උන්වහන්සේගේ කරුණාවැමති අත්වලින් වඩාගත් බවත්, උන්වහන්සේගේ ශුද්ධවූ වචනයේ උන්වහන්සේ පොරොන්දුවී තිබෙන ලෙස සදාකාල ජීවනයේ ආශිර්වාදය දී, මේ **ළදරුවා** උන්වහන්සේගේ සදාකාල රාජ්‍යයේ **පංගුකාරයෙක්** කරගන්න බවත්, නුඹලා අනුමාන නොකොට ස්ථිරයෙන් විශ්වාසකරපල්ලා. එසේහෙයින් අපේ ස්වර්ගීය පියානන්වහන්සේ තමන් පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා, මේ **ළදරුවා** කෙරෙහි ප්‍රකාශකොරෙව් කරුණාව අපි මෙලෙස සැබෑවට ඒත්තුගෙණ, විශ්වාසයෙන් සහ භක්තියෙන් යුක්තව උන්වහන්සේට මෙලෙස ස්තුතිකොට, ස්වාමින්වහන්සේ විසින්ම ඉගැන්නූ යාච්ඤාව කියමූ.

ස්වර්ගයේ සිටිනා අපේ පියානනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවේත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ, අපේ වැරදිවලටත් කමාවුව මැනව.



අප පරීක්ෂාවීමට නොපමුණුවා, නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

සියලුබලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ස්වර්ගීයවූ පියානන්වහන්ස, ඔබගේ කරුණාව දැනගැණීමටත් ඔබ ඇදහීමටත් අප කැඳවාගන්ට කරුණාකළ නිසා, අපි ඔබට යටත්භාවයෙන් ස්තුතිකරමුව. මේ දැනගැණීම අපට වැඩිකොට, මේ ඇදහීම අප තුළෙ නිතරම ස්ථිරකළ මැනව. මේ **ළදරුවා** දෙවනු ජනිතව අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා සදාකාල ගැලවීමේ **උරුමක්කාරයෙක්** වෙන පිණිසත්, ඔබගේ **වාලෙක්ව** පැවති සිට ඔබගේ පොරොන්දුව ලබාගන්නා පිණිසත් ඔබගේ ශුද්ධාත්මය **මොහුට** දෙනමෙන්, ඔබ හා ශුද්ධාත්මයානන් සමග දැනටත් සදාකාලයටත් ජීවත්ව ආණ්ඩුකාරණ එම අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ ඊලඟට ප්‍රෙස්බිතර් ඇපකාර මව්පියන්ගෙන් ළදරුවාගේ නම අහගණීවා. ඔවුන් විසින් නම කීවාම දේවගැතියා මෙසේ කියාවා.

නුඹ යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල්ද, මේ ලෝකයේ නිෂ්ඵල අහංකාරය හා මාන්නයද, සියලු ලෝකවූ තෘෂ්ණාවල් සහ මාංසවූ තෘෂ්ණාවල්ද, යන දේට, එලඹෙන්නේවත් අසුවෙන්නේවත් නැතුව මේ ළදරුවා වෙනුවෙන් ඒවා අත්අරිණවාද කියා අසමි.

උත්තරය. ඒ සියල්ල මම අත්අරිමි.

දේවගැතියා. ස්වර්ගයේ සහ පොළොවේ මැවුම්කාර සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේ අදහගන්නවාද, උන්වහන්සේගේ ඒකජාත පුත්‍රද අපේ ස්වාමිදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහගන්නවාද, උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ, මරියානම් කන්‍යාවගෙන් ඉපද, පොන්තියුස් පිලාත් යටතේ වධවිඳ, කුරුසියේ ඇනගැසුම්කා මැරී වළලනු ලැබ, පරලොවට ගොස් තුන්වෙනිදා මළවුන්

ගෙන් නැවත නැගිට, ස්වර්ගයට නැගී සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳගත් බවද, ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චයකරණ පිණිස ලෝකාන්තමේදී එතනින් එන බවද, අදහගන්නවාද. ශුද්ධාත්මයානන්වහන්සේ අදහගන්නවාද. ශුද්ධවූ සර්වසාධාරණ සභාවත්, පවිත්‍රයන්ගේ එකඟකමත්, පාපවල කමාවත්, ශරීරයේ නැවත නැගිටීමත්, මරණින් පසු සදාකාල ජීවනයත්, ඇතිබව අදහගන්නවාද.

උත්තරය. මේ සියල්ල ස්ථිරයෙන් අදහගණිමි.

දේවගැතියා. එහෙනම් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කැමැත්තත් ආඥාවලුත් කීකරුලෙස රක්ෂාකොට නුඹේ ජීවිතාන්තය දක්වා එලෙස හැසිරෙන්ට කැමතිද.

උත්තරය. මම කැමතියි.

¶ ඊලඟට ප්‍රෙස්බිතර් කියාවා.

මින්පසු මේ **ළදරුවා** කුරුසියේ ඇනාගසනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිල්ල ප්‍රකාශකරන්ටද, පාපයටත් ලෝකයටත් යක්ෂයාටත් විරුද්ධව ක්‍රිස්තුස්වහන්සේගේ ජයකොඩිය යටතේ දක්ෂලෙස යුද්ධකරන්ටද, ජීවිතාන්තය දක්වා උන්වහන්සේගේ විශ්වාස **සේවකයෙක්** හා **දාසයෙක්ව** සිටින්ටද ලජ්ජානොවෙන පිණිස, අපි **මොහු** ක්‍රිස්තුස්වහන්සේගේ සේනාව නැමති රංචුවට ඇතුළත්කොට කුරුසියේ ලකුණෙන් * ලකුණුකරමුව. ආමෙන්.

¶ නැවතද ප්‍රෙස්බිතර් කියාවා.

ප්‍රිය සහෝදරයෙනි, දැනට මේ **ළදරුවා** බව්තීස්මයෙන් දෙවනු ජනිතව ක්‍රිස්තුස්වහන්සේගේ සභාව නැමති ශරීරයේ පිහිටුවනු ලැබූහෙයින් ඒ ප්‍රයෝජන උදෙසා සියලු බලඇති දෙවියන්වහන්සේට සතුතිකරමුව. තවද මේ පටන්ගැන්ම ලෙස

* මෙහිදී ප්‍රෙස්බිතර් ළදරුවාගේ නළලේ කුරුසියේ ලකුණ කරාවා.



මේ **ළදරුවාට** ඔහුගේ ජීවිතය මුලුල්ලම පසුතරන්ට පුළුවන්වෙන පිණිස, අපි එක්සිත්ව දෙවියන්වහන්සේට යාච්ඤාකරමු.

¶ ඊලඟට ප්‍රෙස්බිතර් කියාවා.

ඉතා කරුණාවන්තවූ පියානනි, මේ **ළදරුවා** ඔබගේ ශුද්ධාත්මයෙන් දෙවනු ජනිතකරන්ටත්, ඇතිකරගැණීමෙන් ඔබගේම දරුවෙක් කරගන්ටත්, ඔබගේ ශුද්ධවූ සභාවට ඇතුළත්කරගන්ටත් කැමතිවූ නිසා, අපි ඔබට හිතෙන්ම සතුතිකරමුව. තවද පාපයට මැරී, ධර්මිෂ්ඨකමට ජීවත්ව, ක්‍රිස්තුස්වහන්සේ සමග මරණයෙහි තැන්පත්කරණු ලැබූවාවූ **මොහුම**, පුරාණ මනුෂ්‍යයා කුරුසියේ ඇනගසා, පාපසකන්ධය මුලුල්ලම විනාශකරන්ට පුළුවන්කරණ හැටියටද, මොහු ඔබගේ පුත්‍රයාගේ මරණයේ **පංගුකාරයෙක්** වූනාහෙයින්, උන්වහන්සේගේ නැවත නැගිටීමෙත් **පංගුකාරයෙක්** වෙන්ට **මොහුම** පුළුවන්කරණ හැටියටත්, එසේකොට, ඔබගේ ශුද්ධවූ සභාවේ අනිකුත් අයවල් සමග ඔබගේ සදාකාල රාජ්‍යයේ **උරුමක්කාරයෙක්** වෙන්ට **මොහුට** සලස්වන හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබට යටත්භාවයෙන් යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ එවිට සියල්ලෝම නැගිට්ටාම දේවගැතියා ඇපකාර දෙමව්පියන්ට මේ අවවාදය කියාවා.

මේ **ළදරුවා** යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල් අත්හරිණ හැටියටද, දෙවියන්වහන්සේ අදහමින් උන්වහන්සේට වැඩකරණ හැටියටද **මොහුගේ** ඇපකාරවූ නුඹලා ලවා පොරොන්දුකෙරෙව්වාය. එබැවින් අපේ ඇදහිල්ල ලෙස අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය පසුව යන්ටත්, උන්වහන්සේ හා සමානවෙන්ටත්, උන්වහන්සේ අප උදෙසා මරණු ලැබ නැවත නැගුටුන හැටියට බව්තිස්මවූ අපි පාපයට මැරී ධර්මිෂ්ඨකමට නැවත

නැගිට අපේ සියලු නපුරු දුෂ්ට තෘෂ්ණාවල් නිතර නසාගණිමින්, සියලු ගුණයෙන් හා භක්තිවූ ජීවත් විමෙන් දවස්පතා හැසිරෙන්ට බව්තිස්මයේ අපට ප්‍රකාශකර තිබෙන බව නිතර සිහිකරමින්, මේ ළදරුවාට ඉගෙණගන්ට පුළුවන්වුන කඩිනමින්, මෙහිදී තුඹලා ලවා **මොහු** කොරෙව්වේ කොයි ආකාර මහත් ගිවිසුමක්ද පොරොන්දුවක්ද ප්‍රකාශයක්ද යනාවග සලකා, **මොහුට** උගන්වන්ට තුඹලාට නිසි බව සිහියට ගන්ට යුතුය. **මොහුට** මේ කාරණා වඩා හොඳට දැනගන්ට පුළුවන්වෙන පිණිස, දේශනාවල් අහන්ට කැඳවාගෙණ යන්ටත්, ප්‍රධානකොට ජන්මභාෂාවෙන් ඇදහිල්ලේ ක්‍රමයද ස්වාමීන්ගේ යාච්ඤාවද ආඥාවල් දසයද ප්‍රාණය ගලවා ගැණිම පිණිස ක්‍රිස්තියානිකාරයෙක් විසින් දැනගන්ටත් අදහගන්ටත් යුතු අනිකුත් සියලු දේද තුඹලා විසින් **මොහුට** උගන්වන්ටත්, **මොහු** භක්තිවනත ක්‍රිස්තියානිකාරයෙක්ව හැසිරෙණ හැටියට තුඹලා විසින් ධර්මිෂ්ඨතාවයේ ඇතිකරන්ටත් යුතුය.

¶ පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් වතුරෙන් බව්තිස්මකිරීම බව්තිස්මයට තිබෙන්ටම ඕනෑ කාරණ බැවින්, ප්‍රෙස්බිතර් විසින් දේවස්ථානයට ළදරුවා ගෙණවුන්ගෙන් එලෙස බව්තිස්ම කළාද කියා ඇසූ කල ඔවුන් විසින් ඊට අනුමාණ උත්තර දුන්නොත්, ළදරුවන් ප්‍රකාශයෙන් බව්තිස්ම කිරීමට මින් ඉහත නියමකළ ක්‍රමය ලෙස ඒ ළදරුවා බව්තිස්මකරාවා. එසේ නුමුත් ඒ ළදරුවා බව්තිස්ම භාජනයේ ගිල්වනකල මේ වාක්‍යය කියාවා

තුඹ මීට පළමු බව්තිස්ම නොලැබුවානම්—න— පියානන්ගෙත්, පුත්‍රයානන්ගෙත්, ශුද්ධාත්මයානන්ගෙත්, නාමයෙන් තුඹ බව්තිස්මකරමි. ආමෙන්.

---

# වැඩි වයසට පැමිණියාවූ

## තමතමුන් ගැණ උත්තර දෙන්ට පුළුවන්වූ අය බව්තිස්මකිරීමේ ක්‍රමය.

---

¶ වැඩි වයසට පැමිණියාවූ අය බව්තිස්ම ලැබීමට සිටින කල ක්‍රිස්තියානි ආගමේ ප්‍රධාන කාරණ ගැණ ඔවුන් සෑහෙන තරමට දැනගත්තාද නැද්ද කියා පරීක්ෂාකරණ පිණිසත් යාච්ඤාවීමෙන් හා නිරාහාරව ඉඳිමෙන් මේ ශුද්ධවූ සක්‍රමෙන්තුව ලැබීම ගැණ සූදානම්වීමට අවවාද ලබාගන්නා පිණිසත් ඔවුන්ගේ දෙමව්පියන් විසින් හෝ වෙන දැනුමැති කෙණෙක් විසින් හෝ බිස්කොප්ට නොහොත් උන්නාන්සේ විසින් ඊට නියමකරණ තැනැත්තාට කල්තියා නොහොත් ස්වල්ප වශයෙන් සතියකට පළමුවෙන් දැන්විය යුතුය.

¶ එවිට ඔවුන් යුතු අයවල්ව පෙණුනොත් ඉරිදා දවසකවත් ශුද්ධවූ දවසකවත් සමූහය එකතුවූ කල දේවගැතියාගේ කල්පනාවට හොඳව පෙණෙන හැටියට උදය නොහොත් සවස යාච්ඤාවේදී දෙවෙනි කියවීම ඉවරවූ පසු ඇපකාර දෙමව්පියන් විසින් බව්තිස්ම භාජනය ඉදිරියේ ඔවුන් සිටුවන්ට සෑදී සිටිය යුතුය.

¶ මෙහි ඉදිරිපිට සිටුවන්ට යෙදුනවුන්ගෙන් කවුරුවත් බව්තිස්ම ලැබුවාද නැද්ද කියා ප්‍රෙස්බිතර් එහි සිට අසාවා. එවිට ඔවුන් නැතැයි කියා උත්තර දුන්නොත් ප්‍රෙස්බිතර් මෙසේ කියාවා.

අතිශයින් ප්‍රියවූ තැනැත්තෙනි, සියලු මනුෂ්‍යයන් පාපයෙන් පිළිසිඳ උපන් බැවිනුත්, මාංසයෙන් උපන් දේ මාංසයම නිසා, මාංසයේ සිටින්නෝ පාපයේ ජීවත්වෙමින් නොයෙක් අයුතු ක්‍රියා කරමින්ම හැසිරෙණවා මිස දෙවියන්වහන්සේ සතුටුකරන්ට බැරිබැවිනුත්, වතුරෙන්ද ශුද්ධාත්මයෙන්ද දෙවනු ජනිතව අලුත්ව උපන් කෙණෙකුට මිස, දෙවියන්වහන්සේගේ රාජ්‍යයට පැමිණෙන්ට වෙන කෙණෙකුට බැරිය කියා අපේ ගැලවුම්කාර

ක්‍රිස්තුස්වහන්සේ කියා තිබෙන බැවිනුත්, මේ තැනැත්තන්ට ජන්මයෙන් තිබෙන්ට නුපුළුවන්වූ ඒ ස්වභාව දෙවියන්වහන්සේ තමන්ගේ අනන්ත කරුණාවෙන් මොවුන්ට දෙන හැටියටද, වතුරෙන් හා ශුද්ධාත්මයෙන් බව්තිස්ම ලැබීමත් ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධවූ සභාවට පිළිගැණීමත් එහි ජීවමානවූ අවයවයන් කරන්ට යෙදීමත් මොවුන්ට සලස්වාදෙන හැටියටද, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ පියවූ දෙවියන්වහන්සේට යාච්ඤා වෙන ලෙස නුඹලාගෙන් ඉල්ලමි.

¶ ඊළඟට ප්‍රෙස්බිතර් කියාවා.

අපි යාච්ඤාවෙමු.

¶ මෙහිදී සියලු සමූහය දණගසත්වා.

මහත් කරුණාවෙන් නෝවඃ සහ ඔහුගේ පවුල වතුරෙන් විනාශනොවෙන පිණිස නැවේ රක්ෂාකළාවූ, තමන්ගේ සෙනාව වන ඊශ්‍රායෙල් මනුෂ්‍යයන් රතුමුහුද මැදින් උපද්‍රවයක් නොව ගෙණයාමෙන් තමන් විසින් නියමකළ ශුද්ධවූ බව්තිස්මයේ ආදර්ශයක් පෙන්නුවාවූ, යොර්දන් ගඟේදී තමන්ගේ ප්‍රේම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බව්තිස්මයෙන් පාපය සෝදාහැරීමට සංඥාවක් පිණිස වතුර පිරිසිදුකළාවූ සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස, ඔබගේ අප්‍රමාණ කරුණාවල් උදෙසා මේ ඔබගේ දාසයන් දෙස කරුණාවෙන් බැලුව මැනව. මොවුන් ඔබගේ උදහසින් මූදනුලැබ, ක්‍රිස්තුස්වහන්ගේ සභාව නැමති නැවට ගන්ට යෙදී, ඇදහිල්ලේ ස්ථිරව, ප්‍රාර්ථනාවෙන් ප්‍රීතිව, ප්‍රේමයේ මුල්ඇද, මෙලොව පීඩා නැමති රළ පසුකොට සදාකාල ජීවන නැමති දිවයිනට පැමිණ, එහි සියලු කාලයේ ඔබ සමග රජකම්කරණ පිණිස, ශුද්ධාත්මයෙන් මොවුන් සෝද පවිත්‍රකරණමෙන් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි ඔබට යාච්ඤාකරමුව. ආමෙන්.



සියලු අසරණයින්ට සරණවූ, පිහිට ලබන්ට එන සියල්ලන්ට ආධාරකාරවූ, අදහන්නාවුන්ට ජීවනදායකවූ, මළවුන් නැවත නැගුටුවන්නාවූ, සියලු බලඇති අමරණීයවූ දෙවියන්වහන්ස, මේ තැනැත්තන් ඔබගේ ශුද්ධවූ බව්තිස්මයට පැමිණ, ආත්මිකවූ දෙවනු ජනිතයෙන් පාප මිදීම ලබන පිණිස, මොවුන් උදෙසා අපි ඔබට යාච්ඤාවෙමුව. ස්වාමිනි, ඉල්ලව් තොපට ලැබේය කියාත් සොයව් තොපට සම්භවේය කියාත් තට්ටුකරව් තොපට දොර අරිණු ලැබේය කියාත් ඔබගේ අති ප්‍රියපුත්‍රයා ලවා පොරොන්දුකෙරෙව් ලෙස මොවුන් පිළිගත මැනව. මේ තැනැත්තෝ ඔබගේ ස්වර්ගීය ධෝවනය නැමති සදාකාලවූ ආශිර්වාදය උරුමවෙමින්, අපේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබ විසින් පොරොන්දුවූ ඔබගේ සදාකාල රාජ්‍යයට පැමිණෙන්ට පුළුවන්වෙන හැටියට, ඉල්ලන්නාවූ අපට දුනමැනව. සොයන්නාවූ අපට සම්භවෙන්ට සැලැස්සුව මැනව. තට්ටුකරන්නාවූ අපට දොර ඇරිය මැනව. ආමෙන්.

¶ මින්පසු සෙනග නැගිට සිටිත්වා, ප්‍රෙස්බිතර්ද මෙසේ කියාවා.

ශුද්ධවූ යොහන් විසින් ලිවූ ශුභාරංචියේ තුන්වෙනි පරිච්ඡේදයේ පළමුවෙනි පදේශ්ට ලියවී තිබෙන වචන අහපල්ලා.

යුදයින්ගේ ප්‍රධානියෙක්වූ නිකදේමුස්නම් ඵරිසියෙක් සිටියාය. ඔහු රාත්‍රියේ යේසුස්වහන්සේ ලඟට ඇවිත් රබ්බි යමෙක් සමග දෙවියන්වහන්සේ නැත්නම් ඔබ කරන්නාවූ මේ ආශ්චර්යයීවල් කරන්ට ඔහුට බැරිය. එබැවින් ඔබ දෙවියන්වහන්සේ ලඟින් ආවාවූ ගුරුවරයෙක් බව දනිමුයයි කීවාය. යේසුස්වහන්සේ සැබවක් සැබවක් නුඹට කියමි, යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට බැරියයි කීවාය. එවිට නිකදේමුස් මනුෂ්‍යයෙකුට මිහලුවූ පසු උපදින්ට පුළුවන් කො

හොමද, දෙවෙනිවර මව් කුසයට පැමිණ උපදින්ට
පුළුවන්දැයි උන්වහන්සේගෙන් ඇසුවාය. යේසුස්ව
හන්සේ උත්තර දෙමින් සැබවක් සැබවක් නුඹට
කියමි යමෙක් වතුරෙන්ද ආත්මයෙන්ද නූපන්
නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට පැමි
ණෙන්ට බැරිය. මාංසයෙන් උපන් දේ මාංසයය
ආත්මයෙන් උපන් දේ ආත්මයය. නුඹලා නැවත
උපදින්ට ඕනෑයයි නුඹට මම කීවාට පුදුමනො
වෙන්න. හුළඟ කැමති කැමති තැනකට ගසන
වාය. එහි ශබ්දය නුඹට ඇසෙනවාය. නුමුත් කොත
නින් එනවාද, කොතනට යනවාද කියා නුඹ දන්
නේනැත. ආත්මයෙන් උපන් සියල්ලොත් එසේම
යයි කීවාය.

¶ ඊළඟට මෙහි සඳහන්වෙන අවවාදය කියාවා.

ප්‍රිය තැනැත්තෙනි, වතුරෙන්ද ආත්මයෙන්ද
උපන් කෙණෙකුට මිස, දෙවියන්වහන්සේගේ
රාජ්‍යයට පැමිණෙන්ට වෙන කෙණෙකුට බැරිය
කියා මේ ශුභාරංචියේ අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්
වහන්සේ විසින්ම කියා තිබෙන වචන නුඹලා
ඇසුවාය. මේ සක්‍රමේන්තුව ලබන්ට පුළුවන්කමක්
ඇත්නම් ඒක ලබන්ටම ඉතාම නිසි බව එයින්
තේරුම්ගන්ට පුළුවන. තවද ශුද්ධවූ මාක්ගේ ශුභා
රංචියේ අන්තිම පරිච්ඡෙදයේ පෙණෙන හැටියට,
තොප් ලොව මුලුල්ලේම ගොස් සියලු සත්වයන්ට
ශුභාරංචි ප්‍රකාශකරව්. අදහගන්නාවූ බව්තිස්මය
ලබන්නාවූ තැනැත්තා ගැලවෙයි; නුමුත් අදහ
නොගන්නා තැනැත්තා වරදට පැමිණෙයි කියා
උන්වහන්සේ ස්වර්ගයට නැගිණ කෙණෙහිම
තමන්ගේ ගෝලයින්ට ආඥාකළාය. බව්තිස්මයෙන්
අපට මහත් ප්‍රයෝජන ලැබෙන බව ඒ කීමෙනුත්
පෙණෙනවාය. එසේ හෙයින් ශුද්ධවූ පේත්‍රුස් විසින්
ශුභාරංචි පළමුවෙන් ප්‍රකාශකළවිට බොහෝ දෙ
නෙක් මැඩුනු සිත් ඇතුව සහෝදරවූ මනුෂ්‍යයෙනි



කුමක්කරමුදැයි ඔහුගෙණුත් අනික් අපොස්තුළු
වරුන්ගෙණුත් ඇසූවිට නුඹලාමත් නුඹලාගේ දරු
වන්ටත් අපේ ස්වාමිවූ දෙවියන්වහන්සේ විසින්
අඬගසන දුර සිටින්නාවූ සියල්ලන්ටත් පොරොන්
දුව ඇති බැවින් පශ්චාත්තාපව පව් මිදීම පිණිස
නුඹලා සියල්ලෝම බව්තිස්ම ලබව්, එවිට ශුද්ධාත්ම
දානය නුඹලාට'ලැබේයයි කියා වෙනත් නොයෙක්
වචනවලින් අවවාද කරමින් මේ දුෂ්ට වග්ගයා
ගෙන් මිදෙව්යයි ඔවුන්ට උත්තරදෙමින් කීවාය.
එම අපොස්තුළුවරයාම වෙන තැනක සාක්ෂිදෙමින්
කියා තිබෙන හැටියට අපි බව්තිස්මයෙන් එනම්
මාංසයේ අපවිත්‍රය පහකිරීමෙන් නොව දෙවියන්ව
හන්සේ කෙරෙහි යහපත් හිතකින් දෙන උත්තර
යෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගී
ටීම නිසා දැනුත් ගැලවෙනවායයි කීවාය. එබැවින්
සැබෑලෙස පශ්චාත්තාප වෙන්නාවූ ශ්‍රද්ධාවෙන් උන්
වහන්සේ වෙතට යන්නාවූ මේ තැනැත්තන් උන්
වහන්සේ කරුණාවෙන් පිළිගෙණ මොවුන්ගේ
පාපවල් කමාකොට ශුද්ධාත්මයත් සදාකාල ජීවන
යේ ආශිර්වාදයත් මොවුන්ට දී උන්වහන්සේගේ සදා
කාල රාජ්‍යයේ පංගුකාරයන් කරණවා ඇත කියා
නිසැකව ස්ථිරයෙන් විශ්වාසකරපල්ලා. තවද අප
ගේ ස්වර්ගීය පියානෝ තමන්ගේ පුත්‍රවූ යේසුස්
ක්‍රිස්තුස්වහන්සේ ලවා'ප්‍රකාශකළාවූ කරුණාව මේ
තැනැත්තන් කෙරෙහි තිබෙන බව අපි නිසැකව
දන්නහෙයින් ශ්‍රද්ධාවෙන් හා භක්තියෙන් යුක්තව
මෙසේ කියමින් උන්වහන්සේට ස්තුතිකරමු.

සියලු බලඇති සදාකාලවූ දෙවියන්වහන්ස,
ස්වර්ගීය පියානන්වහන්ස ඔබගේ කරුණාව දැන
ගැණීමටත් ඔබ ඇදහීමටත් අප කැඳවාගන්ට කරු
ණාකළ නිසා අපි ඔබට යටත්භාවයෙන් ස්තුතිකර
මුව. මේ දැනගැණීම අපට වැඩිකොට මේ ඇදහීම
අප තුළේ නිතරම ස්ථිරකළ මැනව. මේ තැනැත්

තාන් දෙවනු ජනිතව සදාකාල ගැලවීමේ උරුමක්කාරයන් කරන්ට යෙදෙන පිණිස ඔබගේ ශුද්ධාත්මය මොවුන්ට දෙනමෙන් ඔබ හා ශුද්ධාත්මයානන් සමග දැනටත් සදාකාලයටත් ජීවත්ව ආණ්ඩුකාරණ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාච්ඤාවෙමුව. ආමෙන්.

¶ එවිට ප්‍රෙස්බිතර් බව්තිස්ම ලබන පිණිස සිටිනවුන්ට මෙසේ කියාවා.

ශුද්ධවූ බව්තිස්මය ලබන කැමැත්තෙන් මෙහි ඇවිත් සිටින්නාවූ ඉතා ප්‍රිය පැනැත්තෙනි, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් නුඹලා පිළිගෙණ නුඹලාට ආශිර්වාද කරණලෙසද, නුඹලාගේ පාපවලින් නුඹලා මුදාහරිණ ලෙසද, ස්වර්ගරාජ්‍යය හා සදාකාල ජීවනය නුඹලාට දෙනලෙසද කාරුණ්‍ය කාරණමෙන් මේ සමුදුව යාච්ඤාකළ බව නුඹලා ඇසුවාය. තවද අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප විසින් ඉල්ලූ සියලු දේ දෙන ලෙස උන්වහන්සේගේ ශුද්ධවූ වචනයේ පොරොන්දුවූ බවද නුඹලා ඇසුවාය. උන්වහන්සේ ඒ පොරොන්දුව සතාකටම කඩනොකොට ඉෂ්ටකරණවා ඇත. ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පොරොන්දුවී තිබෙන බැවින් නුඹලාගේ මේ සාක්ෂිකාරයින්ද මේ සියලු සමුදුවද ඉදිරියේ නුඹලාත් යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල් අත්අරිණ හැටියටද, දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනය ස්ථිරයෙන් අදහන හැටියටද උන්වහන්සේගේ ආඥාවල් කීකරුකමින් රක්ෂාකරණ හැටියටද, අවඩකාලෙස පොරොන්දුවෙන්ට ඕනෑය.

¶ ඉන්පසු ප්‍රෙස්බිතර් විසින් බව්තිස්ම ලබන්නට ඇවිත් සිටින එක එකාගෙන් මෙහි පහළ පෙණෙන ලෙස ඇසිම් ඇසිය යුතුය.

ඇසිම. නුඹ යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල්ද ලෝකේ නිෂ්ඵල අහංකාරය හා මාන්නයද, සියලු ලෝකවූ තණ්හාවල්ද මාංසයේ නපුරු තෘෂ්ණාවල්ද යන දේට එළඹෙන්නේවත් අනුවෙන්නේවත් නැතුව ඒවා අත්අරිණවාද.



උත්තරය. ඒ සියල්ල මම අත්අරිමි.

ඇසිම. ස්වර්ගයේ සහ පොළවේ මැවුම්කාර සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේ අදහගන්නවාද, උන්වහන්සේගේ ඒකජාත පුත්‍රද අපේ ස්වාමිදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහගන්නවාද, උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ, මරියානම්වූ කන්‍යාවගෙන් ඉපද පොන්තිවුස් පිලාත් යටතේ වධවිද කුරුසියේ ඇනනැසුම්කා මැරී වළලනු ලැබ පර ලොවට ගොස් තුන්වෙනිදා මළවුන්ගෙන් නැවත නැගිට ස්වර්ගයට නැගී සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳගත් බවද, ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චයකරණ පිණිස ලෝකාන්තිමේදී එතනින් එනබවද, අදහගන්නවාද. ශුද්ධාත්මයානන්වහන්සේ අදහගන්නවාද. ශුද්ධවූ සර්වසාධාරණ සභාවත් පවිත්‍රයන්ගේ එකඟකමත් පාපවල කමාවත් ශරීරයේ නැවත නැගිට්මත් මරණින් පසු සදාකාල ජීවනයත් ඇති බව අදහගන්නවාද.

උත්තරය. ඒ සියල්ල ස්ථිරයෙන් අදහගණිමි.

ඇසිම. මේ ඇදහිල්ලේ බව්තිස්ම ලබන්ට කැමතිද.

උත්තරය. ඊට මම කැමතිය.

ඇසිම. එහෙනම් නුඹ දෙවින්වහන්සේගේ ශුද්ධවූ කැමැත්තත් ආඥාවලුත් කීකරුලෙස රක්ෂාකොට නුඹේ ජීවිතාන්තය දක්වා එලෙස හැසිරෙන්ට කැමතිද.

උත්තරය. දෙවියන්වහන්සේගේ පිහිටෙන් එසේ කරන්ට උත්සාහකරමි.

¶ එවිට ප්‍රෙස්බිතර් කියාවා.

කරුණාවන්තවූ දෙවියන්වහන්ස, මේ තැනැත්තන් තුළ පිහිටි පුරාණ ආදම් වළලමින්, අලුත් මනුෂ්‍යයා මොවුන් තුළ නැගුව මැනව. ආමෙන්.

මොවුන් තුළ සියලුම මාංසික ආසාවල් නසමින් ශුද්ධාත්මයට අයිති සියලු දේ ජීවත්කොට වඩින කළ මැනව. ආමෙන්.

යක්ෂයත් ලෝකයත් මාංසයත් පරදවා ජය ගන්න පිණිස මොවුන්ට බලයත් සවියත් දුනමැනව. ආමෙන්.

සදාකල් ජීවත්ව සියල්ල ආණ්ඩුකරන්නාවූ ප්‍රශංසනීයවූ දෙවිස්වාමිනි, අපේ තිලයෙන් හා සේවයෙන් මෙහිදී ඔබට පූජාකරන්ට යෙදෙන තැනැත්තන් ස්වර්ගීය ගුණයන්ගෙන් සරසා සදාකාලවූ යහපත් විපාකය ඔබගේ කරුණාවෙන් ඔවුන්ට දුනමැනව. ආමෙන්.

අපේ පාපවල කමාව පිණිස තමන්ගේ අනර්ඝවූ ඇලයෙන් වතුර හා ලේ වැගිරෙව්වාවූ, තොපි ගොස් සියලු මනුෂ්‍යයන් මගේ ගෝලයන්කර, පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් ඔවුන් බව්තිස්මකරව්යයි තමන්ගේ ගෝලයින්ට ආඥාකළාවූ යේසුස් ක්‍රිස්තුස් නම් අති ප්‍රේම පුත්‍රයෙක් ඇති සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස, මේ සමුදුව කාරණ යාච්ඤාවල් පිළිගන්න හැටියටත් පාපය සෝදාදැමීමට සංඥාවක්වූ මේ වතුර පිරිසිදුකරණ හැටියටත් දැන් එයින් බව්තිස්ම ලබන්ට සිටින මේ තැනැත්තන්ට ඔබගේ කරුණාව සම්පූර්ණයෙන් දෙන හැටියටත් ඔබගේ විශ්වාසවූ තෝරාගත් දරුවන්ගේ ගණනේ මොවුන් සදාකල් පවත්වන හැටියටත්, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ ඊලඟට ප්‍රෙස්බිතර් විසින් බව්තිස්ම ලබන්ට සිටින එක එකාගේ දකුණත අල්වා ඔහුව යහපත්ව පෙණෙනලෙස බව්තිස්ම භාජනය ලඟ ඔබින හැටියට හිටවා සාක්ෂිකාර මව්පියන්ගෙන් නම අහගණ ඔහු දියේ ගල්වමින් නොහොත් ඔහුට දිය ඉසිමින් මෙසේ කියාවා.



**න. පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් තුඹ බව්තිස්මකරමි.**

¶ ඊලඟට ප්‍රෙස්බිතර් කියාවා.

මින්පසු මේ **තැනැත්තා** කුරුසියේ ඇනගසනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිල්ල ප්‍රකාශකරන්ටද පාපයටත් ලෝකයටත් යක්ෂයාටත් විරුද්ධව ක්‍රිස්තුස්වහන්සේගේ ජයකොඩිය යටතේ දක්ෂ ලෙස යුද්ධකරන්ටද ජීවිතාන්තය දක්වා උන්වහන්සේගේ විශ්වාස **සේවකයෙක්** හා **දාසයෙක්වී** සිටින්ටද ලජ්ජානොවෙන බවට ලකුණක් පිණිස, අපි **මොහු** ක්‍රිස්තුස්වහන්සේගේ සේනාව නැමති රංචුවට ඇතුළත්කොට කුරුසියේ ලකුණෙන් * ලකුණුකරමුව. ආමෙන්.

¶ නැවතද ප්‍රෙස්බිතර් කියාවා.

ප්‍රිය සහෝදරයෙනි, දැනට මේ තැනැත්තෝ දෙවනු ජනිතව ක්‍රිස්තුස්වහන්සේගේ සභාව නැමති ශරීරයේ පිහිටුවනු ලැබූහෙයින් ඒ ප්‍රයෝජන උදෙසා සියලු බලඇති දෙවියන්වහන්සේට ස්තුතිකරමු. තවද මේ පටන්ගැන්ම ලෙස මේ තැනැත්තන්ට ඔවුන්ගේ ජීවිතය මුලුල්ලම පසුකරන්ට පුළුවන්වෙන පිණිස අපි එක්සිත්ව දෙවියන්වහන්සේට යාච්ඤාකරමු.

¶ එව්ට සියල්ලෝම දනගසා ස්වාමින්ගේ යාච්ඤාව කියත්වා.

ස්වර්ගයේ හිටින අපේ පියානනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ, අපේ වැරදිවලටත් කමාවූව මැනව. අප පරීක්ෂාවීමට නොපමුනුවා, නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

---

* මෙහිදී ප්‍රෙස්බිතර් මිනිහාගේ නළලේ කුරුසියේ ලකුණ කරාවා.

සර්වශක්තියවූ පියානන්වහන්ස ඔබගේ කාරුණ්‍යව දැනගැණීමටත් ඔබ ඇදහීමටත් අප කැඳවාගන්ට කාරුණ්‍යකළ නිසා අපි ඔබට යටහත්භාවයෙන් ස්තූතිකරමුව. මේ දැනගැණීම අපට වැඩිකොට, මේ ඇදහීම අපතුලේ නිතරම ස්ථිරකළ මැනව. දැන් මේ තැනැත්තෝ දෙවනු ජනිතව අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා සදාකාල ගැලවීමේ උරුමක්කාරයන් කරණු ලැබ ඔබගේ දාසයෝව පැවති සිට, ඔබගේ පොරොන්දු ලබාගන්ට පුළුවන් වෙන පිණිස ඔබගේ ශුද්ධාත්මය මොවුන්ට දෙනමෙන් ඔබ හා ශුද්ධාත්මයානන් සමග ඒකත්වයත්ව ඔබ සමග සදාකල් ජීවත්ව ආණ්ඩුකරණ ඔබගේ පුත්‍රවූ එම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා සාවඥවෙමුව. ආමෙන්.

¶ නැවත සියල්ලෝම නැගිට සිටිකල ප්‍රෙස්බිතර් මෙහි පහත සඳහන්වෙන අවවාද කියාවා. පළමුකොට ඇපකාර මව්පියන්ට මෙසේ කියාවා.

මේ තැනැත්තෝ, යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවල් අත්අරින්ටද දෙවියන්වහන්සේ අදහමින් උන්වහන්සේට වැඩකරන්ටද නුඹලා ඉදිරියේ පොරොන්දුවූනාය. එබැවින් තෝරාගත් සාක්ෂිකාරවූ නුඹලා ප්‍රධානකොට මේ සමූදව ඉදිරියේ මොවුන් කොපමණ මහත් ගිවිසුමකුත් පොරොන්දුවකුත් ප්‍රකාශයකුත් කළාද යනාවග මොවුන්ට සිහිකරවන්ට නුඹලාට නිසිබව සිහියටගන්ට යුතුය. තවද මොවුන් කාරුණ්‍යවෙහිද අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැණීමෙහිද වර්ධනවෙන පිණිසත් මේ ලෝකයේ භක්තිවනතව ධර්මිෂ්ඨව සංසුංව හැසිරෙණ පිණිසත දෙවියන්වහන්සේගේ ශුද්ධවූ වචනය හරියාකාර ඉගෙණගැණීමට බොහෝ සෙයින් උත්සාහකරන්ට නුඹලා විසින් මොවුන්ට දැනුමැතිකම් දියයුතුය.



¶ ඊලඟට ඒ අලුතෙන් බව්තිස්ම ලැබූ අයට අවවාදකරමින් මෙසේ කියාවා.

දැන් බව්තිස්ම ලැබීමෙන් ක්‍රිස්තුස්වහන්සේ පැලඳගත්තාවූ නුඹලා විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඇදහීමෙන් දෙවියන්වහන්සේගෙත් ආලෝකයෙත් දරුවන්වූ බැවින් නුඹලාගේ ක්‍රිස්තියානිනාමයලෙසද ආලෝකයේ දරුවන්ට ඔබිනාලෙසද හැසිරීම නුඹලාගේ නිස්සැක හා යුතුකමක්ය. තවද බව්තිස්මවූ අපි අපේ ඇදහිල්ල ලෙස අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය පසුව යන්ටත් උන්වහන්සේ හා සමානවෙන්ටත් උන්වහන්සේ අප උදෙසා මරණු ලැබ නැවත නැගුටුනු හැටියට බව්තිස්මවූ අපිත පාපයට මැරී ධර්මිෂ්ඨකමට නැවත නැගිට අපේ සියලු නපුරු දුෂ්ටතෘෂ්ණාවල් නිතර නසාගැණීමින් සියලු ගුණයෙන් හා භක්තිවූ ජීවත්වීමෙන් දවස්පතා හැසිරෙන්ට බව්තිස්මයේ අපට ප්‍රකාශකර තිබෙන බව නිතර සිහිකරන්ට නුඹලාට යුතුය.

¶ මෙසේ බව්තිස්ම ලැබූ සියල්ලන් ශුද්ධවූ රාත්‍රිභෝජනයට ඇතුළත්වෙන පිණිස ඔවුන්ට ප්‍රස්ථා ඇතිහැටියකින් බව්තිස්ම ලැබූ ලඟදීම බිස්කොප් ලවා ස්ථිරකරවාගන්ට යුතුය.

¶ ළදරු කාලයේ බව්තිස්ම නොලැබූ කිසිවෙක් තමා ගැණම උත්තරදෙන්ට පුළුවන් දැනුමැති වයසට පැමිණෙන්ට පළමුවෙන් බව්තිස්ම ලැබීමට ගෙණඑන්ට යෙදුනොත් ළදරුවන්ගේ ප්‍රසිද්ධ බව්තිස්මයේ ක්‍රමයලෙස ඔහු බව්තිස්ම කළාම ඇත. තවද ඔහු බලවත් උපද්‍රවයකට පැමිණ සිටියොත් අප්‍රකාශ බව්තිස්මයේ ක්‍රමය ලෙස කළාම ඇත. නුමුත් ළදරුවාය යන වචනය වෙනුවට ඒ ප්‍රස්තාවට නිසිව තිබෙන හැටියකින් ලමයා නොහොත් තැනැත්තායයි කියාවා.

# කතිකිස්මය.

මෙවත්

ස්ථිරවීමට සිටින සියලුදෙනා විසින්ම
තමුන් බිස්කොප් උන්නාන්සෙ ලඟට
ගෙණයාමට පළමුවෙන් ඉගෙණගන්ට
නිසි ගුරුකම්.

ඇහීම. නුඹේ නම මොකද?

උත්තරය. [මෙහිදී ක්‍රිස්තියානි නම කියන්ට ඕනෑය.]

ඇ. මේ නම නුඹට දුන්නේ කව්ද?

උ. මම බව්තීස්ම ලබනවිට මගේ ඇපකාර මව්පියෝය. එකල මම ක්‍රිස්තුස්වහන්සේගේ අවයවයක්ද දෙවියන්වහන්සේගේ දරුවෙක්ද ස්වර්ග රාජ්‍යයේ උරුමක්කාරයෙක්ද වුනෙමි.

ඇ. එකල නුඹේ ඇපකාර මව්පියෝ නුඹ වෙනුවට මක්කළාද?

උ. මගේ නාමින් කාරණ තුණක් පොරොන්දුව ගිවිසගත්තාය. ඒනම්:

පළමුවෙනුව. මා විසින් යක්ෂයා සහ ඔහුගේ සියලු ක්‍රියාවන්ද මේ දුෂ්ටවූ ලෝකයේ අහඞ්කාරකම හා නිෂ්ඵලකමද මාංසයේ සියලු පාප තෘෂ්ණාවන්ද අත්හරිණ හැටියටත්

දෙවෙනුව. මා විසින් ක්‍රිස්තියානි ඇදහිල්ලේ සියලු වගන්ති අදහන හැටියටත්

තුන්වෙනුව. මා විසින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත සහ ආඥාවන් රක්ෂාකොට ජීවිතාන්තය දක්වා එහිම හැසිරෙණ හැටියටත්ය.

ඇ. එසේවීනම් ඔවුන් නුඹ වෙනුවට පොරොන්දුවූ ලෙස අදහන්ටත් කරන්ටත් නුඹට යුතුය කියා සිතන්නේ නැද්ද?



උ. සැබෑවටම එසේ හිතමින් දෙවියන්වහන්සේගේ උපකාරයෙන් එලෙස කරන්නෙමි. තවද අපගේ ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ කාරණකොටගෙණ මේ ගැලවීමේ මාර්ගයට මා කැඳෙව් නිසා අපේ ස්වර්ගීය පියාණන්ට හිතෙන්ම ස්තුති කරමින් මාගේ ජීවිතාන්තය දක්වා එහිම හැසිරෙණ පිණිස කරුණාව ලැබෙන හැටියට දෙවියන්වහන්සේට යාච්ඤාකරමි.

## ගුරුවරයා.

නුඹේ ඇදහිල්ලේ ක්‍රමය කියාපන්.

ස්වර්ගයේ සහ පොළොවේ මැවුම්කාර සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේ අදහමි. උන්වහන්සේගේ එකම පුත්‍රවූ අපේ ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේද අදහමි. උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ මරියානම් කන්‍යාවගෙන් ඉපද පොන්තියුස් පිලාත් යටතේ වධවිඳ කුරුසියේ ඇණගැසුම්කා මැරී වළලනුලැබ පරලොවට ගොස් තුන්වෙනිදා මළවුන් කෙරෙන් නැවත නැගිට ස්වර්ගයට නැගී සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳගත් බවද ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චයකරණ පිණිස එතැනින් එන බවද අදහමි.

ශුද්ධාත්මයාණන්වහන්සේද අදහමි. ශුද්ධවූ සර්වසාධාරණ සභාවත් පවිත්‍රයන්ගේ එකඟකමත් පාපවල කමාවත් ශරීරයේ නැවත නැගිටීමත් සදාකා ජීවනයත් ඇති බවද අදහමි.

ඇ. නුඹේ මේ ඇදහිල්ලේ ක්‍රමයෙන් නුඹ ඉගෙණගන්න ප්‍රධාන කාරණ මොනවාද?

උ. පළමුවෙනුව. මා සහ මුලු ලෝකය මැව් පියාවන දෙවියන්වහන්සේ කෙරෙහිද

දෙවෙනුව. මා සහ සියලු මනුෂ්‍යවර්ගයා ගලවාගත් පුත්‍රවන දෙවියන්වහන්සේ කෙරෙහිද

තුන්වෙනුව. මා සහ දෙවියන්වහන්සේගේ තෝරාගත් සියලු මනුෂ්‍යයන් පිරිසිදුකරන්නාවූ ශුද්ධාත්මවනා දෙවියන්වහන්සේ කෙරෙහිද අදහන්ට ඉගෙණගණිමි.

ඇ. නුඹ දෙවියන්වහන්සේගේ ආඥාවන් රක්ෂාකරණ හැටියට නුඹේ ඇපකාර මව්පියන් විසින් නුඹ වෙනුවට පොරොන්දුවූනා බව නුඹ කීවාය. ආඥා කීයක් තිබෙනවාද කියා මට කියාපන්.

උ. දසයක.

ඇ. ඒ මොනවාද?

උ. වාල්කමේ ගෘහයවූ මිසරදේශයෙන් තා පිටතට ගෙණා තාගේ දෙවිවූ යෙහෝවඃ මමයයි නික්මයාමේ කථාවේ විසිවෙනි පරිච්ඡේදයේ දෙවියන්වහන්සේ විසින් කී ආඥාවල්ය.

1. මා ඇර වෙන දෙවිකෙනෙක් සරණ නොගණුව.

2. කැපූයම් රූපයක් හෝ උඩ අහසේවත් පාත පොළවේවත් පොළවෙන් යට වතුරේවත් තිබෙන දෙයකට සමානවූ කිසිදෙයක් තට සාදනොගණුව. ඒ දේට නමස්කාරයක්වත් වැඳීමක්වත් නොකරව. මක්නිසාද තාගේ දෙවිවූ යෙහෝවඃනම් මම අන්‍යභක්ති නොඉවසන්නාවූ දෙවිකෙනෙක. මට වෛරවෙන්නාවුන්ගේ පාප ගැණ තුන්වෙනි හතරවෙනි පරම්පරාව දක්වා ඔවුන්ගේ දරුවන්ට අච්චුකරන්නාවූ මට ස්නේහවෙන්නාවුන්ගේත් මාගේ ආඥා පවත්වන්නාවුන්ගේත් පරම්පරා දහස්ගණනකට කරුණාව පෙන්වන්නාවූ දෙවිකෙනෙක.

3. තාගේ දෙවිවූ යෙහෝවඃගේ නාමය නිරර්ථකයේ නොකියව, මක්නිසාද යෙහෝවඃගේ නාමය නිරර්ථකයේ කියන්නා යෙහෝවඃවහන්සේ විසින් නිවැරදිකාරයෙක්කොට ගන්නේ නැත.

4. සබත්දවස පිරිසිදුකොට පවත්වන්ට සිහිකරගණුව. සදවසක් වැඩකොට තාගේ සියලු කර්මාන්ත කරගණුව. සත්වෙනි දවස තාගේ දෙවිවූ යෙහෝවඃගේ නිවාඩුදවසය. ඒ දවසේ තෝ කිසි වැඩක් නොකරව. තවද තාගේ පුතාවත් දූවවත් දාසයාවත් දාසිවත් සිව්පා ජාතිහුවත් තාගේ සීමාවතුළ සිටින ආගන්තුකයාවත් ඒ දවසේ වැඩ නොකරාවා. මක්නිසාද යෙහෝවඃ ස්වර්ගයත් පොළවත් මුහුදත් එහි තිබෙන සියල්ලත් සදවස ඇතුළත මවා සත්වෙනිද නිවාඩුගත් බැවින් සත්වෙනි දවසට ආශීර්වාදකොට පිරිසිදුකළාය.



5. තාගේ පියාටත් මව්ටත් ගෞරවකරව, එයින් තාගේ දෙවිවූ යෙහෝවඃ තට දෙන රටේදී තාගේ දවස් බෝවෙයි.

6. මිනී නොමරව.

7. කාමමිථ්‍යාචාරය නොකරව.

8. හොරකම් නොකරව.

9. තාගේ අසල්වාසියාට විරුද්ධව බොරුසාක්ෂි නොකියව.

10. තාගේ අසල්වාසියාගේ ගෙදරට ආසානොවව. තාගේ අසල්වාසියාගේ ස්ත්‍රියටවත් ඔහුගේ දාසයාටවත් දාසියටවත් ගොණාටවත් කොටළුවාටවත් වෙන කොයි දෙයකටවත් ආසානොවව.

ඇ. මේ ආඥාවලින් නුඹ ඉගෙණගන්න ප්‍රධාන කාරණා මොනවාද?

උ. මම කාරණා දෙකක් ඉගෙණගන්නවාය. ඒනම් මා විසින් දෙවියන්වහන්සේට කරන්ට නිසියුතුකමත් මාගේ අසල්වාසියාට කරන්ට නිසි යුතුකමත්ය.

ඇ. නුඹ විසින් දෙවියන්වහන්සේට කරන්ට නිසි යුතුකම මොකද?

උ. මා විසින් දෙවියන්වහන්සේට කරන්ට නිසියුතුකමනම් උන්වහන්සේ ඇදහීමත් උන්වහන්සේට භයවීමත් මාගේ මුලු හෘදයෙන්ද මාගේ මුලු සිහියෙන්ද මාගේ මුලු ආත්මයෙන්ද මාගේ මුලු

ශක්‍තියෙන්ද උන්වහන්සේට ආදරවීමත් නමස්කා
ර කිරීමත් සතුත්කිරීමත් මාගේ මුළු විශ්වාසය උන්
වහන්සේ කෙරෙහි තැබීමත් උන්වහන්සේට යා
ච්ඤාකිරීමත් උන්වහන්සේගේ ශුද්ධවූ නාමයටද
වචනයටද ගෞරවකිරීමත් මාගේ ජීවිතාන්තය
දක්වා සැබෑකමින් උන්වහන්සේට මෙහෙකිරී
මත්ය.

ඇ. නුඹ විසින් නුඹේ අසල්වාසියාට කරන්ට
නිසි යුතුකම මොකද ?

උ. මා විසින් මාගේ අසල්වාසියාට කරන්ට නිසි
යුතුකමනම් මටම මෙන් ඔහුට ආදරවීමත් සියලු
මනුෂ්‍යයන් විසින් මට කරණවාට මම කැමති යම්
දෙයක් ඇද්ද ඒ දේ මා විසින් ඔවුන්ට කිරීමත්
මාගේ මව්පියන්ට සෙනේහවීමත් ගෞරව සත්කාර
කිරීමත් මහා රජිනින්ට හා උන්වහන්සේ යටතේ
බලය ලත් සියල්ලන්ට ගෞරවකිරීමත් කීකරුවී
මත් මාගේ සියලු මූලාදෑනින්ට හා ඉගැන්නුම්
කාරයන්ටද දේවගැතියන්ට හා ස්වාමිවරුන්ටද
යටත්වීමත් මට වඩා උතුම් අයට යටත්කමින් සහ
ගෞරවයෙන් හැසිරීමත් වචනයෙන් හෝ ක්‍රියා
වෙන් හෝ කිසි කෙණෙකුට හිංසා නොකිරීමත්
අවඩකාවූ සාධාරණවූ අන්දමින් මාගේ සියලු ගණු
දෙනු කිරීමත් මාගේ ශ්‍රතෝ ක්‍රෝධ වෛර නොබැ
ඳීමත් හොරකම්කිරීමෙන් හා කොල්ලගැණීමෙන්
මාගේ අත් වලකාගැණීමත් නපුරු කථාවෙන් හා
බොරු කීමෙන්ද කේලම් කීමෙන්ද දිව වලකා
ගැණීමත් පමණ දැනීමෙන්ද සංසුංකමින්ද පිරිසි
දුකමින්ද ශරීරය තබාගැණීමත් අන්සන්තක
දේට ඇලුම්ව ආසානොවීමත් මාගේම රක්ෂාව ලබා
ගන්නා පිණිස ඉගෙණගැණීම සහ යුතුලෙස
උත්සාහකිරීමත් දෙවියන්වහන්සේ විසින් මා යම්
තරමකට පත්කරන්ට කැමතිවෙනවාද එහි කට
යුතු දේ මා විසින් කිරීමත්ය.



## ගුරුවරයා.

මාගේ හොඳ දරුව දෙවියන්වහන්සේගේ අධි
කවූ කාරුණාව නැතුව නුඹට මේ දේ කිරීමවත්
උන්වහන්සේගේ ආඥාවල් ලෙස පිළිපැදීමවත්
උන්වහන්සේට මෙහෙකිරීමවත් නුඹේම සමර්ථක
මින් බැරි බව හිතාගෙණ ඒ කාරුණාව ලැබීම
පිණිස නිතර උත්සාහයෙන් යාච්ඤාකරන්ට නුඹ
දැනගන්ට ඕනෑය. එබැවින් පුළුවන්නම් මට ඇ
සෙන්ට ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව කියාපන්.

## උත්තරය.

ස්වර්ගයේ සිටිනා අපගේ පියාණෙනි, ඔබගේ
නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය
පැමිණේවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන්
පොළවෙත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝ
ජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට
අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමා
වුවමැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා නපු
රෙන් අප ගලවාගතමැනව. මක්නිසාද රාජ්‍යයත්
බලයත් මහිමතාවයත් සදාකල්ම ඔබගේය. ආමෙන්.

ඇ. නුඹ මේ යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ
ගෙන් ඉල්ලන්නේ මොනවාද ?

උ. සියලු යහපත් දේ දෙන්නාවූ අපේ ස්වර්ගීය
පියවූ දෙවිස්වාමීන්ට අප විසින් කටයුතුව තිබෙන
ප්‍රකාරයට නමස්කාරකරමින් මෙහෙකරන්ටත්
කීකරුවෙන්ටත් පුළුවන්වෙන පිණිස මට හා සිය
ලු මනුෂ්‍යයන්ට පිහිට දෙනලෙස උන්වහන්සේ
ගෙන් ඉල්ලමි. තවද අපේ ශරීරවලට හා ආත්මවලට
උවමනාවූ සියලු දේ අපට දෙනලෙසද අපට කාරු
ණාකරමින් අප විසින් කළ පව් කමාකරණලෙසද
අපේ ආත්මයටත් ශරීරයටත් වෙන්නාවූ සියලු
අනතුරුවලදී අප ගලවා රක්ෂාකරණ ලෙසද සියලු

පාපයෙනුත් දුෂ්ටකම්නුත් ආත්මික සතුරගෙණුත් සදාකාල මරණයෙනුත් අප ආරක්ෂාකරගන්නා ලෙසද දෙවියන්වහන්සේට යාච්ඤාකරමි. තවද අපේ ස්වාමිවූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කරුණාවෙන් හා යහපත්කමින් උන්වහන්සේ එසේ කරණවා ඇතැයි විශ්වාසකරමි. එබැවින් එසේ වේවා යන අර්ථඇති ආමෙන්යයි කියමි.

ඇ. ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ සභාවේ සක්‍රමේන්තු කීයක් නියමකළාද?

උ. බව්තිස්මයත් ස්වාමින්ගේ රාත්‍රිභෝජනයත් යන දෙක පමණක්ය. ඒවා ගැලවීමට සාමාන්‍යයෙන්ම උවමනාය.

ඇ. සක්‍රමේන්තුව යන වචනයෙන් නුඹට හැඟෙන්නේ මොකද?

උ. අපට දෙනලද්දාවූ ඇතුළතවූ ආත්මික කරුණාවේ පිටතවූ දෘශ්‍යමාන ලකුණක් බව මට හැඟෙනවාය. තවද ඒක එම කරුණාව ලැබීමට මාර්ගයක්ද ඒක ලැබෙන බව සහතිකකිරීමට උකසක්ද වශයෙන් ක්‍රිස්තුස්වහන්සේ විසින්ම නියෝගකළ ලකුණක්ය.

ඇ. සක්‍රමේන්තුවකට පඞ්ගු කීයක්ද?

උ. දෙකය. ඒනම් පිටතවූ දෘශ්‍යමාන ලකුණත් ඇතුළතවූ ආත්මික කරුණාවත්ය.

ඇ. බව්තිස්මයේ පිටතවූ දෘශ්‍යමාන ලකුණ නොහොත් සංඥාව මොකද?

උ. වතුරය. එයින් පියානන්ගේද පුත්‍රයානන්ගේද ශුද්ධාත්මයානන්ගේද නාමයෙන් බව්තිස්ම කරණු ලැබීමය.

ඇ. ඇතුළවූ ආත්මික කරුණාව මොකද?

උ. [මුළ තැනැත්තන් හා සමානව] පාපයට මැරීමත් ධර්මිෂ්ඨකම් කිරීමට නැවත ඉපදීමත්ය. මක්නිසාද ස්වභාවයෙන්ම පාපයෙහි උපන්නාවූ උදහසේ දරුවෝවූ අපි මෙයින් කරුණාවේ දරුවෝ වෙනවාය.



ඇ. බව්තිස්ම ලැබීමට සිටින්නන්ගෙන් ඕනෑකරන්නේ මොකද?

උ. පසුතැවිලිවීමත් ශ්‍රද්ධාවත්ය. පසුතැවිලිවීමෙන් ඔවුන් පාපය අත්අරිණවාය. ශ්‍රද්ධාවෙන් ඒ සක්‍රමේන්තුවේදී ඔවුන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගේ පොරොන්දු ස්ථිරලෙස විශ්වාසකරණවාය.

ඇ. එසේවීනම් බිළිඳුකම නිසා ඒ කාරණ දෙක ඉෂ්ටකළ නොහැකිවූ ළදරුවන් බව්තිස්ම කරන්නේ මක්නිසාද?

උ. ඔවුන් ඒ කාරණ දෙකම තමන්ගේ ඇපකාරයන් ලවා පොරොන්දුකරවන නිසාය. ඔවුන් නිසි වයසට පැමුණුනාම ඒ පොරොන්දුව ඉෂ්ටකිරීමට තමන්ම බැඳිසිටිනවාය.

ඇ. ස්වාමීන්ගේ රාත්‍රිභෝජනය යන සක්‍රමේන්තුව නියමකළේ මක්නිසාද?

උ. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය නම්වූ යාගයත් එයින් අපට ලැබෙන ප්‍රයෝජනත් නිතරම සිහිකිරීම පිණිසය.

ඇ. ස්වාමින්ගේ රාත්‍රිභෝජනයේ පිටත පඞ්ගු නොහොත් සලකුණ මොකද?

උ. රොටි සහ මුද්‍රිකපානයය. ඒවා පිළිගන්ට කියා ස්වාමින්වහන්සේ ආඥාකළාය.

ඇ. එහි ඇතුළතවූ පඞ්ගුව නොහොත් අභිප්‍රාය මොකද?

උ. ක්‍රිස්තුස්වහන්සේගේ මාංසය හා ලේය. ඒවා ස්වාමින්ගේ රාත්‍රිභෝජනයේදී ඇදහිලිවන්තයෝ සැබෑවටම පිළිගන්නවාය.

ඇ. එයින් අපට ලැබෙන ප්‍රයෝජන මොනවාද?

උ. රොටියෙන් හා මුද්‍රිකපානයෙන් අපේ ශරීරවලට ශක්තියත් සැපයත් ලැබෙන්නාක්මෙන්ම ක්‍රිස්තුස්වහන්සේගේ මාංසයෙන් හා ලෙයින් අපේ ආත්මවලට ශක්තියත් සැපයත් ලැබීමය.

ඇ. ස්වාමීන්ගේ රාත්‍රිභෝජනයට පැමිණෙන්නවුන් විසින් කටයුතුව තිබෙන්නේ මොකද?

උ. අලුත් ජීවිතයකින් කල්යවන්ට ස්ථිරලෙස හිතාටගණිමින් තමුන් විසින් කළ පව් ගැණ සැබෑවටම පසුතැවිලිවෙනවාද කියාත් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ දෙවියන්වහන්සේගේ කරුණාව කෙරෙහි ජීවමාන ශ්‍රද්ධාවක් ඇතුව සිටිනවාද කියාත් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය ස්තුතියෙන් සිහිකරණවාද කියාත් සියලු මිනිසුන් හා සමග ප්‍රේමයෙන් කල්කරණවාද කියාත් පරීක්ෂාකර බැලීමය.

---

## ස්ථිරකිරීමේ ක්‍රමය

නොහොත්

## බව්තිස්මලැබූ, සෑහෙණ වයසට පැමිණි අයගේ, හිසඅත්තැබීමේ ක්‍රමය.

---

¶ නියමකරණලද දවසේදී ස්ථිරකිරීම ලබන්ට සිටින්නාවූ සියල්ලෝම බිස්කොප් ඉදිරියේ දක්වනුලැබ පෙළට සිටිත්වා. එවිට බිස්කොප් විසින්වත් ඒ තැන විසින් නියමකරන්ට යෙදුන වෙන දේවගැතියෙක් විසින්වත් මෙහි පහළ ලියා තිබෙන ප්‍රාරම්භය කියයුතුය.

ස්ථිරකිරීම ලබන්නන්ගේ වඩා ප්‍රයෝජනය උදෙසා ඒක පවත්වන පිණිස, ඇදහිල්ලේ ක්‍රමයද ස්වාමීන්ගේ යාච්ඤාවද, ආඥාවල් දසයද කියන්ටත්, ලුහුඬු කතිකිස්මයේ අනික් ඇහිම්වලට උත්තර දෙන්ටත් පුළුවන් තැනැත්තන් මිස වෙන අය, මින්මතු ස්ථිරනොකෙරීම හොඳයයි කියා සභාව නියමකරන්ට කල්පනාකළාය. තවද යුතු වයසට පැමිණි, බව්තිස්ම ලබද්දී ඇපකාර මව්පියෝ තමුන් වෙනුවට පොරොන්දුවූදේ ඉගෙණගත් දරුවන් විසින්, ඒ දේ තමන්ගේම කටින් කැමැත්තෙන්,



සභාව ඉදිරියේ ප්‍රකාශයෙන් සව්කොට ස්ථිරකරන්ටත්, තමන් විසින් පිළිගත්තාය කියා ප්‍රකාශකළ දෙය දේවකරුණාවෙන් නිතර විශ්වාසයෙන් ඉෂ්ටකරන්ට උත්සාහකරණ හැටියට පොරොන්දුවෙන්ටත්, මෙම නියෝගය පැවැත්වීම ඉතා යුතුය.

¶ එවිට බිස්කොප් මෙසේ කියාවා.

තුඹලා බව්තිස්ම ලබද්දී තුඹලා වෙනුවට කරන්ට යෙදුනු මහත් පොරොන්දුව හා ගිවිසුම තුඹලා විසින්ම සව්කරමින් ස්ථිරකාමින්, තුඹලාගේ ඇපකාර මව්පියන් තුඹලා වෙනුවට පොරොන්වූනු සියලු දේ විශ්වාසකරන්ටද ඉෂ්ටකරන්ටද තුඹලා බැඳිසිටින බව ඒත්තුගෙණ, මෙහි දෙවියන්වහන්සේ ඉදිරියෙත් මේ සමුදුව ඉදිරියෙත්, මෙම පොරොන්දුව සහ ගිවිසුම අලුත්කරණවාද ?

¶ එවිට එක එකා ඇහෙනතරම් ශබ්දයෙන් මෙසේ කියාවා.

මම අලුත්කරමි.

බිස්කොප්. අපට උපකාර ස්වර්ගයත් පොළවත් මැව් ස්වාමීන්ගේ නාමයෙහිය.

උත්තරය. මෙතැන් පටන් සදාකාලේටම ස්වාමීන්වහන්සේගේ නාමයට ප්‍රශංසා වේවා.

බිස්කොප්. ස්වාමිනි අපේ යාච්ඤාවල් ඇසුවමැනව.

උත්තරය. අපේ කන්නලව්ව ඔබ වෙතට පැමිණේවා.

බිස්කොප්. අපි යාච්ඤාකරමු.

සියලු බලඇති සදාකල් ජීවත්වෙන දෙවියන්වහන්ස, මේ ඔබගේ දාසයන් වතුරෙන් හා ශුද්ධාත්මයෙන් දෙවනු ජනිතකොට ඔවුන්ගේ සියලු පාපවලට ඔබවහන්සේ කමාව දෙන්ට කරුණාකළාය. ස්වාමීනි, සැනසිලිකාරවූ ශුද්ධාත්මයානන්ගෙන් මොවුන් සවිකොට, ශුද්ධාත්මයානන්ගෙන් ලැබෙන ඥානය හා තේරුම්ගැණීමද මන්ත්‍රණය හා ආත් සවිකමද දැනගැන්ම හා සැබෑවූ භක්තියද

යන, ඔබගේ කරුණාවෙන් වන නොයෙක් ආකාර දීමනාවල් මොවුන්ට දවසින් දවස වැඩිකොට, ඔබ කෙරෙහි පිරිසිදු භයවීමේ දැනටත් සදාකාලයටත් මොවුන් පූර්ණකළ මැනව. ආමෙන්.

¶ එවිට බිස්කොප් මේ මතු සඳහන්වෙන ලෙස කියමින් තමන් ඉදිරියේ පිළිවෙළින් දනගසා ඉඳිනවුන් එකිනෙකාගේ ඉසපිට අත තබාවා.

ස්වාමීනි මේ ඔබගේ දරුවා [නොහොත් දාසයා] ඔබ සනාතකව නිතර පවතින පිණිසත්, ඔබගේ සදාකාලවූ රාජ්‍යයට පැමිණෙනතුරු, ඔබගේ ශුද්ධාත්මයේ දවසින් දවස වඩ වඩා වර්ධනවෙන පිණිසත්, ඔබගේ ස්වර්ගීයවූ කරුණාවෙන් මොහු ආරක්ෂා කළමැනව. ආමෙන්.

¶ ඊළඟට බිස්කොප් මෙසේ කියාවා.

ස්වාමීන්වහන්සේ තුඹලා සමග වේවා.

උත්තරය. උන්වහන්සේ තුඹ සමගත් වේවා.

¶ ඊළඟට බිස්කොප් මෙසේත් කියාවා. සියල්ලෝම දනගසා සිටිය යුතුය.

අපි යාච්ඤාකරමු.

ස්වර්ගයේ සිටින අපේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය පැමිණේවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවේත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමාවුව මැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා, නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

¶ මේ ලුහුඬු යාච්ඤාවත් කියාවා.

සියලු බලඇති සදාකල් ජීවත්වෙන දෙවියන්වහන්ස, තමන් ප්‍රියවූ පිළිගන්නාවූ දෙයට මනාපවීම හා ඒ දේ කිරීමට අප සලස්වන්නාවූ දිව්‍යාත්මයානන්වහන්සේ, මේ ඔබගේ දාසයන්ට ඔබගේ



කරුණාවත් ශුභාශයපත්කමත් ඇතිබව, එම සලකුණෙන් සහතිකකරණ පිණිස, ඔබගේ ශුද්ධ අපොස්තුළුවරයන්ගේ ආදර්ශය ලෙස දැන් අපේ අත් තැබූ මොවුන් වෙනුවට යටහත්වූ යාච්ඤාවල් ඔබට කරමුව. ඔබගේ පියගත්වූ අත මොවුන් කෙරෙහි නිතර පවතීවා. ශුද්ධාත්මය මොවුන් සමග නිතර හැසිරේවා. මොවුන්ට අනාතිමේදී සදාකාල ජීවනය ලබන්ට පුළුවන්වෙන හැටියට, ඔබගේ වචනය දැනගණ ඊට කීකරුවෙන්ට සලස්වනාමෙන්, ඔබ හා ශුද්ධාත්මයානන් සමග සදාකාලේටම එකම දෙවියන්ව ජීවත්ව ආණ්ඩුකරණ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ අපි යාච්ඤාකරමුව. ආමෙන්.

සියලු බලඇති ස්වාමීන්වහන්ස, සදාකාලිකවූ දෙවියන්වහන්ස, දැන් සහ සදාකාලේටම ඔබගේ ඉතා මහත් උපකාරයෙන් අපේ ප්‍රාණත් ශරීරත් රක්ෂාකරණු ලබන පිණිස, ඔබගේ නීතිය ලෙස හැසිරීමෙහිද ඔබගේ ආඥාලෙස ක්‍රියාකිරීමෙහිද, අපේ හිත් සහ ශරීර දෙදීමටත් පිරිසිදුකිරීමටත්, ආණ්ඩුකිරීමටත් කරුණාකරණමෙන්, අපේ ස්වාමිද ගැලවුම්කාරදවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ ඊළඟට බිස්කොප් මෙසේ කියමින් ඔවුන්ට ආශීර්වාද කරාවා.

පියානන්ද පුත්‍රයානන්ද ශුද්ධාත්මයානන්ද යන සියලු බලඇති දෙවියන්වහන්සේගේ ආශීර්වාදය තුඹලා කෙරෙහි වේවා, තුඹලා සමග නිතර පවතීවා. ආමෙන්.

¶ ස්ථිරකරන්ට යෙදුන කෙණෙක් නොහොත් ස්ථිරකරණු ලැබීමට සැදී කැමතිව සිටින කෙණෙක් මිස වෙන කිසිවෙක් ශුද්ධවූ රාත්‍රිභෝජනයට ඇතුළත්කරන්ට නොයෙදේ.

# සරණපාවාදීමේ ක්‍රමය.

සරණ පාවාගැණීමට සිටින සියල්ලන්ගේ පෙරණම් ඉරිදා තුණක් දේවස්ථානයේ උදය යාච්ඤාවේදීවත් උදය යාච්ඤාව නැත්නම් සවස යාච්ඤාවේදීවත් දෙවෙනි කියවීම නිමවූවිටම දේවගැතියා විසින් ව්‍යවහාර ලෙස මෙසේ කියයුතුය.

———තෝම්බුවට අයිති ම. අතරෙත්——තෝම්බුවට අයිති න. අතරෙත් සරණපාවාදෙන පෙරණම් ප්‍රකාශකරමි. මේ දෙන්නාගේ ශුද්ධවූ සරණවීම නොවෙන පිණිස යම් කාරණාවක්වත් යුතු වැලක්මක්වත් නුඹලාගෙන් යමෙක් දන්නවානම් ඒක එළිදරව්කළ යුතුය. මේ පළමුවෙනි[—දෙවෙනි,—තුන්වෙනි] වතාවේ ඇහීමය.

¶ සරණවීමට සිටින දෙගොල්ල පලාත් දෙකකට අයිතිව සිටිතොත් ඒ පලාත් දෙකේම ඔවුන්ගේ පෙරණම් කියයුතුය. එක තෝම්බුවක් බාරවූ දේවගැතියා අනිත් තෝම්බුව බාරවූ දේවගැතියාගෙන් පෙරණම් තුන් වරක් කියෙවූ බවට ඔප්පුවක් නැතුව ඔවුන්ගේ විවාහය සිද්ධනොකෙරේවා.

¶ තවද සරණපාවාදීම සිද්ධකිරීමට නියමවූ දවසේ නියමවූ කාලයේ සරණවීමේ යෙදෙන්ට සිටින අයවල් තමුන්ගේ මිත්‍රයන් හා අසල්වාසීන් සමග දේවස්ථානයේ මධ්‍යයට එත්වා. එහිදී මනමාලයා දකුණු පැත්තෙත් මානමාලි වම්පැත්තෙත් ලංව සිටිනකල ප්‍රෙස්බිතර් මෙසේ කියාවා.

ප්‍රියතැනැත්තෙනි, අපි මේ පුරුෂයා සහ මේ ස්ත්‍රිය ශුද්ධවූ සරණවීමේ යොදන පිණිස දෙවියන්වහන්සේ ඉදිරියේද මේ සමූහය අභිමුඛයේද එකතුවූනෙමුව. ශුද්ධවූ සරණවීම මනුෂ්‍යයා නිර්දෝෂව සිටි කාලයේදී දෙවියන්වහන්සේ විසින් පිහිටුවන්ට යෙදුන ගරුකටයුතුවූ ස්ථානාන්තරයක්ය. ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව අතරේ තිබෙන එකඟකම මේ කාරණාවෙන් සංඥාකොට අපට හඟවන්ට යෙදුනාය. ක්‍රිස්තුස්වහන්සේ ගලීලයේ කානාහි සරණමංගල්‍යයට පැමිණීමෙන්ද පළමුවෙනි හාස්කම එහිදී කෙරීමෙන්ද මේ ශුද්ධවූ ස්ථානාන්තරයට ගෞරවකොට අලඞ්කාරකළාය. තවද සරණවීම සියල්ලන් අතරේ ගරුකටයුතුව තිබෙන බව ශුද්ධවූ පාවුල් වර්ණනාකර තිබෙනවාය. ඒනිසා හයාදූකමෙන්ද ඥානයෙන්ද කල්පනා කිරීමෙන්ද සංසුංකමෙන්ද දෙවියන්වහන්සේට හයවීමෙන්ද සරණවීම පිහිටුවන්ට යෙදුන කාරණාවල් යුතුලෙස කල්පනාකරමින්ද මිස, නුවන නැති මෘගයන් වාගේ කල්පනා නොකර සුළුවට සිතා මාංසික තෘෂ්ණාවල් සහ ආසාවල් පූර්ණකරණ පිණිස කාම අදහසින් කිසිවෙකු විසින් සරණපාවාගැණීමට පැමිණෙන්ටවත් එළඹෙන්ටවත් යුතු නැත.



පළමුවෙනුව. සරණවීම නියමකරන්ට යෙදුනේ ස්වාමීන්වහන්සේට හයවීමෙහිද උන්වහන්සේගේ ඉගැන්වීමෙහිද උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ස්තුතිකරමින් පවතින්ට දරුවන් තැනීමට ජනිත කරණ පිණිසය.

දෙවනුව. ඒක නියමකරන්ට යෙදුනේ සංවාසයෙන් දුරුව සිටීමේ අනුග්‍රහය නොලැබූ අය පාපයෙන් වැලකී වෙශ්‍යකමින් දුරුව සරණ පාවාගෙණ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ නිර්මලවූ අවයවයක් වාගේ පවතිනා පිණිසය.

තුන්වෙනුව. ඒක නියමකරන්ට යෙදුනේ ස්ත්‍රීපුරුෂයන් දුක් සැප දෙකේදීම එක්ව සිට ඔවුනොවුන්ට උපකාරකරගණිමින් සැනසෙන පිණිසය. එහි ශුද්ධවූ සරණවීමේ යෙදෙන පිණිස මේ දෙන්නා දැන් ඇවිත් සිටිනවාය. එබැවින් මොවුන් නාඩුමාර්ගය හැටියට එක්කරණු ලබන්ට බැරිවූ යුතු කාරණාවක් පෙන්වාදෙන්ට පුළුවන්වූ යමෙක්

ඇත්නම් ඔහු දැන් කථාකරවා, නැත්නම් මතු සඳකාලේටම නිශ්ශබ්දව සිටිවා.

¶ තවද සරණවීමට ඇතුළත්වෙන පිණිස ඇවිත් සිටිනවුන්ට ප්‍රෙස්බිතර් කියාවා·

විනිශ්චයේ භයානකවූ දවසේදී සියලු හිත්වල රහස් ප්‍රකාශකරන්ට යෙදෙනකල නුඹලා උත්තර දෙන්ට ඕනෑ බැවින් සරණවීමේ යෙදෙන්ට නාධූමාර්ගීය ලෙස වැලකීමක් නුඹලාට තිබෙන බව නුඹලා දෙන්නාගෙන් කොයි කෙණෙක් නුමුත් දනිතොත් ඒ කාරණාව දැන් එළිදරව්කරන්ට නුඹලා දෙන්නාට අණ දෙමින් අවවාද කරමි. ඒ මක්නිසාද කිවොත් දෙවියන්වහන්සේගේ වචනයේ ඉඩදී තිබෙනලෙස මිස වෙන හැටියකට කවුරුනුමුත් සරණපාවාගණිතොත් ඔවුන් දෙවියන්වහන්සේගෙන් සරණපාවාගන්ට නොයෙදෙන බවත් ඔවුන්ගේ සරණවීම නාධූමාර්ගීය ලෙස නොවන බවත් නුඹලා සැබෑවටම දැනගන්නා පිණිසය.

¶ සරණවීමේ දවසේදී දෙවියන්වහන්සේගේ නීතිය හැටියටවත් රටේ ආණ්ඩුවේ හැටියටවත් ඒ දෙන්නා සරණවීමට ඇතුළත්වෙන්ට බැරිබවට වැලැක්මක් යමෙක් විසින් ප්‍රකාශකොට කියා සරණවීම පිණිස ඇවිත් සිටින්නන්ගේ අලාබය ගෙවීමටවත් ඔහු විසින් කළාවූ පැමිනිල්ල ඔප්පුකිරීමටවත් ඇප දුන්නොත් ඒ පැමිනිල්ල විභාගවෙනතුරු සරණවීම අතපසුකරන්ට යුතුය·

¶ කිසි තහනමක් නැත්නම් දේවගැතියා පුරුෂයාට මෙසේ කියාවා.

**ම.** ශුද්ධවූ සරණවීමේ දෙවියන්වහන්සේගේ නියමයේ හැටියට හැසිරෙණ පිණිස, නුඹේ භාර්යාව කොට මේ ස්ත්‍රිය පාවාගන්ට කැමත්ද. රෝගයේදීත් නිරෝගයේදීත් මෑට සෙන්හවෙන්ටත් මෑ සනසන්ටත් ගෞරවකරන්ටත් රක්ෂාකරන්ටත් අනිකුත් සියල්ලන් අත්ඇර නුඹලා දෙන්න ජීවත්ව සිටිනතුරු මෑට පමණක්ම පැහී සිටින්ටත් කැමතිද.

පුරුෂයා උත්තරදෙමින්—මම කැමතිය කියාවා.



¶ එවිට ප්‍රෙස්බිතර් ස්ත්‍රීට කියාවා.

**නා.** ශුද්ධවූ සරණවීමේ දෙවියන්වහන්සේගේ නියමයේ හැටියට හැසිරෙණ පිණිස නුඹේ ස්වාමිපුරුෂයාකොට මේ පුරුෂයා පාවාගන්ට කැමතිද ? රෝගයේදිත් නිරෝගයේදිත් මොහුට කීකරුවෙන්ටත් වැඩකරන්ටත් සෙන්හවෙන්ටත් ගෞරවකරන්ටත් මොහු රක්ෂාකරන්ටත් අනිකුත් සියල්ලන් අත්ඇර නුඹලා දෙන්න ජීවත්ව සිටිනතුරු මොහුට පමණක්ම පැහී සිටින්ටත් කැමත්ද.

එවිට ස්ත්‍රී උත්තරදෙමින්—මම කැමතිය කියාවා.

¶ එවිට දේවගැතියා කියාවා.

මේ පුරුෂයාට සරණපාවාගන්ට මේ ස්ත්‍රී දෙන්නේ කවුද.

¶ එවිට ඔවුනොවුන් මෙසේ දිවුරුම්කරගතයුතුය. දේවගැතියා විසින් ස්ත්‍රිය ඈගේ පියාගේවත් මිත්‍රයාගේවත් අතින් බාරගෙණ පුරුෂයාගේ දකුණතින් ස්ත්‍රීගේ දකුණත අල්වන්ටද තමනුත් මෙහි පහත පෙණෙන ලෙස කියමින් ඔහුටත් එලෙසම කියන්ටද සැලැස්විය යුතුය.

**ම.** යන මම **නා.** යන නුඹ මේ දවස පටන් දුක් සැප දෙකේදිත්, පොහොසත් අපොහොසත්කමේදිත්, රෝග නිරෝග දෙකේදිත්, දෙවියන්වහන්සේගේ ශුද්ධවූ නියමයේ හැටියට මරණින් අපවෙන්වෙනතුරු මා සනාතකව පවත්වාගන්ටත් සෙන්හවෙනටත් සනසන්ටත් මගේ භාර්යාවකොට පාවාගණිමි, මීට උගහක්කොට මගේ වචනය නුඹට දෙමි.

¶ එවිට ඔවුන් තමන්ගේ අත් මුදාගතයුතුය. තවද ස්ත්‍රී තමන්ගේ දකුණතින් පුරුෂයාගේ දකුණත අල්වාගණ පළමු ලෙසින් දේවගැතියාට අනුව මෙසේ කියාවා.

**නා.** යන මම **ම.** යන නුඹ මේ දවස පටන් දුක් සැප දෙකේදිත්, පොහොසත් අපොහොසත්කමේදිත්, රෝග නිරෝග දෙකේදිත්, දෙවියන්

වහන්සේගේ ශුද්ධවූ නියමය හැටියට මරණින් අප වෙන්වෙනතුරු මා සනාථකව පවත්වාගන්ටත් සෙන්හවෙන්ටත් සනසන්ටත් කීකරුවෙන්ටත් මගේ ස්වාමිපුරුෂයාකොට පාවාගණිමි, මීට උගහක්කොට මගේ වචනය නුඹට දෙමි.

¶ එවිට ඔවුන් නැවතත් තමුන්ගේ අත් මුදාගණිත්වා. තවද ස්ත්‍රීට දෙන පිණිස මුද්දකුත් ප්‍රෙස්බිතර්ට හා ඔහුගේ උදව්කාරයන්ට දෙන්ට නියම මිළත් පුරුෂයා විසින් පොත පිට තැබියයුතුය. එවිට ප්‍රෙස්බිතර් මුද්ද අරන් ස්ත්‍රීගේ වමතේ හතරවෙනි ඇඟිල්ලේ දමන පිණිස පුරුෂයාට දේවා. පුරුෂයාද මුද්ද ස්ත්‍රීගේ ඇඟිලේ දමා අල්වාගණ ප්‍රෙස්බිතර් කියන හැටියට මෙසේ කියාවා.

පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයෙන් මේ මුද්ද දීමෙන් මම නුඹ සරණපාවාගණිමි, මගේ ශරීරයෙන් නුඹට ගෞරව කරමි, මගේ සියලු ලෝකවූ වස්තුව නුඹ සනාථක කරමි. ආමෙන්.

¶ එවිට පුරුෂයා ස්ත්‍රීගේ වමතේ හතරවෙනි ඇඟිල්ලේ මුද්ද තිබෙන්ටඇර ඔවුන් දෙන්නම දනගසත්වා. එවිට දේවගැතියා කියාවා.

අපි යාච්ඤා කරමු.

සියලු මනුෂ්‍යවර්ගයා මවා ආරක්ෂාකරණ සියලු ආත්මික කරුණා දෙන අනන්ත ජීවනකාරක සදාකාලිකවූ දෙවියන්වහන්ස, මේ මුදුව දීම සහ ගැණීම ලකුණක් හා උගහක් කිරීමෙන් මොවුන් කළාවූ දිවුරුම සහ ගිවිසුම සැබවින්ම ඉෂ්ටකොට රක්ෂාකරන්ටත්, ඊසාක් සහ රෙබෙකා විශ්වාසව හැසුරුණ වාගේ සම්පූර්ණවූ සෙන්හයෙන්ද සමගිතාවෙන්ද නිතර පවත්නටත්, ඔබගේ නීතිය ලෙස හැසිරෙන්ටත් පුළුවන්කරණ හැටියට ඔබගේ නාමයෙන් අප විසින් ආශීර්වාදකරන්නාවූ මේ ඔබගේ දාසයන් වන ස්ත්‍රී පුරුෂ දෙදෙනාට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගේ ආශීර්වාදය දුනමැනව. ආමෙන්.



¶ එවිට ප්‍රෙස්බිතර් ඔවුන් දෙදෙනාගේ දකුණත් එකතුකරමින් කියාවා.

දෙවියන්වහන්සේ විසින් එකතුකරන්ට යෙදුනාවුන් කිසි මනුෂ්‍යයෙක් වෙන්නොකරාවා.

¶ එවිට දේවගැතියා සමූහයට කියාවා.

ම. සහ නා. යන දෙදෙනා ශුද්ධවූ සරණවීමට සතුටින් ඇතුළත්ව දෙවියන්වහන්සේ හා මේ සමූහය ඉදිරියේ ඊට සාක්ෂිදුන් බැවින්ද, ඊට ඔප්පුවක් පිණිස ඔවුන්ගේ වචනය එකිනෙකාට දීමෙන් සහ උකස්කිරීමෙනුත් මුදුවක් දීමෙන් සහ ගැණීමෙනුත් අත් ඇල්වීමෙනුත් ඒ බව එළිදරව්කළ බැවින්ද, ඔවුන් දෙදෙනා ස්ත්‍රී පුරුෂයෝව සිටින බව පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයෙන් මම ප්‍රකාශකරමි. ආමෙන්.

¶ ඊලඟට දේවගැතියා මේ ආශීර්වාදයත් කියාවා.

පියවූ දෙවියන්වහන්සේත් පුත්‍රවූ දෙවියන්වහන්සේත් ශුද්ධාත්මවූ දෙවියන්වහන්සේත් නුඹලාට ආශීර්වාදකොට නුඹලා රක්ෂාකෙරේවා. ස්වාමීන්වහන්සේ කරුණාවෙනුත් පිහිටෙනුත් නුඹලා දෙස බලාවා. පරලොවදී සදාකාල ජීවනය ලැබෙනලෙස නුඹලාට මෙලොවදී එක්ව හැසිරෙන්ට පුළුවන්වෙන පිණිස සියලු ආත්මික ආශීර්වාදයෙන් හා කරුණාවෙන් නුඹලා පූර්ණකෙරේවා. ආමෙන්.

¶ එවිට දේවගැතියාවත් ඔහුගේ උදව්කාරයෝවත් ස්වාමීන්ගේ මේසය ලඟට ගොස් මෙහි පහත සදහන්වෙන ගීතිකාව කියාවා නොහොත් ගායනාකරාවා.

128 ගීතිකාව.

යෙහෝවාවහන්සේට භයවෙන්නාවූ උන්වහන්සේගේ මාර්ගවල හැසිරෙන්නාවූ සියල්ලෝම ආශීර්වාද ලත්තෝය. නුඹේ අතේ කර්මාන්තයෙන් නුඹ කනවා ඇත. නුඹ ආශීර්වාද ලත්තෙක. නුඹට ශුභසිද්ධවේ.

තුඹේ ස්ත්‍රී ගෙයි බිත්තියේ දිච්චාවූ ඵලධරණ මුද්‍රිකාවැලකට සමානය. තුඹේ මේසේ වටකර හිටිනා තුඹේ දරුවෝ ඔලීව පැල සමාන වෙති.

යෙහෝවඃවහන්සේට භයවෙනා මනුෂ්‍යයා මෙසේ ආශිර්වාදලත්තෙක් වේ.

යෙහෝවඃවහන්සේ සියොන්හි සිට තුඹට ආශිර්වාද කරණවා ඇත. ජීවිතාන්තය දක්වා යෙරූසලම සඵලව තිබෙන බව තුඹ දකිනවා ඇත.

එපමණක් නොව තුඹේ පුත්‍රයන්ගේ පුත්‍රයන්ද ඊශ්‍රායෙල්ට සමාදානෙ ඇතිබවද තුඹ දකිනවාඇත.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැන්මේදී තිබුනලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා; ආමෙන්.

¶ නොහොත් මේ ගීතිකාව.

68 ගීතිකාව.

දෙවියන්වහන්ස පොළවේ ඔබගේ මාර්ගයද සියලූ ජාතීන් අතරේ ඔබගේ ගැලවීමද ප්‍රකාශ වෙන පිණිස,

අපට කාරුණත් ආශිර්වාදත්කොට ඔබගේ මූන අප කෙරෙහි බැබලුව මැනව.

දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා; මුලූ ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා.

ඔබ ධර්මිෂ්ඨකමින් සෙනග විනිශ්චය කරණ නිසත් ලෝවැසියන්ට ප්‍රධානකම් කරණ නිසත් ලෝවැසියෝ සතුටුව ගීතිකා කියත්වා.

දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා; මුලූ ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා.

එවිට භූමිය සඵලවෙයි, දෙවියන්වහන්සේ එනම් අපේම දෙවියන්වහන්සේ අපට ආශිර්වාදකරණවා ඇත.



දෙවියන්වහන්සේ අපට ආශිර්වාදකරණවා ඇත, පොළවේ ඉම දක්වා සියල්ලෝම උන්වහන්සේට භයවෙනවා ඇත.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

උත්තරය. පටන්ගැන්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ ගීතිකාවෙන් පසු ස්වාමීන්ගේ මේසේ ඉදිරියේ දනගසා ඉන්න පුරුෂයාවත් ස්ත්‍රීවත් ප්‍රෙස්බිතර් එම මේසේ ලඟ සිට ඔවුන් දෙස බලා කියාවා.

දේවගැතියා. ස්වාමීන්වහන්ස අපට කාරුණකළ මැනව.

උත්තරය. ක්‍රිස්තුස්වහන්ස අපට කාරුණකළ මැනව.

දේවගැතියා. ස්වාමීන්වහන්ස අපට කාරුණකළ මැනව.

ස්වර්ගයේ හිටින අපේ පියානනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමාවූවමැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

දේවගැතියා. ස්වාමිනි ඔබ විශ්වාසකරණ ඔබගේ දාසයන් දැසින් ගැලෙව්ව මැනව.

උත්තරය. ස්වාමිනි ඔබගේ පිරිසිදු ස්ථානයෙන් මොවුන්ට උපකාර එව්වමැනව.

දේවගැතියා. මොවුන් සදාකාලේටම ආරක්ෂාකළ මැනව.

උත්තරය. හතුරන්ට විරුද්ධව මොවුන්ට බල කොටුවක්ව සිටිය මැනව.

දේවගැතියා. ස්වාමිනි අපේ යාච්ඤාව ඇසුව මැනව.

උත්තරය. අපේ කන්නලව්ව ඔබ ලඟට පැමිණේවා.

දේවගැතියා.

ආබ්‍රහම්ගේ දෙවියන්වහන්ස ඊසාක්ගේ දෙවියන්වහන්ස යාකොබ්ගේ දෙවියන්වහන්ස, මේ ඔබගේ දාසයන්ට ආශිර්වාදකොට ඔබගේ ශුද්ධවූ වචනයෙන් මොවුන්ට ප්‍රයෝජන ලැබෙන හැටියට ඉගෙණගන්නා දේ ක්‍රියාවශයෙන් ඉෂ්ටකරණ පිණිස මොවුන්ගේ හිත්වල සදාකාල ජීවනයේ බීජ වපුළ මැනව. ස්වාමීනි ස්වර්ගයේ සිට මොවුන් දෙස කාරුණාවෙන් බලා මොවුන්ට ආශිර්වාදකළ මැනව. ඔබවහන්සේ ආබ්‍රහම් සහ සාරට ඔබගේ ආශිර්වාදය දීමෙන් ඔවුන් සැනසූවාවාගේ මේ ඔබගේ දාසයන් ඔබගේ කැමැත්තට කීකරුව ඔබගේ ආරක්ෂාව කරණකොටගෙණ නිරුපද්‍රව සිටිමින් මොවුන්ගේ ජීවිතය ඇතිතොක් ඔබගේ ප්‍රේමයේ පවත්න පිණිස ඔබගේ ආශිර්වාදය මොවුන්ට කාරුණාවෙන් දෙනලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා යාචඤාකරමුව. ආමෙන්.

¶ මේ ලඟ යාචඤාව දරුවන් වදන වයස පසුවූ ස්ත්‍රීන් සරණපාවා දෙනවිට කියන්ට නොයෙදේ.

තමන්ගේ කාරුණාවෙන් මනුෂ්‍ය වර්ගයාගේ වර්ධනය කරන්නාවූ ස්වර්ගීය පියවූ දයාවන්ත ස්වාමීනි, මේ දෙදෙනම දරුපල ලබන පිණිසද ඔබගේ ප්‍රශංසාව සහ ගෞරවය සඳහා මොවුන්ගේ දරුවන් ක්‍රිස්තියානි චාරිත්‍රය හැටියටත් සුචරිත ධර්මය හැටියටත් තනන්ට යෙදී සිටිනවා මොවුන්ට දකින්ට ලැබෙන තරම් බොහෝකාලයක් භක්තිවන්ත ස්නේහයෙන් සහ විශ්වාසකමින් ජීවත්වෙන්ට පුළුවන්වෙන පිණිසද අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මොවුන්ට ඔබගේ ආශිර්වාද දී උපකාරකළ මැනව. ආමෙන්.



කිසි දෙයක් නැතුව තමන්ගේ බලපරාක්‍රමයෙන් සියලු දේ මවා සයල්ල පිළිවෙලින් පිහිටෙව්පසු තමන්ගේ රූපයත් සමානකමත් හැටියට මැව් පුරුෂයාගෙන් ස්ත්‍රිය අටගණිවයි කියා නියමකරමින් ඔවුන් එකතුකොට, සරණපාවාගැණිමෙන් තමන් විසින් එක්කළවුන් වෙන්කරන්ට යුතුනැති බව ඉගැන්නුවාවූ දෙවියන්වහන්ස, ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව අතරේ තිබෙන ආත්මික සරණපාවාගැන්ම සහ එකගකම හඟවාදීමත්ද පෙන්වාදීමත්ද වීමට උතුම්වූ සංඥාවක් වශයෙන් සරණපාවාගැණිමේ ස්ථානාන්තරය පවිත්‍රකළාවූ දෙවියන්වහන්ස, ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ සභාව නැමති භාර්යාවට ස්නේහවෙමින් ඒ උදෙසා තමන්ම පරිත්‍යාගවෙමින් තමන්ගේම ශරීරය ලෙස ස්නේහයෙන් රක්ෂාකරන්නා වාගේ මේ පුරුෂයා ඔබගේ වචනය ලෙස තමාගේ භාර්යාවට ස්නේහවෙන පිණිසත්, මේ ස්ත්‍රී තමාගේ පුරුෂයාට ස්නේහවෙමින් ආදරණීයව විශ්වාසව කීකරුව අඩදබර නැතුව හික්මුන්කම් ඇතුව සමගිව ශුද්ධවූ භක්තිවන්තවූ ස්ත්‍රීන්ගේ අඩිපාරේ යන පිණිසත්, මේ ඔබගේ දාසයන් දෙදෙනා කාරුණාවෙන් බැලුව මැනව. තවද ස්වාමීනි මොවුන් දෙදෙනාට ආශිර්වාදකර මොවුන්ට ඔබගේ සදාකාලවූ රාජ්‍යය උරුමවෙන්ට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කාරුණාකළ මැනව. ආමෙන්.

ඊලඟට ප්‍රෙස්බිතර් මේකත් කියාවා.

පටන්ගැන්මේදී අපේ මුල් දෙමව්පිය වන ආදම් සහ ඒව මවා සරණපාවාගැණිමෙහි එකතුකොට පවිත්‍රකළාවූ සියලු බලඇති දෙවියන්වහන්සේ තුඹලා විසින් ශරීරයෙනුත් ප්‍රාණයෙනුත් තමන්වන්සේ සතුටුකරණ පිණිසත් තුඹලාගේ ජීවිතාන්තය දක්වා ශුද්ධවූ ස්නේහයෙන් කල්යවන

පිණිසත් තමන්වහන්සේගේ කරුණාධාරාව නුඹලා කෙරෙහි වත්කෙරේවා. නුඹලා පිරිසිදුකරමින් නුඹලාට ආශීර්වාද කෙරේවා. ආමෙන්.

¶ මේ ලඟට ස්ත්‍රී පුරුෂයන්ගේ කටයුතු පෙන්වාදෙන පිණිස දේශනාවක් නොතිබේනම් දේවගැතියා මෙහි පහළ ලියවී තිබෙන ලෙස කියාවා.

සරණපාවාගත්තාවූ නොහොත් ශුද්ධවූ සරණවීමේ යෙදෙන්ට සිටින්නාවූ සියල්ලෙන පුරුෂයන් විසින් තමන්ගේ භාර්‍යාවන්ටත් භාර්‍යාවන් විසින් තමන්ගේ පුරුෂයන්ටත් කරන්ට ඕනෑ යුතුකම් ගැණ ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන හැටි අහපල්ලා. ශුද්ධවූ පාවුල් එපීසවරුන්ට ඇරිය පත්‍රයේ පස්වෙනි පරිච්ඡේදයේ මේ ආඥාව සරණපාවාගත් සියලු පුරුෂයන්ට දී තිබෙනවාය. ක්‍රිස්තුස්වහන්සේ වචනය නැමති වතුරෙන් සභාව සෝද ශුද්ධකොට පිරිසිදුකරන්ටත් රැළි කැලැල් ආදි කිසි දෙයක් නැතුව පිරිසිදුවූ නොපලුදුවූ තේජවන්තවූ සභාවක්කොට ඒක තමන්ට දක්වාගන්ටත් ඒ උදෙසා සෙන්හව පරිත්‍යාගවූනාක්මෙන් පුරුෂයෙනි නුඹලාත් නුඹලාගේ ස්ත්‍රීන්ට සෙන්හවෙයව්. පුරුෂයන් විසින් තමුන්ගේ ස්ත්‍රීන්ට තමුන්ගේ ශරීරයටමෙන් සෙන්හ වෙන්ට යුතුය. තමාගේ ස්ත්‍රීට සෙන්හ වෙන්නා තමාටම සෙන්හවෙනවාය. ස්වාමීන්වහන්සේ තමන්ගේ මාංසයේද ශරීරයේද ඇටවලද අවයවවූ අප නැමති සභාව පෝෂ්‍යකොට රක්ෂාකරන්නාක්මෙන් යමෙක් තමාගේ මාංසය පෝෂ්‍යකොට රක්ෂාකරණවා මිස කිසිකලක ඒකට අප්‍රිය නොවෙයි. මේ නිසා පුරුෂයා තමාගේ මව්පියන් ඇර තමාගේ ස්ත්‍රීට ඇලුම්වෙයි, ඒ දෙදෙනාද එක ශරීරයක් වෙති. මේක මහත්වූ සංඥාවක. මම මේ කථාකරන්නේ ක්‍රිස්තුස්වහන්සේද සභාවද ගැණය. එසේ නුමුත් නුඹලාත් එක එකා තමතමාට මෙන් තමාගේ ස්ත්‍රීට සෙන්හවෙයව්.



තවද එම ශුද්ධවූ පාවුල් කොලොස්සිවරුන්ට ඇරිය පත්‍රයේ සරණපාවාගත් සියලු පුරුෂයන්ට මෙසේ කියනවාය. පුරුෂයෙනි නුඹලාගේ භාර්‍යාවන්ට සෙන්හවෙයව්. ඔවුන්ට කර්කශ නොවව්.

තවද සරණපාවාගත් පුරුෂයෙක්ද ක්‍රිස්තුස්වහන්සේගේ අපොස්තුළුවරයෙක්දවූ ශුද්ධවූ පේත්‍රුස් විසින් සරණපාවාගත්තාවුන්ට කියා තිබෙන හැටි අහපල්ලා. පුරුෂයෙනි නුඹලා ස්ත්‍රීන් සමග ජීවිත අනුග්‍රහයේ පංගුකාරයන්වූ බැවින් නුඹලාගේ යාච්ඤාවල් නොවලකිනා පිණිස දුර්වලතර භාජනයට සමානවූ ස්ත්‍රීට ගෞරවකොට නුවණ ඇතුව වාසයකරව්.

මෙතැන් දක්වා පුරුෂයන් විසින් තමන්ගේ ස්ත්‍රීන්ට කරන්ට ඕනෑ යුතුකම් නුඹලා ඇසුවාය. ඉතින් ස්ත්‍රීවරුණි ශුද්ධලියවිල්ලේ පැහැදිලි ලෙස දක්වා තිබෙන හැටියට නුඹලාගේ පුරුෂයන්ට නුඹලා විසින් කරන්ට ඕනෑ යුතුකම් අසා ඉගෙණගණිල්ලා.

ශුද්ධවූ පාවුල් වරක් කී එපීසවරුන්ට ඇරිය පත්‍රයේ නුඹලාට මෙසේ උගන්වනවාය. ස්ත්‍රීවරුණි ස්වාමීන්වහන්සේට මෙන් තම තමුන්ගේ පුරුෂයන්ට කීකරුව සිටිව්. ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රධානියාව සිටින්නාවාගේ පුරුෂයාත් ස්ත්‍රීට ප්‍රධානියාය. උන්වහන්සේ ශරීරයේ රක්ෂාකාරයාය. එහෙයින් සභාව ක්‍රිස්තුස්වහන්සේට කීකරුව සිටින්නාවාගේ ස්ත්‍රීන් විසින් සියලු කාරණවලදී තමුන්ගේ පුරුෂයන්ට කීකරුව සිටින්ට යුතුය. තවද ස්ත්‍රී තමාගේ පුරුෂයාට ගෞරවකරන්ට බලාගණිවයි එම පාවුල් නැවතත් කියා තිබෙනවාය.

ශුද්ධවූ පාවුල් කොලොස්සිවරුන්ට ඇරිය පත්‍රයේ මේ ලුහුඬු ගුරුකම නුඹලාට දී තිබෙනවාය. ස්ත්‍රීවරුණි ස්වාමීන්වහන්සේ තුළ සුදුසුලෙස නුඹලාගේ පුරුෂයන්ට යටත්වව්.

තවද මේ ඉතා යහපත්වූ දැනුමැතිකම ශුද්ධවූ පේත්‍රුස් තුඹලාට කියනවාය. ස්ත්‍රීවරුණි තුඹලාගේ ස්වාමිපුරුෂයන්ගෙන් යමෙක් දේව වචනයට අකීකරුවුනොත් තුඹලාගේ භය සහිතවූ පිරිසිදු හැසිරීම දුටුවාම වචනය නාසතත් හැසිරීම නිසා ඔවුන් තමුන් අතට හරවාගන්න පිණිස ඔවුන්ට කීකරුවෙයව්. තුඹලාගේ අලඞ්කාරවීම ඉසකෙස් ගෙතීමෙන්ද රත්රන් පැලඳීමෙන්ද ඇඳුම් ඇඳීමෙන්ද කරන්නාවූ පිටත අලඞ්කාරය නොව තුඹලාගේ හෘදයෙහි ඇතුළතවූ මනුෂ්‍යයාගේ නොදිරණ අලඞ්කාරය එනම් දෙවියන්වහන්සේ ඉදිරියේ අනර්ඝ දෙයක්වූ මෘදු සමාදාන ගතියෙන් කරණ අලඞ්කාරය වේවා. එසේ කිරීම දෙවියන්වහන්සේ ඉදිරියේ මහත් අගයක. එලෙස පූර්ණ කාලයේ දෙවියන්වහන්සේ විශ්වාසකළාවූ ශුද්ධ ස්ත්‍රීයෝ තමන්ගේ ස්වාමිපුරුෂයන්ට යටහත්ව අලඞ්කාරවූනාය. සාරා ආබ්‍රහම්ට ස්වාමියයි කියා කීකරුවූනාක් මෙන් තුඹලාත් කිසි විපත්තියකට භයනොව යහපත්කම් කරණකල ඇගේ දූවරු වෙති.

¶ අලුතෙන් සරණපාවාගත් අයවලුන්ට සරණවීමේදීවත් ඉන්පසු ප්‍රසූතා ලැබුනු කඩ්නමින්වත් ශුද්ධ භෝජනය ගන්ට යුතුය.

---

# රෝගාතුරයන් බලන ක්‍රමය.

¶ යමෙක් රෝගාතුරව සිටිනවිට ඒ පිරිසේ දේවගැතියාට දන්වන්ට යුතුය. ඔහු රෝගාතුරයාගේ ගෙදරට ඇවිත් මෙසේ කියාවා.

මේ ගෙටත් මෙහි වසන සියල්ලන්ටත් සමාදානය වේවා.

¶ රෝගාතුරයා ඉදිරියට දේවගැතියා ඇවිත් දනගසා කියාවා.



ස්වාමිනි අපේ වරදවත් අපේ පියවරුන්ගේ වරදවත් සිහිනොකළ මැනව. යහපත්වූ ස්වාමිනි ඔබගේ ඉතා අනර්ඝවූ ලෙයින් මුදාගත් ඔබගේ සේනාවවූ අපට අව්වු නොදී අපට විරුද්ධව නිතර උදහස් නූන මැනව.

උත්තරය. යහපත්වූ ස්වාමිනි අපට අව්වු නුදුන මැනව.

¶ එවිට දේවගැතියා අපි යාච්ඤාකරමුව කියාවා.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

ක්‍රිස්තුස්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වාමින්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වර්ගයේ සිටින අපේ පියානනි, ඔබගේ නාමයට ගෞරව කරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවෙත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමාවූව මැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

දේවගැතියා. ස්වාමිනි ඔබ විශ්වාසකරණ මේ ඔබගේ **දාසයා** ගැලෙව්ව මැනව.

උත්තරය. ඔබගේ පිරිසිදු ස්ථානයෙන් **මොහුට** උපකාර එව්ව මැනව.

දේවගැතියා. සියලු කාලයේ බලයෙන් **මොහු** රක්ෂාකළ මැනව.

උත්තරය. සතුරාට **මොහුගෙන්** ජය ගන්ට නුදුන මැනව.

දේවගැතියා. **මොහුට** නපුරුකම් කරණ පිණිස දුෂ්ටයාට **මොහු** ළඟට එන්ට නුදුන මැනව.

උත්තරය. ස්වාමිනි සතුරාගෙන් ආරක්ෂාව පිණිස **මොහුට** බලකොටුවක්ව සිටිය මැනව.

දේවගැතියා. ස්වාමිනි අපේ යාච්ඤාවල් ඇසුව මැනව.

උත්තරය. අපේ කන්නලව් ඔබ ලඟට පැමිණේවා.

දේවගැතියා.

ස්වාමිනි ස්වර්ගයේ සිට මේ ඔබගේ දාසයා දෙස බලා මොහු සලකා උපකාරකළ මැනව. අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔබගේ කරුණා නැමති ඇසින් මොහු දෙස බැලුව මැනව. ඔබ කෙරෙහි සැබෑවූ විශ්වාසයත් සැනසීමත් මොහුට දුනමැනව. මොහුගේ සතුරා විසින් කරණ උපද්‍රවයෙන් මොහු රක්ෂාකොට නිරතුරුම සමගිකමත් නිරුපද්‍රවයත් මොහුට දුනමැනව. ආමෙන්.

සියලු බලඇති ඉතා කරුණාවන්ත ගැලවුම්කාරවූ දෙවියන්වහන්ස අපේ යාච්ඤාව ඇසුවමැනව. ඔබ නිතර දීමට සැදී සිටින ඔබගේ සහපත්කම් රෝගයෙන් පීඩාවූ මේ ඔබගේ දාසයාට දුනමැනව. මොහුගේ දුර්වලකම් මොහුටම දැනීමෙන් මොහුගේ ශ්‍රද්ධාව ස්ථිරවෙන පිණිසත් මොහු වඩා සැලකිල්ලෙන් යුක්තව පසුතැවිලිවෙන පිණිසත් මේ ඔබගේ පියගතිවූ අච්චුවෙන් මොහු පිරිසිදුකළ මැනව. ඔබගේ කරුණාවෙන් මොහු නැවත සුවපත්කරණවානම් මොහුගේ ඉතිරි ජීවිතය ඔබට භයවෙමින්ද ඔබගේ ගෞරවය පිණිසද පසුකරන්ට පුළුවන්වෙන හැටියටත්, නැත්නම් මේ පීඩා සහිතවූ ජීවිතය නින්දුවූනාම සදාකාල ජීවනයේ ඔබ සමග වසනා පිණිස මේ ඔබගේ අච්චුව ඉවසීමට පිහිට වෙන හැටියටත් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ එවිට දේවගැතියා මෙලෙසවත් මීට සමාන හැටියකටවත් රෝගකාරයාට අවවාද කරාවා.

ඉතා ප්‍රිය තැනැත්ත, සියලු බලඇති දෙවියන්වහන්සේ ජීවිතයෙත් මරණයෙත් ඊට අයිති, යෞවනකම සවිය සනීපය මහලු වයස දුර්වලකම



රෝගය යන සියල්ලෙත් ස්වාමියා බව දැනගන්න. එබැවින් නුඹේ රෝගය කොහොම එකක් නුමුත් දෙවියන්වහන්සේගෙන් පැමිණුනාය කියා සැබෑවට අරගන්න. මේ රෝගය නුඹට පැමිණෙව්වේ අනුන්ට ආදර්ශයක් වශයෙන් නුඹේ ඉවසීම පරීක්ෂාකිරීමට සහ ස්වාමින්වහන්සේගේ දවසේදී තේජස් අනන්ත සැපතත් වැඩිවීමට නුඹේ ශ්‍රද්ධාව ප්‍රශංසනීයව අලඞ්කාරව උතුම්ව පෙණීම පිණිසද නොහොත් නුඹ කෙරෙහි නුඹේ ස්වර්ගීයවූ පියානන්ට අප්‍රියව පෙණෙන්නාවූ දේ හරිනස්සා අලුත් කරණ පිණිසද යන මේ දෙකින් කොයි එකකට නුමුත්, නුඹේ පව් නිසා සැබවින් පසුතැවිලිව නුඹේ රෝගය ඉවසීමෙන් ධර දෙවියන්වහන්සේගේ ප්‍රිය පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා උන්වහන්සේගේ කරුණාව විශ්වාසකොට මේ උන්වහන්සේගේ පියගතිවූ අච්චූකිරීම ගැණ උන්වහන්සේට යටත්ව සතුතිකරමින් උන්වහන්සේගේ කැමැත්තට නුඹ එහෙමපිටින්ම යටහත්වෙතොත් මේ රෝගය වුණේ නුඹේ ප්‍රයෝජනය පිණිසත් සදාකාල ජීවනයට පමුණුවන හරිමාර්ගයේ යෑමට උපකාරවෙන පිණිසත්ය කියා සැබෑවට දැනගන්න.

¶ රෝගාතුරයා ඉතා දුර්වලව සිටිනොත් අවවාදකිරීම මෙහි අන්තිමකරන්ට පුළුවන, නැත්නම් වැඩිදුර මෙලෙස කියාවා.

ස්වාමින්වහන්සේ සෙනෙහවෙන්නන්ට අච්චුකරණවාය, උන්වහන්සේ පිළිගන්නා පුත්‍රයින්ට තළනවාය. පියා අච්චූනොකරන්නේ කොයි පුත්‍රයාටද, ඒ නිසා නුඹලා අච්චුව ඉවසත්නම් දෙවියන්වහන්සේ පුත්‍රයන්ට කරන්නා වාගේ නුඹලාටත් කරණවාය. නුමුත් සියල්ලෝම ලබන අච්චුව නුඹලා නොලබතොත් නුඹලා පුත්‍රයෝ නොව අවජාතකයෝ වෙති. තවද අපට අච්චුකළාවූ අපේ මාංසයේ පියවරුන්ට අපි ගෞරව කළානම් අපි ජීවනය

ලබන පිණිස ආත්මවල පියානන්ට කොපමණ වැඩිව යටහත් නොවෙමුද. ඔවුන් තමන්ගේ කැමැත්ත ලෙස ස්වල්ප කලක් අච්චු කළාය නුමුත් උන්වහන්සේ එසේ කරන්නේ අපි තමන්ගේ පිරිසිදුකමේ පංගුකාරයෝ වෙන පිණිස අපේ ප්‍රයෝජන උදෙසාය යි ශුද්ධවූ පාවුල් හෙබ්‍රෙව්වරුන්ට ලියූ යැවුම් පත්‍රයේ දොළොස්වෙනි පරිච්ඡේදයේ කියා තිබෙන බැවින්, ස්වාමින්වහන්සේගේ අච්චුව හොඳ හිතින් පිළිගණින්න. ප්‍රිය සහෝදරය අපේ ස්වර්ගීයවූ පියානෝ තමන්ගේ කරුණාවන්තවූ යහපත්කමින් කවදා නුමුත් අපට යම් පීඩාවක් පමුණුවන විට අපි උන්වහන්සේගේ පියගතිවූ දඬුවම සතුටු කොරීමෙන් හා නිශ්චලවූ සිතින් ධරණ පිණිසත් අපේ සැනසීම හා දැනුමැතිවීම පිණිසත් මේ වචන ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙනවාය. තවද ක්‍රිස්තුස්වහන්සේ පවා ප්‍රීතියට පැමිණෙන්ට පළමුවෙන් වේදනා වින්දය. තේජසට පැමිණෙන්ට පළමුවෙන් කුරුසියේ ඇනගැසුම් කෑවාය. ඒ නිසා හිංසාවලුත් දුක්කනගාවුත් ලෙඩරෝගත් නිශ්චලව ඉවසීමෙන් ක්‍රිස්තුස්වහන්සේ හා සමානවීමට වඩා මහත් සැනසීමක් ක්‍රිස්තියානිකාරයෙකුට නැත. එසේහෙයින් සැබවින්ම සදාකාල ප්‍රීතියට අපි යන්නාවූ මාර්ගය නම් ක්‍රිස්තුස්වහන්සේ සමග මේ ලෝකයේදී වදවිඳීමය. මරණයෙන් නැගිට සදාකල් ජීවත්වෙමින් උන්වහන්සේ සමග වසන පිණිස එම ජීවත්වීමට පමුණුවන අපේ දොරනම් ක්‍රිස්තුස්වහන්සේ සමග සතුටින් මැරීමය. එබැවින් නුඹට මෙසේ ප්‍රයෝජනවූ නුඹේ රෝගය ඉවසීමෙන් පිළිගෙණ, නුඹේ බව්තිස්මයේදී කොහොම ප්‍රසිද්ධ පොරොන්දුවක් දෙවියන්වහන්සේ සමග නුඹ කළාද කියා සිහිකරන්ට උන්වහන්සේගේ නාමයෙන් මම නුඹට අවවාද කරමි. තවද මේ ජීවිතයෙන්පසු කිසි මනුෂ්‍යයෙකුගේ තරාතිරම් නොබලා



සියල්ලන් විනිශ්චයකරණ ධර්මිෂ්ඨ විනිශ්චයකාරයානන්වහන්සේ ඉදිරියේ ගණන් දෙන්ට ඕනෑ හෙයින් නුඹේ වැරදි නිසා නුඹටම දෝෂ තබාගණිමින් වරදට නියමකරගණ ක්‍රිස්තුස්වහන්සේ නිසා අපේ ස්වර්ගීයවූ පියානන්ගෙන් කරුණාව ලබන්ටත් ඒ භයානක විනිශ්චයේදී නුඹට දෝෂ තැබීමක් නැතුව වරදට නියමනොවී සිටින්ට පුළුවන්වෙන පිණිස දෙවියන්වහන්සේ කෙරෙහිත් මනුෂ්‍යයන් කෙරෙහිත් නුඹේ පැවතීම නුඹ විසින්ම පරීක්ෂාකරණ හැටියට මම නුඹට අවවාද කරමි. එබැවින් නුඹ ක්‍රිස්තියානිකාරයෙක් විසින් අදහන්ට යුතුව තිබෙන හැටියට අදහනවාද නැද්ද කියා නුඹ දැනගන්නා පිණිස ඇදහිල්ලේ ක්‍රමය නුඹට කියවමි.

¶ මෙහිදී දේවගැතියා ඇදහිල්ලේ ක්‍රමයේ වගන්ති මෙසේ කියාවා.

ස්වර්ගයේ සහ පොළවේ මැවුම්කාර සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේ අදහගන්නවාද? උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහගන්නවාද ? උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පිළිසිඳ මරියා නම් කන්‍යාවගෙන් ඉපද, පොන්තිවුස් පිලාත් යටතේ වධවිඳ, කුරුසියේ ඇනගැසුම්කා මැරී වළලනු ලැබ, පරලොවට ගොස් තුන්වෙනිදා නැවත නැගිට, ස්වර්ගයට නැගී සියලු බලඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණුභාගයේ ඉඳගත්බවත්, ජීවත්වෙන්නන් සහ මළවුන් විනිශ්චයකරණ පිණිස ලෝකාන්තිමේදී එතනින් නැවත එනබවත් අදහගන්නවාද ? ශුද්ධාත්මයානන්වහන්සේ අදහගන්නවාද ? ශුද්ධවූ සර්වසාධාරණ සභාවත් පවිත්‍රයන්ගේ එකඟකමත් පාපවල කමාවත් ශරීරයේ නැගිටීමත් මරණින් පසු සදාකාල ජීවනයත් ඇති බව අදහගන්නවාද ?

¶ රෝගාතුරයා උත්තරදෙමින් මෙසේ කියාවා.

**මේ සියල්ල මම ස්ථිරයෙන් අදහගණිමි.**

¶ එවිට දේවගැතියා එම රෝගාතුරයා තමාගේ පව් උදෙසා සැබෑලෙස පසුතැවිලිව සියලු මනුෂ්‍යයන් සමග ප්‍රේමයෙන් සිටිනවාද කියා විභාගකොට ඔහුට වැරදිකළවුන්ට මුලු සිතින්ම කමාවෙන්ටත් ඔහු කිසි කෙණෙකුට වැරදිකළොත් ඔවුන්ගෙන් කමාව ඉල්ලන්ටත් යම් කෙණෙකුට නරකක්වත් අයුතුකමක්වත් කළොත් පුළුවන්පමණ දුරට ඔහුට යුතුකම් කරන්ටත් අවවාදකරාවා. තවද ඔහු තමාගේ දේපල ගැණ නිස්සක් නොකළානම් ඔහුගේ සිත සනසාගන්න පිණිසත් තමාගේ දේපල ගැණ බලේ ලත්තන්ගේ පහසුව පිණිසත් තමාගේ උරුම පත්‍රය හදන්ටද තමන් විසින් ගෙවියයුතු ණය සහ තමාට ලැබෙන්ට නිසි ණය එළිදරව්කරන්ටද ඔහුට දැනුමැතිකම් දේවා. එසේ නුමුත් මනුෂ්‍යයෝ සනීප ඇතුව සිටිනකල තමුන්ගේ දේපල ගැණ නිස්සක් කරන්ට හොඳයි කියා ඔවුන්ට නොයෙක් වර කියාදෙන්ට යුතුය.

¶ දේවගැතියා යාච්ඤාව කියන්ට පළමුවෙන් යුතුව පෙණෙන හැටියකට ඉහතකී සියල්ල කියාවා.

¶ තවද දේවගැතියා විසින් දිළිඳුන්ට උපකාරකරන්ට පුළුවන්කම් ඇති රෝගාතුරයන්ට ඒ පිණිස බොහෝසෙයින් අවවාදකරන්ට මතකනැති නොකළයුතුයි.

¶ රෝගාතුරයාගේ සිත යම් බලවත් පාපයක් නිසා කැලඹී තිබෙතොත් ප්‍රධානකොටම ඒ ඔහුගේ පාපය කියාදෙන්ට ඔහුට උපදෙස් දේවා. තවද එසේ කී පසු රෝගාතුරයා යටත් සිතින් අවංකලෙස කැමතිව සිටිතොත් පූජකයා ඔහුගේ පව් මිදීම මෙසේ ප්‍රකාශකරාවා.

තමන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන්නාවූ සියලු පව්කාරයින්ගේ පාපක්ෂමාව දන්වන්ට තමන්වහන්සේගේ සභාවට පුළුවන්කම දුන්නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ මහත් කාරුණ්‍යවෙන් නුඹේ වරදවල් කමාකරාවා. තවද උන්වහන්සේ විසින් මට දුන් බලය ලෙස පියානන්ගෙත් පුත්‍රයානන්ගෙත් ශුද්ධාත්මයානන්ගෙත් නාමයෙන් මම නුඹේ සියලු පාපවල් මුදමි. ආමෙන්.



¶ ඊළඟට ප්‍රෙස්බිතර් මෙහි පහළ ලියවී තිබෙන ලුහුඬු යාච්ඤාව කියාවා.

සැබවින් පසුතැවිලිවෙන්නන්ගේ පාපවල් තවත් සිහිනොවෙන ලෙස බොහෝ කාරුණ්‍යවෙන් ඒවා දුරුකරන්නාවූ ඉතා කාරුණ්‍යවන්තවූ දෙවියන්වහන්ස, මහත්වූ ආශාවකින් කමාව හා මිදීම ඉල්ලන්නාවූ මේ ඔබගේ දාසයා දෙස ඔබගේ කාරුණ්‍ය ඇසින් බැලුව මැනව. ඉතා ස්නේහවන්තවූ පියානනි යක්ෂයාගේ මායාවෙන් හා දුෂ්ටකමෙන්වත් මොහුගේම මාංසිකවූ කැමැත්තෙන් හා දුර්වලකමෙන්වත් මොහු කෙරෙහි නරක්ව ගියාවූ සියල්ල අලුත්කළ මැනව. මේ රෝගාතුරයා සභාවේ එකගව පවතින හැටියට රක්ෂාකළ මැනව. මොහුගේ තැළුනාවූ සිත බලා මොහුගේ කඳුළු පිළිගණිමින් මොහුට ඉතා ප්‍රයෝජනවත්වේය කියා ඔබට පෙණෙන හැටියකට මොහුගේ වේදනාව සැහැල්ලු කළ මැනව. මොහුගේ මුලු විශ්වාසය කාරුණ්‍යවන්තවූ ඔබ කෙරෙහිම පමණක් තබන හෙයින් මොහුගේ පසුගියාවූ පාපවල් ගණන් නොගෙණ ඔබගේ ආශිර්වාදලත් ආත්මයෙන් මොහු ස්ථිරකළ මැනව. තවද මොහු මේ ලෝකයෙන් පැහැරගන්ට කැමතිවූකල ඔබගේ ඉතා ප්‍රියපුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යෝග්‍යකම් උදෙසා ඔබගේ කාරුණ්‍යවට මොහු ඒත්තුගත මැනව. ආමෙන්.

¶ එවිට දේවගැතියා මේ ගීතිකාව කියාවා.

**71 ගීතිකාවය.**

යෙහෝවඃවහන්ස ඔබ කෙරෙහි මම විශ්වාසකෙළෙමි කිසි කලක මා ලජ්ජාවට පැමිණෙන්ට නෑරියමැනව, ඔබගේ ධර්මිෂ්ඨකමෙන් මා මුදා නිදහස්කළ මැනව, ඔබගේ කණ මා දෙසට නමා මා ගැලෙව්ව මැනව.

මම නිතර පැමිණෙන පිණිස මට බලකොටුවක් වුවමැනව, ඔබ මාගේ පර්වතයත් කොටුවත් වෙන හෙයින් මා ගලවන්ට පොරොන්දුවූනාය.

ස්වාමිවූ දෙවියන්වහන්ස මගේ බලාසිටීමද බාල වයසේ පටන් මගේ විශ්වාසයද ඔබය.

එබැවින් මගේ දෙවියන්වහන්ස දුෂ්ටයාගේ අතින්ද අධර්මිෂ්ඨයාගේ සහ කෲරයාගේ මිටින්ද මා නිදහස්කළ මැනව.

මගේ මව්ගේ කුසේ පටන් ඔබ මා දැරුවාය, මව් කුසයෙන් ඔබ මා පිටතට ගත්තාය. ඔබට මම නිතර ප්‍රශංසා කරමි.

බොහෝදෙනාට මම පුදුමයක් වෙමි, ඔබ මාගේ බලවත් මුවාවක්ය.

ඔබගේ ප්‍රශංසාවෙන්ද තේජසින්ද මාගේ කට දවස මුලුල්ලේ පිරී තිබෙයි.

මහලු වයසේදී මා අහකනොදමා සවි අඩුවෙන්ට වූනාම මා අත්නෑරිය මැනව.

දෙවියන්වහන්සේ ඔහු අත්ඇරියාය ඔහු ගලවා ගන්ට කිසිවෙක් නැති නිසා ඔහුට පීඩාකොට ඔහු අල්ලාගණිව්ය කියා මගේ සතුරෝ එනම් මගේ ප්‍රාණය නාසන්ට බලාසිටින්නෝ මට විරුද්ධව කථා කරමින් මන්ත්‍රණය කරති.

දෙවියන්වහන්ස මාගෙන් ඈත්නූනමැනව, මගේ දෙවියන්වහන්ස මට උපකාර පිණිස ඉක්මන් වූව මැනව.

මාගේ ප්‍රාණයට එදිරි අයවල් ලජ්ජාවටත් විනාශයටත් පැමිණෙත්වා, මට හිංසාකරන්ට සොයන්නෝ නින්දාවෙනුත් අවනම්බුවෙනුත් වැසෙත්වා. මමද නිතරම ප්‍රාර්ථනාකරමින් ඔබට වඩ වඩා ප්‍රශංසා කරමි.

ඔබගේ ධර්මිෂ්ඨකමෙත් ඔබ දෙන ගැලවීමෙත් ගණන මම නොදන්න බැවින් ඒවා දවස මුලුල්ලේම මගේ කටින් ප්‍රකාශකරමි.



ස්වාමිවූ දෙවිවූ ඔබගේ බලයෙන් ඇවිදිමින් ඔබගේ ධර්මිෂ්ඨකම පමණක්ම මතක්කරමි.

දෙවියන්වහන්ස ඔබ මගේ තරුණ වයසේ සිට මට ඉගැන්නුවාය, දැන් දක්වා ඔබගේ ආශ්චර්ය ක්‍රියා ප්‍රකාශකළෙමි.

දෙවියන්වහන්ස මේ පරම්පරාවට ඔබගේ බලයත් පැවත එන්නන්ට ඔබගේ සවිකමත් මා විසින් පෙන්වනතුරු මහලුව ඉස පැහුනාවූ මා අත්නෑරිය මැනව.

දෙවියන්වහන්ස ඔබ මහත් දේ කළාය, ඔබගේ ධර්මිෂ්ඨකම ඉතා උතුම්ය, දෙවියන්වහන්ස ඔබට කවුරු සමානද ?

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැම්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ මේකත් කියාවා.

තමන්වහන්සේගේ කුරුසිය හා අනර්ඝවූ ලෙයින් අප මුදාගත්තාවූ, ලෝකයාගේ ගැලවුම්කාරවූ ස්වාමීනි අප ගලවා අපට උපකාරකරණ හැටියට යටහත්භාවයෙන් ඔබගෙන් ඉල්ලා සිටිමුව.

¶ ඊලඟට දේවගැතියා මෙසේ කියාවා.

තමන්වහන්සේ විශ්වාසකරණ සියල්ලන්ට ඉතා මහත් බලකොටුවක්ව සිටින්නාවූ ස්වර්ගයෙත් පොළවෙත් පොළව යටත් ඇති සියල්ලන්ගෙන් යටහත්කම හා කීකරුකම ලබන්නාවූ සියලු බල ඇති ස්වාමීන්වහන්සේ දැනටත් සදාකාලයටත් නුඹේ ආරක්ෂාකාරයා වේවා. තවද සනීපය හා ගැලවීම ලබාගන්ට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය මිස ස්වර්ගයෙන් යට අන් කිසි නාමයක් මනුෂ්‍යයන්ට දීලා නැති බව නුඹට දැනගන්ට පුළුවන්කරවා. ආමෙන්.

¶ ඉන්පසු කියාවා.

දෙවියන්වහන්සේගේ දයාවන්තවූ කරුණාවටත් ආරක්ෂාවටත් අපි තුඹ බාරකරමුව, යෙහෝවඃවහන්සේ තුඹට ආශිර්වාදකොට ආරක්ෂාකරාවා, යෙහෝවඃවහන්සේ තමන්ගේ මූන තුඹ කෙරෙහි බබලවා තුඹට පිහිටවේවා, යෙහෝවඃවහන්සේ තමන්ගේ මූන තුඹ කෙරෙහි ඔසවා දැනටත් සදාකාලයටත් සමාදානය තුඹට දේවා. ආමෙන්.

---

## ලෙඩ දරුවන් ගැණ යාච්ඤාවය.

ජීවනයත් මරණයත් තමන් විසින් පමණක්ම එවන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, කරුණාවන්ත දෙවි පියානන්වහන්ස, ලෙඩින් ඇඳපිට ඉන්නාවූ මේ ලදරුවා දෙස ඔබගේ කරුණා ඇසින් ස්වර්ගයේ සිට බලනමෙන් අපි ඔබට යටහත්භාවයෙන් යාච්ඤාවෙමුව. මේ ලෝකයේ **මොහු** ජීවත්කරමින් සිටුවන්ට ඔබ කැමතිනම් **මොහු** ඔබට විශ්වාසයෙන් සේවය කිරීමෙන්ද **මොහුගේ** කාලයේ සිටින්නන්ට යහපත්කම් කිරීමෙන්ද ඔබගේ කැමැත්තලෙස හැසිරෙමින් ඔබට ගෞරව පැමිණෙනලෙස කල්යවන හැටියටත්, නැත්නම්, ස්වාමිවූ යේසුස්වහන්සේ තුළ හැතපෙන ප්‍රාණවලට නිරන්තරවූ නිවාඩුව හා සැපත හිමිවෙන්නාවූ ස්වර්ගීක වාසස්ථානවලට **මොහු** පිළිගන්න හැටියටවත්, ස්වාමිනි ඔබගේ ගැලවීම **මොහුට** දුනමැනව, සැහෙණ නියම කාලයේ ශරිරිකවූ වේදනාවෙන් **මොහු** මුදා ඔබගේ කරුණාවල් උදෙසා **මොහුගේ** ප්‍රාණයත් ගලවාගනමැනව. ස්වාමිනි ඔබ හා ශුද්ධාත්මයානන් සමග සියලු කාලයේ එකම දෙවියන්ව ජීවත්වෙමින් රජකම් කරණ එම ඔබගේ පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළේ තිබෙන ඔබගේ කරුණාවල් නිසා මේ ඉල්ලීම ඉෂ්ටකළ මැනව. ආමෙන්.



## ඉතිරිකරන්ට ඉතා අමාරු රෝගාතුරයන් ගැණ කරන්නාවූ යාච්ඤාවක්ය.

කරුණාවල පියවූ අසරණයේදී අපේ එකම උපකාරකාරයාවූ සියලු සැනසීම දෙන්නාවූ දෙවියන්වහන්ස, මෙහි ඔබගේ අත යටතේ නිදාගන්නාවූ ශරීරයෙන් ඉතා දුර්වලවූ මේ ඔබගේ **දාසයාට** උපකාර ලබාදෙන පිණිස අපි ඔබ ලඟට පැමිණ සිටිමුව. ස්වාමිනි **මොහු** දෙස කරුණාවෙන් බලා **මොහුගේ** පිටතවූ මනුෂ්‍යයා ක්ෂයවෙවී යන්නාසේම **මොහුගේ** ඇතුළතවූ මනුෂ්‍යයා ඔබගේ කරුණාවෙන්ද ශුද්ධාත්මයෙන්ද නිතරම තරකරණ හැටියට යාච්ඤාවෙමුව. ඔබගේ කරුණාව නිසා **මොහුගේ** පාපවල් මකන්ට යෙදෙන පිණිසත් **මොහු** මේ ලෝකයේ නැවත නොපෙණෙන හැටියට අහක්ව යන්ට පළමුවෙන් **මොහුගේ** කාමාව ස්වර්ගයේදී මුද්‍රගසන්ට යෙදෙන පිණිසත් **මොහුගේ** පසුගියාවූ ජීවිතයේ සියලු වැරදි නිසා අවඩකාවූ පසුතැවිල්ලද ඔබගේ පුත්‍රවූ යේසුස්වහන්සේ කෙරෙහි ස්ථිරවූ ශ්‍රද්ධාවද **මොහුට** දුනමැනව. ස්වාමීනි ඔබට කරන්ට බැරිවූ කිසිවක් නැතිබවත්, ඔබ කැමතිනම් **මොහු** නැගුටුවන්ට හා අප අතරේ ජීවත්කරන්ට ඔබට පුළුවන් බවත් දනිමුව. එසේ නුමුත් සියලු ආකාරයෙන්ම පෙණෙන හැටියට **මොහුගේ** මරණය කිට්ටුවෙන හෙයින් **මොහු** සමගිකම හා ඔබගේ කරුණාව ඇතුව මේ ලෝකයෙන් පිටත්ව ගියායින් පසු, **මොහුගේ** ප්‍රාණය ඔබගේ අනන්තවූ රාජ්‍යයට අපේ ගැලවුම්කාර ස්වාමිවූ ඔබගේ එකම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යෝග්‍යකම් හා මැදහත්කම නිසා පිළිගන්ට යෙදෙන පිණිස **මොහු** මරණයට නිස්සෙක්කොට සූදානම්කළ මැනව. ආමෙන්.

රෝගාතුරයෙක් මරණසන්නව සිටිනකල ඔහු බාරදෙන පිණිස කියයුතුවූ යාච්ඤාවය.

සම්පූර්ණකමට පැමුණුනාවූ ධර්මිෂ්ඨයන්ගේ ප්‍රාණ ඔවුන්ගේ භූමිකාවූ හිරගෙවලින් නිදහස්වූ පසු තමන් සමග වාසයකරවාගන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස මේ ඔබගේ **දාසයාවූ** අපේ ප්‍රිය **සහෝදරයාගේ** ප්‍රාණය ඔබ ඉදිරියේ ඉතා අගේ ඇති දෙයක්සේ තිබාගන්නා පිණිස ඉතා යටහත් භාවයෙන් ඉල්ලමින්, විශ්වාස මැවුම්කාරයා හා අති කරුණාවන්ත ගැලවුම්කාරයාවූ ඔබගේ අතට බාරදෙමුව. මේ කාලකණ්ණිවූ දුෂ්ටවූ ලෝකයේ සිටිද්දී මාංසයේ තෘෂ්ණාවලින් හා සාතන්ගේ මායාවලින් අපවිත්‍රවූනාවූ **මොහුගේ** ප්‍රාණය එහෙමපින්ම පවිත්‍රකොට ඔබ ඉදිරියේ කැලලක් නැතුව නිර්මලව පෙණෙන පිණිස, ලෝකයේ පාපවල් නැතිකිරීමට මරණලැබූවාවූ ඉතා පිරිසිදුවූ බැටළු පැටවාගේ ලෙයින් සෝදනා හැටියට අපි ඔබට යාච්ඤා වෙමුව. තවද මේ ප්‍රකාර මරණවල් දවසින් දවස දකිමින් ඉතිරිව සිටින අපට අපේ සභාවේ දුර්වලකමද අනිත්‍යකමද දැනගන්ටත්, අපි මෙහි ජීවත්වෙනකල ශුද්ධවූ ස්වර්ගීයවූ අනාතිමේදී අප අනන්ත ජීවනයට පමුණුවන්නාවූ ඥානය ඉගෙණගැණීමට අපේ සිත් නිසි ආකාර යොමුකරන්ට පුළුවන්වෙන ලෙස අපේ දවස් ගණන්කරන්ටත් අපට උගන්වනාමෙන් අපේ ස්වාමිවූ ඔබගේ එකම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යෝග්‍යකම් නිසා ඔබගෙන් ඉල්ලා සිටිමුව. ආමෙන්.

සිතින් හෝ හෘදසාක්ෂියෙන් හෝ කැලඹී සිටින්නවුන් ගැණ කියයුතු යාච්ඤාවය.

ප්‍රශංසනීයවූ ස්වාමිනි, කරුණාධාර පියානනි, සියලු සැනසීම දෙන දෙවියන්වහන්ස, මේ දුක් වේදනාවට පැමිණී සිටින ඔබගේ **දාසයා** දෙස කරුණාවෙන් හා අනුකම්පාවෙන් බැලූව මැනව. ඔබ **මොහුට** විරුද්ධව කර්කශවූ කාරණාවල් පමුණුවමින් **මොහුගේ** පසුගියාවූ අයුතුකම්වල ඵලය වින්දවනවාය



ඔබගේ උදහස මොහු පිට තදින් තිබෙනවාය **මොහුගේ** හිත ඉතා කැලඹී තිබෙනවාය. නුමුත් ඔබගේ ශුද්ධලියවිල්ලෙන්වූ ඉවසීමෙන්ද සැනසීමෙන්ද අපට ප්‍රාර්ථනාව තිබෙන පිණිස අපේ ඉගෙණගැණීමට තමන්ගේ ශුද්ධවූ වචනය ලියෙව්වාවූ කරුණාවන්තවූ දෙවියන්වහන්ස, ඔබ කෙරෙහි තිබෙන **මොහුගේ** විශ්වාසකම් අත්නාරිණ පිණිසත් ඔබ කෙරෙහි මිස වෙන කිසි කෙණෙක් කෙරෙහි **මොහු** විශ්වාස නොකරණ පිණිසත් **මොහු** ගැණද ඔබගේ සැරකිරීමවල් හා පොරොන්දුවල් ගැණද යුතු හැටියට තේරුම්ගන්ට **මොහුට** පුළුවන්කළ මැනව. **මොහුට** පැමිණෙන සියලු පරීක්ෂාකිරීම්වලට විරුද්ධව සිටිමට **මොහුට** බලය දී **මොහුගේ** සියලු රෝග සුවකළ මැනව. තැළුන බටලීයක් වැනි **මොහු** නොබින්ද මැනව. දුම් නගින පාන්තිරය නොනිව්ව මැනව. **මොහුට** අමනාපයෙන් ඔබගේ මෘදුගුණ සහිත කරුණාව වලක්වා නොගෙණ ඔබ විසින් බිදින්ට යෙදුනු **මොහුගේ** ඇට සතුටුවෙන පිණිස ප්‍රීති සන්තෝෂ විදින්ට **මොහුට** දුනමැනව. සතුරු හසින් **මොහු** ගලවා ඔබගේ මූණේ එළිය **මොහු** කෙරෙහි බබලවා අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යෝග්‍යකම් හා මැදහත්කම නිසා **මොහුට** සමගිකම දුනමැනව. ආමෙන්.

---

# රෝගාතුරයන්ට රාත්‍රිභෝජනය පැවැත්වීමේ ක්‍රමය.

---

¶ මැරෙන්නාවූ සියලු මනුෂ්‍යයෝ නොයෙක් අදිස්සි අනතුරුවලටත් ලෙඩරෝගවලටත් යටහත්ව මේ ජීවිතයෙන් කොයිකලක පිටත්ව යනවාද කියා නොදන්න හෙයින් සියලු බලඇති දෙවියන්වහන්සේ ඔවුන්ට හඬගසන්ට කැමතිවූ

කොයිවිටක නුමුත් ඔවුන් නඟින්ට සෑදීසිටින පිණිස, පිරිස හාරව සිටින සේවකයා, වරින්වර, ප්‍රධානකොට වසංගත රෝගයක්වත් දුවුවන් වැලඳගන්නාවූ රෝගයක්වත් තිබෙන අතර, අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය හා ලේවල ශුද්ධවූ පඞ්ගුකාරකම දේවස්ථානයේදී ප්‍රකාශයෙන් පවත්වනකොට ඒක නොයෙක්විට පිළිගන්න හැටියට බොහෝසෙයින් පිරිසට අවවාදකරාවා. මෙසේ කළොත් යම් අදිස්සි රෝගයක් ඔවුන්ට පැමුණුනත් ශුද්ධවූ භෝජනය ගැණ ඔවුන්ට සිත්කැලඹීමක් නැතුව සිටින්ට පුළුවන්වෙයි. නුමුත් රෝගාතුරයා දේවස්ථානයට යන්ට බැරිව ගෙදරදීම ශුද්ධ භෝජනය ලබන්ට කැමතිනම් ඒ බවත් ඔහු සමග පඞ්ගුකාරවෙන්ට සෑදී සිටින්නන්ගේ ගණනත් කල්ඇතුව සේවකයාට දන්වන්ට යුතුය. තවද ස්වල්පවශයෙන් දෙන්නෙක්වත් තුන්දෙනෙක්වත් රෝගාතුරයා සමග නැතුව ශුද්ධ භෝජනය පවත්වන්ට නොනිසිය. තවද සේවකයා රෝගාතුරයාගේ ගෙයි යුතුතැනකදී ඔබින ලෙස ඒක පවත්වන පිණිස ඊට සෑහෙන්නාවූ සියලු දේ සූදානම්කර තිබාගෙණ මෙහි පහළ ලියවී තිබෙන ලුහුඬු යාචඤාවත් යැවුම්පත්‍රයත් ශුභාරංචිත් පටන්ගණිමින් එහිදීම ශුද්ධ භෝජනය පවත්වාවා.

ලුහුඬු යාචඤාවය.

තමන්වහන්සේ සෙනඟවෙන්නාවුන්ට තරවටුකරන්නාවූ තමන්වහන්සේ පිළිගන්නාවුන්ට අච්චුකරන්නාවූ මනුෂ්‍යවර්ගයාගේ මැවුම්කාරවූ සියලු බලඇති සදාකල් ජීවත්වෙන්නාවූ දෙවියන්වහන්ස ඔබගේ අතින් පීඩා ලැබුවාවූ මේ ඔබගේ **දාසයාට** කරුණාකොට **මොහුගේ** රෝගය නිශ්චලව ධරණ හැටියටත් ඔබ කරුණාවෙන්ට කැමතිනම් **මොහුගේ** ශරීරිකවූ සනීප නැවත ලැබෙන හැටියටත් **මොහුගේ** ප්‍රාණය ශරීරයෙන් වෙන්වෙනකල අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා කැලලක් නැතුව ඔබට භාරදෙන්ට යෙදෙන හැටියටත් කරුණාකරණමෙන් අපි ඔබගෙන් ඉල්ලාසිටිමුව. ආමෙන්.



යැවුම්පත්‍රය. හෙබ්‍රෙව් 12. 5.

ස්වාමීන්වහන්සේ ආදරේ ඇත්තාට අච්චුකරණවාය. උන්වහන්සේ පිළිගන්නා කොයි පුත්‍රයාටත් තලනවාය. එබැවින් මාගේ පුත්‍රය ස්වාමීන්ගේ හරචටුකිරීම සුළුනොකරව. උන්වහන්සේ සැරකළාම පසුබට නොවව.

ශුභාරංචි. යොහන් 5. 24.

සැබවක් සැබවක් තුඹලාට මම කියමි, මාගේ වචන අසා මා එවූ තැනන්වහන්සේ කෙරෙහි අදහගන්නාට සදාකාල ජීවනය ඇත. ඔහු වරදට නොපැමිණ මරණයෙන් එගොඩව ජීවනයට පැමුණුනාය.

¶ මින්පසු ප්‍රෙස්බිතර් ශුද්ධ භෝජනය පවත්වන ක්‍රමයේ නියමකර තිබෙන ප්‍රකාරයට "තමුන්ගේ පාපවල් උදෙසා සැබෑලෙස" යනාදී වචනවලින් පටන්ගණිවා.

¶ ප්‍රෙස්බිතර් ශුද්ධ භෝජනය බෙදාදෙනකොට ඔහුම පළමුවෙන් පිළිගෙණ ඒ ලඟට රෝගාතුරයා සමග පිළිගන්ට සෑදී සිටිනවුන්ට දී සියල්ලන්ට පසු රෝගාතුරයාට දේවා.

¶ නමුත් යමෙක් රෝගයේ බලවත්කම නිසාවත් පිරිස හාරව සිටින සේවකයාට කල්තියා නොදැන්වීම නිසාවත් ඔහු සමග පිළිගන්ට මිනිස්සු නැති නිසාවත් වෙන යම් නිසි වැලක්මක් නිසාවත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය හා ලේවල සක්‍රමේන්තුව පිළිගන්ට බැරුව සිටීනම්, සේවකයා ඔහුට දැනුම්දීකම් දෙමින් ඔහු තමාගේ පව් නිසා සැබෑලෙස පසුතැවිලිව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය පිට නසින්ට යෙදුනු බවද ඔහුගේ ගැලවීම පිණිස ලේ වැගිරෙව් බවද ස්ථිරයෙන් විශ්වාසකොට එයින් තමාට පැමිණෙන්නාවූ ප්‍රයෝජනවල් හොඳකාර සිහිකොට ඒ කාරණ නිසා ක්‍රිස්තුස්වහන්සේට ස්තුතිකරණවානම් ඔහු මුඛයෙන් මේ සක්‍රමේන්තුව පිළිනොගත් නුමුත් ප්‍රාණයේ ගැලවීම පිණිස වැඩසිද්ධවෙන ආකාරයෙන් අපේ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය අනුභවකරණ බවත් ලේ බොන බවත් දන්වාදේවා.

¶ ප්‍රෙස්බිතර් රෝගාතුරයෙක් බලන්ට ගියාම ශුද්ධ භෝජනය එවේලේම දෙන්ට ඕනෑනම් රෝගාතුරයන් බැලීම

පිණිස නියමකරන්ට යෙදුනාවූ "යෙහෝවඃවහන්ස ඔබ කෙරෙහි මම විශ්වාසකෙළෙමි" යනාදී ගීතිකාවට එනකල් කියා ලුහුඬුවීම පිණිස අනිත්වා ඈර ඊලඟටම ශුද්ධ භෝජනය බෙදා දෙන්ට මෙහි නියමකර තිබෙන හැටියට පටන්ගණීවා.

¶ වසංගත රෝග කාලයේ නොහොත් දුවූවන් වැලඳ ගන්නාවූ රෝගකාලයේ භය නිසා පිරිසෙන් කෙණෙක්වත් අසල්වාසීන්ගෙන් කෙණෙක්වත් රෝගාතුරයා සමග ශුද්ධ භෝජනය පිළිගන්ට සම්බවෙන්ට නුපුළුවන්නම් ඒ රෝගාතුරයාගේ ඉල්ලීම පිට සේවකයා පමණක් ඔහු සමග පිළිගණීවා.

---

## මළවුන් භූමදානකරණ ක්‍රමය.

---

¶ බව්තිස්ම නොලැබූවන්ටත් සභාවෙන් අහක්කළවුන්ටත් තමුන්ම නසාගත්තවුන්ටත් මෙහි පහළ සඳහන්වෙන භූමදාන කරණ ක්‍රමය කියවන්ට නොයෙදෙන බව දැනගත යුතුය.

¶ ප්‍රෙස්බිතර් සහ ඔහුගේ උදව්කාරයොත් සොහොන් පිට්ටියේ දොරකඩ ලඟදී මිනිය ඉදිරියට ගොස් දේවස්ථානයටවත් වළ ලඟටවත් ඉස්සරව යමින් මෙසේ කියත්වා නොහොත් ගායනාකරත්වා.

නැවත නැගිටීමත් ජීවනයත් මමය, මා අදහන්නාවූ යමෙක් මළ නුමුත් ජීවත්වෙයි. ජීවත්වෙන්නාවූ යමෙක් මා ඇදහුවොත් ඔහු කිසි කාලක නොනසියි ස්වාමීන්වහන්සේ කියා තිබෙනාවාය. යොහන් 11. 25, 26.

මාගේ ගැලවුම්කාරයාණෝ ජීවත්ව සිටිනාබවත් උන්වහන්සේ අන්තිම දවසේදී භූමිය පිට සිටිනාබවත් දනිමි. මගේ හමට පසු පණුවෝ මගේ ශරීරය නාස්තිකළ නුමුත් අන් කෙණෙක් නොව මම මගේ ශරීරය පිටින් දෙවියන්වහන්සේ දකිමි. මගේ



ඇස්වලටද උන්වහන්සේ පෙණෙයි. යොබ් 19. 25, 26, 27.

අපි මේ ලෝකයට කිසි දෙයක් ගෙණාවේ නැත. සැබෑවටම අපට මේ ලෝකයෙන් කිසි දෙයක් ගෙණයන්ටත් බැරිය. යෙහෝවඃවහන්සේ දුන්නාය යෙහෝවඃවහන්සේ ගත්තාය යෙහෝවඃවහන්සේගේ නාමයට ප්‍රශංසා වේවා. 1 තිමෝති 6. 7; යොබ් 1. 21.

¶ දේවස්ථානයට ඇතුල්වූනාම මේ ගීතිකා දෙක නොහොත් ඉන් එකක් කියන්ට යෙදේ.

39. ගීතිකාවය.

මාගේ දිවෙන් පව් නොකරණ පිණිස මාගේ මාර්ගවල් ගැණ ප්‍රවේසම්වෙමියි කීමි, දුෂ්ටයා මා ඉදිරියේ සිටිනකල කටකලියාවෙන් මෙන් මගේ කට රැකගණිමි.

මම කථානොකොට ගොළුව සිටියෙමි යහපතවත් කථානොකොට සිටියෙමි මම ශෝකයෙන් කැලඹුනෙමි.

මම කල්පනාකරණකල ඇවිලුනු ගින්නෙන් මගේ හෘදය මා තුළේ උණුව ගියාය. එවිට මම දිවෙන් කථාකෙළෙමි.

යෙහෝවඃවහන්ස මම කොපමණ දුර්වලදැයි දැනගන්නා පිණිස මාගේ කෙළවරත් මාගේ දවස්වල ගණනත් මොකදැයි මට දන්නුව මැනව.

ඔබ මාගේ දවස් වියතක් මෙන් කළාය මාගේ වයස ඔබ ඉදිරියේ කිසිත් නැත සැබෑවටම සියලු මනුෂ්‍යයෝ තමුන්ගේ හොඳ කාලයේදී සහමුලින්ම හිස්වෙති.

සැබෑවටම සියලු මනුෂ්‍යයෝ හිස්වූ ඡායාවක් මෙන් ඇවිදිති සැබෑවටම ඔවුන් නිෂ්ඵලව චංචලවෙති ඔවුන් වස්තුව එකතුකරති නුමුත් ඒවා කාවුරු ඇදගණිද්දැයි නොදනිති.

තවද ස්වාමීනි මම මොකක් බලා සිටිම්ද? මාගේ බලාපොරොත්තුවීම ඔබ කෙරෙහිය.

මාගේ සියලු වරදවලින් මා නිදහස්කළමැනව අඥානයින්ගෙන් නින්දා ලබන්ට නැරිය මැනව.

ඔබ මේක කළ නිසා මම ගොළුව මාගේ කට නැර සිටියෙමි.

ඔබගේ තැළීම මාගෙන් අහක්කළ මැනව ඔබගේ අතේ පහරෙන් මම විනාශවූනෙමි.

ඔබ අයුතුකම් ගැණ මනුෂ්‍යයාට සැරකරණකල ඔහුගේ ලක්ෂණ කාවෙක් රෙද්ද නාස්තිකරන්නාක්මෙන් නාස්තිවෙනවාය සැබැවටම සියලු මනුෂ්‍යයෝ හිස්වෙති.

යෙහෝවඃවහන්ස මාගේ යාච්ඤාව අසා මාගේ මූරගැසීමට කන් දුනමැනව, මම මාගේ සියලු පියවරුන් මෙන් ඔබ ඉදිරියේ පරදේශියෙක්ද නවාතැන්කාරයෙක්ද නිසා මාගේ කඳුළු නොසලකා හුන්න මැනව.

මම තවත් නොසිට මෙයින් පිටත්ව යන්ට පළමුවෙන් මාගේ බලය ලැබගන්නා පිණිස මා ඉතිරිකළ මැනව.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැන්මේදී තිබුණු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

90. ගීතිකාවය.

ස්වාමීනි සියලු පරම්පරාවෙහිම ඔබ අපේ වාසස්ථානේය.

කඳු අටගන්ට පළමුද පොළව සහ ලෝකය මවන්ට පළමුද සිට සදාකාලෙන් සදාකාලේටම ඔබ දෙවියෝය ඔබ මනුෂ්‍යයන් විනාශකරවා, මනුෂ්‍ය පුත්‍රයෙනි හැරී එව්යයි කියනවාය.

ඔබ ඉදිරියේ දහසක් අවුරුද්ද පසුවුනා ඊයේ දවස වාගෙත් රෑ යාමයක් වාගෙත්ය.



ඔබ සැඩපාරෙන් ගෙණයන්නාක්මෙන් ඔවුන් ගෙණයනවාය ඔවුන් නින්දක් වගේය ඔවුන් උදය වැඩෙන තණකොළ මෙන්ය.

ඒවා උදේ සශ්‍රීකව වැඩී සවස කපනුලැබ වියළී යනවාය.

අපි ඔබගේ උදහසින් විනාශව ඔබගේ තරහෙන් වෙහෙස විඳිමුව.

අපේ අධර්මිෂ්ඨකම් ඔබ ඉදිරියෙන් අපේ රහස්වූ පව් ඔබගේ මූණේ එළියෙන් ඔබ තැබුවාය.

මෙසේ අපේ සියලු දවස් ඔබගේ උදහසින් ගෙවෙනවාය අපේ අවුරුදු කියාපු කථාන්තරයක් මෙන් පසුකරමුව.

අපේ වයස අවුරුදු හැත්තෑවය නුමුත් සවි ඇති නිසා අසූ අවුරුද්දක් වුනොත් අපි හනිකම කපනු ලැබ නැතිවී යන නිසා ඒ සවියෙන් වෙහෙසත් කනගාටුවත් වේ.

ඔබගේ උදහසේ සැරකමත් ඔබගේ ක්‍රෝධයේ තරමට භයවීමත් දන්නේ කව්ද.

අපේ හිත් ප්‍රඥාවට යොමුකරණ පිණිස අපේ දවස් ගණින්ට ඉගැන්නුව මැනව.

යෙහෝවඃවහන්ස, ඔබ ආපසු එන්නේ කවදාද ? ඔබගේ වාලුන් ගැණ පසුතැවිලිවෙන්නේ කවදාද?

අපේ සියලු දවස්වල ප්‍රීතිසන්තෝෂවෙන පිණිස ඔබගේ දයාවෙන් ඉක්මනටම අප පූර්ණකළ මැනව.

අපි ඔබගෙන් දුක් ලැබූ දවස් ගණනේද නපුරුකම් ඉවසූ අවුරුදු ගණනේද හැටියට අපට ප්‍රීතිය දුනමැනව.

ඔබ කළ දේ ඔබගේ වාලුන්ටද ඔබගේ තේජස ඔවුන්ගේ දරුවන්ටද පෙන්නුව මැනව.

අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේගේ අලඞ්කාරය අප කෙරෙහි වේවා අපේ හස්තකර්මාන්ත අපට

ස්ථිරකළ මැනව අපේ හස්තකර්මාන්ත අපට ස්ථිර කළ මැනව.

පියාණන්ටත් පුත්‍රයාණන්ටත් ශුද්ධාත්මයාණන්ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැන්මේදී තිබුණු ලෙස දැන් සහ මතු සදාකාලේටම එසේ වේවා. ආමෙන්.

¶ නැවත ශුද්ධවූ පාවුල් විසින් කොරින්තිවරුන්ට ලිව් පළමුවෙනි යැවුම්පත්‍රයේ පසළොස්වෙනි පරිච්ඡේදයෙන් ගත් කියවීම කියන්ට යෙදේ.

1. කොරින්ති 15. 20.

මනුෂ්‍යයාගෙන් මරණය වුනාවාගේ, මනුෂ්‍යයාගෙන් මළවුන්ගෙන් නැගිටීමත් වුනබැවින්ද ආදම් කාරණකොටගෙණ සියල්ලෝ මරණයට පැමිණෙන්නාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ කාරණකොටගෙණ සියල්ලෝ ජීවත්වනු ලබන බැවින්ද දැන් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට නිදාගත්තවුන්ගේ නාඹුල් ඵලය වුනාය. නුමුත් එක එකාතම තමාගේ ක්‍රමය ලෙස නාඹුල් ඵලයවූ ක්‍රිස්තුස්වහන්සේද ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී උන්වහන්සේට අයිති අයවල්ද නැගිටිති. එවිට උන්වහන්සේ සියලු සතුරන් තමන්වහන්සේගේ පාද යට තබනතුරු උන්වහන්සේ විසින් රාජ්‍යය කටයුතු බැවින් සියලු ආණ්ඩුවද මුලාදෑනිකමද බලයද විනාශකොට රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේටම භාර දෙනවා ඇත එකල කෙළවර වේ. සියලු දේ උන්වහන්සේගේ පාද යටට කළ නිසා මරණයනම්වූ අන්තිම සතුරා විනාශකරණු ලැබේ. නුමුත් සියල්ල යටත්වුනාය යන කීමෙන් සියල්ල උන්වහන්සේට යටත්කළ පියානන් ඇරය කියා පෙණෙනවාය. තවද සියල්ල උන්වහන්සේට යටත්කරණු ලැබූකල දෙවියන්වහන්සේ සියල්ලන් කෙරෙහි සියලු ආකාරයෙන් උතුම්වෙන පිණිස පුත්‍රයාණෝද තමන්ට සියල්ල යටත්කරදුන් උන්වහන්සේට යටත්වෙ



නවා ඇත. එසේ නැත්නම් මළවුන් කෙරෙහි බව්තීස්ම ලබන්නන්ට මක්වේද. මළවුන් මුලුමනින්ම නොනැගිටිත්නම් මළවුන් කෙරෙහි මක්නිසා බව්තීස්ම ලබද්ද. අපිත් සැමවේලෙහිම උපද්‍රවයේ සිටින්නේ මන්ද. තුඹලාගැණ අපේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කාරණකොටගෙණ මට ඇත්තාවූ අහඞ්කාරය පා මම දවස්පතා මියමියි දිවිරමි. මනුෂ්‍යයෝ කාරණ හැටියට එපීසයේදී සිව්පාවුන් සමග මාගේ පොරඇල්ලීමෙන් මට ප්‍රයෝජනය මොකද. මළවුන් නොනැගිටිත්නම් හෙට මියන නිසා අද කමුව බොමුව. මුළානොවව් නපුරු සමාගම් පැවැත්වීමෙන් යහපත් කල්ක්‍රියාව නපුරුවේ. තුඹලාගෙන් සමහරු දෙවියන්වහන්සේ නාදුනත්සී තුඹලාට ලජ්ජා පිණිස කියමි. එබැවින් තුඹලා පව්නොකොට ධර්මිෂ්ඨකම් කිරීමට පිබිද සිටිව්. මළවුන් නැගිටින්නේ කොහොමද කොයියාකාර ශරීරයෙන් ඔවුන් එද්දැයි සමහරෙක් අසති. අහෝ අඥානය තුඹ වපුරණ එක නොමළොත් පැලනොවෙයි. තුඹ වපුරණ එක මතු අටගන්නාවූ පැලය නොව නිකම් වීඇටයක්වත් වෙන ඇටජාතියක්වත්ය. එහෙත් දෙවියන්වහන්සේ තමන්ට කැමති හැටියට ඒවා පැලකොට එක එක බිජුවටයට එහි නියම කඳ අටගන්වනවාය. සියලු මාංස එකාකාර නොවේය මනුෂ්‍යයන්ගේ මාංසය එකාකාරයක සිව්පාවුන්ගේ මාංසය වෙනාකාරයක, මසුන්ගේ මාංසය වෙනාකාරයක පක්ෂීන්ගේ මාංසය වෙනාකාරයක. තවද ස්වර්ගීක ශරීරද භූමික ශරීරද ඇත. එහෙත් ස්වර්ගීකයන්ගේ තේජස එකාකාරයක භූමිකයන්ගේ තේජස වෙනාකාරයක. සූර්යයාගේ තේජස එකාකාරයක චන්ද්‍රයාගේ තේජස වෙනාකාරයක. තේජසින් තාරකාවට තාරකාවක් වෙනස් බැවින් තාරකාවල තේජස වෙනාකාරයක. මළවුන්ගේ නැගිටීමත් එසේමය. කුණුවෙන ආකාර

යෙන් වපුරණුලැබේ කුණුනොවෙන ආකාරයෙන් නැගුටුවනු ලැබේ. තේජස නැතුව වපුරණුලැබේ තේජස ඇතුව නැගුටුවනුලැබේ. දුර්වලකමින් වපුරණුලැබේ බලයෙන් නැගුටුවනු ලැබේ. වපුරන්නේ ප්‍රාණික ශරීරයක්ය නැගිට්න්නේ ආත්මික ශරීරයක්ය. ප්‍රාණිකවූ ශරීරයකුත් ආත්මිකවූ ශරීරයකුත් ඇත. පළමුවෙනි මනුෂ්‍යයාවූ ආදම් ජීවමාන ප්‍රාණයක්ව මවනුලැබුවාය. අන්තිම ආදම් ජීවනදායක ආත්මයක් වූනායයි ලියාතිබෙනවාය. එසේ නුමුත් ආත්මික එක පළමුවෙනි එක නොවේය. එහෙත් පළමුවෙන් ප්‍රාණික එකද ඉන්පසු ආත්මික එකද වූනාය. පොළවෙන්වූ පළමුවෙනි මනුෂ්‍යයා ධූලිමය දෙවෙනි මනුෂ්‍යයා ස්වර්ගයෙන් ආවාවූ ස්වාමීය. ධූලිමය තැනැත්තෝ ඒ ධූලිමය තැනැත්තා වාගේය ස්වර්ගීයකයෝද ස්වර්ගීයකයා වාගේය. අපි ධූලිමය තැනැත්තාගේ රූපය දැරුවාක්මෙන් ස්වර්ගීයකයාගේ රූපයත් දරණවා ඇත. සහෝදරයෙනි ලේ මස්වලට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමවෙන්ට බැරි බවත් කුණුවෙන එකට කුණුනොවීම උරුමනොවෙන බවත් කියමි. මෙන්න තුඹලාට රහසක් කියමි. අපි සිල්ලෝම නිඳගැණීමට නොපැමිණ අන් වෙසක් වෙනවා ඇත. හොරණෑව ශබ්දය පවත්වනකල කුණුවෙන්නාවූ මේක කුණුනොවීම ඇන්දයුතු බැවිනුත් මරණීයවූ මේක අමරණය ඇන්දයුතු බැවිනුත් ඒ අන්තිම හොරණෑ ශබ්දය පවත්වනකල ඇසිපිය හෙළන ක්ෂණයේම මළවුන් කුණුනොවීමට නැගුටුවනවා ඇත. අපිත් අන්වෙසක් වෙනවා ඇත. කුණුවෙන්නාවූ මේක කුණුනොවීමත් මරණීයවූ මේක අමරණයත් ඇන්දම මරණය පරාජයකොට ගිලිනාලද්දේයයි ලියාතිබෙන වචනය සම්පූර්ණවෙයි. මරණය තාගේ කටුව කොතනද මිනීවල තාගේ ජය කොතනද මරණයේ කටුවනම් පාපය පාපයේ බලයනම් නීති



යය. එහෙත් අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට සතුතිවේවා. එසේහෙයින් මාගේ ප්‍රිය සහෝදරයෙනි ස්වාමීන් කෙරෙහි තුඹලාගේ වැඩ නිෂ්ප්‍රයෝජන නොවේයයි තුඹලා දන්නා බැවින් ස්ථිරව නිශ්චලව ස්වාමීන්ගේ ක්‍රියාවල නිතර වර්ධනවෙව් සිටිව්.

¶ මිනිවල ලඟට ඇවිත් මිනිය වළලන්ට සාදනකොට ප්‍රෙස්බිතර්වත් ප්‍රෙස්බිතර් සහ ඔහුගේ උදව්කාරයෝවත් මෙසේ කියත්වා.

ස්ත්‍රියෙකුගෙන් උපදින මනුෂ්‍යයාට ජීවත්වීමට තිබෙන කාලය ලුහුඬුය ඔහු කාලකණ්ණිකමෙන් පූර්ණය ඔහු වැඩී මලක් මෙන් කපාදමන්ට යෙදෙයි සෙවනැල්ලක් මෙන් පහව යයි කිසිකලක එකාකාරව නොපවතී.

අපි ජීවත්ව සිටිද්දීම මරණ අනතුරවේ සිටිනවාය අපේ පාපවල් නිසා යුතුලෙස අපට අමනාපව සිටින්නාවූ ස්වාමීනි අපි ඔබගෙන් මිස කාගෙන් උපකාර ඉල්ලමුද.

ඉතා ශුද්ධවූ දෙවිස්වාමීනි ඉතා බලවන්ත ස්වාමීනි පිරිසිදුවූ ඉතා කරුණාවන්ත ගැලවුම්කාරයානනි සදාකාල මරණයේ කර්කශවූ වේදනාවලට අප පාවා නුදුනමැනව.

ස්වාමීනි අපේ හිත්වල රහස් ඔබ දන්නවාය අපේ යාච්ඤාවලට ඔබගේ කරුණාවන්තවූ කන් වසා නොගතමැනව. ඉතා ශුද්ධ ස්වාමීනි ඉතා බලවන්ත දෙවියන්වහන්ස පිරිසිදුවූ කරුණාවන්ත ගැලවුම්කාරයානනි ඉතා ශ්‍රේෂ්ඨවූ සදාකාල විනිශ්චයකාරයානනි අපේ අන්තිම පැය පැමිණෙන කල මරණයේ වේදනාවල් කොපමණ කර්කශ නුමුත් අප ඔබ කෙරෙන් වෙන්වී යන්ට නැරිය මැනව අපට නිසි අච්වුද නුදුන මැනව.

¶ ලඟ හිටින්නන්ගෙන් කවුරු නුමුත් මිනියට පස් දමනකොට ප්‍රෙස්බිතර් කියාවා.

සියලු බලඇති දෙවියන්වහන්සේ නැසීගියාවූ අපේ මේ ප්‍රිය **සහෝදරයාගේ** ප්‍රාණය තමන් ලඟට ගන්නට මහත් කරුණාවෙන් කැමතිවූනාය. එබැවින් සියල්ල තමන්ට යටහත්කරගන්ට පුළුවන්වූ බලපරාක්‍රමයෙන් අපේ නීචවූ ශරීර තමන්ගේ තේජවන්තවූ ශරීරයට සමානවෙන පිණිස ඒවා අන්වෙසක් කරන්නාවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙණ සදාකාල ජීවනයට නැවත නැගිටීමක් ඇතිබව ස්ථිරලෙස ඒ කානාතයෙන්ම බලාසිටිමින් පස් පස්වලටත් අළු අළුවලටත් දූවිලි දූවිලිවලටත් මේ මිනිය පොළවටත් බාරදෙමුව.

¶ එවිට මෙසේ කියන්ට යෙදේ නොහොත් ගායනාකරන්ට යෙදේ.

මෙතැන් පටන් මළවුන්ගෙන් ස්වාමීන්වහන්සේ කෙරෙහි නසින්නෝ ආශිර්වාද ලත්තෝය කියා ලියවයි ස්වර්ගයෙන් මට කියන ශබ්දයක් ඇසිමි ඒ එසේමය. ඔවුන් තමන්ගේ වෙහෙසින් නිවාඩු ලබත්යි ආත්මයාණන්වහන්සේ කියනවාය.

¶ එවිට ප්‍රෙස්බිතර් කියාවා.

ස්වාමීන්වහන්ස අපට කරුණාකළ මැනව.
ක්‍රිස්තුස්වහන්ස අපට කරුණාකළ මැනව.
ස්වාමීන්වහන්ස අපට කරුණාකළ මැනව.

ස්වර්ගයෙහි සිටින අපේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළවෙත් කරණුලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරදිකළවුන්ට අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමාවුවමැනව. අප පරීක්ෂාවිමට නොපමුණුවා නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.



ප්‍රෙස්බිතර්.

ස්වාමීන්වහන්සේ තුළ නසින්නවුන්ගේ ප්‍රාණ තමන් ලඟ සිටුවාගන්නාවූ ඇදහිලිවන්තයින්ගේ ප්‍රාණද මාංස බරෙන් සැහැල්ලුකළායින් පසු ප්‍රීතියෙන්ද සැපතින්ද තමන් ලඟ වාසයකරවාගන්නාවූ සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබ මේ පව්වූ ලෝකයේ කාලකණ්ණිකමෙන් මේ අපේ **සහෝදරයා** ගලවාගන්ට කැමතිවූ නිසා අපි ඔබට මුලු හිත්වලින් සතුතිකරමුව. තවද ඔබගේ ශුද්ධවූ නාමයේ සැබෑවූ ඇදහිල්ලෙන් නසින්නාවූ සියල්ලන් හා අපිත් ශරීරයෙන්ද ප්‍රාණයෙන්ද ඔබගේ අනන්තවූ සදාකල් පවතින්නාවූ තේජසේ සම්පූර්ණවූ වාසනාවන්තකමට හා තෘප්තිමත්කමට පැමිණෙන පිණිස ඔබගේ කරුණා සහිත යහපත්කමෙන් තෝරාගත්තවුන්ගේ ගණන හනිකම පූර්ණකොට ඔබගේ රාජ්‍යය ඉක්මනට පිහිටවන ලෙස අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා අපි යාච්ඤාවෙමුව. ආමෙන්.

ඛුහුඩු යාච්ඤාවය.

නැවත නැගිටීමද ජීවනයදවූ යේසුස් ක්‍රිස්තුස්නම් අපේ ස්වාමීන්වහන්සේගේ පියවූ කරුණාවන්ත දෙවියන්වහන්ස, තමන් අදහන්නෝ මළනුමුත් ජීවත්වෙනවාය කියාත් ජීවත්වෙන කෙණෙක් තමන් ඇදහුවොත් සදාකාලේටම නසින්ට ඉඩඅරින්නේ නැත කියාත් උන්වහන්සේ ඉගැන්නුවාය. තවද අපොසතුළුවූ පාවුල් ලවා තමන්වහන්සේ කෙරෙහි සැතපෙන්නවුන් ගැණ ප්‍රාර්ථනාව නැත්තන් මෙන් ශොකවෙන්ට එපාය කියා අපට ඉගැන්නුවාය. එබැවින් පියාණෙනි අපේ ප්‍රාර්ථනාව හැටියට අපේ මේ **සහෝදරයා** ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි නිවාඩුගන්නා වාගේ අපි නසින කල අපිත් නිවාඩුගන්නා පිණිසත් අන්තිම දවසේ සාමානෲවූ

නැගිට්මේදී අපි ඔබ ඉදිරියේ පිළිගන්ට යුතු අයවල්ව සිටිනපිණිසත් ඔබට ප්‍රේමකොට භයවෙන සියල්ලන්ට ඔබගේ ප්‍රිය පුත්‍රයා විසින් ප්‍රකාශකරන්ට යෙදෙන ආශිර්වාදය එනම් මාගේ පියානන්ගෙන් ආශිර්වාදලත් දරුවෙනි වරෙව් ලෝකය මැව් තැන් පටන් නුඹලාට සැදූ රාජ්‍යය උරුමවෙයව්යයි යන ආශිර්වාදය ලබන පිණිසත් පාපයේ මරණයෙන් ධර්මිෂ්ඨකමේ ජීවනයට අප නැගුටුවනමෙන් බැගෑපත්ව ඉල්ලාසිටිමුව. කරුණාවනතාවූ පියානනි අපේ මැදහත්කාරයත් ගැලවුම්කාරයත්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා මේ ඉල්ලීම ඉෂ්ටකළමැනව. ආමෙන්.

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවත්, දෙවියන්වහන්සේගේ ආදරයත්, ශුද්ධාත්මයානන්වහන්සේගේ සමගිකමත්, සදාකාලේටම අප සියල්ලන් සමග වේවා.

---

## වැදුවාසින් පසු ස්ත්‍රීන් විසින් ස්තුතිකිරීමේ ක්‍රමය.

---

¶ වැදුවාසින් පසු ස්ත්‍රීන් සැහෙන ප්‍රස්තාවේ යුතුලෙස ඇද දේවස්ථානයට පැමින ව්‍යවහාර ස්ථානයේවත් නායකයා නියමකළ තැනකවත් දනගසා ඉදීවා. එවිට ප්‍රෙස්බතර් ඈට මෙසේ කියාවා.

සියලු බලඇති දෙවියන්වහන්සේ නුඹට කරුණාවෙන් උපද්‍රව නැති සැහැල්ලුවක් දී මහත් වදන වේදනාවෙන් නුඹ ආරක්ෂාකළ නිසා දෙවියන්වහන්සේට හිතෙන්ම ස්තුතිකරමින් මෙසේ කියව.

¶ එවිට ප්‍රෙස්බිතර් 116 වෙනි ගීතිකාව කියාවා.

*Dilexi quonian.*

යෙහෝවඃවහන්සේ මගේ කන්නලව් ශබ්දය ඇසූබැවින් උන්වහන්සේට මම ආදරේය.



උන්වහන්සේ මට ඇහුම්කන් දුන්බැවින් මම ජීවත්ව සිටිනතුරු උන්වහන්සේට යාච්ඤාවෙමි.

මරණ වේදනාවෙන් මම වටවූනාය. පරලොව දුකට මම අසුවූනාය.

මම කැලඹීමටත් ශොකයටත් පැමුණුනෙමි, එවිට යෙහෝවඃවහන්ස මාගේ ප්‍රාණය ගලවාගනමැනවයි කියා ඉල්ලමින් යෙහෝවඃවහන්සේගේ නාමයට යාච්ඤාවීමි.

යෙහෝවඃවහන්සේ කරුණාවන්තය ධර්මිෂ්ඨය එපමණක්නොව අපේ දෙවියන්වහන්සේ දයාබරය.

යෙහෝවඃවහන්සේ අවඩකයන් ආරක්ෂාකරණවාය මම අසරණයට පැමිණුනාය උන්වහන්සේ මට පිහිටවූනාය.

හිත යෙහෝවඃවහන්සේ තාට හොඳකම්කළ නිසා තාගේ නිවාඩු ගැණීමට ආපසු යව.

යෙහෝවඃවහන්ස ඔබ මාගේ ප්‍රාණය මරණයෙන්ද මාගේ ඇස් කඳුලෙන්ද මාගේ කකුල් වැටීමෙන්ද ගලවාගත්තාය.

මම ජීවමාන දේශයේදී යෙහෝවඃවහන්සේ ඉදිරියේ හැසිරෙමි.

මම ඇදහූ බැවින් කථාකෙළෙමි මම බොහෝ පීඩිතවීි සියලු මනුෂ්‍යයෝ බොරුකාරයෝයයි මාගේ ඉක්මන්කමෙන් කීමි.

යෙහෝවඃවහන්සේ මට කළ සියලු උපකාරවලට උන්වහන්සේට මම මොකක් කරම්ද.

මම ගැලවීමේ කුසලාන ගෙණ යෙහෝවඃවහන්සේට යාච්ඤාකරමි.

මම යෙහෝවඃවහන්සේට පොරොන්දුවූ දේ උන්වහන්සේගේ මුලු සෙනග ඉදිරියේ දැන් ඉෂ්ටකරමි.

යෙරුසලම තී මැදදී එනම් යෙහෝවඃවහන්සේගේ ගෙයි මණ්ඩපවලදී යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරමි.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන් ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැන්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සඳාකාලේටම එසේ වේවා.

නොහොත් 127 වෙනි ගීතිකාව.

*Nisi Dominus.*

යෙහෝවඃවහන්සේ ගෙය සාදුවොත් මිස ඒක සාදන්නන්ගේ මාංසිය හිස්වේ.

යෙහෝවඃවහන්සේ නුවර රක්ෂාකළොත් මිස රැකාවළාගේ පිබිද ඉඳීම හිස්වේ.

නුඹලා උදේම නැඟිට රෑවෙනකල් ඉඳීමත් වෙහෙසින් කෑම ගැන්මත් හිස්වේ උන්වහන්සේ තමන් කාරුණ්‍ය ඇත්තන්ට යහපත් ලෙස නින්ද දෙනවාය.

දරුවෝ යෙහෝවඃවහන්සේගෙන් ලබන උරුමේය කුසේ ඵලයද උන්වහන්සේගේ තෑග්ගය.

තාරුණ්‍ය කාලේ දරුවෝ බලවන්තයෙකුගේ අතේ තිබෙන ඊගස් වාගේය.

එයින් පිරුණු ඊකොපුව ඇති පුරුෂයා ආශිර්වාද ලත්තාය. එසේවූවෝ වාසල් දොරකඩදී හතුරන් සමග කථාකරණකල ලජ්ජා නොවෙති.

පියානන්ටත් පුත්‍රයානන්ටත් ශුද්ධාත්මයානන් ටත් ප්‍රශංසා වේවා.

පටන්ගැන්මේදී තිබුනු ලෙස දැන් සහ මතු සඳාකාලේටම එසේ වේවා.

¶ ඊලඟට ප්‍රෙස්බිතර් කියාවා.

අපි යාච්ඤාකරමු.

ස්වාමීන්වහන්ස අපට කාරුණ්‍යකළ මැනව.
ක්‍රිස්තුස්වහන්ස අපට කාරුණ්‍යකළ මැනව.
ස්වාමීන්වහන්ස අපට කාරුණ්‍යකළ මැනව.

ස්වර්ග්‍යාගේ සිටින අපේ පියානනි, ඔබගේ නාමයට ගෞරවකරණු ලැබේවා. ඔබගේ රාජ්‍යය



ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ග්‍යාගේ මෙන් පොළවෙත් කරණු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුනමැනව. අපට වැරද් කළවුන්ට අපි කමාවෙන්නා වාගේ අපේ වැරදිවලටත් කමාවුව මැනව. අප පරීක්ෂාවීමට නොපමුණුවා නපුරෙන් අප ගලවාගත මැනව. ආමෙන්.

දේවගැතියා. ස්වාමීනි ඔබ විශ්වාසකරණ ඔබගේ දැසිවූ මේ ස්ත්‍රීය රක්ෂාකළ මැනව.

උත්තරය. මැගේ සතුරාගෙන් ආරක්ෂාව පිණිස මැට බලකොටුවක් වූවමැනව.

දේවගැතියා. ස්වාමීනි අපේ යාච්ඤාව ඇසුවමැනව.

උත්තරය. අපේ මොරගැසීම ඔබ වෙතට පැමිණේවා.

දේවගැතියා. අපි යාච්ඤාකරමු.

සියලු බලඇති දෙවියන්වහන්ස, ඔබගේ දැසිවූ මේ ස්ත්‍රී වැදීමේදී මහත් වේදනාවෙන් හා උපද්‍රවයෙන් ආරක්ෂාකරන්ට ඔබ කාරුණ්‍යකළ නිසා අපි ඔබට යටත්භාවයෙන් ස්තුතිකරමුව. ඉතා කාරුණ්‍යවන්ත පියානනි, ඔබගේ පිහිටෙන් මේ ස්ත්‍රීට මෙලොවදී ඔබගේ කැමැත්ත හැටියට විශ්වාසකමින් ජීවත්ව හැසිරෙන්ටත්, පරලොවදී සඳාකාල තේජසේ පංගුකාරියෙක් වෙන්ටත් පුළුවන්කරණ හැටියට අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඉල්ලාසිටිමුව. ආමෙන්.

¶ ස්තුතිකරන්ට ආවාවූ ස්ත්‍රීය විසින් ව්‍යවහාරව තිබෙන පූජවල් පූජකරන්ටත් ශුද්ධ භෝජනය පැවැත්වීමක් තිබෙනවානම් ඒක පිළිගන්ටත් යුතුය.